

විවිධත්වයට ඉඩ දෙන රක්ෂණය

වාර්ෂික වාර්තාව 2020

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්

SLIC
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
පියෙකු මෙන් මවක මෙන්



විවිධත්වයට ඉඩ දෙන රක්ෂණය

අපගේ සේවාවන් සඳහා තවත් ප්‍රජාවන්, කාණ්ඩ සහ වයස් කණ්ඩායම් ගණනාවකට ඉඩ ලබා දීමේ අපගේ ප්‍රයත්නයන් ඉස්මතු කරමින් "සැමට එකෙකු" යන ආදර්ශය මෙම වසරේ අපගේ තේමාව වී තිබේ. පවතින වසංගත තත්වය හේතුවෙන් ආර්ථිකයෙහි කිසිදු යහපතක් සිදු නොවූවද, අපගේ පාර්ශවකරුවන්ගේ අභිමතාර්ථයන්ට වටිනාකමක් එක් කරමින් අපගේ ගණුදෙනුකරුවන් වෙත අඛණ්ඩව සේවය සැපයීම සඳහා අපගේ ඔරොත්තු දීමේ හැකියාව මෙන්ම ඉක්මනින් සහ බාධාවකින් තොරව අනුවර්තනය වීමේ හැකියාව ඉන් පරීක්ෂාවට ලක් කරන ලදි. එකිනෙකාට ගැලපෙන පරිදි වෙනස් කරන ලද නිෂ්පාදනයන් සමඟ අපගේ රැකවරණය දිවයින පුරා පුළුල් කිරීමේදී, විවිධත්වයට ඉඩ දෙන රක්ෂණය තුළින් සේවාව සැපයෙන SLIC ආයතනය හි නව පරපුරේ සේවාදායකයින් හොඳින් අවබෝධ කර ගනිමින් ඔවුනට සේවා සැපයීම සඳහා ඔවුන් සමඟ වඩාත් ගැඹුරින් සම්බන්ධ වීමට අප බලාපොරොත්තු වෙමු.

Scan to view this Annual Report
https://www.srilankainsurance.com/en/about-us/annual-reports

පටුන

අප ගැන

4 - ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පිළිබඳ තොරතුරු
6 - අධ්‍යක්ෂක මණ්ඩලය
12 - නායකත්ව කණ්ඩායම
22 - ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමූහයේ ව්‍යුහය
24 - මූල්‍යමය විශයෙන් වැදගත් කරුණු
25 - මූල්‍යමය නොවන වැදගත් කරුණු

නායකත්ව සමාලෝචනයන්

28 - සභාපතිවරයාගේ පණිවිඩය
31 - ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය

වාර්තාවේ පැතිකඩ

උපායමාර්ගය සහ අවධානය

38 - ව්‍යාපාර ආකෘතිය
40 - ප්‍රමාණාත්මතාවය පිළිබඳ කරුණු
41 - පාර්ශවකරුවන්ගේ සම්බන්ධතා
43 - උපායමාර්ගික ප්‍රමුඛතාවයන්

කලමනාකරණ විස්තර ප්‍රකාශය

46 - මෙහෙයුම් පරිසරය
47 - මූල්‍ය ප්‍රාග්ධනය
55 - නිෂ්පාදිත ප්‍රාග්ධනය
59 - බුද්ධිමය ප්‍රාග්ධනය
64 - මානව ප්‍රාග්ධනය
71 - සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
72 - ස්වභාවික ප්‍රාග්ධනය

යහපාලනය සහ අවදානම් පාලනය

88 - ආයතනික පාලන වාර්තාව
91 - විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව
93 - 2020 ආයෝජන කමිටු වාර්තාව
95 - අවදානම් කලමනාකරණ වාර්තාව
107 - අනුකූලතා වාර්තාව
114 - අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය

මූල්‍යමය තොරතුරු

116 - සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව
120 - අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පිළිබඳ වාර්තාව
121 - ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම පිළිබඳ වාර්තාව
122 - රක්ෂකයාගේ ආයුගණක සහතිකය
123 - වගකීම් ප්‍රමාණාත්මතාවයේ පරීක්ෂණය
124 - දරණ ලද වීහෙත් ප්‍රමාණවත්ව වාර්තා නොවූ හිමිකම් පිළිබඳ සහතිකය
125 - ස්වාධීන විගණකවරයාගේ වාර්තාව
130 - මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
132 - ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය
134 - හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
140 - මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය
142 - ඛණ්ඩමය සමාලෝචනය: ආදායම් ප්‍රකාශය
144 - ඛණ්ඩමය සමාලෝචනය - මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
146 - මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

අතිරේක තොරතුරු

266 - ජීවිත රක්ෂණයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
267 - මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ජීවිත රක්ෂණ අරමුදල
272 - සමාගමෙහි ලාභය සහ අලාභය පිළිබඳ දස වසරක සාරාංශය
274 - සමූහයෙහි ශේෂ පත්‍රයෙහි දස වසරක සාරාංශය
276 - ශාඛා ජාලය
284 - ආයතනික තොරතුරු
285 - වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දැනුම්දීම
286 - ලියාපදිංචි වීමේ පෝරමය
287 - පෙරකලාසි පෝරමය



අප ගැන

4 - ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පිළිබඳ තොරතුරු
6 - අධ්‍යක්ෂක මණ්ඩලය
12 - නායකත්ව කණ්ඩායම
22 - ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමූහයේ ව්‍යූහය
24 - මූල්‍යමය වශයෙන් වැදගත් කරුණු
25 - මූල්‍යමය නොවන වැදගත් කරුණු

"SLIC නිසා මගේ හිත නිදහස්. මොකද, මම දන්නවා මගේ ආදරණීය පවුලට ඉහළම රැකවරණයක් ලැබෙන බව.



සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පිළිබඳව

ශ්‍රී ලංකාවේ ජාතික රක්ෂණ සේවා සැපයුම්කරු සහ රටේ රක්ෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමියා ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (SLIC) දශක ගණනාවක කර්මාන්ත ප්‍රවීණතාවය සහ රටෙහි වඩාත්ම පළපුරුදු රක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික දැනුම් පදනම හිමි කරගෙන තිබේ.

ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයේ දියුණුව හා උන්නතිය සඳහා උරදුන් SLIC හි දීර්ඝ ඉතිහාසය තුළ සුවිශේෂී කඩඉමි රාශියක් පසු කිරීමට සමාගමට හැකිව තිබේ. ඒ අතරට මේ දක්වා ගෙවන ලද විශාලතම හිමිකම වන රු.බිලියන 39.5 සහ සිය රක්ෂණ ඔප්පු හිමියන් සඳහා මෙතෙක් ප්‍රකාශයට පත් කළ විශාලතම ප්‍රසාද දීමනාව වන රු.බිලියන 8.7 ද ඇතුළත් වේ. එමෙන්ම SLIC හි මුළු වත්කම් වන රු.බිලියන 235 ක වටිනාකම මෙන්ම ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ විශාලතම කොටස් හිමියන්ගේ අරමුදල වන රු.බිලියන 63 සහ ඉහළම ජීවිත අරමුදල වන රු.බිලියන 134 ද එම කඩඉමි අතරට ඇතුළත් වේ.

ශ්‍රී ලාංකික ජනතාවට වඩාත් හොඳින් සේවා සැපයීම සඳහා සිය සේවා ප්‍රවේශය සහ ගුණාත්මක භාවය වසරින් වසර වැඩි කර ගනිමින් SLIC ශ්‍රී ලාංකික ජනතාවගේ විශ්වාසනීය ජාතික රක්ෂණ සේවා දායකයා ලෙස අඛණ්ඩව කටයුතු කරමින් සිටියි.



අපගේ දැක්ම

අපගේ අපේක්ෂාව කුමක්ද?
අපගේ දැක්ම

- අවදානම් සුරක්ෂිතකරණය සහ ජීවිත ආයෝජන ප්‍රශස්ථකරණය සම්බන්ධයෙන් ජාතියෙහි පළමු තේරීම බවට පත් වීම

අපගේ මෙහෙවර

අප ව්‍යාපාරයේ යෙදී සිටිනුයේ කුමක් සඳහාද?
අපගේ මෙහෙවර

- අපි, අපගේ පාරිභෝගිකයින් වෙත වටිනාකමක් එක් කරන අවදානම් සුරක්ෂිතකරණය සහ ජීවිත ආයෝජන ප්‍රශස්ථකරණය සපයන්නෙමු
- ඒ සඳහා කැපවූ වෘත්තීකයන් කණ්ඩායමක් අප සතු වන අතර ඔවුන්ගේ දායකත්වය අපි හඳුනා ගන්නා අතර එම දායකත්වය අගය කර සිටිමු
- මේ තුළින් වගකීම් සහගත ආයතනික පුරවැසියෙකු ලෙස කොටස් හිමිකරුවන් වෙත ඉහළම වටිනාකමක් ලබා දීමට අප කටයුතු කරමු

SLIC
Sri Lanka Insurance
Like a father - Like a mother



අධ්‍යක්ෂක මණ්ඩලය



1. ජගත් වැල්ලවත්ත මහතා
සභාපති

2. කේ. ඒ. විමලේන්තිරරාජා
අධ්‍යක්ෂක

3. අනිල් කොස්වත්ත මහතා
අධ්‍යක්ෂක



4. එම්. පී. අනිල් කුමාර මහතා
අධ්‍යක්ෂක

5. ජේ. සුරේඛා අලස් මහත්මිය
අධ්‍යක්ෂක

6. එස්. ඒ. නිශාන්ත දයානන්ද මහතා
අධ්‍යක්ෂක

අධ්‍යක්ෂක මණ්ඩලය

1. ජගත් වැල්ලවත්ත මහතා

සභාපති

ජගත් වැල්ලවත්ත මහතාගේ ආයතනික පළපුරුද්ද පෞද්ගලික අංශය තුළ ඉහළම මට්ටමේ තීරණ ගැනීමේ පටන් රාජ්‍ය අංශයේ ප්‍රතිපත්ති සකස් කිරීම දක්වා පුළුල් ක්ෂේත්‍ර ගණනාවක විහිදෙ යයි. ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කටයුතු කරන ලද දීර්ඝ ඉතිහාසය තුළ, වැල්ලවත්ත මහතා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි සභාපතිවරයා වශයෙන් ද (2010 මැයි සිට 2015 ජනවාරි දක්වා) ළමා රක්ෂණ අධිකාරියෙහි හිටපු සභාපතිවරයා වශයෙන්ද කටයුතු කරන ලදි (2007 අප්‍රේල් සිට 2010 මැයි දක්වා). එමෙන්ම ඒ මහතා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිවරයා වශයෙන් ද කටයුතු කරන ලද අතර (2005 දෙසැම්බර් සිට 2007 අප්‍රේල් දක්වා) Lanka Hospitals Corporation PLC හි අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරයි.

වෘත්තීය සමාජ විද්‍යාඥයෙකු ලෙස සිය අධ්‍යයන ජීවිතය හරහා ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට සහාය වන වැල්ලවත්ත මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙස ද සේවය කරයි. අධ්‍යයන ක්ෂේත්‍රයේ වසර 29 කට ආසන්න පළපුරුද්දක් ඔහු සතු වේ. ඔහුගේ අධ්‍යයන විශිෂ්ඨත්වය අතරට කොළඹ විශ්ව විද්‍යාලයේ සංවර්ධන සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලයේ පවුල් සමාජ විද්‍යාව පිළිබඳ විශාරද උපාධිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේශපාලන සමාජ විද්‍යාව පිළිබඳ දර්ශනවේදී උපාධිය අයත් වන අතර ඔහු මේ වන විට කොළඹ විශ්ව විද්‍යාලයේ (ඕස්ට්‍රේලියාවේ ඩේකින් විශ්ව විද්‍යාලයට අනුබද්ධිත) දේශපාලන සමාජ විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය හදාරමින් සිටියි.

2. කේ. ඒ. විමලේන්තිරරාජා

අධ්‍යක්ෂක

කේ. ඒ. විමලේන්තිරරාජා මහතා රාජ්‍ය සේවයේ වසර 27 කට අධික පළපුරුද්දක් සහිත ශ්‍රී ලංකා පරිපාලන ක්ෂේත්‍රයේ නිලධාරියෙකි. ඔහු මේ වන විට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා වශයෙන් කටයුතු කරමින් සිටියි.

ඔහු නීතීඥවරයෙකි.

විමලෙන්තිරරාජා මහතා යාපනය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ විශාරද උපාධිය, මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශාරද උපාධිය සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධිය ද ලබා ඇත. එමෙන්ම ඔහු සංවර්ධන අධ්‍යයන හා රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් සහ තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාවක් ද ලබා ඇත.

මහා භාණ්ඩාගාරයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා ලෙස පත්වීමට පෙර ඔහු රාජ්‍ය සේවයේ විවිධ තනතුරු කිහිපයකම කටයුතු කර ඇත. ඒ අතරට මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් ධූරය, වෙළඳ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් ධූරය, පරිපාලන ප්‍රතිසංස්කරණ භාර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධූරය, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන තොරතුරු නිලධාරී ධූරය මෙන්ම චීනයේ බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අමාත්‍ය උපදේශක ධූරය ද අයත් වේ.

විමලෙන්තිරරාජා මහතා මේ වන විට මහජන බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරනු ලබයි. ඔහු මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා බැංකුව සහ කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය ඇතුළු රජය සතු ව්‍යවසායන් කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරන ලදි.

ඔහු මේ වන විට සාර්ක් සංවර්ධන අරමුදලේ (SDF) සහ පොදුරාජ්‍ය මණ්ඩලීය කුඩා රාජ්‍ය වෙළඳ මූල්‍ය පහසුකමෙහි (CSSTFF) ශ්‍රී ලංකා අධ්‍යක්ෂකවරයා ලෙස කටයුතු කරයි.

3. අනිල් කොස්වත්ත මහතා

අධ්‍යක්ෂක

අනිල් කොස්වත්ත මහතා Litro Gas Lanka Ltd සහ Litro Gas Terminal Lanka (Pvt) Ltd හි වත්මන් සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරිවරයා වන අතර ඔහු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

කොස්වත්ත මහතා කීර්තිමත් විකුණුම් හා අලෙවිකරණ වෘත්තිකයෙකු හා ප්‍රමුඛ ව්‍යවසායකයෙකු වන අතර LAKARCADE (Pvt) Ltd හි නිර්මාතෘ, ප්‍රධාන විධායක නිලධාරිවරයා සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා ද වේ.

ප්‍රමුඛ පෙළේ බහුජාතික සමාගමක් වන Nestle Lanka PLC හි වසර 25 කට අධික අලෙවිකරණ හා උපායමාර්ගික පළපුරුද්දක් ඔහු සතු අතරම වසර 15කට අධික කාලයක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) ඇතුළු රාජ්‍ය අංශයේ සංස්ථා ගණනාවකට විශිෂ්ඨ ලෙස නායකත්වය සපයා ඇත.

කොස්වත්ත මහතා ආර්ථික සංවර්ධනය, අපනයන සංවර්ධනය සහ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳව ගරු අමාත්‍ය ජී. එල්. පීරිස් මහතාගේ උපදේශකවරයෙකු ලෙස ද කටයුතු කළේය.

ඔහු වරලත් කළමනාකරණ ආයතනයේ (FCMI) නාමාකයා (Fellow) සහ වරලත් අලෙවිකරණ ආයතනයේ (FCIM) නාමාකයා මෙන්ම ලංකා තරුණ ව්‍යවසායකයින්ගේ මණ්ඩලයේ (COYLE) ආරම්භක සාමාජිකයෙකු ද වේ.

4. එම්. පී. අනිල් කුමාර මහතා

අධ්‍යක්ෂක

අනිල් කුමාර මහතා EAP Holdings හි ජ්‍යෙෂ්ඨ විධායක උප සභාපති / ප්‍රධාන විධායක නිලධාරිවරයා සහ EBC TV/Radio /EAP Films හි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන ලද අතර ඔහු ස්වර්ණවාහිනී සහ ETV හි හිටපු ප්‍රධාන විධායක නිලධාරිවරයා ද විය.

ඔහු Samsung Mobile හි හිටපු ශ්‍රී ලංකා ප්‍රධානියා ලෙස කටයුතු කළේය. ඉන් පෙර ඔහු Hemas Consumer Goods හි ශ්‍රී ලාංකික හා ජාත්‍යන්තර ව්‍යාපාර සඳහා විකුණුම් හා ජාත්‍යන්තර ව්‍යාපාර අධ්‍යක්ෂකවරයා වූ අතර ඔහුගේ නායකත්වය යටතේ රු.බිලියන 9 ක පිරිවැටුමක් ළඟා කර ගැනීමට ආයතනයට හැකි විය. ඔහු විකුණුම් මෙහෙයුම්, බෙදා හැරීම, පාරිභෝගික අලෙවිකරණය, ජාත්‍යන්තර ව්‍යාපාර සහ විකුණුම් කළමනාකරණ කණ්ඩායම සෘජුවම කළමනාකරණය කළේය. විකුණුම් කළමනාකරණ අංශයට 235 දෙනකුගෙන් සමන්විත වූ ශක්තිමත් විකුණුම් කණ්ඩායමක් සහ බෙදාහරින්නන් 108 ක් ඇතුළත් විය. එමෙන්ම ඉන් පෙර ඔහු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරයා ලෙස රටේ විශාලතම විකුණුම් කන්ඩායමේ ප්‍රධානියා ලෙස කටයුතු කළ අතර ශාඛා ජාලය, විකුණුම් හා අලෙවිකරණය මෙහෙයවමින් සාමාජිකයන් 5,000 කින් යුත් විකුණුම් කණ්ඩායමක් සහ 1,200 ක කාර්ය මණ්ඩලයට නායකත්වය සැපයීය.

Unilever ආයතනයෙහි වසර 20 කට වැඩි ආයතනික පළපුරුද්දක් අනිල් මහතා සතු වේ. 1988 දී Unilever ආයතනයට සම්බන්ධ වූ ඔහු විකුණුම් විධායක, විකුණුම් පරිපාලන කළමනාකරු, ප්‍රාදේශීය විකුණුම් කළමණාකරු සහ ගෘහ හා පෞද්ගලික පාරිභෝගික භාණ්ඩ අංශය භාර වෙළඳ කාණ්ඩ කළමනාකරු වැනි නායකත්ව තනතුරු රාශියක් හෙබවීය. පසුව ඔහු වෙළඳ සක්‍රියකරණ කළමණාකරු ලෙස නව්‍ය වෙළඳ (Modern Trade) අංශයට පිවිසියේය. Unilever වියට්නාම් හි සේවය කිරීමෙන් පසුව ඔහු ගෘහ හා පෞද්ගලික පාරිභෝගික භාණ්ඩ අංශ සඳහා නාලිකා සංවර්ධන හා වෙළඳ අලෙවිකරණ කළමනාකරු ලෙස පත් වූ අතර යුනිලිවර් හි ඖෂධ සහ රූපලාවණ්‍ය අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කළේය. ඔහු Canwill Holdings (Pvt) Ltd. හි සභාපතිවරයා වේ.

වෘත්තීය වශයෙන් අනිල් මහතා චික්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයෙන් වෘත්තීය අලෙවිකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (DipM MCIM) ලබා ඇති අතර කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධිය හදාරමින් සිටී.

එමෙන්ම අනිල් මහතා CIM සහ ICSA සිසුන් සඳහා වසර 12 කට වැඩි කාලයක් දේශන පවත්වා තිබේ.

අධ්‍යක්ෂක මණ්ඩලය

5. සුරේඛා අලස් මහත්මිය

අධ්‍යක්ෂක

සුරේඛා අලස් මහත්මිය රක්ෂණ ක්ෂේත්‍රයේ වසර 35 කට වැඩි කාලයක් සේවය කර ඇති අතර එම කාලය අතරතුර ඇය ඉතා ජ්‍යෙෂ්ඨ තනතුරු හොබවා ඇත. ජාතික රක්ෂණ සංස්ථාවෙන් සිය රක්ෂණ වෘත්තිය ආරම්භ කළ ඇය Union Assurance Limited ආරම්භයේ දී විධායක නිලධාරිනියක ලෙස එහි සේවයට බැඳුණු අතර අනතුරුව එහි සහකාර සාමාන්‍යාධිකාරී (සාමාන්‍ය රක්ෂණ) දක්වා උසස් විය. පසුව ඇය එහි සහකාර සාමාන්‍යාධිකාරී ලෙස උපායමාර්ගික කළමනාකරණ ඒකකයේ ප්‍රධානත්වය ගෙන කටයුතු කළාය.

2005 දී සාමාන්‍ය රක්ෂණ මෙහෙයුම් ප්‍රධානී ලෙස Allianz Insurance Lanka Limited හා සම්බන්ධ වූ ඇය 2006 දී එහි ප්‍රධාන විධායක නිලධාරිනිය ලෙස පත් වන ලදි. අනතුරුව 2008 දී ඇය Allianz Life Insurance Lanka Limited සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිනිය ලෙස පත් වූවාය. 2010 ජූනි මාසයේදී අලස් මහත්මිය Allianz Insurance Lanka Limited සහ Allianz Life Insurance Lanka Limited හි අධ්‍යක්ෂක මණ්ඩලයට පත් වූ අතර 2017 දී එහි කළමනාකාර අධ්‍යක්ෂක ධූරයට පත්විය.

සුරේඛා අලස් මහත්මිය වරලත් රක්ෂණකරුවෙකු වන අතර ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයේ (FCII) නාමාකයා සහ ඕස්ට්‍රේලියානු සහ නවසීලන්ත රක්ෂණ හා මූල්‍ය ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර සාමාජිකාවක් (Snr. Associate-ANZIIF) ද වේ. ඇය බටහිර සිඩ්නි විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශාරද උපාධියක් ලබා ඇත.

2019 දී. සුපිරි කාන්තා ජයග්‍රාහිකාව සම්මානය (Women Super Achiever Award)., 2018 වසරේ ‘දක්ෂතම කාන්තාව’, 2017 දී .වසරේ ප්‍රධාන විධායක නිලධාරී. සම්මානය සහ 2016 දී .වසරේ වෘත්තීය භූමිකා පරමාදර්ශය. ඇතුළු වටිනා සම්මාන කිහිපයක්ම හිමිකර ගැනීමට ඇයට හැකි විය.

6. එස්. ඒ. නිශාන්ත දයානන්ද මහතා

අධ්‍යක්ෂක

නිශාන්ත දයානන්ද මහතා නීතිඥ වෘත්තියේ වසර 19 ක විශිෂ්ට නිපුණත්වයක් ඇති ප්‍රකට නීතිඥවරයෙකි. ඔහු මලියදේව විද්‍යාලයේ ඉගෙනුම ලබා 1999 දී කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයෙන් සිය නීතිවේදී උපාධිය ලබා ගත්තේය. ඔහු 2001 දී ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් සිය නීතිඥවරය ලබා ගන්නා ලදි.

අධ්‍යාපනය සඳහා සිය දක්ෂතාවය කුඩා කල සිටම පෙන්වූ ඔහු 5 ශ්‍රේණියේදී මාවතගම මධ්‍ය මහා විද්‍යාලයෙන් ශිෂ්‍යත්ව විභාගය සමත්වීමෙන් ලබා ගනිමින් කුරුණෑගල මලියදේව විද්‍යාලය වෙත ඇතුළත් වූ අතර එහිදී ඔහු විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා වූ සිය ඉලක්කය කරා ළඟා වීමට සමත් විය.

ඔහුගේ චරිතය තුළ “ජීවිතයේ සමතුලිතතාවය” යන සංකල්පය සහ නායකත්වයේ නිපුණතාවය මැනවින් පිළිබිඹු වූ අතර ඔහු පාසැල් ශිෂ්‍යභට බලකායට බැඳී සිටි කාලයේදී හර්මන් ලූස් අභියෝගය සඳහා තම පාසල නියෝජනය කිරීමෙන් මෙන්ම විවිධ අවස්ථාවන්හිදී ඔහුගේ හට කණ්ඩායම මෙහෙයවීමෙන් ඒ බව විදහා පෙන්වීය. එමෙන්ම ඔහු ජාතික මට්ටමේ දක්ෂ වොලිබෝල් ක්‍රීඩකයෙක් ද වේ. ඔහු නීති පීඨයේ ගත කළ කාලය තුළ සිසුන්ගේ යහපැවැත්ම උදෙසා මූලිකත්වය ගෙන කටයුතු කළ අතර ශිෂ්‍ය සභා සාමාජිකයෙකු ලෙස සිය සාමාජිකයින්ට අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දුන්නේය. ප්‍රමුඛ පෙළේ නීතිඥවරයෙකු ලෙසත්, ඔහුගේ නීතිඥ සමාජයේ තුන් ඉරියව් ක්‍රිකට් ක්‍රීඩකයෙකු ලෙසත් එම නායකත්වයේ ගති ලක්ෂණ අඛණ්ඩව පිළිබිඹු කර සිටින අතර 2017-2018 කාලය අතරතුර ගල්කිස්ස නීතිඥ සංගමයේ උප සභාපතිවරයා වශයෙන්ද කටයුතු කළේය. ඔහු Canowin Hotels and Spas (Pvt) Ltd හි සභාපතිවරයා වේ.

7. සමන්ත උපනන්ද මහතා

අධ්‍යක්ෂක

සමන්ත උපනන්ද මහතා රාජ්‍ය අංශයේ වසර 28 කට වැඩි වෘත්තීය පළපුරුද්දක් ඇති රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වෘත්තිකයෙකු වේ. 1992 දී රජයේ ගණකාධිකාරී සේවයට බැඳී ඇති ඔහු මහා භාණ්ඩාගාරය, ජනාධිපති ලේකම් කාර්යාලය සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ඇතුළු විවිධ රාජ්‍ය ආයතන ගණනාවක සේවය කර ඇත. ඔහු 2021 ජනවාරි 1 වන දින මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා ලෙස වැඩ භාර ගත්තේය.

සමන්ත උපනන්ද මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශේෂ විද්‍යාවේදී උපාධියක් (2 වන පන්තියේ) ලබා ඇති අතර තොරතුරු තාක්ෂණය පිළිබඳ විශාරද උපාධියක් (MSc in IT) ලබා ඇත. එසේම ඔහු කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්, තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක්, විද්‍යුත් රාජ්‍යකරණය පිළිබඳ ඩිප්ලෝමාව සහ පද්ධති ආරක්ෂක පාලනය හා විගණනය පිළිබඳ ඩිප්ලෝමාවක් ද (DISSCA) සම්පූර්ණ කර ඇත.

මීට අමතරව සමන්ත උපනන්ද මහතා චික්සත් රාජධානියේ රාජ්‍ය මූල්‍ය හා ගිණුම්කරණ ආයතනයේ වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී (CPFA) සාමාජිකයෙකි. එමෙන්ම ඔහු ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ නාමාකයා (FCMA) රාජ්‍ය මූල්‍ය හා සංවර්ධන ගණකාධිකාරී ආයතනයේ (FPFA) ද නාමාකයා වේ.

නායකත්ව කණ්ඩායම



1. චන්දන එල්. අලුත්ගම මහතා
ප්‍රධාන විධායක නිලධාරී
BCom (Sp), MBA, FCMI (UK)



2. සුරේෂ් පරණවිතාන මහතා
ප්‍රධාන නිලධාරී - ජීවිත රක්ෂණ
FCII, MBA, DipM, FCIM, MI Mgt, CMA (Aus)
(resigned w.e.f 11th May 2021)



3. රුවන්ති ගුණරත්න මහත්මිය
ප්‍රධාන නිලධාරී - සාමාන්‍ය රක්ෂණ
FCII (UK), Chartered Insurer



4. මාලනි තෙන්නකෝන් මහත්මිය
ප්‍රධාන මූල්‍ය නිලධාරී
MBA, FCA (SL), CPA (Aus),
CIMA (UK)



5. රුක්මන් වීරරත්න මහතා
ප්‍රධාන නිලධාරී - ව්‍යාපාර සංවර්ධන
ACIM



6. ආලෝක ජයවර්ධන මහතා
ප්‍රධාන තොරතුරු නිලධාරී
DCSD, HDCBS (NIBM), BSc (MIS),
PGDBFA (ICASL), MBA, PMP, SAP, CISM

1. චන්දන එල්. අලුත්ගම මහතා
ප්‍රධාන විධායක නිලධාරී
අළුත්ගම මහතා 2018 දී ප්‍රධාන විධායක නිලධාරීවරයා ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වැඩ භාර ගන්නා ලදී. රක්ෂණ ක්ෂේත්‍රයේ විවිධ අංශයන් හි වසර 29 කට වැඩි සේවා පළපුරුද්දක් ඔහු සතු වේ. ඔහුගේ වෘත්තිය ජීවිතයේදී ඔහු Eagle Insurance PLC සහ HNB Assurance PLC වැනි සමාගම් වල ජ්‍යෙෂ්ඨ නායකත්ව තනතුරු රාශියක් හොබවා ඇත. තවද, ඔහු සිය රක්ෂණ වෘත්තියෙන් බැහැරව දේශීය හා ජාත්‍යන්තර සංගම් කිහිපයකම නායකත්ව තනතුරු දරා ඇත. එමෙන්ම අළුත්ගම මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ පශ්චාත් උපාධි ඒකකයේ බාහිර කථිකාචාර්යවරයකු ලෙස දේශන පවත්වා ඇත. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශාරද උපාධිය සහ කැලණිය විශ්ව විද්‍යාලයේ වාණිජවේදී උපාධිය ලබා ඇති අතර එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ආයතනයේ නාමාකයා (Fellow) (FCMI) ද වේ. ඔහු රක්ෂණය සහ බැංකු රක්ෂණය පිළිබඳ දේශීය හා විදේශීය සම්මන්ත්‍රණ සඳහා පර්යේෂණ පත්‍රිකා රැසක් ඉදිරිපත් කර ඇති අතර ඔස්ට්‍රියාවේ වියානා හි Generali Insurance AG සහ සිංගප්පූරුවේ NUS Business School හි ඇතුළුව දේශීය හා විදේශීය ආයතන කිහිපයකින්ම සවිස්තර පුහුණුව ලබා ඇත. මෙහි පත්වීම ලැබීමට පෙර අළුත්ගම මහතා HNB General Insurance Ltd හි ප්‍රධාන ව්‍යාපාර නිලධාරියා සහ ප්‍රධාන නිලධාරියා ලෙස කටයුතු කළේය. අලුත්ගම මහතා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන නිලධාරියා ලෙස ද කටයුතු කරයි.

2. සුරේෂ් පරණවිතාන මහතා
ප්‍රධාන නිලධාරී - ජීවිත රක්ෂණ
සුරේෂ් පරණවිතාන මහතා 1986 වසරේදී සිය රක්ෂණ වෘත්තිය ආරම්භ කර ඇති අතර ඉන් වැඩි කාලයක් ජීවිත රක්ෂණ ක්ෂේත්‍රය සම්බන්ධව කටයුතු කර තිබේ. ඔහු වරලත් රක්ෂණ ආයතනයේ සහ වරලත් අලෙවිකරණ ආයතනයේ නාමාකයා (Fellow) මෙන්ම සහතිකලත් කලමනාකරණ ගණකාධිකාරිවරයෙකු වන අතර ව්‍යාපාර පරිපාලනය පිළිබඳව විශාරද උපාධියක් ලබා ඇත.

3. රුවන්ති ගුණරත්න මහත්මිය
ප්‍රධාන නිලධාරී - සාමාන්‍ය රක්ෂණ
රුවන්ති මහත්මිය 2017 ජනවාරි මාසයේදී ප්‍රධාන නිලධාරී - සාමාන්‍ය රක්ෂණ වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට සම්බන්ධ වූ අතර ඇය එම ධුරයෙහි අද දක්වාම කටයුතු කරයි. රක්ෂණ ක්ෂේත්‍රයේ වසර 31 කට වැඩි පළපුරුද්දක් ඇය සතු වේ. 1989 Union Assurance ආයතනයෙන් සිය රක්ෂණ වෘත්තීය ආරම්භ කළ ඇය වසර 6 ක් එහි සේවය කළාය. අනතුරුව, Janashakthi Insurance හා සම්බන්ධ වී එහි වසර 11ක් සේවයේ යෙදුනාය. Janashakthi Insurance ආයතනයේ සහකාර සාමාන්‍යාධිකාරී - ව්‍යාපාර ලෙස සේවය කිරීමෙන් අනතුරුව ඇය 2007 දී සහකාර සාමාන්‍යාධිකාරී - සාමාන්‍ය රක්ෂණ ලෙස Union Assurance ආයතනය හා සම්බන්ධ වූවාය. 2009 දී ඇය Union Assurance ආයතනයේ සාමාන්‍යාධිකාරී - සාමාන්‍ය රක්ෂණ ලෙස උසස් වූ අතර ඇය 2016 දක්වා එහි සේවයේ යෙදුනාය. ඇය එක්සත් රාජධානියේ වරලත් රක්ෂණ ආයතනයේ නාමාකයෙක් (Fellow) වන අතර වරලත් රක්ෂකයෙකුද වේ.

4. මාලනි තෙන්නකෝන් මහත්මිය
ප්‍රධාන මූල්‍ය නිලධාරී
විගණන හා මූල්‍ය අංශයෙහි වසර 31කට වැඩි පළපුරුද්දක් තෙන්නකෝන් මහත්මිය සතු වේ. 2017 දී ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස ඇය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වැඩ භාර ගන්නා ලදී. ඇය ජ්‍යෙෂ්ඨ කලමනාකරණ තනතුරු කිහිපයක් හොබවා ඇති අතර EAP Holdings හි සමූහ ප්‍රතිව්‍යුහගතකරණ ප්‍රධානී, EAP Broadcasting Corporation හි මූල්‍ය පරිපාලක ධුරය මෙන්ම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ, මාර්ග සංවර්ධන අධිකාරියේ සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කලමනාකරණ තනතුරු ද ඒ අතරට ඇතුළත් වේ. එමෙන්ම ඔස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන් හි විදේශ ආයතන කිහිපයක මෙන්ම රාජ්‍ය සංවිධාන කිහිපයකම මූල්‍ය පළපුරුද්ද ඇය සතුවේ. (SunCorp Insurance, Government Shared Service Agency and Brisbane City Council)

ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ නාමාකයෙක් (Fellow) වන අතර එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සහකාර නාමාකයෙක් (Fellow) මෙන්ම ඕස්ට්‍රේලියාවේ සහතිකලත් වෘත්තීය ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ නාමාකයෙක් (Fellow) ද වේ. එමෙන්ම ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශාරද උපාධියක් ලබා ඇති අතර එහිදී සේවක මනෝ විද්‍යාව පිළිබඳ විශේෂඥතාවයක් හිමි කරගෙන තිබේ.

5. රුක්මන් වීරරත්න මහතා
ප්‍රධාන නිලධාරී - ව්‍යාපාර සංවර්ධන
රුක්මන් වීරරත්න මහතා 2018 ජූලි මස ප්‍රධාන නිලධාරී - ව්‍යාපාර සංවර්ධන ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා යළි සම්බන්ධ විය. දේශීය මෙන්ම විදේශීයව ද වසර 37 කට වැඩි පළපුරුද්දක් ඔහු සතු වේ. 1983 දී Aitken Spence Insurance (Pvt) Ltd ආයතනයෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඔහු James Finlay Insurance, Mercantile Credit Insurance, CTC Eagle Insurance Co Ltd, Eagle Star Insurance (UK), ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවල Union Assurance PLC සහ Janashakthi Insurance Ltd. යන ආයතන සඳහා සිය සේවය සපයා ඇත. රක්ෂණ ක්ෂේත්‍රය හැරුණු කොට, සත්කාර ක්ෂේත්‍රයටද සම්බන්ධව සිටි ඔහු John Keells Holdings සමූහයේ Cinnamon City Hotels හි අලෙවිකරණ අධ්‍යක්ෂක හා සහකාර උප සභාපතිවරයා ලෙස කටයුතු කළේය.

වීරරත්න මහතා වරලත් අලෙවිකරණ ආයතනයේ සහකාර නාමාකයෙකු (Fellow) (ACIM) වන අතර 2016 දී ආසියාවේ හොඳම අලෙවිකරුවා වශයෙන් සම්මානයට පාත්‍ර විය.

6. ආලෝක ජයවර්ධන මහතා
ප්‍රධාන තොරතුරු නිලධාරී
ආලෝක ජයවර්ධන මහතා තොරතුරු තාක්ෂණය, ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ සහ ව්‍යාපෘති කලමනාකරණ ක්ෂේත්‍රයන්හි වෘත්තීය විධායකයෙකු වන අතර විදුලි සංදේශන, නිෂ්පාදන, අලෙවිකරණ හා බෙදාහැරීම්, මෘදුකාංග, ප්‍රාග්ධන වෙළඳපොල සහ රක්ෂණය වැනි ව්‍යාපාර අංශ ගණනාවක වසර 21 කට වැඩි පළපුරුද්දක් ලබා ඇත.

ඔහු අයර්ලන්තයේ ඩබ්ලින් විශ්ව විද්‍යාලයෙන් කලමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා ගත් අතර ඔස්ට්‍රේලියාවේ සඳර්න් ක්‍රොස්ලන්ඩ් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශාරද උපාධිය ලබා ගත්තේය. තවද ඔහු ව්‍යාපාර කලමනාකරණය පිළිබඳ ජාතික ආයතනයෙන් පරිගණක අධ්‍යයනය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් ද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ව්‍යාපාර හා මූල්‍යකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ද ලබා ඇත. ඔහු PMP සහතික ලත් ව්‍යාපෘති කලමනාකරුවෙකු වන අතර CISM සහතික ලත් තොරතුරු ආරක්ෂණ කලමනාකරුවෙකු මෙන්ම අලෙවිකරණය හා බෙදාහැරීම පිළිබඳ SAP සහතික ලත් උපදේශකයෙකු ද වේ.

මේ වන විට ඔහු මැලේසියාවේ ඒෂියා ඊ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය හදාරමින් සිටියි.

නායකත්ව කණ්ඩායම

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්



1. තනූජා හිඟුලගේ මහත්මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සාමාන්‍ය රක්ෂණ
BSc (Hons), FCII (UK),
Chartered Insurer, ANZIIF (Fellow) CIP



2. ඩී. ඒ. රුවනි ධර්මවර්ධන මහත්මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අනුකූලතා, අවදානම් සහ ආයතනික සැලසුම්කරණ
LLB (Hons), Attorney-at-Law, MBA (UK),
ACISI (UK)



3. දයාරත්න පෙරේරා මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ජීවිත (තාක්ෂණික)
BSc (Hons), FCII, Dip. in BA, Chartered
Insurer, MBA (USJ), ANZIIF (Fellow) CIP



4. වෛද්‍ය ෂෙරිකා ප්‍රනාන්දු මහත්මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වෛද්‍ය
MBBS (SL), MSc -Community
Medicine (SL), ACII (UK), MRCGP
(INT) (UK)



5. ලලින් ද සිල්වා මහතා
බෙදාහැරීම් ප්‍රධානී - සාමාන්‍ය
PG in Finance and Bus
Administration, MBA



6. රෝහිත අමරපාල මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් සහ සේවක සම්බන්ධතා
FCIPM (SL), FCMI (UK), MBA
(University of Western Sydney,
Australia)



7. නාමලී ඒ සිල්වා මහත්මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ
MCIM (UK), Chartered Marketer,
Prof Dip in Marketing – CIM,
ACIB (UK), MBA



8. චමින්ද ගුණසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පරිපාලන
BB Mgt (Accountancy) Sp (Hons), FCA,
ACMA, MBA – Finance, Colombo



9. මාලක බණ්ඩාර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය
BSc – Accountancy (Sp),
FCA, MBA (Colombo)

සහකාර සාමාන්‍යාධිකාරීවරුන්



1. චමින්ද අතාවුද මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - ජීවිත (තාක්ෂණ)
BSc (Hons), FCII, AIII, ANZIIF (Fellow), MBA (Colombo), Chartered Insurer



2. රොෂාන් කොලස් මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - බැංකු රක්ෂණ, විකල්ප බෙදාහැරීම් සහ ව්‍යාපාර රඳවා ගැනීම (GI)
MBA, CMA (Aus), Dip in Marketing (SLIM), MSLIM, FCPM, MIM (SL)



3. මහේන්ද්‍ර සිල්වා මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - පරිපාලන
Attorney-at-Law, LLB (SL), MBA in HRM (OUSL), PG. Dip in HRM, NDES, MIIE (SL), I ENG, AMCIPM (SL)



4. සුදත් නිශාන්ත මහතා
බෙදාහැරීම් ප්‍රධානී - ජීවිත
MLRHRM (UOC), Pg. Dip. in Labour Relations & HRM, BSc. (B/Admin.) (Sp.), LIMRA (USA), AMTC [USA], MIM (SL)



5. සරත් ප්‍රනාන්දු මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - රථ වාහන
BSc Eng (Mechanical) Sp, AMIE (SL)



6. ප්‍රියවංශ දේශප්‍රිය මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - විශේෂ ව්‍යාපෘති
FCA, BCom (Sp), FCMA



7. ජගත් වෙල්ගම මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - විකුණුම් සහාය සහ නියෝජිත ආයතන පරිපාලනය
MBA, MABE (UK), GD in Mgt. (Aus), PG Dip. – Mkt Mgt (USJP), Ad. Dip in Mkt. Mgt. (USJP), Dip. in Mass Com. (USJP), Dip. in NIT, Licentiate – III, MSLIM



8. ජීවන්ත වැලිහිඳ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - ඉංජිනේරු සේවා
BSc (Eng)

නායකත්ව කණ්ඩායම

සහකාර සාමාන්‍යාධිකාරීවරුන්



9. සතික වික්‍රමසිංහ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - අවදානම් කළමනාකරණ
BSc (Hons) – MMU (UK),
MBA (Cardiff), MBCS



10. මදුභාෂිනී බක්මීදෙණිය මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරී - නීති
Attorney-at-Law, MBA (PIM),
NDHRM (IPM)



11. නදීරා ගුණවර්ධන මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරී - මුහුදු රක්ෂණ
BSc (Hons), MBS (Col), MBA
(PIM/Uni of Canberra, Aus), FIII,
Sp Dip in Marine (lll), ACII (UK),
Chartered Insurer



12. සශික රණසිංහ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - ආයෝජන
CFA (USA), FRM (USA), BSc (Hons)
Engineering, ACMA (UK), AIB (SL)



13. මහේෂ් ගමගේ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - කාණ්ඩ අලෙවිකරණ (සාමාන්‍ය රක්ෂණ)
MBA (AUS), CMA (AUS), PG. Dip. M (SL),
MSLIM, CPM (ASIA)
(Appointed w.e.f 01/04/2021)



14. ජේ. ඒ. ඩී. කසුන් සමීර මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - කාණ්ඩ අලෙවිකරණ (ජීවිත රක්ෂණ)
Chartered Marketer, Pgd Dip in
Marketing (CIM, UK), CPM (Asia
Pacific), MCIM, UK
MBA (UoW, UK)
(Appointed w.e.f. 03/05/2021)

ජ්‍යෙෂ්ඨ කලමනාකාරවරුන්



1. ඩබ්. ඩී. සී. විතානගේ මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - ප්‍රධාන කාර්යාල සම්බන්ධතා



2. එස්. පී. ඒ. රොද්‍රිගෝ මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - ආරක්ෂක



3. කේ. ජී. ඩී. ජී. කන්දේගම මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - තොරතුරු තාක්ෂණ දත්ත මධ්‍යස්ථානය



4. ඩබ්. එස්. කුලසිංහ මහත්මිය
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - මූල්‍ය



5. ඩී. පී. ජේ. එස්. මෛත්‍රිරත්න මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - හදිසි අනතුරු



6. එන්. ජී. කේ. බණ්ඩාර මහතා
ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය ඉංජිනේරු



7. ආර්. එම්. ඒ. කේ. රාජපක්ෂ මහතා
ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය ඉංජිනේරු



8. එම්. ඩී. චන්දිරාමි මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - ආයතන ව්‍යාපාර සංවර්ධන



9. එම්. පී. එන්. කුමාර මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - සමාජ සාමාජික අලෙවිකරණ දෙපාර්තමේන්තුව



10. ඩී. එන්. කේ. නාරංගම්මන මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - නියෝජිත ආයතන බඳවා ගැනීම්



11. එල්. එච්. ඒ. එස්. සිරිමාන්න මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - ව්‍යාපාර රැඳවා ගැනීම්



12. ආර්. එන්. සේනාධීර මහතා
ජ්‍යෙෂ්ඨ රථවාහන ඉංජිනේරු

නායකත්ව කණ්ඩායම

ජ්‍යෙෂ්ඨ කලමනාකාරවරුන්



13. එම්. ඩී. අත්තනායක මහත්මිය
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - නීති (ජීවිත)



14. පී. ඒ. එම්. පී. ඩබ්. ගුණතිලක මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - ජාලකරණ සහ සන්නිවේදන



15. එම්. ජේ. එස්. දාඛරේරා මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - බැංකු රක්ෂණ (ජීවිත)



16. ජී. කේ. එම්. එස්. නානායක්කාර මහත්මිය
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - ජීවිත



17. ජී. ඩබ්. ආර්. සී. ද සිල්වා මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - ජීවිත



18. එන්. ඩී. කේ. එම්. ජයතිලක මහත්මිය
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - ජීවිත



19. ඩබ්. ඩී. ටී. ඩෙප් මහත්මිය
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - සෞඛ්‍ය අනතුරු රක්ෂණ සහ පුද්ගල හානි



20. ජේ. එස්. ජයවර්ධන මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - මානව සම්පත්



21. පී. එන්. ඒ. ධර්මසේන මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - ජීවිත



22. බී. එච්. එන්. කේ. කේ. පෙරේරා මහත්මිය
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - ජීවිත



23. ඩී. ඩබ්. එස්. වෛද්‍යරත්න මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු (2021/05/09 සිට බ. පැ. ප. විශ්‍රාම යන ලදි)



24. කේ. ඒ. එස්. රණතුංග මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - ප්‍රතිරක්ෂණ

ජ්‍යෙෂ්ඨ කලමනාකාරවරුන්



25. ඒ. යූ. රාජපක්ෂ මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - මූල්‍ය මෙහෙයුම්



26. බී. සී. එස්. පෙරේරා මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - ගිනි සහ ඉංජිනේරු හිමිකම්



27. ආර්. සී. ටී. ද ලිවේරා මහතා
ජ්‍යෙෂ්ඨ අවදානම් ඉංජිනේරු



28. ජේ. එම්. කේ. සී. කේ. එල්. ජයසිංහ මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - රථ වාහන හිමිකම්



29. කේ. වී. එන්. නෝනිස් මහත්මිය
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - රථ වාහන ප්‍රාරක්ෂණය



30. ඒ. එච්. එස්. අබේගුණවර්ධන මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - විශේෂ ව්‍යාපෘති



31. කේ. කේ. ඒ. පී. මාපලගම මහතා
උපදේශක - විමර්ශන
(2020/12/01 වන දින සිට බ. පැ. ප. පත් කරන ලදි)



32. එස්. ජේ. පී. හෙට්ටිආරච්චි මහත්මිය
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - මෘදුකාංග සංවර්ධනය (ජීවිත)
(2021/04/01 වන දින සිට බ. පැ. ප. පත් කරන ලදි)



33. ඕ. එම්. ඉන්ද්‍රානි මහත්මිය
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - මෘදුකාංග සංවර්ධනය (සාමාන්‍ය)
(2021/04/01 වන දින සිට බ. පැ. ප. පත් කරන ලදි)



34. ඩබ්. ඒ. ඩී. ගුණවර්ධන මහතා
ජ්‍යෙෂ්ඨ රථ වාහන ඉංජිනේරු
(2021/04/01 වන දින සිට බ. පැ. ප. පත් කරන ලදි)



35. ඩබ්. ඒ. ඩී. එම්. වීරක්කොඩි මහතා
ජ්‍යෙෂ්ඨ කලමනාකරු - බෙදා හැරීම් (Personal Lines - සාමාන්‍ය)
(2021/04/01 වන දින සිට බ. පැ. ප. පත් කරන ලදි)

නායකත්ව කණ්ඩායම

ප්‍රාදේශීය කලමනාකරුවන්



1. බණ්ඩාර වීරසූරිය මහතා
වයඹ - 1



2. සනත් ප්‍රනාන්දු මහතා
ඉහළ බස්නාහිර



3. දීපාල් නවගමුව මහතා
බස්නාහිර - 2



4. ටී. ඩී. පී. පීරිස් මහතා
දකුණ - 1



5. යූ. ජී. යූ. ආර්. කුමාර මහතා
බස්නාහිර - 1



6. ඩබ්. එම්. ඒ. යූ. කුලසේන මහතා
රත්නපුර



7. ආර්. හේවාපතිරණගේ මහතා
බස්නාහිර - 3



8. එන්. කේ. එස්. එස්. කුමාර මහතා
දකුණ - 2



9. ජී. සාතියන් මහතා
උතුර



10. එච්. ජේ. එස්. මෙන්ඩිස් මහතා
දකුණ - 1



11. කැලුම් ජයසිංහ මහතා
ඌව



12. සමන්ත පීරිස් මහතා
බස්නාහිර - 1

ප්‍රාදේශීය කලමනාකරුවන්



13. ඒ. එම්. එච්. අධිකාරී මහතා
මධ්‍යම - 1



14. ගාමිණි සරත්චන්ද්‍ර මහතා
මධ්‍යම - 2



15. ධම්මික බණ්ඩාර මහතා
ඌව



16. අජිත් තිලකරත්න මහතා
උතුරු මැද - 2



17. මහින්ද දිසානායක මහතා
වයඹ - 1



18. පී. පුවනේන්ද්‍රන් මහතා
නැගෙනහිර



19. නාමල් ලියනගේ මහතා
ඉහළ බස්නාහිර



20. ආර්. ලිංගේශ්වරන් මහතා
නැගෙනහිර
(2021/03/01 දින සිට බ. පැ. ප. පත් කරන ලදි)



21. ඩී. එම්. එස්. දිසානායක මහතා
රත්නපුර
(2021/04/01 දින සිට බ. පැ. ප. පත් කරන ලදි)

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමූහයේ ව්‍යූහය




Canowin Hotels and Spas (Pvt) Ltd
100%
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පූර්ණ හිමිකාරිත්වය දරන අනු සමාගමක් වන මෙම ආයතනය මඟින් අධිවේගී මාර්ගය භාවිත කරන්නන්හට විවිධ සේවා සපයන දක්ෂිණ අධිවේගී මාර්ග යේ සේවා ස්ථානයන්හි හිමිකාරිත්ව දරණ අතර ඒවා කලමනාකරණය කරනු ලබයි.
Canwill Holdings (Pvt) Ltd
45.95%
හෝටල් ව්‍යාපෘති කලමනාකරණ සහ ආයෝජන ව්‍යාපාරයේ නියුතු Canwill Holdings (Pvt) Ltd ආයතනයෙහි 45.95% ක කොටස් හිමිකාරිත්වය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතු වේ.
Management Services Rakshana (Pvt) Ltd
100%
Management Services Rakshana ආයතනය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි වැටුප් සකස් කිරීම කලමනාකරණය කිරීම සඳහා පිහිටුවන ලද සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් පූර්ණ හිමිකාරිත්වය දරන අනු සමාගමක් වන අතර බාහිර වෙළඳපොළ වෙත හෝ පාර්ශවයන් වෙත කිසිදු සේවාවක් හෝ නිෂ්පාදනයක් සැපයීම සිදු නොකරයි.
Sinolanka Hotels & Spa (Pvt) Ltd.
100%
Helanco Hotels & Spa (Pvt) Ltd.
100%

මූල්‍ය වශයෙන් වැදගත් කරුණු

	2020 රු.මිලියන	2019 රු.මිලියන
වර්ෂය සඳහා ප්‍රතිඵල		
මුළු ආදායම	**52,614**	48,609
දළ ලිඛිත වාරික	**39,421**	33,794
ශුද්ධ උපයන ලද වාරික	**34,206**	29,772
ආයෝජන හා වෙනත් අදායම්	**18,408**	18,837
බදුකරණයට පෙර ලාභය (PBT)	**7,972**	8,205
බදුකරණයට පසු ලාභය (PAT)	**5,789**	7,029
ප්‍රතිලාභ/හිමිකම්, මෙහෙයුම්, පරිපාලන සහ වෙනත් වියදම්	**28,524**	28,744
සමාන්‍ය රක්ෂණය		
සාමාන්‍ය රක්ෂණ අරමුදල	**18,866**	16,648
ශුද්ධ හිමිකම් අනුපාතය	**51**	61
වියදම් අනුපාතය	**37**	35
ජීවිත රක්ෂණය		
ජීවිත රක්ෂණ අරමුදල	**134,014**	116,767
වියදම් අනුපාතය	**37**	46
මුහුණත වටිනාකම මත ප්‍රසාද දීමනා	**8,694**	8,244















මූල්‍යමය නොවන වැදගත් කරුණු



මූල්‍යමය නොවන වැදගත් කරුණු



නායකත්ව සමාලෝචනයන්

28 - සභාපතිවරයාගේ පණිවිඩය
31 - ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය

"මට මගේ පුතාගේ අනාගතය ගැන බය වෙන්න දෙයක් නැහැ. දශක ගාණක් තිස්සේ දන්න තැනකින් විශ්වාසවන්ත රැකවරණයක් පුතාට ලැබෙනවා"



සභාපතිවරයාගේ පණිවිඩය



"විවිධත්වයට ඉඩ දෙන රක්ෂණය, එසේත් නැති නම් මා එය හැඳින්වීමට වඩාත් කැමති පරිදි "සැමට රක්ෂණය" යන සංකල්පය සෑම ශ්‍රී ලාංකිකයෙකුගේම ජීවිතයේ ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීම සඳහා පවතින නිසැක සහ හොඳම ක්‍රමවේදය බැවින් මම එය දිගින් දිගටම අවධාරණය කර සිටියෙමි."

පසුගිය වසර වෙන කිසිම වසරකට වඩා වෙනස් වූ වසරක් විය. කොවිඩ්-19 වසංගතය අපගේ ජීවිත කෙතරම් බලපෑමට ලක් කරන්නේදැයි කිසිවෙකුටත් සිතා ගත නොහැකි විය. ජනතාව මෙන්ම ව්‍යාපාරයන්ද අතිශය පීඩනයට ලක්ව සෞඛ්‍ය සේවා පද්ධතියද එහි උපරිම සීමාවන්ට ලඟා වී ඇති අවධියක, විවිධත්වයට ඉඩ දෙන රක්ෂණයක් යන සංකල්පය අන් කවරදාකටත් වඩා වැදගත් වේ.

විවිධත්වයට ඉඩ දෙන රක්ෂණය, එසේත් නැති නම් මා එය හැඳින්වීමට වඩාත් කැමති පරිදි "සැමට රක්ෂණය" යන සංකල්පය සෑම ශ්‍රී ලාංකිකයෙකුගේම ජීවිතයේ ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීම සඳහා පවතින නිසැක සහ හොඳම ක්‍රමවේදය බැවින් මම එය දිගින් දිගටම අවධාරණය කර සිටියෙමි. ආර්ථික පිරමීඩයේ පහළම ස්ථරයේ සිටින්නන් ද ඇතුළුව සෑම පුද්ගලයෙකුටම රක්ෂණය උපකාරී වේ. නිදසුනක් ලෙස සෞඛ්‍ය රක්ෂණයක් තිබීමෙන් අඩු ආදායම් ලාභී පුද්ගලයින් වෛද්‍යවරයෙකු වෙත යෑමට වැඩි පෙළඹීමක් පවතින අතර එය මාතෘ හා ළදරු මරණ අවම කර ගැනීමට හේතු වේ. එමෙන්ම රක්ෂණාවරණයක් සහිත ගොවීන් බොහෝ විට ණය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන බැවින් එය ඔවුන්ගේ ගොවි ව්‍යාපාරයන් වර්ධනයට ද හේතුවේ. ඉතා සුළු අමතර ආදායමක් සහිත පුද්ගලයින්ටද රෝගී වීම, භෝග විනාශ වීම, ස්වභාවික ආපදා හෝ ආදායම් උපයන්නා මරණයට පත්වුවහොත් ඇතිවිය හැකි ආදායම් අහිමි වීමේ තත්වයන්ට මුහුණ දීම සඳහා රක්ෂණාවරණයක් තිබීම ඉතා වැදගත් විය හැකිය. මේ අනුව රක්ෂණය තුළින් ආර්ථිකයේ ස්ථාවරභාවය වඩාත් තහවුරු කරන අතර දීර්ඝ කාලීනව අසමානතා අවම කිරීමට හේතුවේ.

කෙසේ වෙතත් ඉතා කණගාටුදායක ලෙස, ශ්‍රී ලංකාවේ රක්ෂණාවරණ ලබා ගැනීම අතීතයේ පටන් ඉතා පහළ මට්ටමක පැවතුනි. ශ්‍රී ලංකාවේ රක්ෂණාරවණ ලබා ගැනීමේ අනුපාතය 1.3% ක් (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස) වන අතර එය ලොව අඩුම රක්ෂණාවරණ ලබා ගැනීමේ මට්ටමක පවතියි. මෙම තත්වය SLIC වැනි ඉහළ පරිමාණයේ රක්ෂණ ආයතනයකට සීමා රහිත අවස්ථාවන් රැසක් ලෙස පෙනුනද, ශ්‍රී ලංකාවේ රක්ෂණ වෙළඳපොල සාපේක්ෂව අඩු වර්ධනයක් දක්වන අතර රක්ෂණාවරණ පිළිබඳ සාමාන්‍ය ජනතාවගේ දැනුම්වත්භාවය මඳකම විවිධත්වයට ඉඩදෙන රක්ෂණාවරණයක් ප්‍රවර්ධනය කිරීමෙහි ලා විශාල බාධකයක්ව පවතියි. අර්බුදකාරී අවස්ථාවන් හිදී ඒවායින් ආරක්ෂා වීමට රක්ෂණය ආරක්ෂිත දැලක් මෙන් ක්‍රියා කරන බව සහ පුද්ගලයින්ට මෙන්ම ව්‍යාපාරයන්ටද අනපේක්ෂිත අර්බුද වලින් යථා තත්වයට පත්වීම සඳහා රක්ෂණය උපකාර වන බව ශ්‍රී ලාංකිකයන්ගෙන් බොහෝ දෙනෙකු නොදැන සිටිති. වඩාත් කණගාටුවට කරුණ නම්, දැනුම්වත්භාවය නොමැතිකම හේතුවෙන් රක්ෂණය යනු වරප්‍රසාද ලත් සුළු පිරිසකට පමණක් ගැළපෙන නිෂ්පාදනයක් යන වැරදි මතය ජනතාව තුළ මුල් බැසගෙන තිබීමයි. එහෙයින් ඔබට පෙනී යන පරිදි "සැමට රක්ෂණය" ලබා දීම පහසු කාර්යයක් නොවේ.

කෙසේවෙතත්, ශ්‍රී ලංකාවේ සේවය සැපයූ වසර 58කට අධික පළපුරුද්ද සමඟ, සෑම පුද්ගලයෙකුට රක්ෂණය සඳහා ප්‍රවේශය සැපයීමේ ව්‍යාපාරයට නායකත්වය ලබා දීමට SLIC වෙත හැකියාව පවතින බව මම විශ්වාස කරමි. ද්වි පාර්ශවීය ප්‍රවේශයක් අනුගමනය කරමින් මෙම පවතින පරතරය පියවීම සඳහා අපි දැනටමත් යම් ප්‍රගතියක් ලබා සිටිමු. මේ සඳහා අපි පළමුවෙන්ම වඩාත් ප්‍රායෝගික හා දැරිය හැකි මිලක් සහිත රක්ෂණ නිෂ්පාදන සැලසුම් කිරීම සහ වාණිජකරණය කිරීමට කටයුතු කළෙමු. ඒ අනුව, බහුතර සාමාන්‍ය ජනතාවට වඩාත් පහසුවෙන් රක්ෂණාවරණයක් ලබා ගත හැකි වන පරිදි, අපගේ මූලික නිෂ්පාදන බොහොමයක් ඒවායේ " lite" විකල්ප ඉදිරිපත් කිරීම සඳහා ප්‍රතිනිර්මාණය කිරීමට අපි පටන් ගත්තෙමු. අපගේ නව නිෂ්පාදන සංවර්ධන ක්‍රියාවලියේදීද මෙය විශේෂයෙන් අවධානයට ලක් කරනු ලැබේ. මීට සාක්ෂි වශයෙන්, අපගේ නිෂ්පාදන කළඹට අලුතින්ම එකතු වූ MOTOR PLUS RIDER සහ MOTOR PLUS TUK රක්ෂණාවරණද මෙම දැරිය හැකි මිලක් සහිත රක්ෂණ මූලධර්ම අනුව සකස් කර ඇත.



සභාපතිවරයාගේ පණිවිඩය



අපගේ දෙවන උපායමාර්ගය වන්නේ ප්‍රතිලාභ ලැබීමට ජනතාවට ඉඩ ලබා දීමෙන් ඔවුන් අතර රක්ෂණය පිළිබඳ දැනුම්වත්භාවය ඇති කිරීමයි. මෙහිදී කොවිඩ්-19 ට එරෙහි සටනේ ඉදිරිපෙළ සේවයේ යෙදෙන රාජ්‍ය අංශයේ සේවකයින්ට නොමිලේ ලබා දුන් ජීවිත ආවරණයක් වන විරු අභිමන් රක්ෂණාවරණය දියත් කිරීම තුළින් පසුගිය වර්ෂය තුළ මෙම අංශයේ යහපත් ප්‍රගතියක් ලබා ගැනීමට අපට හැකි විය. විරු අභිමන් යනු කොවිඩ්-19 ට එරෙහි සටනේ පෙරමුණ ගෙන සිටි වෛද්‍ය වෘත්තිකයන්, සෞඛ්‍ය සේවකයින්, ත්‍රිවිධ හමුදාව සහ අනෙකුත් අත්‍යවශ්‍ය සේවකයින් ඇතුළු රාජ්‍ය අංශයේ සේවකයින්ගේ පවුල් සඳහා නොමිලේ ලබා දෙන මූල්‍ය ආවරණයකි.

"සුරක්ෂා" ළමා රක්ෂණ පහසුකම හරහා ද "සැමට රක්ෂණය" සංකල්පය ප්‍රවර්ධනය කිරීමට අපි කටයුතු කළෙමු. "සුරක්ෂා" යනු රටේ සිසු දරුවන් රක්ෂණය කිරීම අරමුණු කරගනිමින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දියත් කරන ලද වැඩසහටහනකි. "සුරක්ෂා" වැඩසටහන දියත් කළ 2017 ඔක්තෝබර් 01 වන දින පටන් මේ දක්වා එහි ප්‍රධාන පහසුකම් සැපයුම්කරු වශයෙන් SLIC හට රටේ පාසල් වල සිසු දරුවන් මිලියන 4.5 කට අධික සංඛ්‍යාවක් වෙත ළඟා වීමට හැකි වී තිබේ.

"සැමට රක්ෂණය" ප්‍රවර්ධනය කිරීමෙහි ලා SLIC මෑතදී ලබා ඇති ප්‍රගතිය දෙස බැලීමෙන් විවිධත්වයට ඉඩ දෙන රක්ෂණයක් සඳහා වන අපේක්ෂාවන් පිළිබඳව මම ඉතා සුබවාදීව සිටිමි. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ විවිධත්වයට ඉඩ දෙන රක්ෂණයක් ප්‍රවර්ධනය කිරීමේ සමස්ථ වගකීම දැරීමට SLIC හට පමණක් හැකි නොවන බවද අවධාරණය කිරීමට මට සිදුවී තිබේ. වඩාත් අර්ථවත් බලපෑමක් ඇති කිරීම සඳහා සියලුම රක්ෂණ ආයතන එකට එකතු වී කටයුතු කළ යුතු වේ. එහෙයින්, අනාගතයේදී තිරසාරව වර්ධනය වීම සඳහා සමස්ථ රක්ෂණ කර්මාන්තයටම වඩාත් සාධාරණ වේදිකාවක් නිර්මාණය කිරීමට SLIC සමඟ අත්වැල් බැඳ ගැනීමට අනෙකුත් දේශීය රක්ෂණ ආයතන වලින් මම ඉල්ලා සිටිමි.

2020 දී අප ආරම්භ කළ විවිධත්වයට ඉඩ දෙන රක්ෂණයක් ප්‍රවර්ධනය කිරීමේ මෙම ගමන නිසැකවම අපට වැදගත් ස්ථානයක් ලබා දී තිබේ. ඉන් SLIC හි නාමය වඩාත් ප්‍රචලිත කර ඇති අතර ඉදිරි වසරවලදී නව හා අලුතින් එක්වන වෙළඳපල වලට පිවිසීම සඳහා අපට ස්ථාවර පදනමක් නිර්මාණය කර තිබේ. මා අනාගතය දෙස විශාල අපේක්ෂාවක් සහිතව බලා සිටින්නේ එබැවිනි. SLIC හි අනාගතය යළි අර්ථ දැක්විය හැකි ඝාතීය වර්ධන මාවතක ආරම්භයේ අප සිටින බව මම විශ්වාස කරමි.

"2020 දී අප ආරම්භ කළ විවිධත්වයට ඉඩ දෙන රක්ෂණයක් ප්‍රවර්ධනය කිරීමේ මෙම ගමන නිසැකවම අපට වැදගත් ස්ථානයක් ලබා දී තිබේ. ඉන් SLIC හි නාමය වඩාත් ප්‍රචලිත කර ඇති අතර ඉදිරි වසරවලදී නව හා අලුතින් එක්වන වෙළඳපල වලට පිවිසීම සඳහා අපට ස්ථාවර පදනමක් නිර්මාණය කර තිබේ"

අවසන් වශයෙන් මම SLIC කණ්ඩායමට ස්තූති කර සිටිමි. අප අද මෙතැන සිටින්නේ SLIC ප්‍රමුඛස්ථානයේ තැබීමෙහි ලා ඔවුන්ගේ දැඩි කැපවීම හේතුවෙනි.

එමෙන්ම සියලු ශ්‍රී ලාංකිකයින් වෙත රක්ෂණය සැපයීම සඳහා SLIC හි ප්‍රයත්නයන්ට දක්වන සහයෝගය වෙනුවෙන් ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අනෙකුත් අදාළ සියලුම බලධාරීන් වෙත මාගේ කෘතඥතාවය පළ කර සිටීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ජගත් වැල්ලවත්ත
සභාපති
2021 ජූනි 03



ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය



ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය

2020 වසර නිසැකවම ඉදිරි වසර කිහිපය පිළිබඳ අවිනිශ්චිත හැඟීම් දනවයි. සමස්ථ ලෝකයම වසංගතයකට මුහුණ දෙනු ඇතැයි කිසිවෙකුට හෝ සිතා ගත නොහැකි වූ අතර, කොවිඩ්-19 හි බලපෑම අප දන්නා ලෝකය කෙතරම් ඉක්මනින් වෙනස් විය හැකිද යන්න පිළිබඳ අපට බොහෝ දේ උගන්වා ඇත. අනෙක් අතට, මෙම වසංගතය බොහෝ රට වලට, ව්‍යාපාර වලට සහ පුද්ගලයන්ට ඔවුන්ගේ ඔරොත්තු දීමේ හැකියාව පරීක්ෂා කිරීමට සහ අනපේක්ෂිත අභියෝගයන් මධ්‍යයේ නොනැසී සිටීමට අනුවර්තනය වීම සඳහා නව මාර්ග සොයා ගැනීමට අවස්ථාවක් වී තිබේ. සාරාංශයක් ලෙස SLIC විසින් වසංගත බලපෑම කළමනාකරණය කරන ලද්දේද මේ අයුරින් වන අතර පසුගිය වසර තුළ අප ලද ජයග්‍රහණයන්ගෙන් ඒ බව සහතික කරන බව මම සාඩම්බරයෙන් පවසමි.

වසර පුරා විශිෂ්ඨ කාර්යසාධනයක්

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇතිවූ අභියෝගකාරී සාර්ව ආර්ථික පරිසරය සහ මුහුණ දීමට සිදුවූ විශාල බාධක හමුවේ වුවද බොහෝ අංශයන්ගෙන් කර්මාන්තය අභිභවා යමින් 2020 වර්ෂයේදී විශිෂ්ඨ කාර්යසාධනයක් ළඟා කර ගැනීමට SLIC ට හැකි විය.

2020 වර්ෂයේදී SLIC රු. මිලියන 39,421 ක් ලෙස ඒකාබද්ධ දළ ලිඛිත වාරිකයේ (GWP) ශක්තිමත් වර්ධනයක් වාර්තා කළ අතර එය 2019 දී වාර්තා වූ අගයට සාපේක්ෂව 16.65% ක වර්ධනයකි. එසේ නමුත් SLIC ට සාපේක්ෂව රක්ෂණ කර්මාන්තය ඉතා මන්දගාමී වේගයකින් වර්ධනය වූ අතර 2020 වර්ෂයේදී කර්මාන්තයේ සාමාන්‍ය වර්ධනය 9.7% ක් ලෙස වාර්තා විය. එමෙන්ම 2020 වර්ෂයේ 16.65% ක් ලෙස සටහන් වූ ඒකාබද්ධ දළ ලිඛිත වාරිකයේ වර්ධනය අපගේ පෙර වසර 5 තුළ වර්ධන සාමාන්‍යය අගය වූ 9.31% කට වඩා බොහෝ සෙයින් ඉහළ බවද මා විසින් පෙන්වා දිය යුතු වේ.

අපගේ මෙම ඉහළ ප්‍රතිඵල වලට හේතු වී ඇත්තේ ජීවිත රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණ යන අංශයන් දෙකෙහිම පවතින ශක්තිමත් ක්‍රියාකාරිත්වයයි. විශේෂයෙන් ජීවිත රක්ෂණ අංශය පැවති වාර්තා කිහිපයක්ම බිඳ දමමින් ඉතා විශිෂ්ඨ කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අපගේ ජීවිත රක්ෂණ අරමුදල 14.77% කින් වර්ධනය වූ අතර 2020 දෙසැම්බර් 31 වන විට එය රු. මිලියන 134,013 ක් විය. එමෙන්ම, ජීවිත රක්ෂණ අංශයේ දළ ලිඛිත වාරිකය ඉන් පෙර වාර්තා කළ රු. මිලියන 14,820 ක අගය ද අභිභවමින් 2020 මූල්‍ය වර්ෂය තුළ රු. මිලියන 19,257 ක අගයක් කරා ළඟා විය. පෙර වසරට සාපේක්ෂව මෙය 29.95% ක වර්ධනයක් වන අතර එම අගය 2020 වර්ෂය සඳහා කර්මාන්තයේ සාමාන්‍යය අගය වන 16% ට වඩා සැලකිය යුතු ලෙස ඉහළ අගයකි. එමෙන්ම SLIC හි ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙහි බදු ගෙවීමෙන් පසු ලාභය (ජීවිත රක්ෂණ අරමුදලට මාරු කිරීමට පෙර) 2020 මූල්‍ය වර්ෂය සඳහා රු. මිලියන 18,263 ක් ලෙස සටහන් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 30.17% ක ප්‍රශංසනීය වර්ධනයක් මෙන්ම කර්මාන්තයේ වාර්තාගත වර්ධනයට වඩා ඉතා ඉහළ අගයක වර්ධනයක් බවද ප්‍රකාශයට පත් කිරීමට ලැබීම පිළිබඳ මම අතිශයින් සතුටු වෙමි.

SLIC හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ද 2020 මූල්‍ය වර්ෂය තුළ ස්ථාවර කාර්යසාධනයක් වාර්තා කළ අතර 2019 වර්ෂයේදී රු. මිලියන 18,974 ක් ලෙස වාර්තා වූ දළ ලිඛිත වාරිකයට සාපේක්ෂව 2020 මූල්‍ය වර්ෂයේදී රු. මිලියන 20,163 ක් ලෙස 6.27% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදි. මෙම ප්‍රතිඵල සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වාර්තා වූ පස් අවුරුදු වර්ධන සාමාන්‍යය වන 6.42% හා සමපාතව පවතින බව පැවසීමට ලැබීම සතුටට කරුණකි. එමෙන්ම මෙම අවස්ථාවේදී කොවිඩ්-19 වසංගතය අපගේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට බලපෑ ආකාරය පිළිබඳ යම් සන්දර්භයක් සැපයීම වැදගත් යැයි මම සිතමි. වසංගතය හේතුවෙන් ඇති වූ ආර්ථික පසුබෑමෙන් මෙන්ම වාහන ආනයනය තහනම් කිරීමෙන් ද ඇතිවූ ඒකාබද්ධ බලපෑම අපගේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පරිමාවෙන් සැලකිය යුතු ප්‍රමාණයක් සඳහා දායක වන මෝටර් රථ අංශයට විශාල පසුබෑමක් විය. කෙසේවෙතත්, SLIC හි ශක්තිමත් වෙළඳපොල හිමිකමෙහි සහයෙන් මෝටර් රථ අංශය 2020 මූල්‍ය වර්ෂය තුළ රු. මිලියන 11,806 ක දළ ලිඛිත වාරිකයක් වාර්තා කරන ලද අතර කඩා වැටුණු වෙළඳපල තත්ත්වයන් සැලකිල්ලට ගැනීමේදී එය ප්‍රශංසනීය ජයග්‍රහණයක් ලෙස මම දකිමි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ අනෙකුත් අංශයන් ද, විශේෂයෙන් දේපල හා ධීවර රක්ෂණ අංශයන් ද වර්ධනය පෙන්නුම් කිරීම පිළිබඳව මම සතුටු වෙමි.

අපගේම අය රැක බලා ගනිමින්

වසංගතය කිසිවෙකුට පාලනය කළ හැකි දෙයක් නොවූවද, එවැනි අනපේක්ෂිත හා වෙනස්වන පරිසරයක පවා අපගේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සහ අපගේ සේවකයින්ගේ මෙන්ම 3000 කට අධික ක්‍රියාකාරී නියෝජිත බලකායේ ආරක්ෂාව සහතික කිරීමේ දී අප ලද සාර්ථකත්වයට හේතු වූයේ අපගේ ඉලක්කගත ප්‍රතිචාරය බව මම තරයේ විශ්වාස කරමි.

2020 මාර්තු මාසයේදී රට වසා දැමීම ආරම්භයේදීම ක්‍රියාත්මක වෙමින්, අපි වහාම අපගේ ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම ක්‍රියාත්මක කළ අතර අපගේ ගනුදෙනුකරුවන් හට බාධාවකින් තොරව අඛණ්ඩව සේවාවන් ලබා ගත හැකි වන පරිදි අපගේ තොරතුරු තාක්ෂණ මෙහෙයුම් සඳහා නිශ්චිත පූර්වෝපායන් ක්‍රියාත්මක කළෙමු.

ඒ අතරම, අපි ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම්, වෘත්තීය සමිති නියෝජිතයින් සහ සෞඛ්‍ය බලධාරීන් සමඟ එක්ව වසර තුළ අපගේ සේවකයින් ආරක්ෂිතව ක්‍රමානුකූල ලෙස නැවත සේවයට ගෙන්වීම සඳහා ක්‍රියාමාර්ගයන් සැලසුම් කිරීමට කටයුතු කළෙමු. අපගේ සියලුම සේවකයින්ගේ මෙන්ම රට පුරා සිටින අපගේ නියෝජිත බලකායේ සෞඛ්‍ය හා ආරක්ෂාව තහවුරු කිරීමට කොවිඩ්-19 ආරක්ෂක පියවර ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා අපි විශේෂ කාර්ය සාධක බලකායක් ද නිර්මාණය කළෙමු.

කෙසේවෙතත්, දුෂ්කර කාලයන් හමුවේ වුවද එක් දෙයක් පිළිබඳව අපට තරයේ විශ්වාසයක් තිබුණි. එනම් අපගේ සේවකයින්ගේ වැටුප් කප්පාදු කිරීම හෝ සේවකයන් සංඛ්‍යාව අඩු කිරීම අප කිසිසේත් සිදු නොකරන බවයි. ඒ වෙනුවට අප බෙහෙවින් වෙනස් ප්‍රවේශයක් අනුගමනය කළ අතර අපගේ කණ්ඩායම් වල උනන්දුව එලෙසම පවත්වා ගැනීම සහ සාර්ථකත්වය සඳහා ඔවුන් දැක්වූ කැපවීම වෙනුවෙන් ඔවුන් හට ප්‍රතිලාභ ලබා දීම කෙරෙහි අවධානය යොමු කළෙමු.

රට වසා දැමීම සහ වසංගත ආශ්‍රිත සංචරණ සීමා හේතුවෙන් ආදායම් අහිමි වීම වළක්වා ගැනීම සඳහා අපගේ නියෝජිත බලකායට අපි විවිධාකාරයෙන් අපගේ සහාය ලබා දුන්නෙමු. මෙම ප්‍රයත්නයන් සඳහා අපගේ නියෝජිතයින්ගෙන් අපට ලැබී ඇති ඉමහත් අගය කිරීමෙන් පෙනී යන්නේ මෙවන් සුළු ක්‍රියාවන් බොහෝ වෙනසක් ඇති කරන අතර ඒවායින් ඔවුන් අපගේ අනාගත ප්‍රගතියේද කොටසක් බවට පත්වන බවයි.

අපගේ හරය ශක්තිමත් කරමින්

වසංගතයෙන් අපගේ දෘෂ්ඨි කෝණයන් වෙනස් වීමත් සමඟ, අපි ඉදිරි වසර 3 සඳහා SLIC හි වර්ධන මාර්ගය සැලසුම් කිරීම අරමුණු කරගත් නව උපායමාර්ගික සැලසුම් අභ්‍යාසයක් ආරම්භ කළෙමු. අපගේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ඉතා උනන්දුසහගතව සිටි අපි අපගේ න්‍යාය පත්‍රයේ පළමු අදියර ලෙස සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය හා ජීවිත රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ මනා කළමනාකරණ අධීක්ෂණයක් ලබා ගැනීම සඳහා පුළුල් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් දියත් කළෙමු. මේ තුළින් වෙළඳපොලේ ඇති නිශ්චිත අවස්ථාවන් මත පදනම්ව, එක් එක් ව්‍යාපාරයේ පරිමාණය ක්‍රමානුකූලව වැඩි දියුණු කිරීම සඳහා SLIC වෙත පදනමක් සකස් කරනු ඇතැයි අප සිතමු.

දිගු කලක් තිස්සේ ස්ථාපිත වී ඇති සේවා ස්ථාන භාවිතයන් සහ විවිධ වයස් කාණ්ඩ ගණනාවකට අයත් ශ්‍රම බලකායක් සහිත SLIC වැනි විශාල ආයතනයක වෙනසක් ක්‍රියාත්මක කිරීම පහසු කාර්යයක් නොවන බව මම උදක්ම පිළිගනිමි. මෙම අවස්ථාවෙහිදී සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දුන් නායකත්වය මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා මාවත සකස් කළ බව මම සඳහන් කරනු කැමැත්තෙමි. මාස 3 ක කාලයක් පුරා පැවති අවධාන කණ්ඩායම් සැසි (focus group) මාලාවක් හරහා අපගේ සේවකයින් හා වෘත්තීය සමිති නියෝජිතයින්ගෙන් 52% ක් පමණ බලමුලු ගැන්වීමෙන් වෙනස්වීම් කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රායෝගික ප්‍රවේශයක් ලබා ගැනීමට අපට හැකි විය. මෙම අවධාන කණ්ඩායම් සැසිවාර බොහොමයකට පෞද්ගලිකව සහභාගී වීමෙන් අපගේ සේවකයින්ගේ නවෝත්පාදන හැකියාවන් දැනගැනීමට මට හැකි විය. SLIC හි දැනුම් පදනමෙහි ශක්තිමත් භාවය සැබවින්ම අගය කිරීමට ද ඉන් මට අවස්ථාව ලැබින. තවද, මෙම නව කළමනාකරණ ව්‍යුහයන් සාපේක්ෂව පහසුවෙන් මෙන්ම නව මූල්‍ය වර්ෂය සඳහා නිසි වේලාවට ක්‍රියාත්මක කිරීමට අපට හැකිවූයේ මෙම සහභාගීත්ව ප්‍රවේශය හේතුවෙන් බව මම විශ්වාස කරමි.

ඩිජිටල් ඒකාබද්ධතාවය වැඩි කරමින්

2019 දී ඩිජිටල් ඒකාබද්ධතාවය සිය උපායමාර්ගික ප්‍රමුඛතාවයන්ගෙන් එකක් ලෙස ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, SLIC සිය මෙහෙයුම් ව්‍යුහය සහ පාරිභෝගිකයා සමඟ අන්තර් ක්‍රියා කරන ඉදිරි පෙළ ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීමේදී ස්ථාවර ප්‍රගතියක් ලබා ඇත. එමෙන්ම 2019 දී SLIC පාරිභෝගික යෙදුම දියත් කිරීමේ සැලකිය යුතු සන්ධිස්ථානයක් අත්කර ගැනීමට අප සමත් වූ අතර එය සමස්ථ දේශීය රක්ෂණ කර්මාන්තයේම සම්මතයන් ඉහළ නැංවීමට හේතු විය.

පසුගිය වසරේ වසංගතය ආශ්‍රිතව ඇතිවූ අභියෝගයන්ට ප්‍රතිචාර දැක්වීමේදී පාරිභෝගික යෙදුම සහ අනෙකුත් ඩිජිටල් ආයෝජනයන් හි ප්‍රතිඵල මහත් සේ ඉවහල් වූ විය. එමෙන්ම අපගේ සේවක මණ්ඩලයට සහය දැක්වීමට සහ අපගේ විකුණුම් නියෝජිතයින් සවිබල ගැන්වීම සඳහා අපගේ අභ්‍යන්තර ක්‍රියාවලි ව්‍යුහය ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා අපගේ ඩිජිටල්කරණ වැඩසටහන වේගවත් කිරීමට අප පියවර ගත්තෙමු. අපගේ ගනුදෙනුකරුවන්ට ගෙවීම් සිදු කළ හැකි ආකාර පුළුල් කිරීම සඳහා අපි වෙනත් සේවා සපයන්නන් සමඟ ඩිජිටල් ඒකාබද්ධතාවයද වැඩි කළෙමු.



"වසංගතයෙන් අපගේ දෘෂ්ඨි කෝණයන් වෙනස් වීමත් සමඟ, අපි ඉදිරි වසර 3 සඳහා SLIC හි වර්ධන මාර්ගය සැලසුම් කිරීම අරමුණු කරගත් නව උපායමාර්ගික සැලසුම් අභ්‍යාසයක් ආරම්භ කළෙමු."

අපගේ නිෂ්පාදන උපායමාර්ගය වේගවත් කරමින්

SLIC සිය තරඟකාරීත්වයෙන් වෙනස් වීමට අපගේ විවිධ වූ සහ සුවිශේෂී වූ නිෂ්පාදන පෙළගැස්ම වැදගත් කාර්ය භාරයක් ඉටු කරන අතර ඉතා තරඟ කාරී දේශීය රක්ෂණ කර්මාන්තය තුළ වෙළඳපල නායකත්වය ස්ථාවරව පවත්වා ගැනීමට අපගේ නිෂ්පාදන නිරන්තරයෙන් නව්‍යකරණය කිරීමට සහ යාවත්කාලීන කිරීමට අප සතු හැකියාව නිසැකවම බලපා ඇත. 2020 වර්ෂයේදී ද අපගේ නිෂ්පාදන උපාය මාර්ගයන්ට අඛණ්ඩව පාදක වූයේ මෙම මූලික පදනම වේ. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ දියත් කරන ලද නව නිෂ්පාදන තුනම අපගේ කර්මාන්තයේ ප්‍රමුඛත්වය ගෙන සිටින Motor Plus නිෂ්පාදන පෙළගැස්මට අලුතින් එක් වූ නිෂ්පාදන වේ. "LADIES ONLY" යනු කාන්තා රියදුරන් සඳහාම සකස් කරන ලද සුවිශේෂී විසඳුමක් වන අතර MOTOR PLUS RIDER සහ MOTOR PLUS TUK යන නිෂ්පාදන දෙකම සාමාන්‍ය වෙළඳපල ඉලක්ක කර ගත් නිෂ්පාදන වේ. එම නිෂ්පාදන හරහා ඉලක්ක වෙළඳපලෙහි අවශ්‍යතා සපුරාලීම අරමුණු කර ගනිමින් අප විසින් එම නිෂ්පාදන සඳහා විවිධ අංගයන් ගණනාවක් ඇතුළත් කර ඇත.

අපගේ ආචාර ධර්මයන් ආරක්ෂා කර ගනිමින්

SLIC හි ආචාර ධර්මයන් විදහා දැක්වීමට පසු ගිය වසර තරම් සුදුසු අවස්ථාවක් මින් පෙර ලැබී නොමැත. අර්බුදකාරී කාල පරිච්ඡේදයේදී, ශ්‍රී ලංකාවේ ජනතාවට අපගේ සහයෝගය ලබා දීමට අපි පසුබට නොවූ අතර ඒ සඳහා විරු අභිමන් ව්‍යාපෘතිය දියත් කිරීමට අප කටයුතු කළෙමු. මෙම ව්‍යාපෘතිය කොවිඩ්-19 මර්ධන සටනෙහි පෙරමුණ ගෙන ක්‍රියා කරන වෛද්‍ය වෘත්තිකයන්, සෞඛ්‍ය සේවකයින්, ත්‍රිවිධ හමුදා වැනි රාජ්‍ය අංශයේ සේවකයින්ගේ සහ වෙනත් අත්‍යාවශ්‍ය සේවා සපයන සේවකයින්ගේ පවුල් සඳහා නොමිලේ සැපයෙන මූල්‍ය ආවරණයකි. සිය සේවකයින් ආරක්ෂිතව පූර්ණ කාලීනව රැකියා සඳහා නැවත ගෙන්වා ගැනීමේදී ද රාජ්‍ය අංශයේ ආයතනවලට සහාය වීම සඳහා SLIC ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන ලදි. වසංගතය හේතුවෙන් දරුණු ලෙස පීඩා විඳි අපගේ අසල්වැසියන්ට වියළි සලාක ලබා දීමෙන් ඔවුන්ට උපකාර කිරීමට ද අපට අවස්ථාව ලැබුණි. වසංගතයේ බරපතලකම හා සසඳන විට මේවා සුළු ක්‍රියාකාරකම් වුවද, කොවිඩ්-19 ට එරෙහි අපගේ ජාතික සටන ශක්තිමත් කිරීම සඳහා ඒවා උපකාරී වී ඇති බව මම විශ්වාස කරමි.

ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය

ඉදිරි ගමන

වර්තමාන තත්වය අනුව, මෙම වසංගතය සමඟ ශ්‍රී ලංකාවේ සටන සැළකිය යුතු කාලයක් අඛණ්ඩව පවතින බව පෙනේ. SLIC හට, පසුගිය වසරේ අත් හදා බැලීම් සහ ලැබූ පීඩාවන් තවත් විශ්වාසයෙන් යුතුව ඉදිරියට යාමට ඉඩ සලසන වැදගත් පාඩම් වනු ඇත. ඒ අතරම ඉදිරි වසර කිහිපය තුළ SLIC සඳහා පවතින අසීමිත අවස්ථාවන් මම දකිමි. ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ලබා ගැනීමේ මට්ටම තවමත් 1.3% (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස) ක් ලෙස පවතින පසුබිමක, දුර බැහැර ග්‍රාමීය ප්‍රදේශ ද ඇතුළුව අපගේ සේවාවන් දිවයින පුරා ව්‍යාප්ත කිරීම, ඉදිරියේ ඇති වීමට නියමිත අවස්ථාවන් ග්‍රහණය කර ගැනීම සඳහා SLIC හි ස්ථාවරය සහතික කරනු ඇත.

ඒ අතරම අපගේ නිෂ්පාදන කළඹ නව්‍යකරණය හා පුළුල් කිරීම තුළින් සහ හොඳම පාරිභෝගික අත්දැකීම් විසඳුම් ලබා දීම තුළින් අපගේ වෙළඳපල කොටස ශක්තිමත් කිරීමට අපි උත්සාහ කරමු. එමෙන්ම වෙනස්වන තරඟකාරී පසුබිම තුළ SLIC හට තරඟකාරී වාසියක් ලබා දෙන නව්‍ය, ඩිජිටල් විසඳුම් හරහා වෙළඳපොළට නායකත්වය දීම අන් කවරදාටත් වඩා වර්තමානයේ දී වඩාත් වැදගත් වේ. එමෙන්ම අපගේ අභ්‍යන්තර ධාරිතාවයන් ශක්තිමත් කිරීමට සහ ඉදිරි වසර වලදී ව්‍යාපාරය වර්ධනය සඳහා ඒ හා සමානවම වැදගත් වන තිරසාර වේදිකාවක් නිර්මාණය කිරීම සඳහා ද තාක්ෂණය සඳහා අඛණ්ඩව ආයෝජනය කිරීමට අප කටයුතු කරමු.



"SLIC සිය තරඟකාරීත්වයෙන් වෙනස් වීමට අපගේ විවිධ වූ සහ සුවිශේෂී වූ නිෂ්පාදන පෙළගැස්ම වැදගත් කාර්ය භාරයක් ඉටු කරන අතර ඉතා තරඟ කාරී දේශීය රක්ෂණ කර්මාන්තය තුළ වෙළඳපල නායකත්වය ස්ථාවරව පවත්වා ගැනීමට අපගේ නිෂ්පාදන නිරන්තරයෙන් නව්‍යකරණය කිරීමට සහ යාවත්කාලීන කිරීමට අප සතු හැකියාව නිසැකවම බලපා ඇත."

ස්තූතිය

මෙම පසුගිය වසර අන් කිසිදු වසරකට වඩා වෙනස් වූ අතර SLIC සතුව හොඳම මානව සම්පත සිටින බව බොහෝ ආකාරවලින් ඔප්පු වී තිබේ. 2020 වසරේදී SLIC ඉහළටම ඔසවා තබමින් කැපවීම සහ වෘත්තීයභාවය පිළිබඳ සුවිශේෂී ආදර්ශයක් සැපයීමට සමත් වූ අපගේ සේවක මණ්ඩලය අගය කර සිටීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

තමන් වැඩිපුරම අගය කර සිටිනා දේ ආරක්ෂා කිරීම සඳහා SLIC මත අඛණ්ඩව විශ්වාසය තැබූ අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට ඒ වෙනුවෙන් මම ස්තූතිවන්ත වෙමි. මෙවන් පෙර නොවූ විරූ කාලයකදී අප වෙත තැබූ විශ්වාසය, කැපවීම, සහ අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් අපගේ විකුණුම් නියෝජිතයින්, රක්ෂණ තැරැව්කරුවන්, ප්‍රතිරක්ෂණ හවුල්කරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ට අපගේ ස්තූතිය පළ කර සිටිමු.

පසුගිය වසර පුරා දැක්වූ සහයෝගය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයට සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට මාගේ කෘතඥතාවය පළ කර සිටිමි.

අවසාන වශයෙන්, වසංගතය නොතකා, සියලු අංශයන්ගෙන් සාර්ථක වීමට SLIC මෙහෙයවූ අචල සහයෝගය සහ තීක්ෂණ නායකත්වය පිළිබඳව සභාපතිවරයා වෙත සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ අවංක ස්තූතිය පළ කරනු කැමැත්තෙමි.

චන්දන එල් අලුත්ගම
ප්‍රධාන විධායක නිලධාරී
2021 ජූනි 03



වාර්තාවේ පැතිකඩ

"SLIC නිසා පාරෙ යද්දි මට වගේම මගේ පවුලේ අයටත් ආරක්ෂාව ලැබෙනවා"



මෙය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (SLIC) විසින් ප්‍රකාශයට පත් කරන ලද තෙවන ඒකාබද්ධ වාර්ෂික වාර්තාවයි. එහි ගනුදෙනුකරුවන්, සේවකයින්, ආයෝජකයින්, ශ්‍රී ලංකා රජය සහ නියාමන ආයතන හෝ SLIC පිළිබඳ උනන්දුවක් දක්වන වෙනත් ඕනෑම පාර්ශවකරුවන් ද ඇතුළු පුළුල් පිරිසක් මෙම වාර්තාවෙන් ඉලක්ක කෙරේ.

SLIC විසින් ප්‍රකාශයට පත් කරන ලද නවතම ඒකාබද්ධ වාර්තාව නිකුත් කරන ලද්දේ 2019 මූල්‍ය වර්ෂය සඳහා ය. මෙම වාර්තාව සහ පසුගිය වසර 8 ක කාලය සඳහා ප්‍රකාශයට පත් කරන ලද වෙනත් වාර්ෂික වාර්තා ආයතනයේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය - www.srilankainsurance.com

පරාසය සහ සීමාවන්

මෙම වාර්තාව 2020 ජනවාරි 1 සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලය ආවරණය කරන අතර SLIC හි මූලික ව්‍යාපාරික ක්‍රියාකාරකම් වන ජීවිත හා සාමාන්‍ය රක්ෂණ යන අංශ ආවරණය කරයි. 2020 මූල්‍ය වර්ෂය තුළ SLIC හි කාර්යසාධනය පිළිබඳ පූර්ණ තක්සේරුවක් පාර්ශ්වකරුවන්ට ලබා දීම සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන (තිරසාරභාවය) තොරතුරු මෙන්ම අනුකූලතාවය, පාලනය සහ අවදානම් කළමනාකරණය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ අඩංගු වේ.

වාර්තාකරණ රාමුව

මූල්‍ය වාර්තාකරණය	මූල්‍ය නොවන (තිරසාරභාවය) වාර්තාකරණය	පාලනය, අනුකූලතාවය සහ අවදානම් වාර්තාකරණය
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්	IIRC (ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලය) රාමුව	රජය සතු රක්ෂණ සමාගම් සඳහා අදාළ වන නීති රාමුව, ආයතනික පාලන සංග්‍රහය -2017
	GRI සම්මතයන්	
	එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කයන් (SDG's)	

පරාසය සහ සීමාවන් හි පෙර වාර්තාකරණ කාලයන් හා සැලකිය යුතු වෙනසක් සිදු නොවූ බවත්, පෙර වාර්තාකරණ වර්ෂයේ නිකුත් කළ වාර්ෂික වාර්තාව හා සසඳන විට කිසිදු පුනප්‍රකාශයක් නොමැති බවත් සැලකිල්ලට ගත යුතුය.

ප්‍රමාණතාවය (Materiality)

මෙම වාර්තාවේ මූල්‍යමය නොවන අන්තර්ගතය තීරණය කිරීම සඳහා අපි ප්‍රමාණතාවය පිළිබඳ මූලධර්මය භාවිතා කර ඇත්තෙමු. ප්‍රමාණතාවය යනු පාර්ශවකරුවන්ට අදාළ විය හැකි මූල්‍ය නොවන (තිරසාරභාවය) තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා වන GRI (Global Reporting Initiative) සම්මතයන් විසින් ප්‍රවර්ධනය කරන ලද සංකල්පයකි. ඒ අනුව, මෙම වාර්තාව හරහා, අපගේ ප්‍රමාණතා කාරණා ලෙස අප විසින් සලකනු ලබන දෑ සඳහා සන්දර්භය අපි සපයන්නෙමු. එනම්, කෙටිකාලීන, මධ්‍යම හා දිගු කාලීන වශයෙන් වටිනාකම් නිර්මාණය කිරීමේ අපගේ හැකියාවට බලපෑම් කළ හෝ බලපෑම් කළ හැකි දෑ ඒ යටතට අයත් වේ. ආයතනයට වටිනාකමක් ලබා දීම සහ අපගේ පාර්ශවකරුවන්ට ධනාත්මක ප්‍රතිඵල ලබා දීම සඳහා අපගේ උපාය මාර්ගයන් සුසර කරමින් සහ අපගේ ප්‍රාග්ධනයන් හය හරහා අපගේ සම්පත් යළි ස්ථානගත කරමින් මෙම ප්‍රමාණතා කාරණා පිළිබඳව අප අවධානය යොමු කරන ආකාරය වාර්තාවෙන් තවදුරටත් පෙන්වා දේ.

ප්‍රමාණතා කාරණා විසඳීම සඳහා අපගේ ප්‍රාග්ධනයන් හරහා සම්පත් වෙන් කරන ආකාරය						
ප්‍රමාණතා කාරණය	මූල්‍ය	නිෂ්පාදිත	බුද්ධිමය	මානව	සමාජයීය	සබඳතාමය
ආර්ථික කාර්යසාධනය	✓	✓	✓			
වෙළඳපල පැවැත්ම	✓	✓		✓	✓	
දූෂණ විරෝධී වීම			✓		✓	
තරඟකාරී නොවන හැසිරීම			✓		✓	
රැකියා නියුක්තිය	✓			✓		
ව්‍යාත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව	✓			✓		
පුහුණු හා සංවර්ධනය	✓			✓		
විවිධත්වයට ඉඩ දීම			✓	✓		
වෙනස්කොට නොසැළකීම			✓	✓		
එක්රැස් වීමේ නිදහස සහ සාමූහික තැරැව් කිරීම				✓		
දේශීය ප්‍රජාවන්	✓				✓	✓
පාරිභෝගික සෞඛ්‍ය සහ ආරක්ෂාව					✓	
අලෙවිකරණය සහ ලේබල්කරණය					✓	
සමාජයීය ආර්ථික අනුකූලතාවය					✓	✓

ඉදිරි දැක්මේ ප්‍රකාශ

මෙම වාර්තාවේ SLIC හි මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම්වල ප්‍රතිඵල පිළිබඳ ඉදිරි දැක්මේ ප්‍රකාශයන් අඩංගු වේ. එම ප්‍රකාශයන්හි ස්වභාවය අනුව අනාගතයේ සිදුවිය හැකි හෝ නොවිය හැකි සිදුවීම් හෝ තත්වයන් මත ඒවා රඳා පවතින බැවින් ඒ සම්බන්ධයෙන් අවදානමක් සහ අවිනිශ්චිතතාවයන් පවතියි. මෙම ප්‍රකාශයන් සැබෑ ප්‍රතිඵල වලට වඩා ප්‍රධාන වශයෙන් වෙනස් වීමට හේතු විය හැකි සාධක අතරට ජාතික ආර්ථික තත්වයන්, රක්ෂණ රෙගුලාසි සහ තරඟකාරී හා නියාමන සාධක මෙන්ම අනෙකුත් සාධක ද ඇතුළත් වේ. ඒ හේතුවෙන්, වාර්තාවේ සඳහන් ඉදිරි දැක්මේ ප්‍රකාශයන් අදාළ වන්නේ ඒවා ඉදිරිපත් කළ දිනය වන විට පමණක් යැයි සලකනු ලබන අතර, නව තොරතුරු, අනාගත සිදුවීම් හෝ සිදු නොවීම් හේතුවෙන් ඉහත කී ප්‍රකාශයන් කිසිවක් යාවත්කාලීන කිරීමට හෝ සංශෝධනය කිරීමට SLIC කිසිදු වගකීමක් නොදරයි.

ප්‍රතිපෝෂණය

අපගේ වාර්ෂික වාර්තාවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට අපට සහාය වීම සඳහා ඔබගේ ගැටළු සහ යෝජනා අප සාදරයෙන් පිළිගන්නා අතර ඒවා යොමු කළ යුත්තේ:

ඩී. ඒ. රුවනි ධර්මවර්ධන,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අනුකූලතාවය, අවදානම් සහ ආයතනික සැලසුම්කරණය
සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව.
"රක්ෂණ මන්දිරය", අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
දුරකථන: +94 11 235 7741

උපායමාර්ගය සහ අවධානය

38 - ව්‍යාපාර ආකෘතිය
40 - ප්‍රමාණතාවය පිළිබඳ කරුණු (Materiality Issues)
41 - පාර්ශවකරුවන්ගේ සම්බන්ධතා
43 - උපායමාර්ගික ප්‍රමුඛතාවයන්



ව්‍යාපාර ආකෘතිය


පාර්ශවකරුවන් ලබා දෙන යෙදවුම්
කොටස් හිමියන්:
99.97% භාණ්ඩාගාර ලේකම්
රක්ෂණ ඔප්පු හිමියන්:
434,470
ජීවිත රක්ෂණ ඔප්පු හිමියන්
1,266,809
සාමාන්‍ය රක්ෂණ ඔප්පු හිමියන්
49% 51%
සේවකයින්:
එකතුව 2,626
ව්‍යාපාර හවුල්කරුවන්:
ප්‍රතිරක්ෂණකරුවන්, නියෝජිතයින්, තැරැව්කරුවන්, බැංකු
නියාමකයින්:
IRCSL, DROC, FIU – CBSL"
සැපයුම්කරුවන්
ජීවිත හා සාමාන්‍ය රක්ෂණ
දැක්ම
මෙහෙවර
නුබුන්වත්කම සහ ප්‍රාග්ධන කළමනාකරණය
යෙදවුම්
• කොටස් හිමියන්ගේ අරමුදල්
• ආයෝජන
• ජීවිත අරමුදල
• සාමාන්‍ය අරමුදල
• දේපළ, පිරියත සහ උපකරණ
• තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
• ආයතනික දැනුම
• හොඳම භාවිතයන්
• දත්ත විශ්ලේෂණ
• සේවා සහ සැපයුම්
• සම්බන්ධතා
• සහයෝගීතා සහ සන්ධානයන්
• සමීක්ෂණ ප්‍රතිඵල
• සහතික කිරීමේ සේවා
• උපයෝගීතා (Utilities)
බෙදාහැරීමේ නාලිකා
අභ්‍යන්තර ක්‍රියාවලීන්
නිෂ්පාදන හා සේවාවන්
සේවා සම්මතයන්
ක්‍රියාකාරකම්
• ප්‍රතිරක්ෂණය/ප්‍රාරක්ෂණය
• සේවා සහ ප්‍රතිපත්ති පරිපාලනය
• හිමිකම් කලමනාකරණය
• ආයෝජන ක්‍රියාකාරකම්
• අලෙවිකරණය, විකුණුම් සහ බෙදා හැරීම්
පාලන රාමුව
අවදානම් කලමනාකරණය
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ නියාමන අධිකාරීවරුන්
මෙහෙයුම් පරිසරය



ව්‍යාපාරික ආකෘති රූප සටහන මඟින් SLIC තුළ ක්‍රියාකාරකම් සිදුවන ආකාරය සහ අප ක්‍රියාත්මක වන පරිසරය පමණක් නොව අපගේ දැක්ම හා මෙහෙවර ද එයට බලපාන්නේ කෙසේද යන්න පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබා දෙයි. නීති හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක වනවා සේම; අපගේ මෙහෙවර, දැක්ම සහ වටිනාකම් මගින් අප සපුරා ගැනීමට අපේක්ෂා කරන අරමුණු සහ එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ උපායමාර්ගය සකස් කරන්නේ කෙසේද යන්න නිර්වචනය කරයි. ඒ හා සමානව, අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන SLIC හි සෑම ක්‍රියාකාරකමකටම මෙම බාහිර හා අභ්‍යන්තර බලපෑම් බලපානු ලබයි. අනෙක් අතට, අපගේ අරමුණු ද අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම් මගින් හැඩගස්වා ඇති අතර, SLIC එය විසින්ම මෙහෙයුම් පරිසරයට අඛණ්ඩව අනුවර්තනය වන බව සහතික කරමින් මෙම චක්‍රය අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

ප්‍රමාණතාවය පිළිබඳ කරුණු (Materiality Issues)

SLIC හි ව්‍යාපාරික ආකෘතිය ආයතනය මෙන්ම සහ අපගේ පාර්ශවකරුවන්ට ද වැදගත් වන අංශයන් කෙරෙහි අවධානය යොමු කරයි. අපගේ පාර්ශවකරුවන් සමඟ ඵලදායී ලෙස සම්බන්ධ වීමෙන් මෙම අංශ හඳුනා ගෙන ඇත. සිදුවීමේ සම්භාවිතාව සහ බලපෑමේ විශාලත්වය මත පදනම්ව සම්බන්ධ සියලු පාර්ශ්වයන්ට ඇති අදාළත්වය සහ වැදගත්කම විශ්ලේෂණය කිරීමෙන් මෙම අංශවල වැදගත්කම තීරණය කෙරේ. මෙම වාර්ෂික වාර්තාවෙහි කලමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ අංශයේ වැඩි විස්තර සහිතව මෙම කරුණු සාකච්ඡා කරනු ඇති අතර එය පහත වගුවේ සාරාංශගත කොට ඇත.

අංකය	අංක මාතෘකාව	SLIC ට ඇති වැදගත්කම	පාර්ශවකරුවන්ට ඇති වැදගත්කම
1	ආර්ථික කාර්යසාධනය	ඉතා ඉහළයි	ඉතා ඉහළයි
2	වෙළඳපල පැවැත්ම	ඉතා ඉහළයි	ඉතා ඉහළයි
3	දූෂණ විරෝධී වීම	ඉහළයි	ඉහළයි
4	තරඟකාරී නොවන හැසිරීම	ඉහළයි	ඉහළයි
5	රැකියා නියුක්තිය	ඉතා ඉහළයි	ඉතා ඉහළයි
6	වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව	ඉහළයි	ඉහළයි
7	පුහුණුව හා විවිධත්වය	ඉතා ඉහළයි	ඉතා ඉහළයි
8	විවිධත්වය හා සමාන අවස්ථාවන්	ඉතා ඉහළයි	ඉතා ඉහළයි
9	වෙනස්කොට නොසැළකීම	ඉහළයි	ඉහළයි
10	එක්රැස් වීමේ නිදහස සහ සාමූහික තැරැව් කිරීම	ඉහළයි	ඉහළයි
11	දේශීය ප්‍රජාවන්	ඉහළයි	මධ්‍යමයි
12	පාරිභෝගික ධනය සහ ආරක්ෂාව	ඉහළයි	ඉහළයි
13	අලෙවිකරණය සහ ලේබල්කරණය	ඉහළයි	මධ්‍යමයි
14	සමාජ ආර්ථික අනුකූලතාවය	ඉහළයි	ඉහළයි



පාර්ශවකරුවන්ගේ සම්බන්ධතා

රටේ ප්‍රමුඛතම රක්ෂණ ආයතනය මෙන්ම සියලු ශ්‍රී ලාංකිකයන්ගේ වඩාත් විශ්වාසවන්තම රක්ෂණ ආයතනය ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පවත්වා ගෙන යාමට අප දරන උත්සාහයේ දී, අපගේ පාර්ශවකරුවන් සමඟ දීර්ඝ කාලීනව සබඳතා ශක්තිමත් කිරීමට අපි බලාපොරොත්තු වෙන්නෙමු. එකිනෙකා සමඟ සම්බන්ධ වීම ශක්තිමත් සබඳතා වර්ධනය කිරීමේ අනිවාර්ය අංගයකි.

අපගේ විවිධ පාර්ශවකරුවන්ගේ කණ්ඩායම් අපගේ ව්‍යාපාරයට බලපාන ගැටළු පිළිබඳව විවිධ අදහස් දරන අතර, මෙම විවිධ දෘෂ්ටිකෝණයන් වෙත අවධානය යොමු කිරීම තුළින් SLIC හි දිගුකාලීන සාර්ථකත්වයට සහ තිරසාරභාවයට සහාය වීම සඳහා සැබෑ අවබෝධයක් සහ වටිනාකමක් ලබා ගත හැකි බව අපි දනිමු. ඉතා විධිමත් පාර්ශවකරුවන් හඳුනා ගැනීමේ ක්‍රියාවලියක පටන් අපගේ පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීම සඳහා අප ඉතා ක්‍රමානුකූල ප්‍රවේශයක් අනුගමනය කරමු.

පාර්ශවකරුවන් හඳුනා ගැනීම
පාර්ශවකරුවන් යනු SLIC හි ක්‍රියාකාරකම්, නිෂ්පාදන හෝ සේවා සහ සංවිධානාත්මක ක්‍රියාකාරිත්වයට බලපෑම් කළ හැකි සහ/හෝ ඒවායින් බලපෑමට ලක්විය හැකි පුද්ගලයින්, පුද්ගල කණ්ඩායම් හෝ ආයතන වේ. මේ ආකාරයෙන් හඳුනාගෙන ඇති පාර්ශවකරුවන් හට ඔවුන්ගෙන් SLIC වෙත ඇති විය හැකි බලපෑමේ මට්ටම අනුව ප්‍රමුඛතාවය අනුපිළිවෙලින් පෙළගස්වනු ලැබේ.

සම්බන්ධ වීමේ ක්‍රමවේද සහ සම්බන්ධවීමේ මූලධර්ම
විවිධ පාර්ශවකරුවන් සඳහා අපි විවිධ සම්බන්ධතා ක්‍රමවේදයන් භාවිත කරමු. සම්බන්ධතා නාලිකා සාමාන්‍යයෙන් තීරණය කරනු ලබන්නේ පාර්ශවකරුවන්ගෙන් SLIC වෙත ඇති වන බලපෑම මත වන අතර, පහත දැක්වෙන මූලධර්ම සියලුම සම්බන්ධතා නාලිකා සඳහා අදාළ වේ;

- උපදේශනාත්මක සාකච්ඡාවන් ඇති කිරීම සඳහා විවෘතභාවය සහ විනිවිදභාවය
- කාලෝචිතභාවය සහ තොරතුරු වල අදාළත්වය
- ප්‍රතිචාර වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩ හා ඉදිරියට පවත්වාගෙන යන සමාලෝචනය

හිමිකාරිත්වය සහ වගකිවයුතු බව
SLIC හි පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වීම විමධ්‍යගත කර ඇති අතර පාර්ශවකරුවන්ගේ සියලු සම්බන්ධතා සහ විමසීම් හෝ ගැටළු කළමනාකරණය කරන තනි කණ්ඩායමක් නොමැත. සියළුම සේවකයින් ඔවුන්ගේ වගකීම් ක්ෂේත්‍රයන් තුළ සබඳතා කළමනාකරණය කිරීම සහ අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම සම්බන්ධයෙන් වගකිව යුතු වේ.

ආයතනයේ අවසන් පාලන තන්ත්‍රය ලෙස කටයුතු කරන SLIC හි අධ්‍යක්ෂ මණ්ඩලය පාර්ශ්වකරුවන්ගේ සබඳතා සහ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා, පාර්ශවකරුවන් විසින් උනන්දුවන කරුණු සහ ඔවුන්ගේ අපේක්ෂාවන් පිළිබඳව නිරන්තරයෙන් දැනුම්වත් කරනු ලබන අතර එය ආදානයන් සැලසුම් කිරීම සහ තීරණ ගැනීම සඳහා උපායමාර්ගික යෙදවුම් ලෙස භාවිත වේ.



පාර්ශවකරුවන්ගේ සම්බන්ධතා

පාර්ශවකරුවන්ට අදාළ වන ප්‍රධාන කරුණු	SLIC වෙත බලපෑම	සම්බන්ධ වීම	සම්බන්ධ වීමේ කාල පරාසය
ශ්‍රී ලංකා රජය ආයෝජන, ව්‍යාපාර සංවර්ධන, ප්‍රතිලාභ, නවෝත්පාදනය සහ කර්මාන්ත වර්ධනය, අනුකූලතා	ඉහළයි	වාර්ෂික වාර්තාව	වාර්ෂිකව
		පුවත්පත් නිවේදන	අවශ්‍යතාවය පරිදි
		අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සමඟ රැස්වීම් සහ සාකච්ඡා	අවශ්‍යතාවය පරිදි
වෙනත් නියාමකයින් අවශ්‍යතා මත පදනම් වූ නීති හා රෙගුලාසි වලට අනුකූල වීම, යහපත් ආයතනික පාලනය, කර්මාන්තයේ ස්ථාවරත්වය, සදාචාරාත්මක වීම	ඉහළයි	නියාමන අධිකාරීන් සමඟ රැස්වීම්	අවශ්‍යතාවය පරිදි
		වාර්ෂික වාර්තාව	වාර්ෂිකව
		කර්මාන්ත සංසද	අවශ්‍යතාවය පරිදි
		ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ සහ තත්ව වාර්තා	තෙමසකට වරක්, වාර්ෂිකව
		පුවත්පත් නිවේදන	අවශ්‍යතාවය පරිදි
පාරිභෝගිකයින් පාරිභෝගික සම්බන්ධතාවය, රඳවා ගැනීම, අදාළ නිෂ්පාදන, නිෂ්පාදන තොරතුරු, රක්ෂණාවරණ ප්‍රසාද දීමනා, ප්‍රතිපත්ති හිමිකම්, වෙනත් නියාමකයින්	ඉහළයි	ඇමතුම් මධ්‍යස්ථානය	නිරන්තරයෙන්
		පාරිභෝගික තෘප්තිමත්භාවය පිළිබඳ සමීක්ෂණය	අවශ්‍යතාවය පරිදි
		මුහුණට මුහුණ අන්තර්ක්‍රියා	නිරන්තරයෙන්
		වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය	නිරන්තරයෙන්
		පාරිභෝගික අදහස්	නිරන්තරයෙන්
ව්‍යාපාර හවුල්කරුවන්	මධ්‍යම	රැස්වීම්	අවශ්‍යතාවය පරිදි
වර්ධන විභවය, නිසි කලට ගෙවීම්		විද්‍යුත් තැපෑල, දුරකථන ආදිය හරහා සන්නිවේදනය	අවශ්‍යතාවය පරිදි
සේවකයින් සේවක සුභසාධනය, තෘප්තිය, රඳවා ගැනීම, පුහුණු සහ සංවර්ධනය, පිළිගැනීම සහ ප්‍රතිලාභ, වෘත්තීය ප්‍රගතිය, රැකියා සුරක්ෂිතභාවය	ඉහළයි	රැස්වීම්	නිරන්තරයෙන්
		විද්‍යුත් තැපෑල, දුරකථන ආදිය හරහා සන්නිවේදනය	අවශ්‍යතාවය පරිදි
		අනුප්‍රාප්තිය සැලසුම් කිරීම	අවශ්‍යතාවය පරිදි
		පුහුණු සහ සංවර්ධන ක්‍රියාකාරකම්	අවශ්‍යතාවය පරිදි
		සම්මාන උළෙල	වාර්ෂිකව
		ප්‍රජා ව්‍යාපෘති සඳහා සම්බන්ධ වීම	අවශ්‍යතාවය පරිදි
		දුක්ගැනවිලි හැසිරවීම	අර්ධ වාර්ෂිකව
		අභ්‍යන්තර වෙබ් අඩවිය සහ B-Connect යෙදුවුම හරහා තොරතුරු බෙදා ගැනීම	නිරන්තරයෙන්
		අරමුණු/ප්‍රධාන කාර්යසාධන ඇඟවීම් සැකසුම්	වාර්ෂිකව
		කාර්යසාධනය ඇගයීම	අර්ධ වාර්ෂිකව
ප්‍රජාව සහ පරිසරය ප්‍රජා ආයෝජන, ආයතනික සමාජ වගකීම් වැඩසටහන්	මධ්‍යම	ප්‍රජා ව්‍යාපෘති	නිරන්තරයෙන්
		පුවත්පත් නිවේදන	අවශ්‍යතාවය පරිදි
		වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය	නිරන්තරයෙන්
		උත්සව/අවස්ථා	අවශ්‍යතාවය පරිදි
		ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති	නිරන්තරයෙන්
		තිරසාර සංවර්ධන වැඩටහන්	නිරන්තරයෙන්

උපායමාර්ගික ප්‍රමුඛතා

වඩ වඩාත් අභියෝගාත්මක හා ඉහළ ගතිකයක් සහිත පරිසරයක ක්‍රියාත්මක වන බැවින් අපගේ උපාය මාර්ග අඛණ්ඩව සුනම්‍ය ලෙස පැවතීම අතිශයින් වැදගත් ය. මෙම ප්‍රවේශය මගින් ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ඇති නායකත්තව තත්ත්වය තවදුරටත් ශක්තිමත් කිරීම පමණක් නොව තවත් සැලකිය යුතු ප්‍රතිලාභ ලබා දෙන බව අපි විශ්වාස කරමු.

කොවිඩ් -19 වසංගතයෙන් පැන නගින අභියෝගාත්මක ආර්ථික තත්වයන්ට මුහුණ දී ඇති අපි පුළුල් මෙහෙයුම් සන්දර්භය පිළිබඳව අවබෝධයක් ලබා ගනිමින් 2020 දී අපගේ ප්‍රධාන ව්‍යාපාර දෙකම නැවත සලකා බැලුවෙමු. අපගේ තක්සේරු කිරීම් මත පදනම්ව කෙටිකාලීන හා මධ්‍ය කාලීන කාලීන ලෙස අපගේ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඉවහල් වන ක්‍රියාමාර්ග මාලාවක් හරහා මූලික නිපුණතා සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

සාමාන්‍ය ව්‍යාපාරය

විකුණුම්

ගතහැකි ක්‍රියාමාර්ග

- හරස් විකිණුම් (Cross Selling) වැඩි කිරීම්
- විකුණුම් ව්‍යුහය නැවත සකස් කිරීම
- නාලිකාව කේන්ද්‍ර කරගත් විකුණුම් ව්‍යුහය
- අලෙවි විධායක (ME) නාලිකාව ප්‍රතිව්‍යුහගත කිරීම
- මෝටර් නොවන ප්‍රාරක්ෂණය සඳහා ශාඛා වලට හැකියාව ලබා දීම
- අහිමි වූ ව්‍යාපාර අවස්ථා නැවත ලබා ගැනීම
- මූලික බණ්ඩවල හිමි වෙළඳපල කොටස වැඩි කරගැනීම
- සැමට රක්ෂණය ප්‍රවර්ධනය කිරීම

2020 සඳහා ප්‍රගතිය

ජීවිත හා සාමාන්‍ය ව්‍යාපාර සඳහා ශාඛා මට්ටමේ අධීක්ෂණය වෙන වෙනම ශක්තිමත් කිරීම සඳහා නව නායකත්ව තනතුරු සහිතව 2020 මැද භාගයේදී ශාඛා පාලන යාන්ත්‍රණය නවීකරණය කරන ලදී. ඒ අනුව, ව්‍යාපාර දෙකම සඳහා සාමූහිකව පවත්වාගෙන යන කලාප 21 , ජීවිත හා සාමාන්‍ය ව්‍යාපාර සඳහා කලාප 15 බැගින් බෙදා වෙන් කරන ලද අතර එමඟින් එක් එක් මෙහෙයුම සඳහා බිම් මට්ටමින් ශක්තිමත් අධීක්ෂණයක් සහතික කෙරේ.

වයස අවුරුදු 5 ත් 21 ත් අතර සිසුන් මිලියන 4.5 කට වැඩි පිරිසක් ආවරණය වන පරිදි සුරක්ෂා රක්ෂණ ඔප්පුව නිකුත් කරනු ලැබුවේ රෝහල් ගත කිරීම, බරපතල රෝගාබාධ, සැත්කම් සහ සිසුන්ට සිදුවන පෞද්ගලික අනතුරු මෙන්ම දෙමව්පියන්ගේ මරණය වැනි අවාසනාවන්ත සිදුවීමකදී එකවර ගෙවීම සඳහා ප්‍රතිලාභ රැසක් ලබා දෙමිනි.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සෙලාන් බැංකුව, පෑන් ඒෂියා, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, කොමර්ෂල් බැංකුව සහ ලංකා බැංකුව සමඟ උපායමාර්ගිකව හවුල් වී ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මේ වන විට ලීසිං සමාගම් 13 ක් හා ටොයොටෝ ලංකා, ඩිමෝ සහ යුනයිටඩ් මෝටර්ස් වැනි ප්‍රධාන වාහන බෙදාහරින්නන්ගේ හවුල්කාරිත්වයන් 3 ක් සමඟ එක්ව නව හවුල්කාරිත්වයන් වර්ධනය කිරීමට කටයුතු කරයි.

අලෙවිකරන

ගතහැකි ක්‍රියාමාර්ග

- මෝටර් රක්ෂණය සඳහා වෙළඳපල බණ්ඩනය
- කළඹ මට්ටමේ මිලකරණය
- නිෂ්පාදන අදාළත්වය වැඩි දියුණු කරන්න

2020 සඳහා ප්‍රගතිය

පරිශීලකයින්ගේ විශේෂිත අවශ්‍යතා සපුරාලීම සඳහා මෝටර් රථ රක්ෂණ නිෂ්පාදිතය විවිධ බණ්ඩ මත පදනම්ව නැවත සන්නාම කරන ලදී
මෝටර් ප්ලස් යටතේ "ලේඩීස් ඔන්ලි" දියත් කිරීම
මෝටර් ප්ලස් රයිඩර් දියත් කිරීම
මෝටර් ප්ලස් ටුක් දියත් කිරීම

ප්‍රධාන විධායක නිලධාරීගේ ප්‍රධානත්වයෙන් යුත් විකුණුම්, අලෙවිකරණ, මෙහෙයුම් සහ ආයුගණක අංශවල ප්‍රධාන පුද්ගලයින්ගෙන් සමන්විත නිෂ්පාදන සංවර්ධන කමිටුව පවත්නා නිෂ්පාදනවල ක්‍රියාකාරිත්වය සමාලෝචනය කිරීම සහ පාරිභෝගික අවශ්‍යතා මත පදනම්ව පවත්නා නිෂ්පාදනවල සංශෝධන / වැඩිදියුණු කිරීම් තීරණය සිදුකරනු ලැබේ.

කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම

ගතහැකි ක්‍රියාමාර්ග

- ප්‍රතිරක්ෂණයේ ශුද්ධ රඳවා තබා ගැනීම් සමාලෝචනය කිරීම
- මෝටර් හිමිකම් ඉල්ලීම් ක්‍රියාවලිය ප්‍රතිනිර්මාණය කිරීම
- මෝටර් නොවන හිමිකම් ඉල්ලීම් ක්‍රියාවලිය ප්‍රතිනිර්මාණය කිරීම
- අවදානම් ඉංජිනේරුවන්ගේ ක්‍රියාකාරිත්වය විමධ්‍යගත කිරීම / ප්‍රතිව්‍යුහගත කිරීම
- ප්‍රතිරක්ෂණ ක්‍රියාවලිය ප්‍රතිනිර්මාණය
- ලාභදායී ව්‍යාපාර සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක පෙළගැස්වීම

2020 සඳහා ප්‍රගතිය

රොබෝ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය පදනම් කරගත් ක්‍රියාවලි ස්වයංක්‍රීය විසඳුම් සලකා බැලීම

රට පුරා අපගේ විකුණුම් කණ්ඩායම් පොදු ද්වාරයක් හරහා සම්බන්ධ කිරීම සඳහා විකුණුම් බලකායේ ස්වයංක්‍රීය වේදිකාව ක්‍රියාත්මක කිරීම.

සේවා ප්‍රමිතීන් ශක්තිමත් කිරීම

ප්‍රාරක්ෂණය

1.අලුත් කිරීමේ නිවේදන මෙන්ම ඊට අදාළ වෙනත් ලියකියවිලි මෘදු පිටපත් ලෙස යවනු ලැබේ
2.ඊ සමුද්‍රීය පහසුකම භාවිතය වැඩි දියුණු කිරීම
3.සංචාරක රක්ෂණයේ අන්තර්ජාල මිලදී ගැනීමේ පහසුකම හඳුන්වා දීම
4.වැඩි දියුණු කළ සේවා ප්‍රමිතීන් හඳුන්වා දීම
5.පුහුණුව අවසන් වූ පසු අවදානම් ප්‍රාරක්ෂණ කිරීම ශාඛාවන්ට බලය ඇත

හිමිකම්

1.ලේඛන සහ ජායාරූප මත පදනම්ව කුඩා දේපල හිමිකම් පියවීම
2.පරිලෝකනය කරන ලද ලේඛන මත කුඩා අනතුරු වන්දි ගෙවීම්
3.රෝහල් විසින් සපයනු ලබන ලේඛනවල මෘදු පිටපත් මත පදනම්ව රෝහල් හිමිකම් මුදල් රහිතව පියවීම
4. චෙක්පත් වෙනුවට මාර්ගගත බැංකු මුදල් සම්ප්‍රේෂණ

2021 සඳහා ඉලක්ක

- උසස් සේවාවක් සැපයීම සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා කැපවූ විකුණුම් බලකායක් නිර්මාණය කිරීම.
- ඉහළ වටිනාකම්කින් යුත් වාහන සහිත ඉහළ පෙළේ ගනුදෙනුකරුවන් ඉලක්ක කර ගනිමින් මෝටර් රක්ෂන නිෂ්පාදන "මෝටර් ප්ලස් පිනැකල්" ලෙස නැවත නම් කිරීම සහ එම අංශයේ අවශ්‍යතා සපුරාලීම සඳහා අමතර ප්‍රතිලාභ ලබා දීම.
- මෝටර් රක්ෂන නිෂ්පාදන "මෝටර් ප්ලස් කොමර්ෂල්" ලෙස නැවත නම් කිරීම සහ එම අංශයේ අවශ්‍යතා සපුරාලීම සඳහා අමතර ප්‍රතිලාභ ලබා දීම.
- ගනුදෙනුකරුවන්ගේ වඩා හොඳින් අවශ්‍යතා සපුරාලීම සඳහා "බිස්නස් ක්ලබ්" සහ "ඩීවෙලිං හවුස්" නිෂ්පාදන යටතේ දැනට පවතින ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම.
- කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අපගේ සේවාදායකයින්ගේ අලුතින් ඇතිවූ අවශ්‍යතා සපුරාලීම සඳහා ශල්‍ය හා රෝහල්කරණ නිෂ්පාදන යටතේ ලබා දී ඇති ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම
- බෞද්ධ පූජ්‍ය පක්ෂයට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට විශේෂ ශල්‍ය හා රෝහල්ගත කිරීමේ අවශ්‍යතා සඳහා නිෂ්පාදනයක් දියත් කිරීම

පිටු අංක 47 සිට 54 දක්වා ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවේ වැඩි විස්තර දක්වා ඇත.

උපායමාර්ගික ප්‍රමුඛතා

ජීවිත ව්‍යාපාරය

විකිණුම්

ගතහැකි ක්‍රියාමාර්ග

- වේගවත් වර්ධනයක් සහතික කිරීම සඳහා රක්ෂණ ඔප්පු සංඛ්‍යාව අපේක්ෂිත ශුද්ධ මෙහෙයුම් ලාභය සහ මූල්‍ය ලාභය උත්පාදනය කිරීම
- රක්ෂණ ඔප්පු සංඛ්‍යාව සෘජු පදනමෙන් 10% ක් සහ නියෝජිත දත්ත ගබඩාවෙන් අවම වශයෙන් 5% ක් සහතික කිරීමෙන් ශුද්ධ මෙහෙයුම් ලාභය වැඩි කිරීම
- පළමු වාරිකය සහ රක්ෂණ ඔප්පු සංඛ්‍යාව අවම වශයෙන් මසකට 2.5 ක ඵලදායිතාවයක් පවත්වා ගැනීම සඳහා සක්‍රීය කිරීම් තුළින් මූල්‍ය ලාභය සහ ශුද්ධ මෙහෙයුම් ලාභ අරමුණු සාක්ෂාත් කර ගැනීම
- විකුණුම් වේගවත් කිරීම සඳහා නියෝජිතයින්ගේ සහභාගීත්වය වැඩි කිරීම

2020 සඳහා ප්‍රගතිය

මෙම වර්ෂය තුළ ඔප්පු 65089 ක් නිකුත් කර ඇති අතර ඉන් සියයට 76 ක්ම පරිත්‍යාග ජීවිත රක්ෂණ ඔප්පු වේ

උකස් ආරක්ෂණ රක්ෂණ ඔප්පු සියයට 110 කින් වැඩි කිරීම

රට පුරා අපගේ විකුණුම් කණ්ඩායම් පොදු ද්වාරයක් හරහා සම්බන්ධ කිරීම සඳහා විකුණුම් බලකායේ ස්වයංක්‍රීය වේදිකාව ක්‍රියාත්මක කිරීම.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ මහජන බැංකුව සමඟ උපායමාර්ගිකව හවුල් විය.

අලෙවිකරන

ගතහැකි ක්‍රියාමාර්ග

- සුවිශේෂී උපායමාර්ග අනුගමනය කිරීම තුළින් සියලු වෙළඳපොළ බණ්ඩයන් ඇතුලත් කිරීම
- පවත්නා නිෂ්පාදන අබණ්ඩව වැඩිදියුණු කිරීම තුළින් ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය දිනා ගැනීමෙන් ආදායම් ලැබීම් වේගවත් කිරීම
- නව වෙළඳපල බණ්ඩ වලට ඇතුලත් වීම සඳහා දිවයින පුරා විහිදීම වැඩි දියුණු කිරීම
- දෘශ්‍යතාව වැඩි දියුණු කිරීම සහ ඉහළ මට්ටමේ දැනුවත්භාවය ශක්තිමත් කිරීම සඳහා උපායමාර්ගික අලෙවිකරණ සහ ප්‍රවර්ධන ක්‍රියාකාරකම්
- සාපේක්ෂව අඩු ප්‍රවේශ වීමේ පිරිවැයක් සහිත නැගී එන වෙළඳපලවලට එළැඹීම

2020 සඳහා ප්‍රගතිය

කොවිඩ් -19 වසංගත තත්වයට එරෙහිව සටන් කිරීමේ ක්‍රියාවලියට සෘජුවම සම්බන්ධ වූවන් සඳහා "විරු අභිමන්" දියත් කිරීම.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පාරිභෝගික යෙදුමට නව විශේෂාංග එකතු කර ගනුදෙනුකරුවන්ට යෙදුම හරහා ගෙවීම් සිදු කළ හැකිය.

යාපනය, ගම්පහ සහ වාරියපොල ශාඛා වැඩි පහසුකම් සහිතව නැවත ස්ථානගත කරන ලද අතර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නව කවුන්ටරයන් ලංකා හොස්පිට්ල්ස් පීඑල්සී නාරාහේන්පිට සහ මහජන බැංකු ප්‍රධාන කාර්යාලයේ විවෘත කරන ලදී.

ප්‍රධාන විධායක නිලධාරීගේ ප්‍රධානත්වයෙන් යුත් විකුණුම්, අලෙවිකරණ, මෙහෙයුම් සහ ආයුගණක අංශවල ප්‍රධාන පුද්ගලයින්ගෙන් සමන්විත නිෂ්පාදන සංවර්ධන කමිටුව පවත්නා නිෂ්පාදනවල ක්‍රියාකාරිත්වය සමාලෝචනය කිරීම සහ පාරිභෝගික අවශ්‍යතා මත පදනම්ව පවත්නා නිෂ්පාදනවල සංශෝධන / වැඩිදියුණු කිරීම් තීරණය සිදුකරනු ලැබේ.

කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම

ගතහැකි ක්‍රියාමාර්ග

- ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සමඟ කෙලින්ම සම්බන්ධ වන කාර්ය සාධනය මත පදනම් වූ සංස්කෘතිය ශක්තිමත් කිරීම
- විකුණුම් බලකායේඵ ලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා පුහුණුව සඳහා ආයෝජනය කිරීම

2020 සඳහා ප්‍රගතිය

රට පුරා අපගේ විකුණුම් කණ්ඩායම් පොදු ද්වාරයක් හරහා සම්බන්ධ කිරීම සඳහා විකුණුම් බලකායේ ස්වයංක්‍රීය වේදිකාව ක්‍රියාත්මක කිරීම.

වසංගත ආශ්‍රිත සීමාවන් හේතුවෙන් නිතිපතා පුහුණු කටයුතු සිදු කළ නොහැකි බැවින් වෙබ් පාදක පුහුණුවීම් සිදු කරන ලදී.

වාරික ගෙවීම් විකල්ප - ජීවිත ගෙවීම් සඳහා eZ Cash සහ ජීවිත ගෙවීම් සඳහා mCash යනාදිය.

ශාඛා මගින් පද්ධතියට ලේඛන උඩුගත කිරීමේ පහසුකම

ඩිජිටල් යෝජනා ආකෘති පත්‍රය ක්‍රියාත්මක කිරීම

2021 සඳහා ඉලක්ක

- පහසුව වැඩි දියුණු කිරීම සහ සමස්ත පාරිභෝගික අත්දැකීම් වැඩි දියුණු කිරීම සඳහා ඩිජිටල් ගණුදෙනු පහසුකම් හඳුන්වා දීම (digital onboarding)

පිටු අංක 47 සිට 54 දක්වා ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවේ වැඩි විස්තර දක්වා ඇති

කලමනාකරණ විස්තර ප්‍රකාශය

46 - මෙහෙයුම් පරිසරය
47 - මූල්‍ය ප්‍රාග්ධනය
55 - නිෂ්පාදිත ප්‍රාග්ධනය
59 - බුද්ධිමය ප්‍රාග්ධනය
64 - මානව ප්‍රාග්ධනය
71 - සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
72 - ස්වභාවික ප්‍රාග්ධනය



මෙහෙයුම් පරිසරය

ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වය

කොවිඩ් වසංගතය මගින් ඇති කරන ලද දැවැන්ත ගෝලීය ආර්ථික පසුබෑමේ පසුබිම තුළ , ශ්‍රී ලංකා ආර්ථිකය ද 2020 දී සියයට 3.6 කින් සංකෝචනය විය . එය නිදහසින් පසු ඇති වූ දරුණුම ආර්ථික අවපාතය බව පෙනී යයි. කොවිඩ් 19 පැතිරීම වැළැක්වීම සඳහා දේශීයව සහ ජාත්‍යන්තරව පනවා ඇති සංචරණ සීමා කිරීම් සහ අනෙකුත් ව්‍යාප්තිය වැළැක්වීමේ ක්‍රියාමාර්ග, සියලුම අංශවල සැබෑ ආර්ථික කටයුතුවලට බාධා ඇති කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 දී සියලු අංශවල අව වර්ධනයක් (de-growth) වාර්තා විය. කෘෂිකාර්මික අංශය හා සේවා අංශය 2019 ට සාපේක්ෂව පිළිවෙලින් සියයට 2.4 සහ සියයට 1.5 කින් පහත වැටිණි. කර්මාන්ත අංශයේ තියුණුම සංකෝචනය දක්නට ලැබුණු අතර එය පෙර වසරට සාපේක්ෂව සියයට 6.9 ක අවවර්ධනයක් පෙන්නුම් කරයි.

මේ බලපෑම නිසා ආර්ථිකයේ සමස්ත ප්‍රමාණය 2020 දී ඇමරිකානු ඩොලර් බිලියන 80.7 ක් දක්වා අඩුවී ඇති අතර එය පෙර වසරේ ඇමරිකානු ඩොලර් බිලියන 84 විය. ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය 2020 දී ඇමරිකානු ඩොලර් 3682 ක් දක්වා අඩුවී ඇති අතර එය 2019 දී ඇමරිකානු ඩොලර් 3852 ක් විය.

රටේ විරැකියා අනුපාතය පෙර වසරේ සියයට 4.8 සිට 2020 දී සියයට 5.5 දක්වා ඉහළ ගියේය. තවද, කොවිඩ් -19 වසංගතය පැතිරී යාම වැළැක්වීම සඳහා පනවා ඇති දැඩි සංචරණ සීමාවන් මධ්‍යයේ, ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය 2019 දී සියයට 52.3සිට 2020 දී සියයට 50.6 දක්වා පහත වැටුණි.

මේ අතර, පිරිහිණු ඉල්ලුම් තත්ත්වයන්, සාර්ථකව පුරෝකථනය කළ උද්ධමන අපේක්ෂාවන් (well-anchored inflation expectations) සහ පාලන මිල රාමුවල පහළට සංශෝධනය කිරීම් ඉලක්කගත මට්ටම්න් උද්ධමනය පවත්වා ගැනීමට උපකාරී විය. 2019 අවසානයේ සියයට 4.8ට සාපේක්ෂව 2020 අවසන් වන විට වසරින් වසර වාර්ෂික උද්ධමනය සියයට 3.5 ක් විය.

තවත් කැපී පෙනෙන තත්ත්වයක් වූයේ , ශ්‍රී ලංකාවේ වෙළඳ හිඟය 2020 දී ඩොලර් මිලියන 6008 ක් දක්වා ඇමරිකානු ඩොලර් මිලියන 1989 කින් සැලකිය යුතු ලෙස පහත වැටීමයි. ප්‍රධාන වශයෙන් වසංගතය ආරම්භයේ දී රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය අනුව 2020 අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක වන අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම මෙයට හේතු විය.

මූලාශ්‍රය - ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව 2020

රක්ෂණ අංශය

2020 දී ශ්‍රී ලංකාවේ රක්ෂණ අංශය රක්ෂණ සමාගම් 27 කින් සමන්විත විය - එනම් දිගුකාලීන රක්ෂණ සමාගම් 13 ක්, සාමාන්‍ය රක්ෂණ සමාගම් 12 ක් සහ දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවලට සම්බන්ධ සමාගම් 2 ක් වී අතර විය .

රක්ෂණ අංශයේ සමස්ත වත්කම් වසරින් වසර 14.6% කින් වර්ධනය වී. 2020 අවසන් වන විට රු. බිලියන 790.1 ක් විය. දිගුකාලීන රක්ෂණ උප අංශයේ වත්කම් පදනම 16.1% කින් ඉහළ ගොස් ඇති අතර සාමාන්‍ය රක්ෂණ උප අංශයේ වත්කම් පදනම 2019 ට සාපේක්ෂව 11.0% කින් ඉහළ ගොස් තිබේ.

2019 අවසන් වන විට රු. බිලියන 190.2 වූ රක්ෂණ අංශයේ දළ ලිඛිත වාරිකය 9.7% කින් වර්ධනය වී 2020 අවසන් වන විට රු. බිලියන 208.6 සිට ක් විය. දිගු කාලීන රක්ෂණ උප අංශයේ දළ ලිඛිත වාරිකය 16.0% කින් ඉහළ ගොස් ඇති අතර සාමාන්‍ය රක්ෂණ උප අංශයේ දළ ලිඛිත වාරිකය මෙම කාලය තුළ 4.2% කින් ඉහළ ගොස් තිබේ. මෝටර් රක්ෂණ අංශය ප්‍රමුඛත්වය දරන සාමාන්‍ය රක්ෂණ උප අංශය 2020 වර්ෂයේදීද රක්ෂණ අංශයේ දළ ලිඛිත වාරිකයේ ප්‍රධාන දායකයා ලෙස රැඳී සිටියේය.

සමස්තයක් වශයෙන්, රක්ෂණ අංශය 2020 දී වසරින් වසර 25.9% ක ලාභය ඉහළයාමක් වාර්තා කර ඇති අතර එය බොහෝ දුරට සාමාන්‍ය රක්ෂණ උප අංශය නිසා ඇති වූවකි. සාමාන්‍ය රක්ෂණ උප අංශය 2020 දී 104.9% ක දැවැන්ත ලාභ වර්ධනයක් වාර්තා කළ අතර එය දිගු කාලීන රක්ෂණ උප අංශයේ වසරින් වසර ලාභයේ 19.1% ක අඩුවීම මඟහරවා ගැනීමට තරම් විය. කොවිඩ්-19 වෛරසය පැතිරීම පාලනය කිරීම සඳහා රජය විසින් පනවා ඇති අගුලු දැමීම් හේතුවෙන් හිමිකම් ඉල්ලීම් පහත වැටීම සාමාන්‍ය රක්ෂණ උප අංශයේ ලාභදායීතාව ඉහළ නැංවීමට ප්‍රධාන හේතුව ලෙස සැලකේ. 2020 දී සාමාන්‍ය රක්ෂණ උප අංශයේ වාර්තා වූ හිමිකම් 2019 ට සාපේක්ෂව 27.1% කින් අඩු වී ඇත. කෙසේ වෙතත්, දිගු කාලීන රක්ෂණ උප අංශයේ හිමිකම් පසුගිය වසරට සාපේක්ෂව 2020 අවසන් වන විට 7.5% ක වර්ධනයක් වාර්තා කර ඇත.

රක්ෂණ අංශයේ දළ ලිඛිත වාරිකය



මූලාශ්‍රය - ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව 2020

මූල්‍ය ප්‍රාග්ධනය

අභියෝග මධ්‍යයේ වුවද, අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය නොතකා සමාගමේ මූල්‍ය ප්‍රාග්ධන සංචිතය ඥානාන්විතව කළමනාකරණය කිරීමෙන් අපගේ ප්‍රධාන කොටස් හිමියන්ගේ සහ ඔප්පු හිමියන්ගේ බැඳියාව (interest) ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට හැකි වී තිබේ.



මූල්‍ය ප්‍රාග්ධනය

දළ විශ්ලේෂණය

2020 වර්ෂය යනු ගෝලීය ආර්ථික හා මූල්‍ය වෙලඳපොලවල අස්ථාවරත්වය සමඟ පෙර නොවූ විරූ සමාජ විදරණයයන්ගෙන් පිරි වසරකි. 2020 මාර්තු 11 වන දින ලෝක සෞඛ්‍ය සංවිධානය කොවිඩ් 19 සම්බන්ධව වසංගතයක් බවට ප්‍රකාශයට පත් කළේය. සෑම රටකින්ම පාහේ අඩු පොලී අනුපාත වල බලපෑම හැම අතින්ම දැණුනු පරිසරයක ලාභ අරමුණු කරගත් සංවිධානවල මූල්‍ය ප්‍රාග්ධන සංචිතය ආරක්ෂා කිරීමේ සටන 2020 මුදල් වර්ෂය තුළ දී මුහුණ දුන් වඩාත්ම අභියෝගාත්මක කාර්යය විය. රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් ගත් කල, ලොව පුරා දැන් සිදුවෙමින් පවතින විශාල සාකච්ඡා වන්නේ රක්ෂණ සමාගම්වල නුබුන්වත් අනුපාතය කෙරෙහි මූල්‍ය ප්‍රාග්ධන වෙළඳපොළවල් ඇති කරන බලපෑමයි. අද වන විට ගෝලීය රක්ෂණ සමාගම්වල කළමනාකරණය යටතේ වත්කම් ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 20 කට වඩා කළමනාකරණය කරන අතර එම වත්කම්වලින් 50% කට වඩා වැඩි ප්‍රමාණයක් රජයේ බැඳුම්කර වේ. වත්කම් පාර්ශ්වයෙන් නුබුන්වත් අනුපාතය අඩුවීම කෙරෙහි බලපාන ප්‍රධාන ප්‍රේරකයන් වන්නේ, අඩු පොලී අනුපාත, බැඳුම්කර අවශේණි කිරීම, ණය සහ ණය පැතිරීමේ අවදානම සහ කොටස් වෙළඳපල අස්ථාවරත්වය වේ.

වර්ධන වේගය පවත්වා ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් බදු අඩුකිරීම් ඇතුළු ඉලක්කගත ක්‍රියාමාර්ගවලින් ව්‍යාපාරවලට සහාය ලබා දීම සහ ආර්ථිකයන් වඩාත් හොඳින් කළමනාකරණය කිරීම සඳහා තවදුරටත් මූල්‍යමය සහාය ලබා දීමෙන් පුද්ගලික ආදායමට මූල්‍යමය බලපෑම අවම කිරීමට උපකාරී වන ක්‍රියාමාර්ග ගනු ලබයි. වාරික මුදල් ලැබීම් අඩුවීම සහ මූල්‍ය වත්කම්වල වටිනාකම පිරිහීම ඇතුළු කොවිඩ්-19 වසංගතයෙන් පැන නගින අහිතකර බලපෑම් රටේ රක්ෂණ කර්මාන්තයටද අත්විඳීමට සිදු විය.

අභියෝග මධ්‍යයේ වුවද, අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය නොතකා සමාගමේ මූල්‍ය ප්‍රාග්ධන සංචිතය ඥානාන්විතව කළමනාකරණය කිරීමෙන් අපගේ ප්‍රධාන කොටස් හිමියන්ගේ සහ ඔප්පු හිමියන්ගේ බැඳියාව ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට හැකි වී තිබේ. කෙසේවෙතත්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 2020 මූල්‍ය වර්ෂයේ ශුද්ධ ලාභය/යටිපෙළේ (bottomline) මූල්‍ය කාර්ය සාධනය අනුව අවපාතයකට මුහුණ දී තිබේ.

මූල්‍ය ප්‍රාග්ධන සංචිතයේ තිරසාර වර්ධනය යනු ව්‍යාපාරයේ දියුණුව සඳහා දායක වන සමාගමේ අවසාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා වඩාත් තීරණාත්මක අංගයකි. තවද ඒමඟින් පාර්ශවකරුවන්ගේ දායකත්වය සදාචාරාත්මක හා විචක්ෂණශීලී ලෙස ආරක්ෂා කරයි.

කෙසේවෙතත්, 2020 මුදල් වර්ෂයේදී සමාගමේ දළ ලාභය් (topline) මූල්‍ය කාර්ය සාධනය පෙන්නුම් කරන්නේ, සිය මූල්‍ය විනය, මූල්‍ය ස්ථායිතාව, ද්‍රවශීලතාවය සහ ලාභදායීතාවය පවත්වා ගෙන යන අතරම නව ව්‍යාපාර වර්ධනය කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරමින්, ආකර්ශනීය අවස්ථා ඇති තැන්වල ප්‍රාග්ධනය ආයෝජනය කිරීම තුළින් තරඟකාරී වාසි ලබා ගනිමින්, නව සාමාන්‍යයට ගැලපෙන පරිදි සිය ව්‍යාපාර උපාය මාර්ග නැවත සැලසුම් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විශාල උත්සාහයක් යෙදූ ඇති බවයි.

මූල්‍ය ප්‍රතිඵල

2020 මුදල් වර්ෂයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ආදායම සහ දළ ලිඛිත වාරික (GWP) වසරින් වසර 8.24% ක සහ 16.65% ක වර්ධනයක් වාර්තා කරමින් යහපත් ඉහළ පෙළක් අත්කර ගෙන ඇති අතර, අවසන එය රු. මිලියන 52,614 ක් සහ රු මිලියන 39,421 බවට පත් ව ඇත. කෙසේ වෙතත්, බදු ගෙවීමෙන් පසු මෙහෙයුම් ලාභය සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා රුපියල් මිලියන 5,788 ක් වූ අතර එය වසරින් වසර 17.65% ක අඩුවීමක් පෙන්නුම් කරයි. අපගේ මූලික ආදායම් මාර්ගයක් වන මූල්‍ය ආයෝජන වලින් ලැබෙන ආයෝජන ආදායම වසරින් වසර 6.57% කින් අඩුවී රුපියල් මිලියන 16,511 (2019 - රු .මිලියන17,672) දක්වා අවසන් වන අතර සමාගමේ මුළු වත්කම් රු. මිලියන 235,630 බවට පත් විය. පසුගිය වසර 5 තුළ සමාගම ඒකාබද්ධ දළ වාරික 9.31% ක සමුච්චිත සාමාන්‍ය වර්ධන අනුපාතයක් (CAGR) ලබා ගෙන ඇත. බදු ස්වරූපයෙන් ශ්‍රී ලංකා රජයට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ දායකත්වය රු. මිලියන 2,388 කි.

ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ස්ථාවරත්වය

රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ (RII) 26 (1) වගන්තියට අනුව, ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ද්විත්වය සඳහා රක්ෂණකරුවන් විසින් ස්ථිර නුබුන්වත් / අවදානම පාදක ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතික පවත්වාගෙන යා යුතු වේ

අවශ්‍ය කරන්නාවූ අවදානම පාදක ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය අනුගාමී වසර කිහිපයක් තිස්සේ අවශ්‍ය මට්ටමට ද වඩා ඉහළ මට්ටමක පවත්වා ගැනීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමත් වී තිබේ. ඒ අනුව, ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා අවදානම පාදක ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය 2019 දී 436% ට සාපේක්ෂව 2020 වර්ෂයේ දී 459% ක් වාර්තා කර ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා අවදානම් පාදක ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය 2019 දී 212% ට සාපේක්ෂව 2020 වර්ෂයේ දී 223% ක් විය.

ඒකාබද්ධ ව්‍යාපාර කාර්යසාධනය

මූල්‍ය වර්ෂය සඳහා ඒකාබද්ධ දළ ලිඛිත වාරික රු. මිලියන 39,421 (2019 - රු. මිලියන 33,794) වසරින් වසර 16.65% ක වර්ධන වේගයකින් නියෝජනය වන අතර වසර 5 ක සමුච්චිත සාමාන්‍ය වර්ධන අනුපාතය 9.31% කි. මූල්‍ය ආයෝජන වලින් ලැබෙන ආයෝජන ආදායම 2020 මුදල් වර්ෂයේදී 6.57% කින් අඩුවී ඇති අතර එහි වටිනාකම රුපියල් මිලියන 16,511 (2019 - රු. මිලියන 17,672) ක් වන අතර එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ අඩු පොලී අනුපාත පරිසරය සහ 2020 මුදල් වර්ෂය තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අනුබද්ධ සමාගම් වලින් ලැබුණු ලාභාංශ ප්‍රමාණයයි. සමාගමේ මුළු වත්කම් 11.30% කින් වර්ධනය වී ඇති අතර එහි වටිනාකම සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ රුපියල් මිලියන 235,630 (2019 - රු. මිලියන 211,700). සමාගමේ බදු ගෙවීමට පෙර ලාභය 2.84% කින් අඩුවී රු. මිලියන 7,971 (2019-රු .8,205). බදු ගෙවීමෙන් පසු ලාභය 17.65% කින් පිරිහී ඇති අතර එය රු. 5,788 (2019 - රු. මිලියන 7,028) ශුද්ධ ලාභයක්/ ශුද්ධ ආදායම වාර්තා කරයි. පසුගිය වසර හා සසඳන විට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් 9.2% ක කොටස් මත ප්‍රතිලාභයක් (ROE) පවත්වා ගෙන යනු ලැබේ.

ඒකාබද්ධ දළ ලිඛිත වාරිකය (GWP)

(රු. මිලියන)



මූල්‍ය ආයෝජන වලින් ලැබෙන ආයෝජන ආදායම

(රු. මිලියන)



බදු ගෙවීමෙන් පසු ලාභය (PAT)

(රු. මිලියන)



මුළු වත්කම්

(රු. මිලියන)



මූල්‍ය ප්‍රාග්ධනය

ජීවිත රක්ෂණ ව්‍යාපාරය

කොවිඩ් 19 වසංගතයෙන් හා රටේ අඩාල වූ ආර්ථික කාර්ය සාධනයෙන් ඇති වූ අහිතකර ආර්ථික බලපෑම් තිබියදීත්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව තවත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් රක්ෂණ කර්මාන්තයේ මෙතෙක් ලබා දී ඇති විශාලතම ප්‍රසාද නිකුතුව වන රු. මිලියන 8,694 ක් වන රක්ෂණ ඔප්පු හිමියන් සඳහා ප්‍රකාශ කළ අතර , එය ආයතනයේම කලින් මූල්‍ය වර්ෂය සඳහා වාර්තාව වූ රු. මිලියන 8,244 පසු කර යාමක් විය.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකය (GWP) රු. මිලියන 19,257 ක් (2019 - රු. මිලියන 14,820) වනම් වසරින් වසර 29.95% ක වර්ධනයක් වාර්තා කරමින් වසර 05 ක 12.80% සමුච්චිත සාමාන්‍ය වර්ධන අනුපාතයක් අත්පත් කරගත්තේය. ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ මූල්‍ය ආයෝජන වලින් ලැබෙන ආයෝජන ආදායම 3.48% කින් පමණක් ඉහළ ගොස් ඇති අතර එහි වටිනාකම පෙර වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 13,910 ක් (2019- රු. මිලියන 13,442). ජීවිත අරමුදල රු. මිලියන 17,246 සිට රු. මිලියන 134,013 න් අවසන් වී ඇති අතර (2019-රු. මිලියන 116,766), ඒ අනුව 2020 මුදල් වර්ෂයේදී 14.77% ක වසරින් වසර වර්ධනයක් වාර්තා කරයි. බදු ගෙවීමෙන් පසු ලාභය (ජීවිත අරමුදලට මාරු කිරීමට පෙර) රු. 18,263 ක් (2019 - රු. 14,031) වීනම් වසරින් වසර 30.17% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

දළ ලිඛිත වාරිකය (GWP)

(රු. මිලියන)



බදු ගෙවීමෙන් පසු ලාභය (ජීවිත අරමුදලට මාරු කිරීමට පෙර)

(රු. මිලියන)



මූල්‍ය ආයෝජන වලින් ලැබෙන ආයෝජන ආදායම

(රු. මිලියන)



සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

ශ්‍රී ලංකාවේ ජාතික රක්ෂණ සේවා සැපයුම්කරු සහ රටේ රක්ෂණ පුරෝගාමියා ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව යළිත් වරක් පාසල් සිසුන්ගේ ජාතික රක්ෂකයා බවට පත්වූයේ 2020 මූල්‍ය වර්ෂයේදී 'සුරක්ෂා' ළමා රක්ෂණ ඔප්පුව සඳහා පහසුකම් සපයන්නාගේ තනතුර දිනා ගැනීමෙනි. මෙය සියලුම පාසල් යන සිසුන්ට අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නොමිලේ ලබා දේ.

සාමාන්‍ය මූල්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ඉහළ පෙළ 2020 මූල්‍ය වර්ෂය තුළ මධ්‍යස්ථව වර්ධනය වී ඇති අතර, දළ වාරික ආදායම වසරින් වසර 6.27% ක වර්ධනයක් වාර්තා කරමින් රු. මිලියන 20,163 කට පත්ව ඇත (2019- රු. මිලියන 18,974). පසුගිය වසර 5 ක කාලය තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ වාරික ආදායම, 6.42% ක සමුච්චිත සාමාන්‍ය වර්ධන අනුපාතයක් සමඟ 2016 මුදල් වර්ෂයේදී රුපියල් මිලියන 15,720 සිට 2020 මූල්‍ය වර්ෂයේදී රුපියල් මිලියන 20,163 දක්වා වර්ධනය වී ඇත. සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය මූල්‍ය ආයෝජන වලින් රුපියල් මිලියන 2,601 (2019- රු. 4,228) ක ආයෝජන ආදායමක් වාර්තා කර ඇති අතර එය වසරින් වසර 38.48% ක අඩුවීමකි. මෙයට හේතුව වන්නේ පරිපාලිත සමාගම් (ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් සහ ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී) වෙතින් ලැබෙන ලාභාංශ අඩුවීම සහ කොටස් වෙළඳපොලේ සමස්ත අව ක්‍රියාකාරිත්වය හේතුවෙන් විශේෂයෙන් මූල්‍ය ආදායම අතින් ප්‍රතිආයෝජන අඩු ප්‍රතිලාභ දැරීමයි. ආයෝජන ආදායම පහත වැටීමෙන් ඇති වූ බලපෑම, බදු ගෙවීමෙන් පසු ලාභය වසරින් වසර 21.78% කින් පහත වැටීමෙන්, 2020 මුදල් වර්ෂයේදී (2019- රු. 4,658) රුපියල් මිලියන 3,643 දක්වා ළඟා වීමෙන් පිළිඹිමු වී ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අඛණ්ඩව වසර ගණනාවක් මෝටර් රථ රක්ෂණයේ වෙළඳපොළ ප්‍රමුඛයා වූ අතර පසුගිය මූල්‍ය වර්ෂයේදී රුපියල් මිලියන 12,908 ට සාපේක්ෂව 2020 මූල්‍ය වර්ෂයේ දළ ආදායමේ වාරිකයේ වටිනාකම රුපියල් මිලියන 11,806 ක් වූ අතර එය මෝටර් රථ රක්ෂණ දළ වාරික ආදායමේ වසරින් වසර 8.54% ක පහත වැටීමකි. ඒ 2020 මුදල් වර්ෂය තුළ රට තුළ පැවති අඩු ආර්ථික හා ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙසය

බදු ගෙවීමෙන් පසු ලාභය (PAT)

(රු. මිලියන)



මෝටර් රථ රක්ෂණය (දළ වාරික ආදායම)

(රු. මිලියන)



දළ වාරික ආදායම (GWP)

(රු. මිලියන)



මූල්‍ය ආයෝජන වලින් ලැබෙන ආයෝජන ආදායම

(රු. මිලියන)



මූල්‍ය ප්‍රාග්ධනය

ආයෝජන සමාලෝචනය

ආයෝජන උපායමාර්ගය

2020 සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආයෝජන උපාය මාර්ගයට ඇතුළත් වූයේ කොවිඩ් 19 හේතුවෙන් පැවති අවිනිශ්චිතතාවයන් හේතුවෙන් ඇතිවූ අවදානම් කරමින් කොටස් වෙළඳාම සඳහා ඇති අවස්ථාවන් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම වේ. ආර්ථිකයේ කෙටිකාලීන කම්පනවලට ඔරොත්තු දිය හැකි තිරසාර වර්ධනයක් ඇති කරගැනීම සහතික කිරීටම ද එම කාලය තුළ මූලික අවධානයක් යොමු කරන ලදී.

ආයෝජන කළඹ විවක්ෂණශීලී හා කාලෝචිත ලෙස විවිධාංගීකරණය කිරීම තුළින් කොවිඩ් 19 හි බලපෑම හේතුවෙන් ඇති වූ අක්‍රමවත් අවදානම අවම කරන ලදී. මෙමඟින් ආයෝජන සුරක්ෂිත වූ අතර කර්මාන්තයේ අනෙකුත් සමාගම් අතර තරඟකාරීව සිටීමටත් නියාමන රාමුව තුළ ආයතනයේ පහළ මට්ටම වැඩි දියුණු කිරීමටත් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලැබුණි. සෑම ආයෝජනයක්ම දැඩි පරීක්ෂණ ක්‍රියාවලියකට භාජනය කරන ලද අතර, කර්මාන්තයේ හොඳම භාවිතයන්ට අනුගත වෙමින්, නිසි ප්‍රවේශමෙන් හා විවක්ෂණශීලීව කටයුතු කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ආයෝජන කමිටුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආයෝජන තීරණ මෙහෙයවයි. ආයෝජන කමිටුවේ වගකීම් අතරට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආයෝජන කළඹ කළමනාකරණය කිරීම, වත්කම් වෙන් කිරීම සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම, වත්කම් හා වගකීම් ඵලදායී ලෙස ගැලපීම සහ උපක්‍රමික ආයෝජන අවස්ථා උපයෝගී කර ගැනීම ඇතුළත් වේ. කාරක සභාව වරලත් මූල්‍ය විශ්ලේෂක ආයතනයේ වත්කම් කළමනාකරුවන්ගේ නීති සංග්‍රහයට අනුකූල වේ. විවිධ කුසලතා හා විශේෂඥතාවයන්ගෙන් යුත් වෘත්තිකයන්ගෙන් මෙම ආයතනය සමන්විත වේ. සියළුම පාර්ශවකරුවන්ගේ යහපත උදෙසා ආයෝජන සිදු කිරීම සහතික කරයි.

වත්කම් වෙන් කිරීම

ජීවිත අරමුදල:

2020 දෙසැම්බර් 31 දිනට අරමුදලේ සංයුතිය

ජීවිත අරමුදල කළඹ

31/12/2020 දිනට



ආයෝජනය කළ හැකි වත්කම්වල වර්ධනය:

(රු. බිලියන)



වත්කම් වෙන් කිරීම
සාමාන්‍ය අරමුදල:
2020 දෙසැම්බර් 31 දිනට අරමුදලේ සංයුතිය

සාමාන්‍ය අරමුදල කළඹ
31/12/2020 දිනට



ආයෝජන කාර්ය සාධනය
කාලෝචිත ආයෝජන තීරණ මගින් ජීවිත හා සාමාන්‍ය අරමුදල් සඳහා 2020 දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ප්‍රශංසනීය ප්‍රතිලාභ අත්කර ගත්තේය. කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් වර්ෂය තුළ පැවති සියලු අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ මෙය සිදුවිය.

සමාගම වර්ෂය තුළ මුළු ආයෝජන ආදායම රුපියල් බිලියන 16.6 ක් ලෙස සටහන් කර තිබේ.

ජීවිත අරමුදල
සාමාන්‍ය අරමුදල

ආයෝජන ආදායම
(රු. මිලියන)



ආයෝජනය කළ හැකි වත්කම්වල වර්ධනය:
(රු. බිලියන)



ආයෝජන ආදායම
(රු. මිලියන)



මූල්‍ය ප්‍රාග්ධනය

වත්කම් - වගකීම් ගැලපුම්

ජීවිත අරමුදල

ජීවිත අරමුදල දිගුකාලීන වගකීම් වලින් සමන්විත වන අතර එය පරිපූර්ණ ආරක්ෂාවක් සඳහා දිගු කාලීන වත්කම් සමඟ සැසඳිය යුතුය. කෙසේ වෙතත්, ස්ථාවර ආදායම් වෙලඳපොලවල එවැනි මෙවලම් හිඟය සැලකිල්ලට ගෙන දිගු කාලීන මෙවලම් සුදුසු ආයෝජන අවස්ථා සොයා ගැනීම අභියෝගයක් ලෙස පවතී. එබැවින් නොවැළැක්විය හැකි ලෙස වත්කම් හා වගකීම් පරිණත නොගැලපීම දැනුවත්ව කර්මාන්තය පුරා සිදු කරනු ලබයි. පොලී අනුපාත චලනයන් පිළිබඳ අපේක්ෂාවන් මත පදනම්ව වත්කම්වල කල්පිරීම සකස් කරනු ලැබේ.

2020 දී පොලී අනුපාත තියුනු ලෙස පහත වැටීමට පෙර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සාපේක්ෂව ඉහළ ප්‍රතිලාභයක් සහිත රජයේ සහ ආයතනික ණය සඳහා යොමු වී සිටියේය. පොලී අනුපාත පහත වැටී ආකර්ශනීය ප්‍රතිලාභයක් මත නැවත ආයෝජනය කිරීම අභියෝගයක් වූ විට, කොටස් වෙළඳාම මූලික අවධානය බවට පත් වූ අතර සැලකිය යුතු ප්‍රාග්ධනයක් ලබා ගැනීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමත් විය. වර්ෂය අවසානයේ ලාභ. වෙලඳපොලවල් ගැඹුරින් විශ්ලේෂණය කිරීමෙන් පසු තීරණාත්මක තීරණ ගැනීම, නියමිත වේලාවට කොටස් වෙලඳපොලවලට ඇතුළු වීමට හා පිටවීමට ප්‍රධාන හේතුව විය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් 2021 දී අඛණ්ඩව ආයෝජන හා වෙළඳ උපාය මාර්ග අනුගමනය කරනු ඇති අතර වර්ෂය තුළ ඇතිවිය හැකි ඕනෑම අවස්ථාවක් ප්‍රයෝජනයට ගනී.

සාමාන්‍ය අරමුදල:

සාමාන්‍ය අරමුදලේ වගකීම්වල කෙටි කාලීන ස්වභාවය වත්කම් හා වගකීම් කල් පිරීම් ගැලපීම පහසු කරයි. කෙසේ වෙතත්, අපේක්ෂිත පොලී අනුපාත වෙනස්වීම් වලින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා නොගැලපීම් දැනුවත්ව සිදු කරනු ලැබේ.

(රු. '000)	2020	2019	2018	2017	2016
පිරිවැයට					
ලයිස්තුගත අනුබද්ධ ආයතන	**2,764,196**	2,764,196	2,925,567	2,925,567	2,925,567
ලයිස්තුගත නොවූ අනුබද්ධ ආයතන	**18,059,696**	18,059,696	18,160,337	18,160,337	18,160,337
ශුද්ධ වත්කම් වටිනාකමට					
ආශ්‍රිත සමාගම්	**164,125**	148,509	143,646	143,646	138,448
විකිණීම සඳහා පවතින					
ලයිස්තුගත කොටස	**19,215,501**	23,765,732	27,221,446	32,460,737	30,914,016
ලයිස්තුගත නොවූ කොටස්	**11,267**	24,411	35,495	48,891	47,972
ඒකක භාර	**1,590,984**	2,029,106	4,822,078	4,593,369	964,320
ලයිස්තුගත ණයකර	**33,376,199**	32,360,621	23,867,197	21,017,947	19,566,029
භාණ්ඩාගාර බිල්පත	**-**	-	-	-	-
භාණ්ඩාගාර බැදුම්කර	**1,226,488**	1,776,535	2,534,387	4,659,451	4,062,844
ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගය					
ලයිස්තුගත කොටස	**12,454,354**	5,647,092	3,628,205	4,050,081	5,320,606
ඒකක භාර	**2,892,326**	-	-	-	-
කල් පිරීම සඳහා පවතින					
භාණ්ඩාගාර බිල්පත	**-**	-	-		-
භාණ්ඩාගාර බැදුම්කර	**51,885,786**	53,113,519	54,622,918	55,020,955	49,313,553
ණය සහ ලැබිය හැක					
ලයිස්තුගත නොවූ ණයකර	**22,310,237**	5,623,014	500,534	500,534	500,534
කාල තැම්පත	**14,086,589**	27,064,616	22,113,279	14,708,677	12,336,280
සංවර්ධන බැදුම්කර	**11,257,602**	10,749,452	10,456,279	7,539,703	7,158,558
වාණිජ පත	**-**	-	256,462	-	-
භාර සහතික	**-**	-	-		-
ප්‍රතිවර්ථන (Reverse Repos)	**14,450,605**	2,062,637	1,009,160	1,771,895	1,035,996
එකතුව	**205,745,955**	185,185,067	172,296,990	167,601,790	152,445,060

නිෂ්පාදිත ප්‍රාග්ධනය

මෑත වසරවලදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සිය ඩිජිටල් තාක්ෂණය ක්‍රමානුකූලව පුළුල් කරමින් සිටින අතර, පළමුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පාරිභෝගික ද්වාරය ආයතනික වෙබ් අඩවියට හඳුන්වා දීමත් සමඟ 2019 දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජංගම යෙදුම දියත් කිරීමත් සිදු විය.



නිෂ්පාදිත ප්‍රාග්ධනය

අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය සහ එය අපගේ පාර්ශවකරුවන් සඳහා වටිනාකමක් නිර්මාණය කරන්නේ කෙසේද

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නිෂ්පාදන ප්‍රාග්ධනය අපගේ කාර්යාල සහ ශාඛා මෙන්ම ශ්‍රී ලංකාව පුරා සිටින ගනුදෙනුකරුවන්ට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නිෂ්පාදන හා සේවාවන් වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසන ඩිජිටල් නාලිකා සහ වෙනත් ජාලයන් ඇතුළු ස්ථාවර වත්කම් වලින් සමන්විත වේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව දිවයින පුරා පිහිටි ශාඛා පවත්වාගෙන යයි. අපගේ ශාඛා 140 ක් සහ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 18 කින් යුත් අපගේ ජාලය ඔස්සේ, දිවයිනේ පළාත් 9 ම සහ දිස්ත්‍රික්ක 25 තුළම අප ශක්තිමත් ලෙස ව්‍යාප්තව ඇත්තෙමු. පාරිභෝගිකයින්ට ඔවුන්ගේ රක්ෂණ අවශ්‍යතා සඳහා සහාය වීමට අත්‍යවශ්‍ය සහයෝගයක් සපයන අපගේ පැය 24 පුරා ඇමතුම් මධ්‍යස්ථානයට, විශේෂිත දුරකථන මාර්ගයක් ඔස්සේ ප්‍රවේශ විය හැකි අතර අපගේ ආයතනික වෙබ් අඩවිය (www.srilankainsurance.com) සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජංගම යෙදුම සමඟ පැය 24 පුරාම නිෂ්පාදන සහ සේවාවන් රාශියකට ප්‍රවේශ වීමට අවස්ථාව ලබා දේ. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සමස්ත වෙළඳපොළ පිවිසුම ප්‍රවර්ධනය සඳහා තවදුරටත් දායක වන පහසු ජංගම ගෙවීම් විසඳුම් රාශියක් සමඟ අනෙකුත් දෙමුහුන් නාලිකා ලබා දීම තුළින් අපගේ හවුල්කාර ජාලයන් අපගේ නිෂ්පාදන ප්‍රාග්ධනය තවදුරටත් වැඩි දියුණු කරයි.





(ඉහත සිතියමට නියෝජිත ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථානය සහ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ඇතුළත් නොවන බව කරුණාවෙන් සලකන්න)

උතුරු මැද 9	අනුරාධපුර, හොරොව්පතාන, පදවිපරාක්‍රමපුර, කැකිරාව, හිඟුරක්ගොඩ, දෙහිඅත්තකන්ඩිය, කදූරුවෙල, අරලගන්විල, බකමූන
ඌව 10	බදුල්ල, වැලිමඩ, බණ්ඩාරවෙල, මහියංගනය, නුවර එළිය, හැටන්, වැල්ලවාය, මොණරාගල, අම්පාර, බිබිලේ
නැගෙනහිර 5	මඩකලපුව, කල්මුණේ , ත්‍රිකුණාමලය, අක්කරයිපත්තු , කන්තලේ
දකුණු 1 -12	ගාල්ල, අම්බලන්ගොඩ, ඇල්පිටිය, තල්ගස්වල, උඩුගම, බද්දේගම, කළුතර, හොරණ, මතුගම, බණ්ඩාරගම, පානදුර, අළුත්ගම
දකුණු 2 -12	හම්බන්තොට, බෙලිඅත්ත, අම්බලන්තොට, තිස්සමහාරාමය, තංගල්ල, මාතර, හක්මන, නෙලුව, අකුරැස්ස, වැලිගම, දික්වැල්ල, දෙනියාය
රත්නපුර 9	රත්නපුර, අවිස්සාවේල්ල, බලන්ගොඩ, කහවත්ත, ඇඹිලිපිටිය, කලවාන, ඇහැලියගොඩ, පල්ලෙබැද්ද, රුවන්වැල්ල,
වයඹ 1 -10	කුරුණෑගල, කුරුණගල නගරය, මැල්සිරිපුර, නාරම්මල, රිදීගම, රඹුක්කන, වරකාපොල, හිරිඳල්ල, පොල්ගහවෙල, කුලියාපිටිය
වයඹ 2-10	හලාවත, පුත්තලම, නිකවැරටිය, මහව, දඹුල්ල, ගලේවෙල, ගල්ගමුව, වාරියපොල, තඹුත්තේගම, ආනමඩුව
බස්නාහිර 1-8	පිටකෝට්ටේ, බත්තරමුල්ල, නුගේගොඩ, කිරුළපණ, නගර කාර්යාලය, රත්මලාන, දෙහිවල, මොරටුව
බස්නාහිර 2-10	කඩවත, කිරිබත්ගොඩ, කොළඹ නාගරික -1,2,3,4,6,7,10,11
බස්නාහිර 3-8	හෝමාගම, කොට්ටාව, මාලඹේ, පිලියන්දල, අතුරුගිරිය, කඩුවෙල, මහරගම, ඉංගිරිය
බස්නාහිර 4-7	බොරැල්ල, පිටකොටුව, කොටහේන, බම්බලපිටිය, වත්තල, රාගම, කොටිකාවත්ත
ඉහළ බස්නාහිර 11	ගම්පහ, වේයන්ගොඩ, මීනුවන්ගොඩ, නිට්ටඹුව, පස්යාල, මීගමුව, කදාන, වෙන්නප්පුව, ජා ඇල, කෙච්චිකඩේ, මාරවිල
මධ්‍යම 12	මහනුවර, දිගන, මහනුවර නගරය, මාතලේ, ගම්පොළ, කටුගස්තොට, මාවතගම, කෑගල්ල, පිලිමතලාව, රිකිල්ලගස්කඩ, මාවනැල්ල , නාවලපිටිය
උතුරු 8	යාපනය, කිලිනොච්චිය, නෙල්ලියඩි, මුලතිව්, මන්නාරම, චෙන්කනායි, වවුනියා, චවාකච්චේරි

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නිෂ්පාදිත ප්‍රාග්ධනය එහි වටිනාකම් නිර්මාණය කිරීමේ අරමුණු සපුරාලන බවට අප විසින් සහතික කරන්නේ කෙසේද යන්න

නිෂ්පාදිත ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමේ අභියෝග සහ අවස්ථාවන්	
අභියෝග	අවස්ථාවන්
දැඩි වෙළඳපල තරඟය	අවස්ථාවන් වර්ධනය කිරීම සඳහා අඩු වියදම් ඩිජිටල් විසඳුම් සඳහා ආයෝජනය කිරීම
භෞතික හා ඩිජිටල් වත්කම් අඛණ්ඩව නඩත්තු කිරීම හා හොඳ තත්ත්වයෙන් පවත්වා ගැනීම සඳහා ඉහළ පිරිවැයක් දැරීම	ශාඛා මෙහෙයුම් පිරිවැය අඩු කිරීම සඳහා අභ්‍යන්තර කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම

ශාඛා පුළුල් කිරීම සහ නැවත ස්ථානගත කිරීම

ශ්‍රී ලංකාවේ සෑම උපායමාර්ගික නගරයකම පාහේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ස්ථාපිත වී ඇති හෙයින්, දැන් අපගේ ශාඛා පුළුල් කිරීමේ උපාය මාර්ගය, නාගරීකරණය සඳහා වේගවත් ගමනක් යන බව පෙනෙන උප නගරවල අපගේ ව්‍යාප්තිය පිළිබඳව අවධානය යොමු කිරීම කෙරෙහි යොමුවී ඇත. ඒ අනුව, නව ශාඛා / පාරිභෝගික සේවා මධ්‍යස්ථාන පිහිටුවීමට අප ගන්නා තීරණය දැන් පදනම් වී ඇත්තේ යම් කලාපයක ජන ඝනත්වයට අනුව ප්‍රශස්ත ශාඛා ව්‍යාප්ති අනුපාතය සාක්ෂාත් කර ගැනීම මත ය. විලදායී වූ මෙම ප්‍රවේශයේ සාර්ථකත්වය දුටු අපි දැන් ශාඛා නැවත ස්ථානගත කිරීම තීරණය කිරීම සඳහාද එම ක්‍රමවේදයම අනුගමනය කරමු.

දෘශ්‍යතාව වැඩි දියුණු කිරීම සහ ප්‍රවේශවීමේ හැකියාව ශක්තිමත් කිරීමේ කළමනාකරණ තීරණයට අනුකූලව යාපනය, ගම්පහ සහ වාරියපොල ශාඛා වෙනත් ස්ථානවලට ගෙන යන ලදී. තවද, අපගේ ව්‍යාප්තිය තවදුරටත් පුළුල් කිරීමට පියවර ගනිමින්, නව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා කවුන්ටරයන් නාරාහේන්පිට හි ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීවිල්සී හි මෙන්ම මහජන බැංකු ප්‍රධාන කාර්යාලයේ ද විවෘත කරන ලදී. මෙම නව විකතු කිරීම් දෙක සමඟ, 2020 දෙසැම්බර් 31 වන විට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ භූගෝලීය ව්‍යාප්තිය ප්‍රධාන කාර්යාල හා විකුණුම් ඒකක හැරුණු විට දිවයින පුරා ස්ථාන 160 ක් වේ.

කාර්යක්ෂම ශාඛා මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ දිවයින පුරා ව්‍යාප්තිය උපායමාර්ගිකව වැඩි කිරීමට අප දරන උත්සාහයට අමතරව, අපගේ පවත්නා ශාඛා ජාලයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ පැතිකඩ වැඩිදියුණු කිරීම සඳහා අපි ක්‍රියාශීලී ප්‍රවේශයක් අනුගමනය කරමු. අපගේ ශාඛා නැවුම් කිරීමේ වැඩසටහන අපගේ ශාඛා ජාලය හරහා භෞතික යටිතල පහසුකම් නංවාලීමට ඉවහල් වූ අඛණ්ඩ ක්‍රියාමාර්ගයකි. වත්මන් මූල්‍ය වර්ෂය සඳහා ශාඛා නැවුම් කිරීමේ වැඩසටහන යටතේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ බම්බලපිටිය, කැකිරාව, අම්බලන්ගොඩ, පදවිය, දික්වැල්ල සහ නාවලපිටිය යන ශාඛා නවීකරණය කරන ලද්දේ එම ප්‍රදේශවල පාරිභෝගිකයින්ට ලබා දී ඇති පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ය.

මෑත වසරවලදී, ශාඛා වල පසුබිම් පද්ධති විධිමත් කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණය සහ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය සඳහා වන ආයෝජනය අපි වැඩි කර ඇත්තෙමු. නිතිපතා පුහුණුව සමඟින් සේවක ඵලදායිතාව ඉහළ නැංවීම සහ ශාඛා මට්ටමින් වඩා හොඳ පිරිවැය විනයක් පවත්වා ගැනීම අරමුණු කොට ගෙන මෙම උත්සාහයන් අඛණ්ඩව සිදුවන අතර අවසානයේ සමස්තයක් ලෙස ජාලයේ වඩා යහපත් සමස්ත කාර්යසාධනයට මග පාදයි. ශාඛා ජාලය පුරා කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සඳහා මූලික පියවරක් ගනිමින්, 2020 මැද භාගයේදී ශාඛා පාලන යාන්ත්‍රණය නවීකරණය කරන ලද අතර, ජීවිත හා සාමාන්‍ය ව්‍යාපාර සඳහා ශාඛා මට්ටමේ අධීක්ෂණය වෙන වෙනම ශක්තිමත් කිරීම සඳහා නව නායකත්ව තනතුරු ස්ථාපිත කරන ලදී. ඒ අනුව ව්‍යාපාර දෙකම සඳහා සාමූහිකව නඩත්තු කරන ලද ප්‍රදේශ 21 කලාප 15 බැගින් ජීවිත හා සාමාන්‍ය ව්‍යාපාර අතර බෙදන ලද අතර එමඟින් එක් එක් මෙහෙයුම සඳහා විස්තරාත්මක මට්ටමින් (granular level) ශක්තිමත් අධීක්ෂණයක් සහතික කෙරේ. මේ අතර අපගේ ඇමතුම් මධ්‍යස්ථාන ක්‍රියාකාරිත්වයේ ඵලදායිතාවය ඉහළ නැංවීම පිණිස, අපගේ ඇමතුම් මධ්‍යස්ථාන කණ්ඩායම්වල හැකියාවන් වර්ධනය කිරීමට අපි නිරන්තරයෙන් ඩිජිටල් තාක්ෂණය හා පුහුණුව සඳහා ආයෝජනය කරමු.

2020 සඳහා මූලික ක්‍රියාකාරකම්

ශාඛා 3 ක් නැවත ස්ථානගත කර ඇත
ශාඛා 6 ක් ප්‍රතිසංස්කරණය කරන ලදි

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඩිජිටල් තාක්ෂණය ශක්තිමත් කිරීම

මෑත වසරවලදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සිය ඩිජිටල් තාක්ෂණය ක්‍රමානුකූලව පුළුල් කරමින් සිටින අතර, පළමුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පාරිභෝගික ද්වාරය ආයතනික වෙබ් අඩවියට හඳුන්වා දීමත් සමඟ 2019 දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජංගම යෙදුම දියත් කිරීමත් සිදු විය. මෙම වේදිකා දෙකම ඒවායේ සමස්ත ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අඛණ්ඩ වැඩිදියුණු කිරීම් වලට ලක් කරන අතර, අපගේ ඩිජිටල් පියසටහන තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගත හැකි වෙනත් විකල්ප ගවේෂණය කරන්නෙමු. මෙම උත්සාහයන් ප්‍රමුඛ බැංකු හා විදුලි සංදේශ සමාගම් සමඟ අගය විකතු කිරීමේ උපාය මාර්ගික සබඳතා ඇති කිරීමට හේතු වී ඇති අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට පුළුල් පරාසයක ජංගම ගෙවීම් විසඳුම් සහ අනෙකුත් දෙමුහුන් නාලිකා හඳුන්වා දෙමින් ඉදිරියට යාමට හැකි වී තිබේ.

ස්ථාවර වත්කම්වල ශුද්ධ ගිණුම් පොත් අගය *(රු. මිලියන)*



ස්ථාවර වත්කම්වලට එකතුකිරීම් *(රු. මිලියන)*



නිෂ්පාදිත ප්‍රාග්ධනය

මූලික සංඛ්‍යාලේඛන

ස්ථාවර වත්කම්වල ආයෝජනය ('000)	මූ. ව. 2020 රු.	මූ. ව. 2019 රු.	මූ. ව. 2018 රු.	මූ. ව. 2017 රු.	මූ. ව. 2016 රු.	මූ. ව. 2015 රු.
ස්ථාවර වත්කම්වලට එකතුකිරීම්	**231,437**	311,149	243,209	160,845	126,854	85,062
ස්ථාවර වත්කම්වල ශුද්ධ ගිණුම් පොත් අගය	**10,867,358**	11,073,931	11,256,423	10,138,320	10,248,900	8,112,393

පළාත	ශාඛා ව්‍යාප්තිය හා ජනගහන ඝනත්වය			
	මූ. ව. 2020		මූ. ව. 2019	මූ. ව. 2018
	ශාඛා ව්‍යාප්තිය (ශාඛා ගණන)	ආසන්න ජනගහණ ඝණත්වය	ශාඛා ව්‍යාප්තිය (ශාඛා ගණන)	ශාඛා ව්‍යාප්තිය (ශාඛා ගණන)
බස්නාහිර	**55**	**6 165 000**	54	52
දකුණු	**26**	**2 669 000**	26	25
මධ්‍යම	**13**	**2 781 000**	13	12
උතුරු	**08**	**1 152 000**	08	08
උතුරු මැද	**10**	**1 386 000**	10	10
නැගෙනහිර	**07**	**1 746 000**	07	07
වයඹ	**20**	**2 563 000**	17	17
සබරගමුව	**12**	**2 070 000**	11	10
ඌව	**07**	**1 387 000**	07	07

මූල්‍ය ප්‍රාග්ධනය
අයත් වෙළඳපල කොටස වර්ධනය කිරීමේ හැකියාව සහ කාලයත් සමඟ අඛණ්ඩව ආදායම ඉහළ නැංවීම සහතික කිරීම

අනෙකුත් ප්‍රාග්ධනයන් කෙරෙහි බලපෑම
නිෂ්පාදිත ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම අනෙක් සියලුම ප්‍රාග්ධනයන්ට ධනාත්මක බලපෑමක් ඇති කරයි

බුද්ධිමය ප්‍රාග්ධනය
විශ්වසනීය භෞතික හා ඩිජිටල් යටිතල පහසුකම් විශ්වසනීයත්වය සහ වෙළඳ නාමයේ කීර්තිය ශක්තිමත් කරයි

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය
දිවයින පුරා වඩා හොඳ ප්‍රවේශයක් තිබීම පාරිභෝගික විශ්වාසය ගොඩනැගීමට උපකාරී වේ

මානව ප්‍රාග්ධනය
වඩාත් කාර්යක්ෂම ශාඛා මෙහෙයුම් සේවකයින්ගේ ඵලදායිතාව වැඩි දියුණු කරන අතර අභිප්‍රේරණය වැඩි කරයි

සපුරාලන තිරසාර සංවර්ධන ඉලක්ක



අනාගතය කෙරෙහි අවධානය

- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ශාඛා ව්‍යාප්තිය ශක්තිමත් කිරීම සඳහා නව ශාඛා සඳහා ආයෝජනය කිරීම.
- ශාඛා නැවත ස්ථානගත කිරීම තුළින් දෘශ්‍යතාව වැඩි දියුණු කිරීම.
- පාරිභෝගික සේවා මධ්‍යස්ථාන නියෝජිතායතන ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන බවට පරිවර්තනය කර අඩු වියදම් ශාඛා ආකෘතියකට මාරු කිරීම.
- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ දිවයින පුරා ව්‍යාප්තිය තවදුරටත් වැඩි කිරීම සඳහා රට පුරා නියෝජිතායතන සංවර්ධන මධ්‍යස්ථාන ගණන පුළුල් කිරීම.
- පිරිවැය ඵලදායී ලෙස ඉක්මනින් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ හැකි ප්‍රධාන ධාරාවේ ඩිජිටල් විසඳුම් ගැන සොයා බැලීම.

බුද්ධිමය ප්‍රාග්ධනය

දිගු කාලීන විශ්ෂ්ඨ වාර්තාවක් සහ ශක්තිමත් සන්නාමයක් සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අපගේ පාර්ශවකරුවන්ට අපගේ සන්නාම පොරොන්දුව ඉටු කිරීම සඳහා මෙම අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීමට හොඳින් ස්ථානගත වී සිටී.



බුද්ධිමය ප්‍රාග්ධනය

අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය සහ එය අපගේ පාර්ශවකරුවන්ට වටිනාකමක් නිර්මාණය කරන්නේ කෙසේද යන්න

අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය සමන්විත වන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වටිනාකම් ප්‍රස්තුතය (value proposition) වැඩි දියුණු කිරීම සඳහා දායක වෙමින් තුල්‍යයන්ට වඩා තරඟකාරී ස්ථානයක් ලබා දීමට උපකාරී වන අස්පෘශ්‍ය වත්කම් සහ දැනුම පදනම් කරගත් සම්පත් වලිනි.



"අවදානම් ආරක්ෂණ හා ජීවිත ආයෝජන ප්‍රශස්තිකරණය සම්බන්ධයෙන් ජාතියේ පළමු තේරීම බවට පත් වීම" යන සිය දැක්මට අනුගත වෙමින් 1962 සිට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ශ්‍රී ලංකාවේ ජනතාවට සේවය කරයි. පසුගිය දශක පහ තුළ මිලියන 8.9 කට අධික ගනුදෙනුකරුවන්ට සේවය කර ඇති ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අංක 1 සහ සෑම ශ්‍රී ලාංකිකයෙකුගේම ජීවිත කාලය පුරාම වඩාත් විශ්වාසදායක රක්ෂණ හවුල්කරුවා ලෙස ස්ථානගතව සිටියි. අපගේ අභ්‍යන්තර පද්ධති සහ ක්‍රියාවලීන්, විශේෂයෙන් අති නවීන තාක්ෂණ පද්ධති, අප වැඩ කරන ආකාරය නිර්වචනය කරන අපගේ අභ්‍යන්තර පද්ධති නිර්මිතය මෙන්ම අපගේ කණ්ඩායම්වල අත්දැකීම් සහ නිහඬ දැනුම යන සියල්ල එක්ව අපගේ සන්නාමයේ විශ්වසනීයත්වය තව දුරටත් වැඩි දියුණු කරයි. සෑම පාරිභෝගික අංශයක් සඳහාම වඩාත් සුදුසු රක්ෂණ විසඳුම් ලබා දීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට නව්‍යකරණය වීමට හා අඛණ්ඩව විකාශය වීමට මේ සියල්ල උපකාරී වේ.

අපගේ සන්නාමයේ අක්තපත්‍ර

- 2020 දී බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් ශ්‍රී ලංකා විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පිට පිට 3 වන වරටත් 'වටිනාම සාමාන්‍ය රක්ෂණ සන්නාමය' ලෙස පිළිගැනීමට ලක්විය.
- මෙගා සිල්ලර සන්නාම සමඟ තරඟ වදිමින් ශ්‍රී ලංකාවේ 'වඩාත්ම ආදරණීය රක්ෂණ සන්නාමය' යන නාමය ද ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ආයතනයට හිමි විය.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ බුද්ධිමය ප්‍රාග්ධනය එහි අගය නිර්මාණය කිරීමේ අරමුණු අඛණ්ඩව සපුරාලන බවට අප සහතික කරන්නේ කෙසේද

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සන්නාම ප්‍රතිඥාව ඉටු කිරීම

දිගු කාලීන විශ්ෂ්ඨ වාර්තාවක් සහ ශක්තිමත් සන්නාමයක් සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අපගේ පාර්ශවකරුවන්ට අපගේ සන්නාම ප්‍රතිඥාව ඉටු කිරීම සඳහා මෙම අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීමට හොඳින් ස්ථානගත වී සිටී. අපි අපගේ විශාලත්වය දේශීය වෙළඳපල විශේෂඥතාව සමඟ මුසු කර අපගේ ප්‍රතින්න වටිනාකම් ප්‍රස්තුතය මත පදනම්ව පාරිභෝගිකයන්ගේ හදවත් දිනා ගනිමු. සුවිශේෂී නිෂ්පාදන කළඹක් සමඟ ඉහළම මට්ටමේ සේවයක් එයට ඇතුළත් වේ. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේදී සහ රට පුරා අපගේ ශාඛා 158 ක ජාලය හරහා අපගේ ව්‍යාපාරයේ ජීවිත හා ජීවිත නොවන ප්‍රතිරක්ෂණ, හිමිකම්, පියවීම් සහ උපකාරක සේවාවන් සඳහා අවම මෙහෙයුම් ප්‍රමිතීන් සකස් කරන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ තත්ත්ව ප්‍රතිපත්තියේ පදනම ලෙස ක්‍රියා කරන ISO 9001: 2015 තත්ත්ව කළමනාකරණ පද්ධතිය නිසා අපගේ කැපවීම තවදුරටත් ශක්තිමත් වේ.අපගේ තත්ත්ව ප්‍රතිපත්තිය යනු අප කරන සෑම දෙයකම පාරිභෝගිකයා මූලිකව සිදු කිරීමේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අභිලාෂයේ ප්‍රතිමූර්තියකි. ඒ අනුව, සියලුම සේවකයින් අපගේ තත්ත්ව ප්‍රතිපත්තිය අභ්‍යන්තරීකරණය කර එය සිය ප්‍රධාන මෙහෙයුම් දර්ශනය ලෙස යොදා ගත යුතුය.

තොරතුරු තාක්ෂණ පද්ධති ආයෝජනය කිරීම

තාක්ෂණය සඳහා ආයෝජනය කිරීම සඳහා අපගේ ප්‍රවේශය අරමුණු කර ඇත්තේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පාරිභෝගිකයින්ගේ අපේක්ෂාවන් සපුරාලන ආකාරය සහ එහි ව්‍යාපාරය කරගෙන යන ආකාරය වෙනස් කිරීම මගින් අපගේ තරඟකාරී ශක්තීන් වැඩි දියුණු කිරීමයි. මෙම පරිවර්තනයේ අත්‍යවශ්‍ය අංගයක් වනුයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපායමාර්ගය වන අතර එය ප්‍රධාන අවධානය යොමු කළ යුතු අංශ හතරක් වටා පවතියි - එනම් ඩිජිටල්කරණය, වැඩිදියුණු කළ පාරිභෝගික අත්දැකීම්, ව්‍යාපාර හා සේවා සක්‍රීය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ මූලික ව්‍යාපාරික පද්ධති වේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපායමාර්ගය



සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, කාර්යක්ෂමතාව, සේවා ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සහ සහයෝගී සේවා පරිසරයක් ගොඩනැගීම අරමුණු කරගනිමින් ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා අපි විශේෂයෙන් අපගේ ඩිජිටල්කරණ න්‍යාය පත්‍රය වේගවත් කළෙමු. මේ සම්බන්ධයෙන්, අප රට පුරා සිටින අපගේ විකුණුම් කණ්ඩායම් පොදු ද්වාරයක් හරහා සම්බන්ධ කිරීම සඳහා විකුණුම් බලකායේ ස්වයංක්‍රීය වේදිකාව සාර්ථකව ක්‍රියාත්මක කළෙමු. තවද, ජීවිත සහ සාමාන්‍ය ව්‍යාපාර දෙකෙහිම ප්‍රධාන කාර්යයන් ඩිජිටල්කරණය වේගවත් කිරීමේ ඉක්මන් හා පහසු මාධ්‍යයක් ලෙස අපි ජංගම යෙදුම් පදනම් කරගත් විසඳුම් මාලාවක් සකස් කළෙමු. අපගේ නවතම කාර්යය වන්නේ ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක අපගේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා රොබෝ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණයපදනම් කරගත් ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණ විසඳුම් ක්‍රියාත්මක කිරීමයි.

පාරිභෝගික අත්දැකීම් අඛණ්ඩව වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කැපවීම පිළිබිඹු කරමින් අපි ශ්‍රී ලංකාවේ මෙම කර්මාන්තයේ මුල්වරට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා පාරිභෝගික යෙදුම 2019 දී එළිදැක්වුවෙමු. එතැන් සිට වෙළඳපොල හොඳින් ග්‍රහණයකරගත් මෙම යෙදුම සමස්ත පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා පුළුල් පරාසයක ඩිජිටල් විසඳුම් ඇතුළත් කිරීමේ අරමුණින්තවදුරටත් වැඩිදියුණු කරන ලදි; එනම් ජංගම ගෙවීම්, ඩිජිටල් බැංකුකරණය සහ විද්‍යුත් ගෙවීම් විකල්ප වේ. මේ ආකාරයට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජංගම යෙදුම වසංගතය තුළ පාරිභෝගිකයන්ට සහාය දැක්වීමේ වැදගත් මෙවලමක් බව ඔප්පු වී තිබේ. මේ අතර, කොවිඩ්19 සීමාවන් මඟහරවා ගැනීමට පාරිභෝගිකයන්ට උපකාර කිරීම සඳහා, පාරිභෝගිකයා සඳහා නවතම QR කේතය පදනම් කරගත් මුදල් රහිත ගෙවීම් පහසුව හඳුන්වා දුන් පළමු ශ්‍රී ලාංකික රක්ෂකයා බවට පත්වීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට හැකිවිය. ස්වයං සේවාමණ්ඩප සහ බැංකුවල මුදල් තැන්පතු යන්ත්‍රවලට ගනුදෙනුකරුවන්ට ප්‍රවේශය ලබා දීම සඳහා බැංකු ජාලය සමඟ ඒකාබද්ධ වීම ඉහළ නැංවීමට අපි පියවර ගත්තෙමු.

බුද්ධිමය ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමේදී ඇති අභියෝග සහ අවස්ථා	
අභියෝග	අවස්ථා
අලුතින් ප්‍රවේශවන්නන්ගෙන් තරඟකාරී පීඩනය	ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අද්විතීය විකුණුම් ප්‍රස්තුතය (USP) ශක්තිමත් කිරීම සඳහා සුවිශේෂී නව නිෂ්පාදන සංවර්ධනය කිරීම සහ දියත් කිරීම
ඩිජිටල් යටිතල පහසුකම් සහ පද්ධති අඛණ්ඩව වැඩිදියුණු කිරීම, සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදුවීම	ගෝලීය හොඳම භාවිතයන් අනුගමනය කිරීම වැඩි දියුණු කිරීම

තවත් වැදගත් වර්ධනයක වන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පාරිභෝගික ඇමතුම් මධ්‍යස්ථානය වෙනත් ස්ථානයකට ගෙන යාමයි. සාමාන්‍ය විමසීම් හැසිරවීමට අමතරව, ඇමතුම් මධ්‍යස්ථානයට 24 / 7-365 මාර්ගගත චැට් පහසුකමක් ද ලබා දී ඇති අතර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නිෂ්පාදන හා සේවාවන් සම්බන්ධයෙන් ආයතනික වෙබ් අඩවියේ පාරිභෝගිකයන්ට සහ අනාගත පාරිභෝගිකයන්ට අපගේ ඇමතුම් මධ්‍යස්ථාන නියෝජිතයින්ගෙන් තථ්‍ය කාලීන තොරතුරු ලබා ගැනීම සඳහා අවස්ථාව ලබා දී ඇත..

2020 සඳහා අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර

ජංගම උපායමාර්ගය

- ගෙවීම් විකල්ප
- අගය එකතු කළ සේවා
- ඔප්පුවල තොරතුරු වෙත පහසුවෙන් ප්‍රවේශ වීම
- වැඩිදියුණු කළ පාරිභෝගික සම්බන්ධතාවය

ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය

- රොබෝ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය කාර්යක්ෂමතාව වැඩි කරයි
- සරල කරන ලද සහ ඩිජිටල් කරන ලද කාර්ය ප්‍රවාහ
- කඩදාසි මත පදනම් වූ ක්‍රියාවලි වෙනුවට ලේඛන කළමනාකරණ පද්ධති විසඳුම්

විකුණුම් බලකායේ ස්වයංක්‍රීයකරණය

- සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම සඳහා ජංගම විසඳුම්
- ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා වෙබ් විසඳුම්
- ගෙවීම් විකල්ප

අගය දාම ඒකාබද්ධ කිරීම

- වැඩ ප්‍රවාහ ඒකාබද්ධ කිරීම සඳහා යෙදුම් ක්‍රමලේඛ අතුරුමුහුණත
- වත්මන් පද්ධතිවල අඛණ්ඩ වැඩිදියුණු කිරීම්

2020 සඳහා ප්‍රධාන වැඩසටහන්



SLIC
Sri Lanka Insurance
Like a father - Like a mother

බුද්ධිමය ප්‍රාග්ධනය

ඒ අතරම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා අපගේ මූලික තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ උත්සාහයන් අපි දිගටම සිදු කළෙමු. මේ සම්බන්ධයෙන්, අපගේ ජීවිත හා සාමාන්‍ය මූලික රක්ෂණ පද්ධති අනාගතයේදී වෙළඳපල නිෂ්පාදන ප්‍රචලිත කිරීම සඳහා වඩාත් නම්‍යශීලී බවක් සහ කාලයක් ලබා දීමට උපකාරී වන අති නවීන ව්‍යාපාරික වේදිකාවලට සංක්‍රමණය කිරීමේ ක්‍රියාවලිය අපි ආරම්භ කළෙමු.

තොරතුරු ආරක්ෂාව හොඳම පිළිවෙත්

දත්ත ආරක්ෂාව සහ පාලනය පාරිභෝගික විශ්වාසය පවත්වාගෙන යාමේ පදනම බව අපි තේරුම් ගනිමු. මිලියන 1.6 කට අධික පාරිභෝගික ගිණුම් හැසිරවීම නිසා දත්ත ආරක්ෂාව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මූලික ප්‍රමුඛතාවයක් බවට පත් කර තිබේ. පාරිභෝගික



දත්තවල රහස්‍යභාවය ආරක්ෂා කිරීමට සහ පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම සඳහා ඉහළම මට්ටමේ ආරක්ෂාවක් ඇති බව සහතික කිරීමට අපි සම්පූර්ණයෙන්ම කැපවී සිටිමු. දත්ත සුරැකීම පිළිබඳ අපගේ නීතිමය බැඳීම්වලට අනුකූල වීම අප සිදු කරන අතර පාරිභෝගික දත්ත ආරක්ෂා කිරීම සඳහා විවිධ තාක්ෂණික හා මෙහෙයුම් ආරක්ෂණ ක්‍රියාත්මක කර ඇත්තෙමු. තවද අපි සේවකයින් සඳහා පුහුණුවක් ලබා දෙන අතර නවතම ආරක්ෂක තර්ජන පිළිබඳව දැනුවත් වීම සඳහා අපගේ පාරිභෝගිකයන්ට සයිබර් අපරාධ පිළිබඳව කල්තියා දැනුවත් කරමු.

ව්‍යාපාර අඛණ්ඩතාව සඳහා සැලසුම් කිරීම

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණ වැඩසටහන සැලසුම් කර ඇත්තේ සේවා කඩාකප්පල් වීම අවම කිරීම සහ ව්‍යාපාර, ගනුදෙනුකරුවන්, කාර්ය මණ්ඩලය සහ අනෙකුත් පාර්ශවකරුවන් කෙරෙහි එහි ප්‍රපතන බලපෑම අවම කිරීම සඳහා ය. අපගේ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණ වැඩසටහනේ කොටසක් ලෙස, අපි ස්වාධීන දත්ත මධ්‍යස්ථානයක් මෙන්ම වෙනම ආපදා ප්‍රතිසාධන අඩවියක් පවත්වාගෙන යන අතර, මේ දෙකම දැනට පවතින නඩත්තු න්‍යාය පත්‍රයට අනුකූලව කාර්තුමය බාහිර විගණනයකට යටත් වේ.

එපමණක් නොව, අවදානම් තත්ත්වයන් සහ ඇති විය හැකි තර්ජන සිදුවීම් විසඳීම සඳහා මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපාර අඛණ්ඩ සැලසුම්කරණ ප්‍රතිපත්තියක් සහ සවිස්තරාත්මක ව්‍යාපාර අඛණ්ඩතාව සහ ආපදා ප්‍රතිසාධන සැලසුම් සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වේ.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අපගේ දත්ත මධ්‍යස්ථාන වේදිකා නවතම IBM පරිසරයට සංක්‍රමණය කරන ලද අතර අඛණ්ඩ සේවා සැපයුමක් සහතික කිරීම සඳහා දත්ත මධ්‍යස්ථානයේ මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කරන ලදී. සමස්ත ශාඛා ජාලය පුරා මෘදුකාංග නිර්වචනය කළ පුළුල් ප්‍රදේශ ජාලය (SD-WAN) යෙදවීම මෙයට සමගාමී විය. තවද, ව්‍යාපාරයට තීරණාත්මක පද්ධති සඳහා අපගේ වර්ධනය වීමේ හැකියාව, කාර්යක්ෂමතාව සහ ප්‍රතිසාධන අරමුණු වැඩි දියුණු කිරීම සඳහා නවතම අථත්‍යකරණ වේදිකා සහ උපස්ථ විසඳුම් අපි අනුගමනය කළෙමු

දැනුම පදනම් කරගත් වත්කම් සංවර්ධනය කිරීම සඳහා ආයෝජනය කිරීම

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වෙළඳපල තුළ තරඟකාරී වාසියක් ඇති කිරීම සඳහා වගකිව යුතු ප්‍රධාන සාධකවලින් එකක් වන්නේ මානව ප්‍රාග්ධනයයි. අපගේ සේවකයින් 2626 දෙනාගේ දැනුම හා විශේෂඥතාව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව තුල්‍යයන්ගෙන් වෙන්ව කැපීපෙනීමට හේතුවන ප්‍රධාන ශක්තීන්ගෙන් එකකි. අපගේ කාර්ය මණ්ඩලයෙන් 54% ක් පමණ සමන්විත වන්නේ වසර 10 කට වැඩි කාලයක් සංවිධානය සමඟ සිටි දිගුකාලීන සේවකයින්ගෙන් ය. රක්ෂණ වෙළඳපොළ පිළිබඳ ඔවුන්ගේ ගැඹුරු දැනුම සැලකිය යුතු වාසියක් ලෙස පවතී.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ධාරිතාවය ගොඩනැගීම සඳහා අපි අපගේ මානව ප්‍රාග්ධනයේ දිගටම ආයෝජනය කරන අතරම සේවකයින්ට ද ඔවුන්ගේ පෞද්ගලික වර්ධන අරමුණු සාක්ෂාත් කර ගත හැකි බව සහතික කරමු. අපගේ මානව සම්පත් උපායමාර්ගය මූලික වශයෙන් අවධානය යොමු කරන්නේ සංවිධානයේ අවශ්‍යතා සහ එහි සේවකයින්ගේ අවශ්‍යතා අතර නිවැරදි සමතුලිතතාවයක් ඇති කිරීම සඳහා ය. ඒ පහත සඳහන් කැපවීම් ආශ්‍රයෙනි:

- උපායමාර්ගික බඳවා ගැනීම්
- කාර්ය සාධන කළමනාකරණය
- අනුප්‍රාප්තික සැලසුම් සහ කුසලතා සංචිත කළමනාකරණය
- පුහුණු හා සංවර්ධන

වැඩි විස්තර සඳහා කරුණාකර 64 වන පිටුවේ මානව ප්‍රාග්ධන සංවර්ධන වාර්තාව බලන්න.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයට මිල කළ නොහැකි සම්පතකි. එක් එක් මණ්ඩලයේ සාමාජිකයින්ගේ විවිධ කුසලතා හා විශේෂඥතාව අපගේ මණ්ඩලයේ ගුණාත්මකභාවය ඉහළ නංවන අතර ඵලදායී තීරණ ගැනීම සහතික කිරීම සඳහා දැක්ම සහ නායකත්වය සපයයි. 87 පිටුවෙහි ආයතනික පාලන වාර්තාව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ වැඩි විස්තර සපයයි.

සේවා විශ්ලේෂණය

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවය කරන වසර ගණන	පුරුෂ	ස්ත්‍රී	%
0-5	348	341	26
6-10	297	216	20
11-15	397	130	20
16-20	45	19	2
21 හා ඉන් ඉහළ	263	570	32



සපුරා ඇති තිරසර සංවර්ධන ඉලක්ක



අනාගතය කෙරෙහි අවධානය

- රොබෝ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය වැඩි කිරීම තුළින් පර්යේෂණ හා සංවර්ධන හැකියාව වැඩි දියුණු කිරීම

මානව ප්‍රාග්ධනය

සේවා සංවිධානයක් ලෙස, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි සේවකයින් එහි මූලිකම වත්කම වේ. අපගේ සේවකයින්ට රටේ සෑම අස්සක් මුල්ලක් නෑරම සිටින සියලුම ශ්‍රී ලාංකිකයන් වෙත ළඟා වීමට හැකි වී ඇත්තේ අපගේ සේවකයින්ගේ කැපවීම සහ උනන්දුව නිසාමය.



අපගේ මානව ප්‍රාග්ධනය සහ එය අපගේ පාර්ශ්වකරුවන් සඳහා අගය නිර්මාණය කරන්නේ කෙසේද යන්න

සේවා සංවිධානයක් ලෙස, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි සේවකයින් එහි මූලිකම වත්කම වේ. අපගේ සේවකයින්ට රටේ සෑම අස්සක් මුල්ලක් නෑරම සිටින සියලුම ශ්‍රී ලාංකිකයන් වෙත ළඟා වීමට හැකි වී ඇත්තේ අපගේ සේවකයින්ගේ කැපවීම සහ උනන්දුව නිසාමය. සරලව කිවහොත් - ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි සෑම ජයග්‍රහණයක් සඳහාම ගාමක බලවේගය වන්නේ අපගේ සේවකයින් ය.

ශ්‍රේණිය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව රැකියාව

	සංඛ්‍යාව			සංයුතිය %	
ශ්‍රේණිය	පුරුෂ	ස්ත්‍රී	මුළු	පුරුෂ	ස්ත්‍රී
ජ්‍යෙෂ්ඨ කළමණාකාර	64	16	80	80%	20%
කළමනාකරණ	128	45	173	74%	26%
සහකාර කළමනාකරු	112	59	171	65%	35%
විධායක	230	515	745	31%	69%
ලිපිකරු	436	597	1,033	42%	58%
තාක්ෂණික	190	0	190	100%	0%
ලිපිකරු නොවන	110	18	128	86%	14%
සුලු	80	26	106	75%	25%
එකතුව	1,350	1,276	2,626	51%	49%

කලාප අනුව සේවකයින්

කලාපය	සංඛ්‍යාව
මධ්‍යම	148
නැගෙනහිර	36
උතුරු මැද	76
උතුරු	52
රත්නපුර	90
දකුණු 1	155
දකුණු 2	117
ඉහළ බස්නාහිර	151
ඌව	89
වයඹ 1	100
වයඹ 2	71
බස්නාහිර 1	114
බස්නාහිර 2	49
බස්නාහිර 3	71
බස්නාහිර 4	51
ප්‍රධාන කාර්යාලය	1,256
එකතුව	2,626



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි මානවප්‍රාග්ධනය එහි වටිනාකම් නිර්මාණය කිරීමේ අරමුණු සපුරාලීම අප විසින් සහතික කරන ආකාරය

උපායමාර්ගික බඳවා ගැනීම්

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි පැහැදිලිව නිර්වචනය කර ඇති බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් ඇති අතර එමඟින් අවශ්‍ය සුදුසුකම්, අදාළ දැනුම හා පළපුරුද්ද, සුදුසු කුසලතා සහ නිවැරදි මානසිකත්වයක් ඇති අපේක්ෂකයින් බඳවා ගැනීම අරමුණු කර ගෙන ඇත. වරින් වර පැන නගින පුරප්පාඩු තනතුරු සඳහා අයදුම් කිරීමට අභ්‍යන්තර අපේක්ෂකයින්ට ප්‍රමුඛතාවය දෙනු ලබන අතර බාහිර බඳවා ගැනීම් සිදු කරන්නේ සුදුසු අපේක්ෂකයෙකු අභ්‍යන්තරව හමු නොවන්නේ නම් පමණි.

අපේක්ෂකයන් පරීක්ෂා කිරීම සඳහා අපි ඉතා හොඳ තෝරා ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කරමු. ඒ අනුව, අලුතින් බඳවා ගන්නන් සියලු දෙනාම ආයතනයට සුදුසු අයද යන්න තීරණය කිරීම සඳහා යෝග්‍යතා පරීක්ෂණ මාලාවක් සඳහා පෙනී සිටිය යුතුය. ඔවුන්ගේ යෝග්‍යතා පරීක්ෂණවල ප්‍රතිඵල මත පදනම්ව, තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් වීම අපේක්ෂා කෙරේ. පුරප්පාඩු සහ / හෝ අවශ්‍යතා මත පදනම්ව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සංයුතිය වෙනස් විය හැකි නමුත්, සියලු සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයන් අදාළ විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් වන අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි ජ්‍යෙෂ්ඨ නායකත්ව කණ්ඩායමේ කොටසකි. බඳවා ගැනීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය හා අපක්ෂපාතී බව සහතික කිරීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු සියළුම සම්මුඛ සාකච්ඡා සඳහා පැමිණිය යුතු බව අපගේ බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය මඟින් නියම කෙරේ. තවද, සියලුම කමිටු සම්මුඛ පරීක්ෂණ කලින් තීරණය කරන ලද ඇගයීම් නිර්ණායක මත පදනම්ව පවත්වනු ලැබේ.

සියලුම නව බඳවා ගැනීම් ආයතනය පිළිබඳව ඉගෙන ගැනීමට සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි සංස්කෘතියට වඩා හොඳින් අනුබද්ධ වීමට හැකිවන පරිදි පුළුල් ප්‍රේරණ හා නම්නීකරණ වැඩසටහනකට සහභාගි වනු ලැබේ

මානව ප්‍රාග්ධනය

බුද්ධිමය ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමේදී ඇති අභියෝග සහ අවස්ථා	
අභියෝග	අවස්ථාවන්
රට පුරා අසමාන නිපුණතා බෙදී යාම	අනුප්‍රාප්තික සැළසුම් තුළින් ඵලදායී කුසලතා මූලාශ්‍රයක් සංවර්ධනය කිරීම
දේශීය රක්ෂණ කර්මාන්තයේ තරඟකාරී ස්වභාවය හේතුවෙන් ක්ෂේත්‍ර නිලධාරීන් අතර ඉහළ සේවක පිරිවැටුමක් ඇත	රක්ෂණ කර්මාන්තය සඳහා නව කුසලතා සපයන්නෙකු වීමට අභ්‍යන්තර පුහුණු අධ්‍යනතායනයක් සංවර්ධනය කිරීම

වේතනය සහ ප්‍රතිලාභ

ශක්තිමත් වෙළඳපල තරඟකාරී ප්‍රතිලාභ ව්‍යුහයක් යනු මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි සමස්ත ප්‍රවේශයේ මූලික අංගයකි. සියළුම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සේවකයින් හට වෙළඳපොළට අනුකූලව සහ අපගේ ව්‍යාපාරයට අදාළ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව සාධාරණ හා යුක්තිසහගත වේතනයක් ගෙවනු ලැබේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සියළුම කම්කරු රෙගුලාසි දැඩි ලෙස පිළිපදින අතර සේවකයින්ගේ යහපැවැත්ම සහතික කිරීමේදී ව්‍යවස්ථාපිත සීමාවන්ද ඉක්මවා යයි. මේ සම්බන්ධයෙන් අපගේ සියලුම කාන්තා සේවිකාවන්ට මාතෘ ප්‍රතිලාභ ආඥා පනතට අනුව මාතෘ නිවාඩු ප්‍රතිලාභ ලබා දෙන අතරම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් මාතෘ ප්‍රතිලාභ ආඥා පනතේ සඳහන් විධිවිධානවලට අමතරව තවත් මාස දෙකක කාලයක් සඳහා වැටුප් රහිත පදනමක් මත ඉඩ ලබා දේ.

නිවාඩු හිමිකම භාවිතා කිරීමට යටත්ව, පීතෘ නිවාඩු සඳහා වන ඉල්ලීම් ද අදාළ ඉල්ලීම මත සේවකයාට වාසිදායක ලෙස සලකනු ලැබේ.

'ප්‍රීතිමත් සේවකයින් විසින් ගුණාත්මක නිෂ්පාදන හා සේවාවන් ලබා දෙයි" යන පදනම යටතේ, අපගේ සියලුම සේවකයින්ට ඔවුන්ගේ ගුණාත්මක ජීවිතය ඉහළ නැංවීම සඳහා පහත සඳහන් ප්‍රතිලාභ ලබා දෙන්නෙමු:

- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සේවකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා සමාගම් වෛද්‍ය රක්ෂණ ආවරණය
- විභාග ගාස්තු ප්‍රතිපූරණය කිරීම
- සියළුම පහසුකම් සහ ආහාර සඳහා සහන මිලක් සහිත කාර්ය මණ්ඩල ආපනශාලාවක්
- සහනාධාර මිල ගණන් යටතේ නිෂ්පාදන රාශියක් ලබා දෙන විශේෂ සුභසාධන වෙළඳසැලක්
- නුවර-චිලිය, අනුරාධපුර සහ කතරගම යන ප්‍රදේශවල පිහිටි නවීන පහසුකම් සහ මනා පුහුණුව ලත් භාරකරුවන්ගෙන් සමන්විත සෑම සේවකයෙකුටම වෙන් කරවා ගත හැකි නිවාඩු නිකේතන තුනකට ප්‍රවේශය.
- දිගු දුර ගමන් සඳහා සේවකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රවාහන බල ඇණියට (Transport Fleet) ප්‍රවේශය
- සේවකයින්ගේ දරුවන්ට අධ්‍යාපනික සහාය. 5 වසර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින පාසල් ළමුන් සඳහා අපි සම්මන්ත්‍රණ පවත්වනු ලබන අතර සිය විභාගය සාර්ථකව සම්පූර්ණ කළ අයට මුදල් ත්‍යාග පිරිනමනු ලැබේ.
- සේවකයින්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට මරණ ප්‍රතිලාභ. "පියෙකු මෙන් මවක් මෙන්" ඔවුන් සමඟ සිටීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව දුන් පොරොන්දුව පිළිබිඹු කරමින් අපි අවශ්‍ය අවස්ථාවල දී සේවකයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට චිත්තවේගීය හා මානසික සහය ලබා දෙමු.

කාර්ය සාධන කළමනාකරණය

කාර්ය සාධනය මත පදනම් වූ සංවිධානයක් ලෙස, අපි දැඩි ලෙස විශ්වාස කරන්නේ ඵලදායී කාර්ය සාධන ඇගයීම් පද්ධතියක් (PAS) සේවකයින්ගේ සංවර්ධනයට සහාය වන අතරම ආයතනික උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වේදිකාවක් නිර්මාණය කරන බවයි. "විශිෂ්ටත්වය සඳහා වෙහෙසීම" යන මූලධර්මය මත පදනම් වූ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කාර්ය සාධන ඇගයීම් පද්ධතිය අපගේ සේවකයින්ගේ කාර්යසාධනය ඇගයීම සඳහා සාධාරණ, විනිවිද පෙනෙන සහ විශ්වසනීය ප්‍රවේශයක් ගනී. ක්‍රියාවලියේ කොටසක් ලෙස, සියලුම ස්ථිර සේවකයින් මූල්‍ය වර්ෂය ආරම්භයේදී කලින් එකඟ වූ මූලික කාර්යසාධන දර්ශක අනුව සිය කාර්ය සාධනය ඇගයීම සඳහා ද්වි-වාර්ෂික ස්වයං ඇගයීමක් සිදු කළ යුතුය. මේ සමඟ කාර්ය සාධනය ඇගයීමේ සාකච්ඡාවක් තුළින් සේවකයින්ට ඔවුන්ගේ කාර්ය සාධනය, ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා මෙන්ම ඔවුන්ගේ දිගු කාලීන වෘත්තීය අරමුණු සිය රේඛීය කළමනාකරු සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබේ. මේ අතර, ශ්‍රේණිගත කිරීම් 2 ට වඩා අඩු සේවකයින්ට අදාළ අධීක්ෂකවරුන් සමඟ සාකච්ඡා කර මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද පුද්ගල සංවර්ධන සැලසුම් මගින් අමතර සහාය ලබා දෙනු ලැබේ.

කාර්ය සාධන ඇගයීම් පද්ධතිය අපගේ මානව සම්පත් තොරතුරු පද්ධතියට පූර්ණ ලෙස ඒකාබද්ධ වී ඇති අතර, සේවකයින්ට ඔවුන්ගේ ප්‍රගතිය අඛණ්ඩව අධීක්ෂණය කිරීමට සහ රේඛීය කළමනාකරුවන්ට වසර පුරා ඔවුන්ගේ කණ්ඩායම්වල ක්‍රියාකාරිත්වය තක්සේරු කිරීමට හැකි වන අතර එමඟින් සියලු සේවකයින් සාමූහිකව විශිෂ්ටත්වය උදෙසා උත්සාහ කිරීමට දිරිගන්වනු ලැබේ.

අනුප්‍රාප්තික සැලසුම් සහ කුසලතා සංචිත කළමනාකරණය

ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය වඩ වඩාත් තරඟකාරී වන විට, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ තරඟකාරීත්වය පවත්වා ගෙන යාම සහ වෙළඳපල තුළ අපගේ වෙළඳ නාමයේ කීර්තිය ඉහළ නැංවීම සඳහා දක්ෂ සේවකයින් රඳවා ගැනීම අතිශයින් වැදගත් වේ. දක්ෂ සේවකයින් රඳවා තබා ගැනීම සඳහා අපගේ ප්‍රවේශය පදනම් වී ඇත්තේ ක්‍රමානුකූල අනුප්‍රාප්ති සැළැස්මක් මත වන අතර එමඟින් හඳුනාගත් සේවකයින් සංවිධානයේ අනාගත නායකයින් බවට පත් කිරීමට අපි උත්සාහ කරමු. අපගේ කාර්ය සාධන ඇගයීම් පද්ධතියේ ප්‍රතිඵල මත පදනම්ව, "ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා කුසලතා සංචිතයට" ඇතුළත් කළ යුතු හොඳම කාර්යසාධකයන් අපි වෙන් කරමු. "ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා කුසලතා සංචිතයේ" පරමාර්ථය වන්නේ ආයතනය තුළ නිසි අනුප්‍රාප්තික සැලැස්මක් ස්ථාපිත කිරීමයි. එමඟින් ඕනෑම පුරප්පාඩුවක් තීරණාත්මක ස්ථානයක පිරවීම සඳහා සෑම විටම සුදුසු අපේක්ෂකයින් සූදානම් බව සහතික කරනු ඇත. "ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා කුසලතා සංචිතයේ" අපේක්ෂකයින්ට ඔවුන්ගේ මෘදු කුසලතා හා තාක්ෂණික කුසලතා වැඩිදියුණු කිරීමට හැකිවන පරිදි බොහෝ සංවර්ධන වැඩසටහන් වල නිරත වීමට අවස්ථාව ලබා දී ඇති අතර ඔවුන්ගේ නායකත්ව හා කළමනාකරණ කුසලතා තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා අපගේ උපදේශන වැඩසටහනෙන් ප්‍රතිලාභ ලබා ගත හැකිය.

පුහුණු හා සංවර්ධන

අපගේ පුහුණු හා සංවර්ධන උපායමාර්ගයේ පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වර්ධන අරමුණු සපුරාලන අයුරින් සේවකයින්ගේ කුසලතා සහ හැකියාවන් වැඩි දියුණු කිරීමයි. කාර්ය සාධන ඇගයීම් පද්ධතිය හරහා හඳුනාගෙන ඇති පුහුණු අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාවය ලබා දීම සඳහා අපි හොඳින් ව්‍යුහගත පුහුණු හා සංවර්ධන රාමුවක් අනුගමනය කර ඇත්තෙමු. පුරප්පාඩු පිරවීම සඳහා පුහුණු අවස්ථා ලබා දෙන අතරම, පුහුණුව සඳහා වන ආයෝජනය අවශ්‍ය නිපුණතා හා නිපුණතා සංවර්ධනය අතින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා දෙන බව සහතික කිරීම සඳහා සහභාගීත්වය සහ ප්‍රගතිය අපි නිරන්තරයෙන් නිරීක්ෂණය කරමු.

අපගේ අනුප්‍රාප්තික සැළසුම් හා කුසලතා සංචිත කළමනාකරණ උපාය මාර්ගයට අනුකූලව, එක් එක් දෙපාර්තමේන්තුවේ නායකත්ව හැකියාවක් දක්වන අයගේ නායකත්ව කුසලතා වර්ධනය කිරීම සඳහා අපට දැන් විශේෂ පුහුණු මොඩියුලයක් ඇත. මෙය ආයතනයේ උපායමාර්ගික ව්‍යාපාරික අරමුණු සඳහා දායක වන තවත් ක්‍රියාමාර්ගයකි.

තවද, අඛණ්ඩ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සහ අඛණ්ඩ පදනමක් මත සේවකයන්ගේ කුසලතා යාවත්කාලීන කිරීමට සේවකයින් දිරිමත් කිරීමේ උත්සාහයක් වශයෙන්, සිය සේවා අංශයට වටිනාකම් එකතු වන ආකාරයට සිය අධ්‍යාපන සුදුසුකම් වර්ධනය කර ගැනීමට තීරණය කරන සේවකයින්ට මූල්‍ය ආධාර සැපයීම සඳහා වෘත්තීය සංවර්ධන ප්‍රතිපූරණ ක්‍රමයක් හඳුන්වා දී ඇත. අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෘත්තීය ආයතනවල සාමාජික ගාස්තු ද ප්‍රතිපූරණය කරයි.

රැකියා දිවියේ සමබරතාවය

සේවකයින්ට රැකියා දිවියේ යහපත් සමතුලිතතාවයක් ඇති බව සහතික කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව උත්සාහ දරයි. අපගේ රැකියා දිවියේ සමතුලිතතා වැඩසටහන් අපගේ සේවකයින්ගේ ශාරීරික හා මානසික යහපැවැත්ම ආරක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. මේ සම්බන්ධයෙන්, අපගේ සේවකයින්ට සිය ශාරීරික යෝග්‍යතාවය පවත්වා ගැනීමට සහාය විය හැකි සුදුසුකම් ලත් උපදේශකවරුන්ගෙන් සමන්විත අංගසම්පූර්ණ ව්‍යායාම ශාලාවක් ඇතුළු විවිධ පහසුකම් සඳහා ප්‍රවේශය ඇත. සිය මානසික හා අධ්‍යාත්මික යහපැවැත්ම ගැන උනන්දුවක් දක්වන අය සඳහා සතිපතා යෝගා පන්ති පවත්වනු ලැබේ. රක්ෂණය, කළමනාකරණය, මූල්‍ය, අලෙවිකරණය සහ විකුණුම් යන ක්ෂේත්‍රවල ප්‍රබන්ධ හා අධ්‍යාපනික මාතෘකා ආවරණය වන පරිදි පොත් 1800 කට අධික සංඛ්‍යාවක පුස්තකාලයකටද සේවකයින්ට ප්‍රවේශය ඇත.

සේවක කටයුතු

සේවකයින් 2600 කට වැඩි පිරිසකගේ ශ්‍රම බලකායක් ඇති ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි කළමනාකාරිත්වය සේවකයින් සමඟ සාධාරණ ලෙස හා විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීමට පූර්ණ වශයෙන් කැපවී සිටී. එමඟින් සාමූහික කේවල් කිරීමේ ගිවිසුම් දෙකට අදාළ සියලු සාකච්ඡා මෙහෙයවයි .සාමූහික කේවල් කිරීමේ ගිවිසුම් මඟින් සේවායෝජකයාගේ අයිතිවාසිකම් සහ වගකීම්, සේවා නියුක්ති කොන්දේසි සහ සේවා නියුක්ති කොන්දේසි වෙනස් කිරීම, වැටුප් සංශෝධන, වෙනත් දීමනා සහ වාර්ෂික ප්‍රසාද දීමනා, වැඩ පිළිවෙත්, වෘත්තීය සමිති ක්‍රියාමාර්ග, ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි ඇතුළු මාතෘකා ගණනාවක් ආවරණය කරයි. සාකච්ඡා සාර්ථකව අවසන් වීමෙන් පසුව, 2022 නොවැම්බරයෙන් අවසන් වන තවත් වසර තුනක කාලයක් සඳහා සාමූහික ගිවිසුම් දෙක 2019 නොවැම්බර් මාසයේදී අලුත් කරන ලදී.

අවංක හා විවෘත සාකච්ඡාවක් ප්‍රවර්ධනය කරන නිරන්තර අන්තර්ක්‍රියා තුළින් කළමනාකාරිත්වය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෘත්තීය සමිති දිරිමත් කරයි. සැලසුම් සහගත කාලසටහනක් සහිත කාර්තුමය රැස්වීම්, වෘත්තීය සමිති නියෝජිතයින් සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා කළමනාකාරිත්වය අතර විවෘත හා විනිවිද පෙනෙන සංවාදයක් සඳහා පහසුකම් සපයයි. "වැඩපොළ සහයෝගිතාවය" යනු සේවා ස්ථාන සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම සඳහා අඛණ්ඩව සිදුකරන තවත් උත්සාහයකි. වැඩමුළු, රැස්වීම් සහ එක්රැස්වීම් මාලාවකින් සමන්විත මෙම වැඩසටහන, සියළුම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සේවකයින්ගේ අභිවෘද්ධිය සඳහා ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ විවිධ අංශවල ක්‍රියාකාරී කළමනාකරණ කණ්ඩායම් සමඟ එක්ව කටයුතු කිරීමට සියලුම වෘත්තීය සමිතිවල නායකත්වය දිරිමත් කිරීමට කටයුතු කරයි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සියලුම වෘත්තීය සමිති නායකයින්ගේ සහභාගීත්වයෙන් සහ ආයතනික කළමනාකරණ කණ්ඩායම ඇතුළුව කළමනාකාරිත්වයේ විවිධ අංශවල අයද සහිතව පැවැත්වූ නව වැඩසටහනකි 'වෙනසකට මුහුණ දීම'.

ව්‍යාපාර ක්‍රියාකාරකම් තුළ සංවිධානාත්මක ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ නියමාවලිය ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සියළුම කළමනාකරුවන් තම කණ්ඩායම් සමඟ නිරන්තරයෙන් සම්බන්ධව සිටිය යුතුය. ආයතනික ප්‍රවෘත්ති ආයතනය පුරා සිටින සේවකයින්ට නිසි පරිදි සන්නිවේදනය වන බවට සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් "බී නිවුස්" නම් කාර්තුමය ප්‍රවෘත්ති පත්‍රයක් ප්‍රකාශයට පත් කරයි. එමඟින් සේවකයින්ට කළමනාකරණ උපාය මාර්ග හා අරමුණු සමඟ පෙළගැස්වීමට උපකාරී වේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ක්‍රියාකාරකම් දින දර්ශනයේ වාර්ෂික කාර්ය මණ්ඩලය එක් රැස් වීම් සහ වාර්ෂික පොළ වැනි දෑ සැලසුම් කර ඇත්තේ සේවකයින්ට අවිධිමත් පසුබිමක් තුළ තම සගයන් හා කළමනාකාරිත්වය සමඟ එකට සම්බන්ධ වීමට අවස්ථාව ලබා දීම සඳහා ය.

දුක් ගැනවිලි හැසිරවීම/වලට ප්‍රතිචාර දැක්වීම

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සිය සේවක දුක්ගැනවිලි හැසිරවීමේදී හැකි තාක් දුරට එහි ආරම්භක ස්ථානයේදීම විසඳීමේ අරමුණින් කටයුතු කරන අතර ආරවුල් හෝ අර්බුදකාරී තත්වයන් මඟහරවා ගැනීම, චිත්ත ධෛර්යය, තෘප්තිය සහ කැපවීම වැඩිදියුණු කිරීම සහ වඩා හොඳ අවබෝධයක් තුළින් සුසංවාදී සේවායෝජක-සේවක සබඳතා සහතික කිරීම සඳහා පැහැදිලි ක්‍රියා පටිපාටියක් අනුගමනය කරයි.

සවිස්තරාත්මක දුක්ගැනවිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක වන අතර ඕනෑම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සේවකයෙකුට වැඩ සම්බන්ධ ගැටළු වාර්තා එය කිරීමට භාවිතා කළ හැකිය. දුක් ගැනවිලි ඉදිරිපත් කරන්නේ කෙසේද යන්න ගැන සවිස්තරාත්මක තොරතුරු සමඟ දුක්ගැනවිලි වර්ග පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙහි දක්වා ඇත. නිල දුක්ගැනවිලි ලෙස වර්ගීකරණය කර ඇති ඒවා සහ සේවකයාගේ ක්‍රියාකාරිත්වයට හෝ හැසිරීමට සෘජුව හෝ වක්‍රව බලපෑම් කළ හැකි පෞද්ගලික දුක්ගැනවිලි පිළිබඳව මෙම ප්‍රතිපත්තිය සවිස්තරාත්මක තොරතුරු සපයයි.

මානව ප්‍රාග්ධනය

දුක්ගැනවිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටියේ විවිධ අදියරයන් මෙම ප්‍රතිපත්තිය මගින් තවදුරටත් දක්වා ඇති අතර, අවසාන අදියරේදී දුක්ගැනවිලි හැසිරවීමේ කමිටුවේ කාර්යභාරය ද ඇතුළත් වන අතර දුක්ගැනවිලි විසඳීම සඳහා නියමිත කාල රාමු ද දක්වා ඇත. කණ්ඩායමක් වශයෙන් තනි තනිව හෝ සාමූහිකව මතු කරන දුක්ගැනවිලි ආමන්ත්‍රණය කිරීමේදී අපි මෙම සම්මත ප්‍රවේශය පවත්වා ගනිමු.

දුක්ගැනවිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මානව සම්පත් දෙපාර්තමේන්තුව වගකිව යුතුය.

මනා භාවිතයන්

මූලික මූලධර්ම හා වැඩ කිරීමේ අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ප්‍රකාශය සහ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙන් උපුටා ගත් එක්සත් ජාතීන්ගේ ගෝලීය සංයුක්තය යටතේ දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව සාධාරණ රැකියා පිළිවෙත් අනුගමනය කිරීම තුළින් සිය සේවකයින්ට හිතකර සේවා පරිසරයක් නිර්මාණය කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සිය කැපවීම ශක්තිමත් කරයි. ඒ අනුව, පහත දැක්වෙන මූලධර්ම අපගේ මානව ප්‍රාග්ධන සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා පාදක වේ;

- වෙනස් කොට සැලකීමෙන් තොරවීම සහ රැකියාවේ සමාන අවස්ථා - බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැනීම දක්වා රැකියා ජීවන චක්‍රයේ සෑම අදියරකදීම වෙනස් කොට සැලකීමෙන් තොර ප්‍රවේශයක් සහ සමාන අවස්ථාවන්ට සහාය දීම අපි අනුගමනය කරමු
- සේවා ස්ථානය තුළ විවිධත්වය හා අන්තර්ග්‍රහණය (inclusion) ප්‍රවර්ධනය කිරීම - සියළුම සේවකයින්ට ගෞරවයෙන් හා අභිමානයෙන් සලකනු ලබන විවිධත්වය හා අන්තර්ග්‍රහණයක් සහිත සේවා පරිසරයක් ඇතිකිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව කැපවී සිටී. ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, ස්ත්‍රී පුරුෂ භාවය, වයස, විවාහක තත්ත්වය හෝ නීතියෙන් ආරක්ෂා කර ඇති වෙනත් කිසිදු තත්වයක් මත සේවකයින්ට වෙනස් කොට සැලකීමක් අත්විඳීමට සිදු නොවීමට වගබලා ගැනීමට සෑම උත්සාහයක්ම දරනු ලබයි. මෙම කැපවීම ක්‍රියාත්මක කිරීමේදී, හැකි සෑම තැනකම ආබාධිත පුද්ගලයන්ට වෘත්තීය අවස්ථා නිර්මාණය කිරීමට අපි උත්සාහ කරමු
- ළමා ශ්‍රමය අහෝසි කිරීමට සහ බලහත්කාරයෙන් වැඩ ගැනීම හා අනිවාර්ය ශ්‍රමය තුරන් කිරීමට සහාය වීම - වගකිවයුතු ආයතනික පුරවැසියෙකු ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ළමා ශ්‍රමය, බලහත්කාරයෙන් වැඩ කිරීම හෝ අනිවාර්ය ශ්‍රමයට එරෙහිව දැඩි ප්‍රතිපත්තියක් අනුගමනය කරයි.
- සේවකයින්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව සඳහා ප්‍රමුඛතාවය දීම - සේවා අංශයේ ආයතනයක් ලෙස ලෙස, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවකයින් කිසිදු ප්‍රමාණවත් (material) වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂිත අවදානම් වලට ලක් නොවේ. එසේ වුවද, අපගේ සේවකයින් සඳහා ආරක්ෂිත හා සුරක්ෂිත සේවා ස්ථානයක් නිර්මාණය කිරීම සඳහා අපි දැඩි ක්‍රියා පටිපාටි සකස් කර ඇත්තෙමු. තවද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ හි අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ අවදානම් තක්සේරු කරමින් අවශ්‍ය අවස්ථාවන්හිදී වැළැක්වීමේ හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා අතර මානව සම්පත් දෙපාර්තමේන්තුව අනෙකුත් දෙපාර්තමේන්තු සහ අදාළ බලධාරීන්ගේ සහාය ඇතිව සේවකයින් අතර දැනුවත්භාවය ඇති කිරීම සඳහා අවශ්‍ය පුනුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සපයයි සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ කරුණු. සේවා ස්ථානයේ සෞඛ්‍යය හා ආරක්ෂාව කළමනාකරණය කිරීම සඳහා විධිමත් රාමුවක් සැකසීමේ උත්සාහයක් වශයෙන්, අපි මෑතකදී පුළුල් සෞඛ්‍ය හා සුරක්ෂිතතා ප්‍රතිපත්තියක් ක්‍රියාතමක කළෙමු.
- ආචාර ධර්ම හා අඛණ්ඩතාව තහවුරු කිරීම - රටේ ප්‍රමුඛතම රක්ෂකයා ලෙස, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කීර්තිය සහ විශ්වසනීයත්වය ගොඩනැගී ඇත්තේ සදාචාරාත්මක ව්‍යාපාරික භාවිතයන් මත ය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සේවකයින් බාහිර ලෝකයට ආයතනයේ තානාපතිවරුන් ලෙස සැලකෙන අතර ඔවුන්ගේ වෘත්තීය හැසිරීම අපගේ අභ්‍යන්තර වටිනාකම් පද්ධතියේ පිළිබිඹුවක් ලෙස දැකිය හැක. එනිසා, අපගේ සේවකයින් සෑම විටම සේවාදායකයින්, අනාගත ගනුදෙනුකරුවන්, වෙළෙන්දන් සහ වෙනත් බාහිර පාර්ශවකරුවන් සමඟ ගනුදෙනු කිරීමේදී සහ සිය සගයන්. ඉහළ නිලධාරීන් සහ කණිෂ්ඨයන් අතර ද අඛණ්ඩතාව, ආචාර ධර්ම සහ වෘත්තීය හැසිරීම පිළිබඳ ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යනු ඇතැයි අපි අපේක්ෂා කරමු. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවක චර්යාධර්ම පද්ධතිය යනු රාජකාරියේ යෙදී සිටියදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සේවකයින්ගේ හැසිරීම පාලනය කරන නීති, සම්මතයන්, වගකීම්, මූලධර්ම, සාරධර්ම, ප්‍රමිති මෙන්ම නීතිමය අනුකූලතා පිළිබඳ ලිඛිත ලැයිස්තුවක් අඩංගු නිල ලේඛනයකි. සියලුම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවකයින්, ව්‍යතිරේකයකින් තොරව, චර්යාධර්ම පද්ධතිය පිළිබඳ දැනුවත් වීම, අවබෝධ කර ගැනීම සහ අනුකූල වීම අවශ්‍ය වේ. එසේ කිරීමට අපොහොසත් වීමෙන් වරදේ ස්වභාවය සහ බරපතලකම අනුව වැරදිකරුවන්ට එරෙහිව සුදුසු විනය ක්‍රියාමාර්ග ගනු ඇත. තවද, සියලුම සේවකයින් පත්වීම් ලිපියේ දක්වා ඇති සියලුම වගන්ති/කොන්දේසි ව්‍යතිරේකයකින් තොරව පිළිපැදීම අපේක්ෂා කෙරේ.

කොවිඩ් -19 වසංගතය
කාලය තුළ සේවකයින්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව

වසංගතයේ බරපතලකම හදුනා ගනිමින්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වත්මන් මූල්‍ය වර්ෂය පුරාම ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛාවල සිය සේවකයින් සඳහා ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් පවත්වා ගැනීම සඳහා ගත හැකි සියලු පූර්වාරක්ෂක පියවර ගත්තේය.

රට වසා තබන ලද කාලයේදී අත්‍යවශ්‍ය සේවාවන් යටතේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වර්ගීකරණය කර ඇති හෙයින්, අපගේ සේවකයින්ට මෙම කාලය තුළ ආරක්ෂිතව වැඩ කිරීමට හැකිවන පරිදි නිර්දේශිත සෞඛ්‍ය මාර්ගෝපදේශ සහ ආරක්ෂක ක්‍රියාමාර්ගයන් ක්‍රියාත්මක කිරීමට අපි වග බලා ගත්තෙමු. 2020 මැයි මස මැද භාගයේදී රට වසා දැමීමෙන් පසු මෙහෙයුම් නැවත ආරම්භ කිරීම සඳහා සූදානම් වූ විට බාහිර හා අභ්‍යන්තර උපදේශකයින්ගේ මග පෙන්වීම යටතේ එක් එක් දෙපාර්තමේන්තුව නියෝජනය කරන සාමාජිකයින්ගෙන් සමන්විත විශේෂ කොවිඩ් කාර්ය සාධක බලකායක් පිහිටුවන ලදී. ආයතනයේ ඇති වී හැකි කොවිඩ් තත්වයකට මුහුණ දීම සඳහා අවශ්‍ය නිපුණතා කොවිඩ් කාර්ය සාධක බලකායේ සාමාජිකයින්ට ලබා දී ඇත.

කොවිඩ් කාර්ය සාධක බලකායේ විෂය පථය යටතේ, සෞඛ්‍ය බලධාරීන් විසින් ප්‍රකාශයට පත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව සේවකයින් නැවත සේවයට ගෙන වීම සඳහා කොවිඩ් පාලන සැලැස්මක් සකස් කරන ලදී. තීරණාත්මක අවදානම් පිළිබඳව පාර්ශවකරුවන් හට සන්නිවේදනය කිරීම හා දැනුවත් කිරීම සහ කොවිඩ් පැතිරීම වැළැක්වීම සඳහා සේවකයින් අතර ස්වයං විනය ප්‍රවර්ධනය කිරීම ද කොවිඩ් කාර්ය සාධක බලකාය වෙත පැවරී තිබුණි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කොවිඩ් 19 පාලන සැලැස්ම ශක්තිමත් කිරීම සඳහා තවත් පියවරක් ගනිමින්, කොවිඩ් කාර්ය සාධක බලකාය විසින් එස් වල් ඒස් 1672: 2020 කොවිඩ් 19- ආරක්ෂිත කළමනාකරණ පද්ධතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. 2020 දෙසැම්බරයේ ආරම්භ කරන ලද ක්‍රියාවලිය 2021 මැද භාගය වන විට අවසන් කිරීමට නියමිතය.

මූලික සංඛ්‍යාලේඛන
ගිවිසුම් ආකාරය අනුව සේවකයින්

	2020	2019	2018
ස්ථිර කාර්ය මණ්ඩලය	**2,517**	2,527	2,511
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය	**109**	133	192
එකතුව	**2,626**	2,660	2,703

වයස් විශ්ලේෂණය

වයස් කාණ්ඩය	පුරුෂ	ස්ත්‍රී	%
18-24	38	54	3.5%
25-29	169	217	14.7%
30-34	222	237	17.5%
35-39	234	120	13.5%
40-44	204	58	10.0%
45-49	225	209	16.5%
50-54	186	248	16.5%
55 හා ඉහළ	72	133	7.8%
එකතුව	1,350	1,276	100%

සේවක බඳවා ගැනීම්

වයස් කාණ්ඩය	පුරුෂ	ස්ත්‍රී	%	%
18-24	9	10	19	46%
25-29	8	3	11	26%
30-34	3	0	3	7%
35-39	1	2	3	7%
40-44	3	0	3	7%
45-49	3	0	3	7%
50-54	0	0	0	0%
55 හා ඉහළ	0	0	0	0%
එකතුව	27	15	42	100%

මානව ප්‍රාග්ධනය

සේවක පිරිවැටුම

වයස් කාණ්ඩය	පුරුෂ	ස්ත්‍රී	%	%
18-24	2	7	9	17%
25-29	1	4	5	9%
30-34	3	2	5	9%
35-39	0	0	0	0%
40-44	1	0	1	2%
45-49	0	1	1	2%
50-54	0	1	1	2%
55 හා ඉහළ	14	18	32	59%
එකතුව	21	33	54	100%

දෙමාපිය නිවාඩු

	පුරුෂ	ස්ත්‍රී	එකතුව
2019 දී දෙමාපිය නිවාඩු සඳහා හිමිකම් ලැබූ සේවකයින් සංඛ්‍යාව	0	69	69
2020 දී දෙමාපිය නිවාඩු සඳහා හිමිකම් ලැබූ සේවකයින් සංඛ්‍යාව	0	79	79
2020 දී දෙමාපිය නිවාඩු හිමිකම් ලබාගත් සේවකයින් සංඛ්‍යාව	0	79	79
දෙමාපිය නිවාඩු අවසන් වීමෙන් පසු 2019 දී නැවත සේවයට පැමිණි සේවකයින් සංඛ්‍යාව	0	69	69
දෙමාපිය නිවාඩු අවසන් වීමෙන් පසු නැවත සේවයට පැමිණි පැමිණි මාස 12 කට පසුවත් සේවයේ සිටින සේවකයන් සංඛ්‍යාව	0	79	79
රඳවා ගැනීමේ අනුපාතය %	0	100%	100%

පුහුණුව හා සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම

ආකාරය	2020 (රු)	2019 (රු)	2018 (රු)
ආයතනය තුළම පුහුණුව	**302,824.00**	947,986.50	842,144.00
බාහිර පුහුණුව	**556,229.00**	1,988,299.65	5,149,425.75
සම්මන්ත්‍රණ	**25,500.00**	749,754.50	1,476,997.00
විදේශීය පුහුණුව	**0.00**	15,580,659.43	8,928,357.47
රක්ෂණ සහ වෘත්තීය අධ්‍යාපනය	**27,134.85**	3,900,245.62	3,976,954.34
වෘත්තීය සමාජිකත්වය	**1,583,682.49**	1,670,787.78	3,912,257.23

මූල්‍ය ප්‍රාග්ධනය
නිපුණ හා කාර්යක්ෂම සේවකයින් හට වඩා ලාභදායී ආකාරයකින් ආදායම් වර්ධනය වේගවත් කිරීමේ හැකියාව ඇත

වෙනත් ප්‍රාග්ධනයන් කෙරෙහි ඇති බලපෑම
මානව ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම අනෙක් සියලුම ප්‍රාග්ධන කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි

බුද්ධිමය ප්‍රාග්ධනය
ඉහළ නිපුණතාවයක් ඇති හා දැනුමැති සේවකයින් සංවිධානයේ ව්‍යංගික දැනුම ගොඩනැගීමට දායක වේ

සමාජයීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය
පුහුණුව ලත් සේවකයින්ට වඩා හොඳ සේවා සැපයුමක් ලබා දිය හැකි අතර එමඟින් පාරිභෝගික අත්දැකීම් වැඩි දියුණු කර පාරිභෝගිකයන්ගේ විශ්වාසය වැඩි කර ගත හැක.

මානව ප්‍රාග්ධනය
වඩා දැනුමැති හා පුහුණු සේවකයින්ට ආයතනය සමඟ වර්ධනය වීමට වඩා හොඳ අවස්ථා තිබේ

සපුරාගත් තිරසාර සංවර්ධන අරමුණු



අනාගතය සඳහා අවධානය

- අනුප්‍රාප්තික සැලසුම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම
- සමස්තයක් ලෙස රක්ෂණ කර්මාන්තය සඳහා විශේෂිත පුහුණු සංවර්ධන ඇකඩමියක ආයෝජනය කිරීම

සමාජයිය හා සම්බන්ධතා ප්‍රාග්ධනය

සැබවින්ම සාර්ථක වීමට නම්, අපගේ ගනුදෙනුකරුවන් තේරුම් ගත යුතු අතර, ඔවුන්ගේ අවශ්‍යතා හා උවමනාවන්ට ප්‍රතිචාර දක්වමින්, අවසානයේදී ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම රක්ෂණ සේවා සැපයුම්කරුවෙකුට වඩා උසස්වූ පරිපූර්ණ පාරිභෝගික අත්දැකීම් නිර්මාණය කළ යුතු බව අප විශ්වාස කරමු.



සමාජයීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය

අපගේ සමාජයීය හා සම්බන්දතා ප්‍රාග්ධනය විසින් අපගේ පාර්ශ්වකරුවන් සඳහා අගය නිර්මානය කරන්නේ කෙසේද

සමාජයීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය යන්නෙන් මූලිකව අදහස් කරන්නේ අපගේ ව්‍යාපාරය ඉදිරියට ගෙන යන ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සබඳතා මෙන්ම යහපත් ආයතනික භාරකරුවෙකු ලෙස සිය වගකීම් ඉටු කිරීමේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමාජය සමඟ ඇති කර ගන්නා සම්බන්ධතා ද වේ.

අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා විශ්වාසය මත පදනම් වූ සබඳතා ඇති කර ගැනීමේ පදනම ලෙස පාර්ශවකරුවන් සමඟ සබඳතා ගොඩනඟා ගැනීම සහ ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ක්‍රියාකාරී ප්‍රවේශයක් පවත්වාගෙන යයි.



නිෂ්පාදිත ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමේදී ඇති අභියෝග සහ අවස්ථා	
අභියෝග	අවස්ථා
ප්‍රතිලාභ රක්ෂණය පිළිබඳ සාමාන්‍ය දැනුවත්භාවය නොමැතිකම / සෘණාත්මක හැඟීම	රටේ රක්ෂණය පැතිරීමේ මට්ටම අඩු වීම
අඩු මාරුවීමේ පිරිවැය නිසා පාරිභෝගික පක්ෂපාතිත්වය ඇති කිරීම අපහසු වේ	වෙළඳ පළට පළමුව පැමිණීමේ වාසිය ලබා ගැනීම සඳහා නවෝත්පාදක නව නිෂ්පාදන සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි පාරිභෝගික ප්‍රාග්ධනය විසින් එහි වටිනාකම් නිර්මාණය කිරීමේ අරමුණු දිගින් දිගටම සපුරාලීම අප විසින් සහතික කරන්නේ කෙසේද යන්න

සැබවින්ම සාර්ථක වීමට නම්, අපගේ ගනුදෙනුකරුවන් තේරුම් ගත යුතු අතර, ඔවුන්ගේ අවශ්‍යතා හා උවමනාවන්ට ප්‍රතිචාර දක්වමින්, අවසානයේදී ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම රක්ෂණ සේවා සැපයුම්කරුවෙකුට වඩා උසස්වූ පරිපූර්ණ පාරිභෝගික අත්දැකීම් නිර්මාණය කළ යුතු බව අප විශ්වාස කරමු. පවත්නා ගනුදෙනුකරුවන් රඳවා තබා ගැනීමට සහ නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමට අප උත්සාහ කිරීමේදී මෙම චින්තනය අපගේ සියලු උපායමාර්ගික අවධානයෙහි හදවතේ පිහිටා ඇති අතර එමඟින් වර්තමානයේ සහ අනාගතයේදී ආදායම උත්පාදනය කිරීමට මඟ පාදනු ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පහත සඳහන් මූලධර්ම මත පදනම්ව ගනුදෙනුකරුවන් සඳහා වූ සිය කැපවීම ශක්තිමත් කරයි;

වෙනස් හා විවිධාකාර නිෂ්පාදන කළඹක්

ගනුදෙනුකරුවන්ගේ පසෙකින් "පියෙකු මෙන් - මවක් මෙන්" සිටින බවට වන පොරොන්දුව පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සියළුම පාරිභෝගික කොටස් සඳහා විවිධාංගීකරණය වූ අවදානම් ආරක්ෂණ සහ ජීවිත ආයෝජන විසඳුම් ලබා දෙයි. එනම් තනි පුද්ගලයන්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් ගේ සිට විශාල සමාගම්වලට දක්වා පාරිභෝගිකයන්ට වේ. අපගේ නිෂ්පාදන වෙනස් වන්නේ ඒ සෑම එකක්ම ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් සඳහා දැරිය හැකි සහ ඇතුළත් කළ හැකි රක්ෂණයක් සපයන රටේ අංක එකේ සැපයුම්කරු වීමට අපගේ සහතික කළ වටිනාකම් ප්‍රස්තුතයේ (assured value proposition) ප්‍රතිමූර්තියක් වීම නිසාය.

ජීවිත රක්ෂණ කළඹ

නිෂ්පාදන කාණ්ඩය	විසඳුම්	ඉලක්කගත ගණුදෙනුකරුවන්
ආරක්ෂාව / ආයෝජනය	ආරක්ෂණ කාණ්ඩය යටතේ ඇති ප්‍රධාන නිෂ්පාදන වන්නේ දිවි තිලිණ, අර්ලි කෑෂ් / යස ඉසුරු, ප්‍රගුණ සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා වෙල්ත් ප්ලස් ය. මෙම නිෂ්පාදන මඟින් ආරක්ෂාව මෙන්ම ඉහළ ප්‍රතිලාභද ලබා දේ.	ආරක්ෂාව සහ ආයෝජන ප්‍රතිලාභ යන දෙකම අපේක්ෂා කරන පාරිභෝගිකයින්
විශ්‍රාම සැලසුම්	විශ්‍රාමික කාණ්ඩය යටතේ ඇති ප්‍රධාන නිෂ්පාදන වන්නේ ෆ්‍රීඩම් සහ ෆ්‍රීඩම් ලයිෆ් ස්ටයිල් ප්ලස් ය. ඉහත සඳහන් නිෂ්පාදන තෝරාගත් කාල සීමාවක් සඳහා සහතික කළ මාසික ආදායමක් සපයයි.	විශ්‍රාම ප්‍රතිලාභයක් අපේක්ෂා කරන පාරිභෝගිකයින්.
ළමා රක්ෂණ සැලසුම්	ළමා කාණ්ඩය යටතේ ප්‍රධාන නිෂ්පාදන වන්නේ මිනිමුතු, මිනිමුතු පරිත්‍යාග සහ මිනිමුතු දායාද රක්ෂණයන්ය. මෙම සැලසුම් මඟින් දරුවාට පරිණත අවධියේදී අරමුදලක් සහතික කරන අතර දෙමව්පියන්ට ආරක්ෂාව සපයයි.	වයස අවුරුදු 15 ට අඩු දරුවන් සිටින ගනුදෙනුකරුවන්
උකස් ආරක්ෂණය	උකස් ආරක්ෂණ සහතික කිරීමේ ඔප්පුව (DTA) මඟින් බැංකු / මූල්‍ය ආයතනවලින් ණය ලබා ගන්නා ණය ගැනුම්කරුවන් සඳහා රක්ෂණ ආවරණයක් සපයයි. නිවාස ණය හෝ වෙනත් ණයක් සඳහා සිදුකරන ලද උකසක් මරණීය අවදානම හෝ ණය ගැතියාගේ පූර්ණ හා ස්ථිර ආබාධිත තත්වයට එරෙහිව රක්ෂණ ඔප්පුවේ කාල සීමාව තුළ ආරක්ෂා කිරීම සඳහා මෙම සැලසුම සැලසුම් කර ඇත්තේ බැංකු / මූල්‍ය ආයතනවලින් ණය ලබා ගන්නා ණය ගැනුම්කරුවන් සඳහාය	බැංකු / මූල්‍ය ආයතනවලින් ණය ලබා ගන්නා ණය ගැනුම්කරුවන්

ආරක්ෂණ සහ ආයෝජන විසඳුම්

Sri Lanka Insurance Janadiri Two year relief plan

Sri Lanka Insurance Divi Thilina Protection Plan

Sri Lanka Insurance EarlyCash

Sri Lanka Insurance Wealth Plus Limited Premium Plan

Sri Lanka Insurance SPEED INVESTMENT

සෞඛ්‍ය රක්ෂණ විසඳුම්

SLIC Comprehensive Health Plus

Sri Lanka Insurance Comprehensive D+ The Health and Life Insurance Cover for Diabetics



ළමුන්ගේ රක්ෂණ විසඳුම්

Sri Lanka Insurance Minimuthu Children's Plan

Sri Lanka Insurance Minimuthu Dayada Children's Plan

Sri Lanka Insurance Minimuthu Parithyaga - Children's Plan

විශ්‍රාමික රක්ෂණ විසඳුම්

Sri Lanka Insurance Freedom Lifestyle Plan

Sri Lanka Insurance Freedom Lifestyle Plus Plan

සමාජයිය හා සම්බන්ධතා ප්‍රාග්ධනය

සමාන්‍ය රක්ෂණ නිෂ්පාදන කලඹ

නිෂ්පාදන කාණ්ඩය	විසඳුම්	ඉලක්කගත ගණුදෙනුකරුවන්
නිවාස රක්ෂණය	මෙය නිවාස හිමියන්ට ඔවුන්ගේ ගොඩනැගිලි ඇතුළු දේපළ ගින්නෙන් හා ඊට සම්බන්ධ අනතුරු සහ සොරකම් වලින් ආවරණය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද පරිපූර්ණ රක්ෂණ ඔප්පුවක් වේ. මෙම ඔප්පුව මගින් නිවාස හිමියාගේ පුද්ගලික වගකීම මෙන්ම ඔහුගේ /ඇයගේ හදිසි මරණයකදී යැපෙන්නන්ට ගෙවීමක් ද ආවරණය කෙරේ	නිවාසවල සම්පූර්ණ අයිතිය හිමි අය.
නිවාස ආරක්ෂණ Lite	මූල්‍ය ආයතනයකින් ණයක් ලබා ගෙන ඇති නිවාස හිමියන්ට පිරිනමනු ලබන මෙයද පරිපූර්ණ රක්ෂණ ඔප්පුවක් වේ. මෙම රක්ෂණ ඔප්පුවේ ඇති සුවිශේෂී වාසිය නම්, දේපලෙහි වටිනාකම නොසලකා රක්ෂිතයාට සම්පූර්ණ ණය මුදල සඳහා රක්ෂණාවරණය ලබා ගත හැකි අතර දේපළක් නියමිත වටිනාකමට වඩා අඩු තක්සේරුවකින් රක්ෂණය කළඳ හිමිකම අඩුනොකරයි.	මූල්‍ය ආයතනයකින් ණයක් ලබා ගෙන ඇති නිවාස හිමියන්
කහවනු මුදල් රක්ෂණ ඔප්පුව	මුදල් තැනකින් තැනකට ගෙනයාමේදී සහ රඳවා තබා ගැනීම, සොරකම් කිරීම සහ ගෙවල්බිඳීම හේතුවෙන් රක්ෂිතයෙකුගේ ව්‍යාපාරික පරිශ්‍රයේදී මුදල් අහිමි වීම මෙම රක්ෂණයෙන් ආවරණය කෙරේ. සේවකයින්ගේ ද්‍රෝහීභාවය, කැරලි, ත්‍රස්තවාදය සහ පුද්ගලික අනතුරු ආවරණය වැනි දිගු ලබාගත හැක.	මුදල් සමඟ ගනුදෙනු කරන ව්‍යාපාරිකයින්
ශ්‍රම සුරැකුම සේවක වන්දි රක්ෂණ ආවරණය	මෙම රක්ෂණය මගින් සේවා කාලය තුළ වන කම්කරුවන්ගේ මරණය හෝ තුවාල සඳහා වන සේවා යෝජක වගකීම ආවරණය කරනු ලැබේ. 1934 කම්කරුවන්ගේ වන්දි ආඥා පනත සහ එහි පසුව සිදුකරන ලද සංශෝධන අනුව ප්‍රතිලාභ ගෙවිය යුතු වේ.	සේවායෝජකයින් ඔවුන්ගේ සේවකයින් වෙනුවෙන්
මෝටර් ප්ලස් විස්තීර්ණ මෝටර් රථ රක්ෂණය	මෙම ප්‍රතිපත්තිය මගින් හදිසි අනතුරු හානි, සොරකම්, ගිනි සහ වෙනත් විවිධ හේතූන්ට එදිරිව මෝටර් රථය ආවරණය කරනු ලැබේ. මෙම රක්ෂණය යටතේ රියදුරු, මගීන්, කැරලි, වැඩ වර්ජනය සහ ත්‍රස්තවාදය ඇතුළත් භාණ්ඩ සඳහා ලබා දිය හැකි දිගු කිහිපයක් ද ඇත.	සියලුම වාහන පදවන්නන්
ශල්‍ය හා රෝහල් වියදම්	මෙම ප්‍රතිපත්තිය මගින් අසනීප, හදිසි අනතුරු හෝ සැත්කම් හේතුවෙන් රෝහල් ගත කිරීම ආවරණය වන පරිදි සුවිශේෂීව සකස් කළ සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රම ඉදිරිපත් කරයි.	ආයතනික අංශය
සමුද්‍ර භාණ්ඩ (Marine Cargo)	සමුද්‍ර භාණ්ඩ ප්‍රවාහන හිමිකම් ඔප්පුව මගින් අන්තර්කාල ගබඩා ඇතුළුව මුහුදු / ගුවන් / මහා මාර්ග මගින් ලොව පුරා විවිධ වර්ගයේ භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා ආවරණය සපයයි.	ආනයනකරුවන් සහ අපනයනකරුවන්
වෙළඳුන් ඒකාබද්ධ රක්ෂණ ඔප්පුව	මෙම සුවිශේෂී නිෂ්පාදිතය කුඩා හා මධ්‍යම පරිමාණ වෙළෙඳුන් අතර ජනප්‍රිය වන අතර එහිදී එක් ප්‍රතිපත්තියක් යටතේ පුළුල් හා පරිපූර්ණ විසඳුමක් ලබා දෙනු ඇත. එනම්, ගිනි හා ඊට සම්බන්ධ අනතුරු, තහඩු වීදුරු, මුදල්, ඉලෙක්ට්‍රොනික උපකරණ සහ කොටස් රක්ෂණය පිරිහීම වේ. කම්කරුවන්ගේ වන්දි රක්ෂණය මෙන්ම තෝරා ගැනීම සඳහා විකල්පයක් ලෙස හිමිකරුට අවමංගල්‍ය වියදම් ඇතුළු පුද්ගලික අනතුරු ආවරණය කිරීම සඳහා, රක්ෂණය තවදුරටත් පුළුල් වේ.	කුඩා හා මධ්‍යම පරිමාණ වෙළඳුන්
තේ කර්මාන්තශාලා විස්තීර්ණ ඔප්පුව	මෙය තේ කර්මාන්තශාලා හිමියන්ට ඔවුන්ගේ දේපළ මෙන්ම වගකීම් ආවරණය කිරීම සඳහා ලබා දෙන විස්තීර්ණ ඔප්පුවකි. මෙම ඔප්පුව මගින් ගිනි හා ඊට සම්බන්ධ අනතුරු, තහඩු වීදුරු, ඉලෙක්ට්‍රොනික උපකරණ, මුදල් සහ භාණ්ඩ ප්‍රවාහනය ආවරණය කරන අතර එය සේවකයින්ගේ වන්දි සහ පුද්ගලික අනතුරු රක්ෂණය ද ආවරණය කරයි. මීට අමතරව, තේ කර්මාන්තශාලා හිමිකම් සඳහා වඩාත් පොදු කරුණ වන විදුලි උච්චාවචනයන් හේතුවෙන් මෝටර් වලට සිදුවන හානි ආවරණය කිරීම සඳහා මෙම රක්ෂණය දීර්ඝ කර ඇත.	තේ කර්මාන්තශාලා හිමියන්
ධීවර බෝට්ටු රක්ෂණය.	ස්වාභාවික අනතුරු මෙන්ම අහම්බෙන් සිදුවන හානි හේතුවෙන් සිදුවන සමස්ථ අලාභයන්හිදී ධීවර ප්‍රජාවට ඔවුන්ගේ බෝට්ටු, දැල් සහ උපකරණ ආවරණය කිරීම සඳහා රක්ෂණ ආවරණයක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් සපයනු ලැබේ. කණ්ඩායමක හදිසි මරණ ආවරණය කිරීම සඳහා ද මෙම රක්ෂණය පුළුල් කෙරේ.	ධීවර බෝට්ටු හිමියන් සඳහා
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සංචාරක ආරක්ෂාව (SLIC Travel Protect)	මෙය සංචාරකයින් විසින් විදේශ සංචාර ආවරණය කිරීම සඳහා මිලදී ගත් රක්ෂණ ඔප්පුවකි. මෙම ඔප්පුවේ සෞඛ්‍ය ප්‍රතිලාභ, හදිසි අනතුරු ප්‍රතිලාභ, පුද්ගලික දේපළ ආවරණය සහ සංචාරක අපහසුතා ආවරණය ඇතුළත් වේ. තවද, පුද්ගලික වගකීම්, පියාසැරි හයි ජැක් ආවරණය, නිවාස ආරක්ෂණ ආවරණය වැනි ප්‍රයෝජනවත් අමතර ප්‍රතිලාභ කිහිපයක් ද ඇත. මෙම ඔප්පුව මගින් වෛද්‍ය සහතික නොමැතිව වයස අවුරුදු 80 දක්වා පුද්ගලයින් ආවරණය කරනු ලැබේ.	සියලුම සංචාරකයින් සඳහා

සෞඛ්‍ය රක්ෂණ විසඳුම්

- Sri Lanka Insurance ANNUAL MEDICAL PLAN
- Sri Lanka Insurance HEALTH PLUS

ව්‍යාපාර රක්ෂණ විසඳුම්

- Sri Lanka Insurance HULL INSURANCE
- Sri Lanka Insurance MARINE CARGO
- Sri Lanka Insurance WORKMEN'S COMPENSATION INSURANCE
- Sri Lanka Insurance BUSINESS CLUB

මෝටර් රක්ෂණ විසඳුම්

- Sri Lanka Insurance MOTORPLUS The Best Option
- Sri Lanka Insurance MOTORPLUS Ladies Only
- Sri Lanka Insurance MOTORPLUS 4WD
- Sri Lanka Insurance MOTORPLUS COMMERCIAL
- Sri Lanka Insurance MOTORPLUS RIDER



නිවාස හිමියන්ගේ රක්ෂණ විසඳුම්

- Sri Lanka Insurance HOME PROTECT LITE
- Sri Lanka Insurance HOME PROTECT

සංචාරක රක්ෂණ විසඳුම්

- Sri Lanka Insurance TRAVEL PROTECT

සමාජයිය හා සම්බන්ධතා ප්‍රාග්ධනය

වෙනත් ඔප්පු

- ගෙවල් බිඳීම
- බැංකුකරුවන්ගේ හානි රක්ෂණය
- වෘත්තිකයන්ගේ හානි රක්ෂණය
- පොදු වගකීම්
- නිෂ්පාදන වගකීම්
- කොන්ත්‍රාත්කරුවන්ගේ අවදානම් සියල්ල
- ඉදිකිරීම් අවදානම් සියල්ල
- කොන්ත්‍රාත්කරුවන්ගේ යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ
- ඉලෙක්ට්‍රොනික උපකරණ
- වාර්ෂික වෛද්‍ය සැලසුම
- රබර් කර්මාන්ත ශාලාව
- ගුවන් යානා රක්ෂණය
- පුද්ගලික හදිසි අනතුරු

අපගේ පිරිනැමීම් කළඹ පුළුල් කිරීම සඳහා අපගේ අඛණ්ඩ උත්සාහයේ කොටසක් ලෙස, සමාලෝචනය කරන ලද වර්ෂයේදී පහත සඳහන් නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වා දෙන ලදී



ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට කාන්තාවන් සඳහා සුවිශේෂී ප්‍රතිලාභ සහිත සුවිශේෂී මෝටර් රථ රක්ෂණයක් 'ලේඩීස් ඔන්ලි". 24/7 මාර්ගයේ ආධාරක සේවාව (ඇදගෙන යාම, ටයර් මාරු කිරීමේ ආධාර, විසර්පිත බැටරි ආධාර), ඇමතුමක් ලබා දී ඇදගෙන යාමේ පහසුකම, සවස 6 සිට පසුදා අලුයම 6 දක්වා, හදිසි අනතුරකදී හදිසි නවාතැන් පිරිවැය ප්‍රතිපූරණය කිරීම ඇතුළුව සුවිශේෂී මෝටර් රථ රක්ෂණය මගින් සුවිශේෂී ප්‍රතිලාභ ලබා දේ., කාන්තාවන් සඳහාම ලෝයල්ටි ප්‍රතිලාභ හිමි වන අතර සෑම හිමිකම් පෑමක් නොකරන වසරක් සඳහාම ත්‍යාගයක් ලැබේ.



මෝටර් ප්ලස් රයිඩර් යනු යතුරුපැදි හිමියන් සඳහාම නිර්මාණය කර ඇති සුවිශේෂී මෝටර් රථ රක්ෂණයකි. ඒ අතර රුපියල් 100,000 ක් දක්වා වටිනා පුද්ගලික අනතුරු ආවරණයක් සහ වැඩකරන පැය 3 ක් තුළ රුපියල් 25,000 ක් දක්වා හිමිකම් පෑමක් ඇතුළත් වේ.



මෝටර් ප්ලස් ටුක් යනු ත්‍රිරෝද රථ හිමියන් සඳහා නිර්මාණය කරන ලද ප්‍රතිලාභ රාශියක් ලබා දෙන විශේෂ මෝටර් රථ රක්ෂණයකි. රුපියල් 100,000 ක් වටිනා පුද්ගලික අනතුරු ආවරණයක්, වැඩ කරන පැය 3 ක් තුළ රුපියල් 40,000 ක් දක්වා හිමිකම් පෑමක් සහ වසරකට රු. 5000 ක් දක්වා ඇදගෙන යාමේ පහසුකම් මෙමඟින් සලසයි.

මෙම නව නිෂ්පාදන සෑම එකක්ම සමඟ විවිධාකාර නම්‍යශීලී ගෙවීම් සැලසුම්, තාක්ෂණික වෘත්තිකයින් කණ්ඩායමක් විසින් අනතුර සිදුවූ ස්ථානයේම තක්සේරු කිරීම, මුදල් රහිත බේරුම්කරණ පහසුකම් සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ජංගම යෙදුම සහ පාරිභෝගික පිවිසීම වන www.srilankainsurance.com හරහා මෝටර් රථ රක්ෂණය අළුත් කිරීමේ හැකියාව ද ඇත.

වසංගත අභියෝග කළමනාකරණය කිරීමට පාරිභෝගිකයින්ට සහාය වීම

කොවිඩ්-19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවී තිබෙන බාධක සැලකිල්ලට ගනිමින්, අඟුලු දැමූ කාල සීමාව තුළ අළුත් කිරීම් සිදු වූ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා මෝටර් රථ රක්ෂණ ඔප්පු හිමියන්ට කාල සීමාව දිගු කරන ලද තාවකාලික ආවරණයක් ලබා දෙන ලදී.

රෝහල්ගත කිරීම් සඳහා දෛනික මුදල් ප්‍රතිලාභ, රෝහල්ගත කිරීමේ බිල් පියවීම (මුදල් රහිත සහ ප්‍රතිපූරණ විකල්ප), බරපතල රෝගාබාධ ආවරණය, කොවිඩ්-19 ආශ්‍රිත ගැටළු හේතුවෙන් ජීවිත අහිමිවීම ආවරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සෞඛ්‍ය හා ජීවිත ප්‍රතිපත්ති පුළුල් කරන ලදී.

කොවිඩ්-19 ආසාදනය හේතුවෙන් රෝහල්ගත වීමේ වියදම් සඳහා සියලුම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ආයතනික සෞඛ්‍ය රක්ෂණ ඔප්පු හිමියන් ද ආවරණය කෙරේ.

ප්‍රතිරක්ෂණ හා හිමිකම් ගෙවීමේ විශිෂ්ටත්වය

වගකිවයුතු ආයතනයක් ලෙස අපි ප්‍රති තරඟකාරී හැසිරීම් වලින් වැළකී සිටිමු. අපගේ විධිමත් මිලකරණ ප්‍රතිපත්තිය මඟින් අපගේ ප්‍රතිරක්ෂණ පිරිනැමීම් මිල නියම කිරීමේදී විනයගරුක, ස්ථාවර හා ප්‍රවේශම් සහගත ප්‍රවේශයක් සඳහා පදනම සපයයි. අපගේ ඉලක්කය වන්නේ අපගේ ගනුදෙනුකරුවන්ට නියම වෙළඳපල මිලට හොඳම පන්තියේ ප්‍රතිරක්ෂණ සේවාවන්ගෙන් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වාරික මිලකරණය සහ හිමිකම් පියවීමේ අවදානම් අතර සමතුලිතතාවයක් ඇති කිරීමයි.

මේ අතර, අපගේ හිමිකම් කළමනාකරණ ක්‍රියාවලිය සෑම විටම කාර්යක්ෂමව පවතින බව සහතික කිරීම සඳහා, පහත සඳහන් මූලධර්ම මත පදනම්ව ගනුදෙනුකරුවන්ගේ යහපතට ප්‍රමුඛතාවය දෙන පැහැදිලි මාර්ගෝපදේශ සහ වගකීම් අප විසින් ස්ථාපිත කර ඇත;

- හිමිකම් ගෙවීම් සාධාරණ ලෙස හසුරුවා ඉක්මණින් ලබා දිය යුතුය
- හිමිකම් පරිහරන ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම විනිවිද පෙනෙන අතර හිමිකම් පරිහරන ක්‍රියාවලියේ සෑම අදියරකම ප්‍රගතිය පිළිබඳව හිමිකරු දැනුවත් කරනු ලැබේ.
- හිමිකම් පෑම අර්ධ වශයෙන් සමථයකට පත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමකදී හිමිකම් පාන අයට ලිඛිත පැහැදිලි කිරීමක් සපයනු ලැබේ

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි මධ්‍යම හිමිකම් සැකසුම් ඒකකය සියලු හිමිකම් ඉල්ලීම් හසුරුවන අතර විශේෂ හිමිකම් මණ්ඩලයක් විසින් මතභේදාත්මක සහ ඉහළ ප්‍රවේශ ලක්ෂ්‍යන්හි හිමිකම් කළමනාකරණය කරයි. නොවිසඳුණු හිමිකම්, තිබේ නම්, රටේ රක්ෂණ නීති රාමුවට අනුව විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණය වෙත යොමු කරනු ලැබේ.

ඉහළ පාරිභෝගික පහසුව

ස්මාර්ට් උපාංග සහ සමාජ මාධ්‍ය භාවිතය වේගවත් වීමත් සමඟ ගනුදෙනුකරුවන්ගේ හැසිරීම අඛණ්ඩව විකාශනය වෙමින් පවතින හෙයින්, තරඟකරුවන් පසුකරයාමට නව්‍යකරණයේ වැදගත්කම අපි තේරුම් ගෙන ඇත්තෙමු. මෙම සන්දර්භය තුළ, ඉහළම පාරිභෝගික පහසුව සලසන නවෝත්පාදක අගය එකතු කළ සේවාවන් ලබා දීමෙන් අපව වෙන්කර හඳුන්වා දීමට අපි උත්සාහ කරමු.

2019 දී දියත් කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි පාරිභෝගික යෙදුම පාරිභෝගික පහසුවෙහි පරම අවස්ථාව ලෙස දැක්විය හැක. පාරිභෝගිකයින්ට ඔප්පු තොරතුරු සහ නිෂ්පාදන විස්තර බැලීමට, ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ඔප්පු දෙකටම වාරික ගෙවීම් කිරීමට මෙන්ම සිය සාමාන්‍ය රක්ෂණ ඔප්පුව අන්තර්ජාලය හරහා අළුත් කිරීමට, මෝටර් රක්ෂණ වන්දි ගෙවීම් ගැන දැන්වීමට, ගූගල් සිතියම්වල ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි ශාඛා සොයා ගැනීමට හැකිවීම, මාර්ගයේ සහ හදිසි ආධාර සේවා 24/7 පිවිසීම , මෝටර් ප්ලස් ලෝයල්ටි රිවෝර්ඩ්ස් හවුල්කාර වෙළෙන්දන් සොයා ගැනීම සහ භුක්ති විඳීමට හැකි වන පරිදි අංග සම්පූර්ණ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි ජංගම යෙදුම ඊළඟ පරම්පරාවේ වේදිකාවක් භාවිතයෙන් ගොඩනගා ඇත.

ඊට අමතරව, අපගේ ආයතනික වෙබ් අඩවිය (www.srilankainsurance.com) නිෂ්පාදන සහ සේවාවන් රාශියකට පැය 24 පුරා ප්‍රවේශය ලබා දෙන අතර අපගේ හවුල්කාර ජාල හරහා සහ වෙනත් දෙමුහුන් නාලිකා සමඟ ප්‍රශස්ත පාරිභෝගික පහසුව සඳහා අපි පහසු ජංගම සහ වෙනත් ගෙවීම් විසඳුම් රැසක් ලබා දී ඇත.

පාරිභෝගික පහසුව සඳහා ඩිජිටල් නාලිකා



කොවිඩ්-19 වසංගතයට ප්‍රතිචාර වශයෙන් නව නාලිකා හඳුන්වා දෙන ලදි

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මොබිටෙල් සමඟ අත්වැල් බැඳගෙන පාරිභෝගිකයින්ට mcash මඟින් ඔවුන්ගේ වාරික ගෙවීමට කරදරයකින් තොර පහසු ක්‍රමයක් සපයයි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ මහජන බැංකුව අතර ඇති අවබෝධතා ගිවිසුමක් මඟින් ශ්‍රී ලංකාව පුරා මහජන බැංකුව හි ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය සහ ස්වයං බැංකු මධ්‍යස්ථාන හරහා සිය වාරික පියවා ගැනීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ගනුදෙනුකරුවන්ට ඉඩ ලබා දේ

ලංකා බැංකුව සමඟ සහයෝගීව QR පදනම් කරගත් ජීවිත රක්ෂණ වාරික ගෙවීම් සක්‍රීය කිරීම සඳහා ලංකා බැංකු "ස්මාර්ට් පේ" හඳුන්වා දීම

රක්ෂණ ඔප්පු මිලදී ගැනීම, රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සහ වාරිකය ලබා ගැනීම සඳහා පහසුකම් සැපයීමට ලංකා හොස්පිටල්ස්හි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සේවා කවුන්ටරයක් පිහිටුවන ලදී.

සමාජයිය හා සම්බන්ධතා ප්‍රාග්ධනය

වගකීමිසහගත අලෙවිකරණය සහ විනිවිද පෙනෙන සන්නිවේදනය

අපගේ පාරිභෝගික සම්බන්ධතා උපායමාර්ගය පාරිභෝගිකයින්ට පැහැදිලි හා සංක්ෂිප්ත තොරතුරු සැපයීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි. මේ සම්බන්ධයෙන්, අපගේ ප්‍රවර්ධන සහ අලෙවිකරණ ද්‍රව්‍ය සංවර්ධනය කිරීමේදී සියලු නියාමන අනාවරණය කිරීමේ අවශ්‍යතාවයන්ට අපි අනුකූල වෙමු. මෙයටත් ඉහළින්, අපගේ ගනුදෙනුකරුවන්ට අවශ්‍ය හා අදාළ සියලු තොරතුරු ලබා දීමේ හොඳම භාවිතයන් මිණුම් සලකුණු කිරීමට අපි උත්සාහ කරමු. එමඟින් අප සමඟ ගනුදෙනු කිරීමේදී දැනුවත් තීරණ ගැනීමට ඔවුන්ට හැකි වේ. අපගේ නිෂ්පාදන හා සේවාවන් පිළිබඳ තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආවරණය වන පරිදි පුළුල් පරාසයක නාලිකා හරහා අපගේ ගනුදෙනුකරුවන්ට දැනුම් දෙනු ලැබේ. තවද, ඕනෑම තොරතුරක් පිළිබඳ විමසීම් වෘත්තීයමය ආකාරයෙන් හැසිරවීමට, අපගේ නිෂ්පාදන හා සේවාවන්ට අදාළ අවදානම් පැහැදිලි කිරීමට සහ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා සුදුසු විසඳුම් පිළිබඳ උපදෙස් ලබා දීමට සියලුම ශාඛා නිලධාරීන් පුහුණු කරනු ලැබේ.

පාරිභෝගික පැමිණිලි කඩිනමින් හා කාර්යක්ෂමව හැසිරවීම

පාරිභෝගික කේන්ද්‍රීය ආයතනයක් ලෙස, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පාරිභෝගික ප්‍රතිපෝෂණය සාදරයෙන් පිළිගන්නා අතර ගනුදෙනුකරුවන්ට කෙලින්ම සම්බන්ධ වීමට නාලිකා ගණනාවක් ස්ථාපිත කර ඇත. මේවාට පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානයක්, අපගේ ආයතනික වෙබ් අඩවිය මෙන්ම මෑත වසරවල වැඩි වැඩියෙන් ජනප්‍රිය වී ඇති සමාජ මාධ්‍ය නාලිකා ද ඇතුළත් ය.

අපගේ සේවා ගුණාත්මකභාවය පිළිබඳව මතු වන සෑම අවධානයක්ම අපගේ සේවාවන් වැඩිදියුණු කිරීමට සහ අප සමඟ ගනුදෙනු කිරීම අපගේ පාරිභෝගිකයන්ට වඩාත් පහසු, විශ්වාසදායක සහ තෘප්තිමත් කිරීමේ අවස්ථාවක් ලෙස සැලකේ. අපගේ මනා පුහුණුව ලත් සම්පත් සේවකයින් පාරිභෝගික අවශ්‍යතා ලේඛනගත කිරීම, අධ්‍යයනය කිරීම සහ සියල්ලටම වඩා කඩිනමින් විසඳීම සහතික කරයි. පාරිභෝගික පැමිණිලි ලැබීමේ සිට පැමිණිල්ල විසඳන තෙක් පැහැදිලිව ප්‍රකාශිත ක්‍රියාවලියක් ඇතුළත් පාරිභෝගික පැමිණිලි කළමනාකරණ පද්ධතියක් අප සතුව ඇත.

පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාවලිය



විශ්වාසවන්තභාවයට ප්‍රතිලාභ ලබා දීම

අපගේ ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ විශ්වාසවන්තභාවය වෙනුවෙන් ප්‍රතිලාභ පිරිනැමීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි පාරිභෝගික වටිනාකම් ප්‍රස්තුතයේ ප්‍රධාන අංගයකි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි මෝටර් ප්ලස් ලෝයල්ටි රිවෝර්ඩ්ස් වැඩසටහන මඟින් මෝටර් ප්ලස් රක්ෂණ ඔප්පු හිමියන්ට විශාල ත්‍යාග දිනුම් ඇදීම්, වෙළඳ හවුල්කරුවන් සමඟ බැඳීම් ඔස්සේ විශේෂ දීමනා සහ අගය එකතු කළ සේවාවන් විශාල ප්‍රමාණයක් ඇතුළුව අසංඛ්‍ය ත්‍යාග සහ ප්‍රතිලාභ ලබා දේ. 2020 දී මෝටර් ප්ලස් ලෝයල්ටි රිවෝර්ඩ්ස් වැඩසටහන ඔටෝ මිරාජ් සහ සර්විස් ලංකා හෝම් නර්සිං හා ස්විෆ්ට් කෙයාර් සමඟ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඇතිකරගත් සබඳතා සමඟ තවදුරටත් පුළුල් කරන ලදී.

ප්‍රධාන සංඛ්‍යාලේඛන

	2020/21	2019/20	2018/19	2017/18	2016/17
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි වෙළඳපල කොටස (ජීවිත රක්ෂණ ව්‍යාපාරය)	**20.33%**	18.84%	19.8 %	21.35%	20.5 %
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි වෙළඳපල කොටස (ජීවිත රක්ෂණ නොවන ව්‍යාපාරය)	**23.1%**	16.7%	16.5%	17.5%	19%

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි ව්‍යාපාර හවුල්කරු ප්‍රාග්ධනය එහි වටිනාකම් නිර්මානය කිරීමේ අරමුන සපුරාලීම දිගටම සිදු කරන බවට අප සහතික වන්නේ කෙසේද?

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි තරඟකාරී මායිම පවත්වා ගැනීමට මෙන්ම ව්‍යාපාරයේ අඛණ්ඩතාව සහතික කිරීමට අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි ව්‍යාපාරයේ ස්වභාවය වන්නේ රක්ෂණ නියෝජිතයින්, රක්ෂණ තැරැව්කරුවන්, ප්‍රතිරක්ෂණකරුවන්, නාලිකා හවුල්කරුවන් මෙන්ම සාමාන්‍ය සැපයුම්වල වෙළෙන්දන් සහ වෙනත් සේවා සපයන්නන් ඇතුළු පුළුල් පරාසයක ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ වැඩ කිරීමට අපට අවශ්‍ය වීමයි. මෙම සියලු පාර්ශවකරුවන් අපගේ සාර්ථකත්වයට දායක වන හෙයින්, අපි නිවැරදි සහයෝගිතා හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම සඳහා විශාල වශයෙන් ආයෝජනය කරන අතර හවුල් වටිනාකමේ මූලධර්මය මත පදනම්ව ශක්තිමත් සහ විශ්වාසදායක හවුල්කාරිත්වයක් ඇති කර ගැනීම අරමුණු කර ගනිමු. අප සතුව බාහිර මූලාශ්‍ර ප්‍රතිපත්තියක් ද තිබේ.

දීර්ඝ කාලීනව විශ්වාසය ගොඩනඟා ගැනීම සහ සබඳතා පවත්වා ගැනීම සඳහා අපගේ ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම සඳහා අපි ඉතා විධිමත් ප්‍රවේශයක් පවත්වා ගනිමු.

රක්ෂණ නියෝජිතයන්

අපගේ රක්ෂණ නියෝජිතයන් අපගේ වෙළඳ සන්නාමයේ ප්‍රධාන තානාපතිවරුන් අතර වේ. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සන්නාමය හා සම්බන්ධ අඛණ්ඩතාව පිළිබඳ ආචාරධර්ම සහ උසස් ප්‍රමිතීන් ඔවුන් විසින්ද පිළිඹිබු කරන බව සහතික කිරීමට අපට අවශ්‍ය වන්නේ එබැවිනි. සියලුම නියෝජිතයින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි විකුණුම් ගිවිසුම හරහා බඳවා ගෙන ඇති අතර, එමඟින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා නියෝජිතයන් ලෙස රැඳී සිටින තාක් කල් සියලුම නියෝජිතයින් පිළිපැදිය යුතු නියමයන් සහ කොන්දේසි නියම කරයි.

තවද, අපගේ සියලුම නියෝජිතයින්ට අතිරේක සංවර්ධන අවස්ථා සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි නියෝජිත ආයතන වෘත්තීය මාවත හරහා ප්‍රවේශය ලබා දෙන්නෙමු. නියෝජිත ආයතන වෘත්තීය මාර්ග වැඩසටහන හරහා හඳුනාගෙන ඇති ඉහළ කාර්යසාධකයන් හට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි අභ්‍යන්තර ප්‍රතිලාභ වේදිකා ඔස්සේ පිළිගැනීමක් ලබා දේ. ඊට අමතරව, අපගේ නියෝජිතායතන බලකාය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි ඩිජිටල්කරණය කිරීමේ මූලපිරීම් වලින් අඛණ්ඩව ප්‍රතිලාභ ලබන බවට අපි සහතික වෙමු.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අනුබද්ධිත නියෝජිත ගිවිසුම්ගතව සිටින විකුණුම්කරුවන් සඳහා වඩාත් ඵලදායී හා ආකර්ශනීය සංවර්ධන මොඩියුලයක් සහ මෙහෙයුම් ව්‍යුහයක් ක්‍රියාත්මක කිරීම සඳහා නියෝජිතායන සංවර්ධන ආකෘතිය (ADM) හඳුන්වා දෙන ලදී. මෙම ව්‍යුහය මඟින් නව බඳවා ගන්නන් සඳහා පැහැදිලි ප්‍රගති මාවතක් ලබා දෙන අතර, දැනට සිටින කාර්ය සාධකයන් නිවැරදිව ස්ථානගත කිරීම සඳහා විධිමත් කිරීමක් සහ මාර්ගයක් සපයන බැවින් මෙය සමාගමේ නියෝජිතයින් බඳවා ගැනීමේ ප්‍රේරණය සඳහා ආධාරක මෙවලමක් වනු ඇත.

සමාජයිය හා සම්බන්ධතා ප්‍රාග්ධනය

නියෝජිතායන සංවර්ධන ආකෘතියේ මෙහෙයුම් ව්‍යුහය



2021 මැයි 19 වන විට නියෝජිතායතන සංවර්ධන ආකෘතිය යටතේ සමූහ මූල්‍ය උපදේශකයින් 52 ක් (අභ්‍යන්තරව හා බාහිරව උසස් කිරීම කරන ලද) සිටිති. කෙසේ වෙතත්, අභ්‍යන්තර උසස් කිරීම් වසරකට දෙවරක් සිදු කරනු ලැබේ, එනම් කාර්ය සාධන නිර්ණායක සහ කර්මාන්ත බඳවා ගැනීම් මත පදනම්ව ජූලි සහ ජනවාරි මාසවලදී .

රටේ ප්‍රමුඛතම රක්ෂණකරු වශයෙන්, MDRT (ඩොලර් මිලියනයක වට මේස) වැඩසටහනේ සාමාජිකයන් වන අපගේ නියෝජිතයින්ගේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන් සංවර්ධනය කිරීමට විශේෂ මුල පිරීම් ද අප සතුව ඇත. ඩොලර් මිලියනයක වට මේස ප්‍රමිති සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගනිමින් උත්සුක වන අපේක්ෂකයින්ට ඔවුන්ගේ විකුණුම් ප්‍රවේශයන් ප්‍රසාධනය කිරීමේ හැකියාව ලබා දීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්, නිතිපතා උපදේශනය සහ සේවාදායක සම්මන්ත්‍රණ සඳහා සුවිශේෂී ප්‍රවේශය සැපයීම කෙරෙහි මෙම උත්සාහයන්හිදි අවධානය යොමු කරයි. 1927 දී ආරම්භ කරන ලද, මූල්‍ය වෘත්තිකයන්ගේ ඉහළ මට්ටමේ සංගමයක් වන ඩොලර් මිලියනයක වට මේස සමුළුව යනු රටවල් 70 ක සමාගම් 500 කට අධික සංඛ්‍යාවක සේවය කරන ලොව ප්‍රමුඛ පෙළේ ජීවිත රක්ෂණ හා මූල්‍ය සේවා වෘත්තිකයන්ගෙන් 65000 කට වැඩි පිරිසකගේ ගෝලීය ස්වාධීන සංගමයක් වේ. MDRT සාමාජිකයින් සුවිශේෂී වෘත්තීය දැනුම, දැඩි ආචාර ධර්ම හැසිරීම සහ කැපී පෙනෙන සේවාදායක සේවය පෙන්නුම් කරයි. MDRT සාමාජිකත්වය ජීවිත රක්ෂණ හා මූල්‍ය සේවා ව්‍යාපාරයේ විශිෂ්ටත්වයේ ප්‍රමිතිය ලෙස ජාත්‍යන්තරව පිළිගැනේ. 2020 වර්ෂයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් මේස සාමාජිකත්ව සභාවට තේරී පත් වූ සාමාජිකයින් 03 දෙනා ද ඇතුළුව උපදේශකයින් 93 දෙනෙකු MDRT සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබා ඇත.

ආයුගණක උපදේශකයන්

Messrs Wills Towers Watson India Pte. Ltd සහ Messrs NMG Financial Services Consulting ජීවිත හා සාමාන්‍ය රක්ෂණ සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආයුගණක උපදේශකයන් ලෙස සේවය කරන අතර ඔවුන්ගේ විශේෂත්වය අවශ්‍ය කරුණු පිළිබඳව අපට උපදෙස් ලබා දෙයි.

ප්‍රතිරක්ෂණකරුවන්

ඉහළ වටිනාකම් සහිත අවදානම් අවශෝෂණය කර ගැනීම සඳහා අතිරේක ආරක්ෂාවන් සැපයීමෙන් ප්‍රතිරක්ෂණකරුවන් අපගේ ව්‍යාපාරයට අත්‍යවශ්‍ය සහයෝගයක් ලබා දෙන අතර එසේ කිරීමෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වර්ධන අරමුණු කරා යාම සඳහා වේදිකාවක් නිර්මාණය කරයි.

ඔවුන්ගේ භාරකාර භූමිකාව සැලකිල්ලට ගෙන, ප්‍රතිරක්ෂණකරුවන් සමඟ ගිවිසුම්ගත කිරීමේදී අපි වරණීය ප්‍රවේශයක් පවත්වා ගනිමු. රක්ෂණ අවදානම් බෙදා හැරීම සහතික කිරීම සඳහා, අපි ශ්‍රේණිගත කළ ප්‍රතිරක්ෂණකරුවන් 103 දෙනෙකු සමඟ සබඳතා පවත්වා ගනිමු. ඒ අය අතරින්; 2019 දී ලොව ඉහළම දළ ලිඛිත වාර්කය ලබාගත් කීර්තිමත් ප්‍රතිරක්ෂණකරුවෙකු වන Swiss Re, 2020 දී අපගේ ප්‍රධාන ප්‍රතිරක්ෂණ ගිවිසුම් බොහොමයකට අඛණ්ඩව මූලිකත්වය දුන්නේය.

විශාලතම ඉන්දියානු ප්‍රතිරක්ෂණ සමාගම සහ ඉන්දියානු රජයට අයත් GIC ද අපගේ ගිවිසුම්වලට අඛණ්ඩව සහභාගී විය. මීට අමතරව, 2019 දී තුන්වන විශාලතම ප්‍රතිරක්ෂණකරු වූ Hannover Re 2020 දී, අපගේ ගිවිසුම්වලින් කොටසක් ලබා ගැනීමට තීරණය කළ අතර තවත් "ඒ" ශ්‍රේණිගත කළ ඉහළ ප්‍රතිරක්ෂණකරුවෙකු වන Korean Re විලෙස සිදු කරන ලදී . චික්සත් රාජධානියේ ලොයිඩ්ගේ සින්ඩිකේට් ඇතුළු තවත් "ඒ" ශ්‍රේණිගත ප්‍රතිරක්ෂණකරුවන් ගණනාවක් අපගේ ගිවිසුම්වලට දිගටම සහාය දක්වයි.

ප්‍රතිරක්ෂණයේ සෘජු ප්‍රතිලාභවලට අමතරව, ප්‍රමුඛ පෙළේ ගෝලීය ප්‍රතිරක්ෂණකරුවන් සමඟ අපගේ දිගුකාලීන සම්බන්ධතාවය නිසා රක්ෂණ කර්මාන්තය පිළිබඳ ඔවුන්ගේ ගැඹුරු දැනුම, ප්‍රතිරක්ෂණ සඳහා විනයගරුක ප්‍රවේශය තුළින් ප්‍රතිලාභ ලබා ගැනීමට සහ අපගේ නවෝත්පාදන උපාය මාර්ග පෝෂණය කිරීම සඳහා නවතම ගෝලීය ප්‍රවණතා පිළිබඳ අවබෝධය ලබා ගැනීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හට හැකි වී තිබේ.

නාලිකා හවුල්කරුවන්

රටේ ප්‍රමුඛතම රක්ෂකයා ලෙස, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙ හි වටිනාකම් දාමයට අපගේ දිවයින පුරා පිහිටි රක්ෂණ තැරැව්කරුවන්ගේ ජාලය, බෑන්ක්ඇෂුරන්ස් හවුල්කරුවන් සහ සෞඛ්‍ය සේවා හවුල්කරුවන්, වාහන නියෝජිතයින්, සේවා වැඩමුළු සහ ගෙවීම් පහසුකම් සපයන්නන් දක්වා පුළුල් පරාසයක නාලිකා හවුල්කරුවන් ඇතුළත් වේ. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙ හි වටිනාකම් ප්‍රස්තුතය වෙළඳපොළට ගෙනයාමට ඔවුන් සියලු දෙනා එක්ව දායක වේ. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙ හි මෙහෙයුම් ප්‍රමිතීන් සහ ආචාර ධර්ම පද්ධතිය සමඟ හවුල් වීමට හවුල්කරුවන්ට උපකාර කිරීම සඳහා අපි අවබෝධතා ගිවිසුමක් හරහා මෙම හවුල්කාරිත්වයට පිවිසෙමු. මේ ආකාරයට අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා තිරසාර දිගුකාලීන සබඳතා ගොඩනඟා ගැනීමේ පදනම ලෙස ව්‍යාපාරික හවුල්කරුවන්ට සාධාරණ හා යුක්තිසහගත ලෙස සැලකීම මෙම අවබෝධතා ගිවිසුම් මගින් සහතික කෙරේ.



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මහජන බැංකුව සමඟ ගිවිසුමක් හුවමාරු කර ගනී



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඔටෝ මීරාජ් සමඟ අවබෝධතා ගිවිසුමක් හුවමාරු කර ගනී



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ද ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී හි කවුන්ටරයක් විවෘත කරනු ලැබීම



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් සර්ටිස් ලංකා හෝම් නර්සිං සහ ස්විෆ්ට් කෙයාර් (පුද්ගලික) සමාගම සමඟ අවබෝධතා ගිවිසුමක් හුවමාරු කර ගනී



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මොබිටෙල් (පුද්) සමාගම සමඟ අවබෝධතා ගිවිසුමක් හුවමාරු කර ගනී

සමාජයිය හා සම්බන්ධතා ප්‍රාග්ධනය

වෙනත් විකුණුම්කරුවන් සහ සේවා සපයන්නන්
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව අනෙකුත් වෙළෙන්දන් සහ සේවා සපයන්නන් ගිවිසුම්ගත වී ඇත. එමඟින් සාධාරණ හා යුක්තිසහගත ලෙස තෝරා ගැනීමේ මූලධර්ම අනුව වෙළෙන්දන් සහ සේවා සපයන්නන් බඳවා ගැනීම අවධාරණය කරයි.

සාධාරණ හා සදාචාරාත්මක ව්‍යාපාරික භාවිතයන් පිළිබඳ දැඩි අනුශාසකයෙකු ලෙස, වෙළෙන්දන්ට සහ සේවා සපයන්නන්ට ඔවුන් සතුව ඇති පැමිණිලි සහ යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සඳහා අපි පැහැදිලි නාලිකාවක් පිහිටුවා ඇත්තෙමු. අපගේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ දක්වා ඇති සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිවලට අනුව මේ ආකාරයෙන් ලැබෙන සියලුම පැමිණිලි සහ යෝජනා සමාලෝචනය කර විසඳනු ලැබේ.

නියෝජිතායන බලකාය
2016 සිට 2020 දක්වා MDRT සාමාජිකයින්

ලබාගත් වර්ෂය	2020	2019	2018	2017	2016	2015
සාමාජික වර්ෂය	2021	2020	2019	2018	2017	2016
මුළු සාමාජිකයන්	**93**	64	63	52	60	42

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි ප්‍රජා ප්‍රාග්ධනය එහි වටිනාකම් නිර්මානය කිරීමේ අරමුණු සපුරාලීම දිගටම සිදු කරන බවට අප සහතික වන්නේ කෙසේද
ශ්‍රී ලංකාවේ විශාලතම ව්‍යාපාරික ආයතනයක් ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ප්‍රජාවේ ක්‍රියාකාරී සහ සහයෝගී සාමාජිකයෙකු වීමට කැපවී සිටී. ප්‍රජා ආයෝජන සඳහා අපගේ ප්‍රවේශය මූලික ජාතික ප්‍රමුඛතා ආමන්ත්‍රණය කිරීම අරමුණු කරයි. වගකිවයුතු ආයතනික භාරකරුවෙකු වීමට උත්සාහ කරමින්, අපි සමහර විට වෙනත් ආයතන සමඟ හවුල් වී එහි අපේක්ෂිත ප්‍රතිලාභීන් සඳහා දීර්ඝ කාලයක් තිස්සේ තිරසාර ප්‍රතිලාභ ලබා දීමේ හැකියාව ඇති වඩාත් බලපෑමෙන් යුත් මූලපිරිම් සිදු කරමු.

සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ දී සිදු කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළේ වසංගත ආශ්‍රිත අභියෝග ජය ගැනීම සඳහා ප්‍රජාවට සහාය වීම කෙරෙහි ය

විරු අභිමන් දියත් කිරීම
විරු අභිමන් - වසංගතයට එරෙහි සටනේ පෙරමුණෙහි සිටින රාජ්‍ය අංශයේ සේවකයින්ගේ පවුල් සඳහා නොමිලේ ලබා දෙන මූල්‍ය ආවරණයකි. ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 පළමු රැල්ල අතරතුර දියත් කරන ලද විරු අභිමන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්, වෛද්‍යවරුන්, හෙදියන්, සහායකයින්, රියදුරන්, සුළු සේවකයින්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරීන් ඇතුළු සියලුම රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවකයින්, ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් (ශ්‍රී ලංකා හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව), ශ්‍රී ලංකා පොලිසිය සහ ශ්‍රී ලංකාවේ සිවිල් ආරක්ෂක බලකාය සහ ක්ෂේත්‍ර නිලධාරීන් ඇතුළු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සාමාජිකයින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සාමාජිකයින් හා තැපැල් දෙපාර්තමේන්තුවේ සාමාජිකයන් සඳහා ව්‍යාප්ත කරන ලදී.

වසංගතයට එරෙහිව සටන් කළ සැඟවුනු වීරයන් සඳහා නොමිලේ ලබා දෙන ලද ශ්‍රී ලංකාවේ පළමු හා එකම ආවරණය මෙය විය.

කොවිඩ් -19 ට එරෙහිව දේශයෙහි සටනට සහාය වීම
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව , ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් යන සමාගම් එක්ව සිය සේවකයින් පූර්ණ කාලීනව සේවයට ගෙන වීමට රජයේ ආයතනවලට සහාය වීම සඳහා පුද්ගලික ආරක්ෂක උපකරණ (PPE) ලබා දුන්නේය. කොවිඩ්-19 පැතිරීමේ අවදානම අවම කිරීම සඳහා පූර්වෝපාය පියවරක් ලෙස නාගරික සභා, පළාත් සභා සහ නගර සභා සහ අනෙකුත් රජයේ ආයතන අතර මතුපිට විෂබීජ නාශක ලීටර් 10,000 ක් බෙදා හරින ලදී. අගුලු දැමීමේ කාලයෙන් පසු සියළුම රාජ්‍ය අංශයේ සේවකයින්ට ආරක්ෂිතව නැවත සේවයට පැමිණිය හැකි බව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව කොළඹ රාජ්‍ය අංශයේ ආයතන කිහිපයක මතුපිට විෂබීජ නාශක ක්‍රියාවලිය ආරම්භ කළේය. සේවකයින්ට මෙම කාර්යාල විවෘත කිරීමට පෙර මහ නගර සභා, නාගරික සභා සහ නගර කාර්යාලවල එවැනි විෂබීජ නාශක ක්‍රියාවලීන් සිදු කරන ලදී.

සාමාන්‍ය ජනතාවට සේවා සපයමින් පෙරමුණේ සිටි ආර්ථික සංවර්ධන නිලධාරීන් 10400 ක් සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් සනීපාරක්ෂක හා මුහුණු ආවරණ පරිත්‍යාග කරන ලදී.



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපති ජගත් වැල්ලවත්ත මහතා පුද්ගලික ආරක්ෂක උපකරණ කට්ටල අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා වෙත භාර දෙයි. අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි , අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත සහ හිටපු අමාත්‍ය ගාමිනි ලොකුගේ යන මහත්ම මහත්මින්ද සිටිති.

'සහන' විදේශ රැකියා රක්ෂණය සහ සුභසාධන යෝජනා ක්‍රමය දියත් කිරීම

සංක්‍රමණික සේවකයින්ගේ ප්‍රයෝජනය සඳහා 'සහන' විදේශ රැකියා රක්ෂණය සහ සුභසාධන යෝජනා ක්‍රමය දියත් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය සමඟ අත්වැල් බැඳගනී.

'සහන' විදේශ රැකියා රක්ෂණය සහ සුභසාධන යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය යටතේ ලියාපදිංචි වී සිටින සංක්‍රමණික සේවකයන් සඳහා විහිදේ. 'සහන' යෝජනා ක්‍රමය මඟින් විදේශයන්හි සේවය කරන අතරතුර ඕනෑම හේතුවක් නිසා සිදුවන මරණ, ආපසු පැමිණ මාස 3 කට පසු ශ්‍රී ලංකාවේ දී සිදුවන මරණ, ස්ථිර හා සම්පූර්ණ ආබාධිතභාවය සහ නැවත ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුව සිදු වන වෛද්‍ය වියදම්ද ආවරණය වේ. පසුගිය වසර 4 තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් සංක්‍රමණික සේවකයන් සඳහා රුපියල් මිලියන 546 ක් වටිනා හිමිකම් පියවා ඇත



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය අතර ගිවිසුම් හුවමාරු කර ගැනීම

පාසල් සඳහා කොවිඩ් 19 මාර්ගෝපදේශයක් වන "සෞඛය සම්පන්න අනාගතයක් සඳහා හොඳ පුරුදු " දියත් කිරීම

කොවිඩ් 19 පාලනය සහ වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව පාසල් සහ අධ්‍යාපන ආයතන සඳහා නිල වීඩියෝ මාර්ගෝපදේශය දියත් කරන ලදී.

ආරක්ෂිත පාසල් පරිසරයක් පවත්වාගෙන යාමට සියලුම සිසුන්, ගුරුවරුන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් දායක වන බව සහතික කිරීම සෞඛ්‍ය සම්පන්න අනාගතයක් සඳහා හොඳ පුරුදු නිල වීඩියෝ මාර්ගෝපදේශය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට හා චක්‍රලේඛයට අනුකූලව සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් හා මෙහෙයවීම් අනුව සකස් කරන ලදී.

වීඩියෝ මාර්ගෝපදේශය සහිත සංයුක්ත තැටි දිවයින පුරා පාසල් අතර බෙදා හරින ලද අතර තෙත භාෂා වීඩියෝව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි නිල යූ ටියුබ් නාලිකාවේ සහ ෆෙස්බුක් පිටුවෙහි පළ කොට ඇත.

සමාජයීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය

සාක්ෂාත් කරගත් තිරසාර සංවර්ධන අරමුණු



අනාගතය සඳහා අවධානය

- රට තුළ රක්ෂණ විනිවිද යාමේ මට්ටම ඉහළ නැංවීම සඳහා විවිධ පාරිභෝගික කොටස් සඳහා වඩාත් අභිරුචිකරණය කළ විසඳුම් සංවර්ධනය කිරීම සහ දියත් කිරීම
- නියෝජිත බලකාය අතර ඩිජිටල් භාවිතය වැඩි කිරීම

මූල්‍ය ප්‍රාග්ධනය
ගනුදෙනුකරුවන් මෙන්ම ප්‍රධාන වටිනාකම් දාම හවුල්කරුවන් සමඟ ශක්තිමත් සහ කල් පවත්නා සම්බන්ධතා කාලයත් සමඟ ආදායම සහ ලාභදායිතාවයේ අඛණ්ඩ දියුණුවක් ඇති කිරීම සඳහා ශක්තිමත් පරිසර පද්ධතියක් නිර්මාණය කරයි

වෙනත් ප්‍රාග්ධනයන් මත බලපෑම
සමාජයීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම අනෙකුත් සියලුම ප්‍රාග්ධනයන් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි

බුද්ධිමය ප්‍රාග්ධනය
විශ්වාසවන්ත පාරිභෝගික පදනමක්, දිගුකාලීන ව්‍යාපාරික හවුල්කාරිත්වයක් සහ ප්‍රජාව තුළ හොඳ ස්ථාවරයක් යන සියල්ලම වෙළඳ සන්නාමයේ කීර්තිය ඉහළ නැංවීමට දායක වේ

සමාජයීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය
භෞතික හා ඩිජිටල් යටිතල පහසුකම් වඩාත් යහපත් අයුරින් සකස් කොට ඒවායේ ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ගණුදෙනු කරුවන්ගෙන් ලැබෙන අදහස් උපකාරී වේ.

මානව ප්‍රාග්ධනය
ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ වැඩ කිරීමෙන් ලබාගත් දැනුම සමඟ ගනුදෙනුකරුවන්ට සේවය කිරීමේ විශේෂඥ තාව, සේවක හැකියාවන් ශක්තිමත් කිරීමට මඟ පාදන අතර එමඟින් වඩාත්ඵලදායී හා නියැලී සිටින ශ්‍රම බලකායකට මග පාදයි

ස්වාභාවික ප්‍රාග්ධනය

ව්‍යාපාරයේ සියලු මට්ටම්වල කඩදාසි රහිත පරිසරයකට සංක්‍රමණය වීමේ අවසාන අරමුණ ඇතිව අපගේ පද්ධති සහ ක්‍රියාවලීන් ක්‍රමානුකූලව ස්වයංක්‍රීය කිරීම සඳහා අපගේ ඩිජිටල් උපායමාර්ගය වේගවත් කර ඇත්තෙමු.



ස්වාභාවික ප්‍රාග්ධනය

රක්ෂණ සේවා සැපයුම්කරුවෙකු ලෙස, අපගේ එදිනෙදා කටයුතු සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ස්වාභාවික සම්පත් මත දැඩි ලෙස රඳා නොපවතී. කෙසේ වෙතත්, අපගේ ගොඩනැගිලි බල ගැන්වීම සඳහා අවශ්‍ය විදුලිය නිපදවීමට අවශ්‍ය ස්වාභාවික සම්පත්, උපයෝගිතා අරමුණු සඳහා සේවකයින් භාවිතා කරන ජලය සහ අපගේ දෛනික මෙහෙයුම්වලදී ජනනය වන කඩදාසි සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ඔස්සේ අපගේ ව්‍යාපාරික කටයුතුවලින් පරිසරයට වක්‍ර බලපෑමක් ඇති කරන බව අපි පිළිගනිමු.

පරිසරය කෙරෙහි සීමිත බලපෑමක් තිබුණද, අපගේ ව්‍යාපාරය වර්ධනය වන විට ආයතනයක් ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විදුලිය, ජලය වැඩියෙන් පරිභෝජනය කරනු ඇති අතර වැඩි අපද්‍රව්‍ය ප්‍රමාණයක් උත්පාදනය කරනු ඇති බව අපට වැටහේ. එවන් තත්වයක් තුල අනාගතයේදී ස්වාභාවික ප්‍රාග්ධනයේ අලාභය අවම කිරීම සඳහා වගකීමෙන් යුතුව කටයුතු කිරීමට ඇති අපගේ කැපවීම තවදුරටත් ශක්තිමත් කිරීමට අප කටයුතු කර ඇත. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා අපි තුන් කොන් ප්‍රවේශයක් අනුගමනය කර ඇත්තෙමු.

පාරිසරික අනුකූලතාවය
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව කිසිදු සෘජු පාරිසරික රෙගුලාසියකට යටත් නොවුවද, අපගේ ව්‍යාපාරය ජාතික පාරිසරික ප්‍රතිපත්තියට අනුකූලව කළමනාකරණය කරන බවට අපි සහතික වෙමු. එනිසා පාරිසරික නීති සම්බන්ධයෙන් සමාගමට අනුකූල නොවන බවට වාර්තා වී නොමැත.

පරිභෝජනය පිළිබඳ විස්තර සෙවීම සහ අධීක්ෂණය කිරීම
අපගේ විදුලි පරිභෝජනය, ජල පරිභෝජනය සහ ජනනය කරන ලද කඩදාසි අපද්‍රව්‍ය පරිමාව නිරීක්ෂණය කිරීම සහ අධීක්ෂණය කිරීම ආයතනය පුරා සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීමට අප දරන උත්සාහයේ පදනම වේ.

කඩදාසි රහිත මෙහෙයුම්
ව්‍යාපාරයේ සියලු මට්ටම්වල කඩදාසි රහිත පරිසරයකට සංක්‍රමණය වීමේ අවසාන අරමුණ ඇතිව අපගේ පද්ධති සහ ක්‍රියාවලීන් ක්‍රමානුකූලව ස්වයංක්‍රීය කිරීම සඳහා අපගේ ඩිජිටල් උපායමාර්ගය වේගවත් කර ඇත්තෙමු. මෙම උත්සාහයන් මෑත කාලයේ සාමාන්‍ය මාසික කඩදාසි භාවිතයේ අඩුවීමට හේතු වී තිබේ. මණ්ඩල රැස්වීම් සහ මණ්ඩල අනු කමිටු රැස්වීම් සඳහා අපි මණ්ඩල රැස්වීම් ස්වයංක්‍රීයකරණ විසඳුමක් තුළින් කඩදාසි රහිත රැස්වීම් පරිසරයක් භාවිතා කර ඇත්තෙමු. අවම කඩදාසි භාවිතය සමඟ අපි වෙනත් කළමනාකරණ අනු කමිටු රැස්වීම් ද පවත්වා ඇත.

ප්‍රධාන සංඛ්‍යාලේඛන

	2020	2019	2018	2017	2016
විදුලි පරිභෝජනය (ඒකක / කිලෝවොට් පැය)	**2,661,400**	2,874,600	2,866,700	2,902,858	2,761,500
ජල භාවිතය (ඒකක / ඝණ මීටර්)	**27,413**	30,594	30,041	29,341	30,192

සපුරාගත් තිරසර සංවර්ධන ඉලක්ක



අනාගතයට අවධානය
- සියලුම ප්‍රධාන ව්‍යාපාර කාර්යයන් සඳහා ක්‍රියාවලි ඩිජිටල්කරණය වැඩි කිරීම
- පුනර්ජනනීය නොවන ප්‍රභවයන් මත යැපීම අවම කිරීම සඳහා පුනර්ජනනීය බලශක්තිය සඳහා ආයෝජනය කිරීම

පාලනය සහ අවදානම් පාලනය

88 - ආයතනික පාලන වාර්තාව
91 - විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව
93 - 2020 ආයෝජන කමිටු වාර්තාව
95 - අවදානම් කළමනාකරණ වාර්තාව
107 - අනුකූලතා වාර්තාව
114 - අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය

"SLIC තරුණ අපේ අවශ්‍යතා හොඳින් හඳුනනවා. ඒ නිසයි මට ඔවුන්ව විශ්වාස"



ආයතනික පාලන වාර්තාව

සභාපතිතුමාගේ හැඳින්වීම

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රාජ්‍ය හිමිකාරිත්වයකින් යුත් ව්‍යාපාරයක් වන අතර, අඛණ්ඩතාව, වගවීම සහ විනිවිදභාවය වෙනුවෙන් කැපවෙමින් අපගේ ශ්‍රී ලංකා රජය ඇතුළු රක්ෂණ ඔප්පු හිමියන්, සේවකයින්, විකුණුම් බලකාය, සැපයුම්කරුවන්, ප්‍රතිරක්ෂණ හවුල්කරුවන් සහ සමස්ත සමාජය යන සියලු පාර්ශවකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා දිගු කාලීන, තිරසාර වටිනාකම් නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. අපගේ මණ්ඩලය විසින් වගකීම, වගවීම, විනිවිදභාවය සහ සාධාරණත්වය යන ආයතනික පාලනයේ ප්‍රධාන අරමුණු හතර මත සමාගම ක්‍රියාත්මක වන බවට සහතික වනු ලබයි. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 17 දරණ නියෝගයට අනුව, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලන නීති සංග්‍රහයේ 2017 හි අඩංගු විධිවිධානවලට අපි අනුකූල වන්නෙමු.

කෙටියෙන් කිවහොත්, ආයතනික පාලනය සඳහා අපගේ ප්‍රවේශය වන්නේ: අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවල කුසලතා, පළපුරුද්ද සහ දැනුම යන සංකලනය වන අතර සමාගමේ ආයතනික පාලන පිළිවෙත් සුසර කරගැනීම සඳහා ඒවා උපකාරී වේ. අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන වශයෙන් කුසලතා හා පළපුරුද්ද අනුව කණ්ඩායම් චින්තනයෙන් වැළකී සිටී. අධ්‍යක්ෂ මණ්ඩලය නිතිපතා, මාසිකව හෝ රැස්වන අතර විධායක කළමනාකරණයේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කරනු ලබයි. එසේම, විධායක නොවන අධ්‍යක්ෂවරුන් එලදායීව ඇගයුම් සිදු කරමින් විශේෂඥ උපදෙස් ලබා දෙනු ලබයි.

සමාගම කාර්යක්ෂමව පවත්වාගෙන යාමේ දී යහ පාලනයේ වැදගත්කම අපි සම්පූර්ණයෙන්ම අගය කරන අතර පහත දැක්වෙන වාර්තා අපේ කාර්යභාර්යය පිළිඹිබු කරයි.



ජගත් වැල්ලවත්ත
සභාපති
2021 ජූනි 03

රාමුව

විධිමත් ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, මාර්ගෝපදේශ සහ අදාළ කළමනාකරණ වාර්තාකරණය ඇතුළුව සිය අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ මණ්ඩල අනු කමිටු සිය මෙහෙයුම් වල සෑම අංශයකම පාලන රාමුවක් යටතේ පවත්වාගෙන යනු ලැබේ.



◀ පත් කරන ලද්දේ ◀ වාර්තා කරනු ලබන්නේ

අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම
වාර්තා කරන දිනය වන විට මණ්ඩලය අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකුගෙන් සමන්විත විය. විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ අදාල ක්ෂේත්‍රවල කීර්තිමත් වෘත්තිකයන් වේ. මණ්ඩලයේ ඵලදායී මෙහෙයුම් අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පුළුල් ව්‍යාපාරික අත්දැකීම් මණ්ඩලයේ සංයුතිය මගින් සපයන බව මණ්ඩලයේ අදහස වන අතර එක් එක් අධ්‍යක්ෂවරුන් විවිධ කුසලතා, දැනුම අත්දැකීම් ගෙන එති. රාජය සතු ව්‍යවසායයක් වීම මත අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන කොටස් හිමියා ලෙස රජය සහ සමාගම සහ එහි කළමනාකරණය අතර අතරමැදියෙකු ලෙස කටයුතු කරයි. සමස්ථ භාරකාරත්වය සඳහා මණ්ඩලය වගකිව යුතු අතර පාර්ශවකරුවන්ට දිගු කාලීන වටිනාකම් ලබා දීම සඳහා මණ්ඩලයේ අනු කමිටු හරහා සෘජුව හා වක්‍රව නායකත්වය සපයයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ පාලනය සහ සැලසුම් කිරීමයි. සමාගමේ මූල්‍ය හා වාණිජ කාර්යසාධනය මණ්ඩලය විසින් නිරන්තරයෙන් තක්සේරු කරනු ලැබේ. ඊට අමතරව, සමාගම විසින් නිරාවරණය කළ හැකි සියලු අවදානම් කළමනාකරණය කිරීමේ ප්‍රමාණවත් බව මණ්ඩලය සමාලෝචනය කර තක්සේරු කරයි.

සමාගම් ලේකම්
පාලන රාමුවේ සම්පූර්ණනත්වය සහතික කිරීම සඳහා සමාගම් ලේකම් වගකීම දරයි. සමාගම් පනතේ සහ පාලන නීති සංග්‍රහයේ දක්වා ඇති සමාගම් ලේකම්ගේ බැඳීම් සහ වගකීම් සමාගමේ යහපාලනය සඳහා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කිරීම අවශ්‍ය වේ. මණ්ඩලයේ ක්‍රියා පටිපාටිවලට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන් සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්ට ප්‍රවේශය ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල සහ කමිටු ක්‍රියා පටිපාටි
අධ්‍යක්ෂ මණ්ඩල කමිටු පිහිටුවීම මණ්ඩලයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ඉවහල් වන අතර උපාය මාර්ග, විගණන, අනුකූලතා ආයෝජන, මානව සම්පත් සහ අවදානම් කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි මණ්ඩලයට වටිනාකමක් එක් කරයි. මණ්ඩලයේ අධීක්ෂණය, සැලසුම් කිරීම සහ තීරණ ගැනීමේ කාර්යයන් සඳහා සහාය වීම සඳහා මණ්ඩලය විසින් විගණන හා අනුකූලතා කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව, ආයෝජන කමිටුව, උපායමාර්ගික කමිටුව සහ මානව සම්පත් කමිටුව යන උප කමිටු පහක් පිහිටුවා ඇත. කමිටු පාලනය කරනු ලබන්නේ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රඥප්ති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සහ වරින් වර මණ්ඩල රැස්වීම්වලදී මණ්ඩලයට වාර්තා කිරීමෙනි.

2020 දී පවත්වන ලද අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් සහ මණ්ඩල අනු කමිටු ගණන සහ මෙම රැස්වීම්වලට සහභාගී වන එක් එක් අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීමේ විස්තර පහත දැක්වේ.

අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් - 2020
සියළුම රාජකාරී ඵලදායී ලෙස ඉටු කිරීම සහතික කිරීම සඳහා මණ්ඩලය ප්‍රමාණවත් ලෙස නිතිපතා රැස්වේ. නොවැළැක්විය හැකි තත්වයන් හේතුවෙන්, මණ්ඩල සාමාජිකයෙකුට මණ්ඩල රැස්වීම්වලට සහභාගී වීමට නොහැකි නම්, එකී අධ්‍යක්ෂවරයාට න්‍යාය පත්‍රයේ කරුණු පිළිබඳව සභාපතිවරයා, ප්‍රධාන විධායක නිලධාරියා හෝ සමාගම් ලේකම් සමඟ රැස්වීමට පෙර සාකච්ඡා කර අදහස් හුවමාරු කර ගත හැකිය.

2020 දී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් පහළොවක් පැවැත්විණි.

අධ්‍යක්ෂකගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
ජගත් වැල්ලවත්ත මහතා (සභාපති)	15
කේ.ඒ. විමලෙන්තිරරාජා	9
අනිල් මීගහගෙදර මහතා	12
අනිල් කොස්වත්ත මහතා	10
නිශාන්ත දයානන්ද මහතා	14
සුරේඛා අලස් මහත්මිය	15
කේ. ඩී. ආර්. ඔල්ගා මහත්මිය (2020.01.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලද අතර අධ්‍යක්ෂක වරයකු වශයෙන් කටයුතු කිරීම 2020.08.17 දින සිය ක්‍රියාත්මක වන පරිදි නතර විය)	7

විගණන හා අනුකූලතා කමිටු රැස්වීම් (ACCM) – 2020
2020 වර්ෂය තුළ දී විගණන හා අනුකූලතා කමිටු රැස්වීම් හතරක් පවත්වා ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිතයා කමිටුවේ සභාපති ලෙස කටයුතු කළේය.

අධ්‍යක්ෂකගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
කේ.ඒ. විමලෙන්තිරරාජා (කමිටුවේ සභාපති - විධායක නොවන අධ්‍යක්ෂක)	4
අනිල් මීගහගෙදර මහතා	4
නිශාන්ත දයානන්ද මහතා	4

ආයෝජන කමිටු රැස්වීම් - 2020
2019 දී ආයෝජන කමිටු රැස්වීම් 17 ක් පැවැත්විණි. රැස්වීම්වල මුලසුන දැරුවේ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.

අධ්‍යක්ෂකගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
කේ.ඒ. විමලෙන්තිරරාජා (කමිටුවේ සභාපති - විධායක නොවන අධ්‍යක්ෂක)	16
ජගත් වැල්ලවත්ත මහතා	15
අනිල් මීගහගෙදර මහතා	12
සුරේඛා අලස් මහත්මිය	9

අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් - 2020
2020 දී අවදානම් කළමනාකරණය කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත. මූල්‍ය ආයෝජනය, ආයු ගණක, ප්‍රතිරක්ෂණ, අනුකූලතා, අභ්‍යන්තර විගණන, මානව සම්පත් කළනාකරණය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ දෙපාර්තමේන්තුවල ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් හරහා විවිධ අවදානම් පරාසයන් නියෝජනය කරන පුළුල් සමාජිකයත්වයක් මෙම කමිටුවට ඇත.

ආයතනික පාලන වාර්තාව

අධ්‍යක්ෂකගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
සුරේඛා අලස් මහත්මිය (කමිටුවේ සභාපති- විධායක නොවන අධ්‍යක්ෂක)	4
අනිල් මීගහගෙදර මහතා	2

මානව සම්පත් කමිටු රැස්වීම්-2020

2020 දී මානව සම්පත් කමිටු රැස්වීම් 09 ක් පැවැත්විණි. රැස්වීම්වල මුලසුන දැරුවේ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.

අධ්‍යක්ෂකගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
නිශාන්ත දයානන්ද මහතා (කමිටුවේ සභාපති- විධායක නොවන අධ්‍යක්ෂක)	8
ජගත් වැල්ලවත්ත මහතා	9
අනිල් කොස්වත්ත මහතා	8

උපායමාර්ගික සමාලෝචන රැස්වීම් -2020

2020 දී උපායමාර්ගික සමාලෝචන රැස්වීම් දෙකක් පැවැත්වූ අතර විධායක කමිටුව වරින් වර උපාය මාර්ග සමාලෝචන සිදු කරයි.

වෙනත් මෙහෙයුම් කමිටු

ඉහත සඳහන් මණ්ඩල අනු කමිටුවලට අමතරව ප්‍රධාන විධායක නිලධාරියාට සහාය වීම සඳහා විධායක කමිටුව (EXCO) ප්‍රතිරක්ෂණ කමිටුව, විගණන පසු විපරම් කමිටුව, ශාඛා කළමනාකරණ ඉදිරි දැක්ම කමිටුව, නීති කමිටුව සහ විකුණුම් හා අලෙවිකරණ සමාලෝචන කමිටුව යන මෙහෙයුම් කමිටු පවතී. මේ සියල්ල පාලන ව්‍යුහය තුළ අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. සාමාජිකයින් සමාගම තුළින් සහ ඔවුන්ගේ අදාළ විශේෂඥ ක්ෂේත්‍රයන්ට අනුකූලව තෝරා ගනු ලැබේ. විධායක කමිටුව උපාය මාර්ග, මෙහෙයුම් සැලසුම්, ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ අයවැය ආදිය සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් ව්‍යාපාරයේ එදිනෙදා කටයුතු කළමනාකරණය කරයි. ආයතනික උපායමාර්ග සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විධායක කමිටුව සහ අධ්‍යක්ෂක මණ්ඩලය ඒකාබද්ධව කටයුතු කරයි. විධායක කමිටුව මාසිකව හා අවශ්‍ය පරිදි රැස්වේ. විධායක කමිටුවේ රැස්වීම් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා වන කමිටුවේ සභාපති විසින් ඕනෑම වේලාවක එහි විමර්ශන කොන්දේසිවලට යටත් වන කරුණු සලකා බැලීමට රැස්වීම් කැඳවනු ලබයි.

තොරතුරු ප්‍රවාහය

අධ්‍යක්ෂක මණ්ඩලයේ සහ අනු කමිටු රැස්වීම් වලදී දැනුවත් තීරණයක් ගැනීමට මණ්ඩලයට හැකි වන පරිදි අවශ්‍ය තොරතුරු බෙදා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සියළුම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් සහ අනු කමිටු රැස්වීම් වලට පෙර සවිස්තරාත්මක ලිපි ලේඛන සපයනු ලැබේ. විධායක කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයින් සහ අනෙකුත් ප්‍රධාන සේවකයින් සහභාගී වන අතර සුදුසු පරිදි රැස්වීම් නියෝජනය කරති. අධ්‍යක්ෂවරුන් වශයෙන් තම රාජකාරි ඉටු කිරීමේදී සමාගමේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට බලය ඇත. ඊට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටීන් නිරීක්ෂණය කිරීම සහතික කිරීම සහ ආයතනික පාලන කාරණා සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් දීම සම්බන්ධයෙන් වගකිව යුතු සමාගම් ලේකම්ගේ සේවාවන්ට සියලුම අධ්‍යක්ෂවරුන්ට ප්‍රවේශය ඇති අතර එමඟින් අධ්‍යක්ෂවරුන් වෙත තොරතුරු කාලෝචිත සහ ආරක්ෂිතව ලබා දීම සහතික කරන අතරම අධ්‍යක්ෂ මණ්ඩල/කමිටු රැස්වීම්වල පාරිසරික බලපෑම අවම කරයි. සියලුම මණ්ඩල අනුකමිටු රැස්වීම් වාර්තා වරින් වර මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය වාර්තාකරණය

අදාළ නීති හා රෙගුලාසි වලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් වගකිව යුතු වේ.

අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනයන්

මෙම මූල්‍ය ප්‍රකාශන මඟින් ආවරණය වන කාල සීමාව තුළ සහ මෙම වාර්තාවේ යාවත්කාලීනව ක්‍රියාත්මක වන අතර අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායීතාවය සමාලෝචනය කර ඇති බව අධ්‍යක්ෂවරු සනාථ කරති. සමාගමේ අභ්‍යන්තර පාලන රාමුව තුළට ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, ක්‍රියාවලි, කාර්යයන් සහ හැසිරීම් ඇතුළත් වේ. සමාගමට අභ්‍යන්තර විගණන කාර්යයක් ඇති අතර එය මණ්ඩලයේ සභාපතිවරයාට සහ විගණන හා අනුකූලතා කමිටුවේ සභාපතිවරයාට වාර්තා කිරීමේ මාර්ග යක් ඇත. සෑම කමිටු රැස්වීමකදීම විගණන හා අනුකූලතා කමිටුව විසින් මෙම කාර්යය සම්බන්ධයෙන් වාර්තා ලබා ගනී. ඊට අමතරව, සමාගම ප්‍රධාන අවදානම් හතරකට වෙනම් උපායමාර්ගික, මූල්‍ය, මෙහෙයුම් සහ උපද්‍රව යන කාරණයන්ට අදාළව ව්‍යවසාය අවදානම් කළමනාකරණය (ERM) පිළිබඳ සාකල්‍යවාදී දැක්මක් අදාල කර ගනී.

පාලන රාමුව වෙත කොවිඩ් -19 හි බලපෑම

කොවිඩ්-19 ආර්ථික අර්බුදයේ සංකීර්ණත්වය හා අවිනිශ්චිතතාවයන් සමඟ, විවිධ සාධක සලකා බැලීමට සිදු වීමෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලිය සංකීර්ණ කාරණයක් බවට පත්ව ඇත. මෙම කාලය තුළ ඇතිවන ව්‍යාපාර අවදානම් සහ සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂාව පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම සඳහා විධායක කමිටුව හරහා විධායක මණ්ඩලය සමාගම් කළමනාකාරිත්වය සමඟ පුළුල්ව හා අඛණ්ඩව කටයුතු කරයි. කිසියම් සංචාරක සීමාවන් පැනවීමකදී හෝ පවතින වසංගතය හේතුවෙන් ප්‍රදේශ හුදෙකලා කිරීමකදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනු කමිටු රැස්වීම් සඳහා සාමාජිකයන්ට දුරස්ථ සහභාගීත්වයක් ලබා දීම සඳහා සමාගමේ ඩිජිටල් රැස්වීම් සේවාව සහාය වේ. ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයකින් සමන්විත ව්‍යාපාර අඛණ්ඩ මෙහෙයුම් කමිටුව (BCSC) ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කරන අතර, එමඟින් මෙම අර්බුදය සමය තුළ සේවකයින් සහ පාර්ශවකරුවන් ආරක්ෂා කරමින් ව්‍යාපාරය ආරක්ෂා කිරීම සිදු කෙරේ.

විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව

විගණන සහ අනුකූලතා කමිටුව මගින් ආයතනයේ මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන පද්ධති, අනුකූලතා රාමුව සහ අභ්‍යන්තර සහ බාහිර විගණන කටයුතු ආදී ක්ෂේත්‍ර කාර්යක්ෂමව සහ මනාව ක්‍රියාත්මක කිරීමේ වගකීම ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය ලබා දීම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. විගණන සහ අනුකූලතා කමිටුව (ACC) විධායක නොවන අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු අතර, විධායක නොවන අධ්‍යක්ෂක සාමාජිකයන්ගෙන් පමණක් සමන්විත විය. සමාගමේ සමාගම් ලේකම්වරයා රැස්වීම්වල ලේකම්වරයා වශයෙන් කටයුතු කරන ලදී. අනුකූලතා කටයුතු සහ විගණන කටයුතු ද්විත්වයම විගණන සහ අනුකූලතා කමිටුව වෙත වාර්තා කරනු ලැබුව ද, මෙම කටයුතු ද්විත්වය ක්‍රියාකාරිව වෙන් කිරීම තුළින් මෙම කටයුතු ස්වාධීනව ක්‍රියාත්මක වන බව සහතික කෙරේ.

ජ්‍යෙෂ්ඨ සහායක කාර්ය මණ්ඩලය විසින් ලබා දෙන වටිනා මෙහෙවර සමඟ විගණන සහ අනුකූලතා කමිටුවේ (ACC) කාර්යයන් ඵලදායීව ඉටු කිරීම සඳහා මූල්‍ය විගණන සහ රක්ෂණ විශේෂඥතාවේ ප්‍රමාණවත් සම්මිශ්‍රණයක් විගණන සහ අනුකූලතා කමිටුව සතුව පවතී.

නිර්දේශය විෂය

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ (SLIC) විගණන සහ අනුකූලතා කමිටුවේ (ACC) නිර්දේශය විෂය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය මගින් 2017 වර්ෂයේ දී ඒකාබද්ධව නිකුත් කරන ලද "සංස්ථාපිත පාලනය පිළිබඳ විශිෂ්ඨතම පරිචයන් සංග්‍රහය" ඇතුළු විගණන කමිටු පිළිබඳ මාර්ගෝපදේශ මූලධර්ම සහ විශිෂ්ඨතම පරිචයන් මත පදනම් වන මණ්ඩලයේ විගණන සහ අනුකූලතා කමිටු (ACC) ප්‍රඥාප්තියේ පැහැදිලිව නිර්වචනය කර තිබේ. සමාගමේ කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ස්ථාපනය කරන ලද මූල්‍ය, ගිණුම්කරණය, ප්‍රසම්පාදනය, නෛතික අනුකූලතාව සහ ආචාර ධර්මවලට අදාළව සමාගමේ අනාවරණය කිරීමේ ක්‍රම සහ පාලන සහ අභ්‍යන්තර පාලන පද්ධති කාර්යක්ෂමව සහ මනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වැඩි දියුණු කළ වගකීම සහ ව්‍යාපාරික අවදානම ආදිය කළමනාකරණය අභිප්‍රේක්ෂණය කිරීම මෙම ප්‍රඥාප්තියේ විෂයපථය මගින් ආවරණය කෙරේ. මෙම කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු අතර එහි ක්‍රියාකාරකම් පිළිබඳව කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට විධිමත්ව වාර්තා කරයි.

කමිටු රැස්වීම්

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වසර තුළ කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී. ප්‍රමාණවත් විස්තර සහිතව කමිටු රැස්වීම්වල වාර්තා ඉදිරිපත් කරනු ලබන අතර එම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ද විධිමත්ව වාර්තා කරයි. විගණන තාක්ෂණයන් පිළිබඳ මග පෙන්වීම සඳහා විගණකාධිපතිවරයාගේ නියෝජිතයින්ට නිරීක්ෂකයෙකු ලෙස සහභාගී වීමට ආරාධනා කරනු ලැබේ.

කමිටු රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පහත දක්වා ඇත.

අධ්‍යක්ෂකගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
කේ.ඒ. විමලෙන්තිරරාජා (ACC හි සභාපති - විධායක නොවන අධ්‍යක්ෂ)	4
ඒන්. දයානන්ද මහතා	4
අනිල් මීගහගෙදර මහතා	4

අභ්‍යන්තර විගණක

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතුව අභ්‍යන්තර විගණන අංශයක් තිබෙන අතර සුදුසුකම් ලත් වරලත් ගණකාධිකාරිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් එම අංශය ක්‍රියාත්මක වේ. අභ්‍යන්තර විගණන වැඩසටහන විගණන සහ අනුකූලතා කමිටුවට (ACC) ඉදිරිපත් කර අනුමත කරවා ගෙන තිබෙන අතර විගණන සහ අනුකූලතා කමිටුව මගින් අභ්‍යන්තර විගණන හා පරීක්ෂා කිරීමේ කටයුතු විධිමත්ව සමාලෝචනය කර අධීක්ෂණය කරනු ලබයි. කමිටුව විසින් සිදු කරන අභ්‍යන්තර විගණක කටයුතු ස්වාධීන බව කමිටුව විසින් තහවුරු කරන අතර අදාල රාජකාරි කටයුතු ඉටු කිරීමෙදි නිසි වෘත්තිය සුපරීක්ෂාව පවත්වාගනි. දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය බල අධිකාරිය සහ සම්පත් ඇති බවට කමිටුව සැහිමකට පත්ව ඇත. අභ්‍යන්තර විගණක අංශයේ ප්‍රධානියාගේ වාර්ථා කමිටුව විසින් එහි කාලීන රැස්වීම් වලදි සමාලෝචනය කරනු ලබන අතර, අභ්‍යන්තර විගණක සැලැස්මේ සහ ප්‍රධාන අණාවරනය කර ගැනිම් වල ප්‍රගතිය අධිත්ෂණය කිරීමට එමගින් කමිටුවට ඉඩ සැලසේ

බාහිර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාව බාහිර විගණකවරයා වශයෙන් පත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) වගන්තිය ප්‍රකාරව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වාර්ෂික විගණනයේ දී විගණකාධිපතිවරයාට සහාය ලබා දීම සඳහා සුදුසුකම් ලත් විගණකයකු වශයෙන් Messrs BDO Partners යන සමාගම විගණකාධිපතිවරයා විසින් පත් කරන ලදී. එසේම, බාහිර විගණකගේ සොයා ගැනීම් සහ නිර්දේශයන්ට කළමනාකරණ ලිපිය සහ කළමනාකරණයේ ප්‍රතිචාරය කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබීය.

විගණන කමිටුවට තොරතුරු ලැබීම

විගණන සහ අනුකූලතා කමිටුවට (ACC) එහි වගකීම් ඉටු කිරීමට පහසුකම් සැලසීම සඳහා කළමනාකාරිත්වයෙන් සහ බාහිර විගණකයන්ගෙන් ප්‍රමාණවත්, විශ්වසනීය සහ කාලෝචිත තොරතුරු ලැබී ඇති බවට විගණන සහ අනුකූලතා කමිටුව සහතික වේ.

වත්කම් සහ වගකීම් තක්සේරු කිරීම සහ හානිකරණය

සාධාරණ අගය ගිණුම්කරණය කිරීම වැඩි වැඩියෙන් උපයෝගී කර ගැනීමත්, එහි පුළුල් වැදගත්කමක් සලකා බලමින්, සාධාරණ අගය ව්‍යුත්පන්න කිරීමේ දී භාවිත කරනු ලබන වැදගත් උපකල්පන අනාවරණය කර ඇති බවත්, ඒ පිළිබඳව සියුම් ලෙස පරීක්ෂා කර ඇති බවත්, එමෙන්ම අවශ්‍ය අවස්ථාවල ඒ සම්බන්ධයෙන් විරුද්ධතාව පවා ප්‍රකාශ කර ඇති බවත් විගණන කමිටුව සහතික කරයි. හානිකරණය සඳහා වන ක්‍රියාවලිය ද ප්‍රමාණවත් වන බව කමිටුවේ අදහසයි.

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිත (IFRS) අදාල කරගැනීම

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිත අදාල කර ගැනීමේ ප්‍රගතිය කමිටුව විසින් අධීක්ෂණය කරන අතර ප්‍රගතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වලදී වරින් වර දැනුවත් කරයි.

විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව

ස්වාධීන බාහිර උපදෙස්
විගණන කමිටුවේ ප්‍රඥප්තිය මගින් අවශ්‍ය අවස්ථාවල දී ස්වාධීන බාහිර උපදෙස් ලබා ගැනීම සඳහා අවසර ලබා දෙයි.

අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියාට සහ අනුකූලතා අංශයේ ප්‍රධානියාට විගණන හා අනුකූලතා කමිටු රැස්වීම්වලට ප්‍රවේශවීමට ඇති හැකියාව
අභ්‍යන්තර විගණන හා අනුකූලතා ප්‍රධානීන්ට විගණන හා අනුකූලතා කමිටුව වෙත සෘජු ප්‍රවේශයක් ඇති අතර එය මණ්ඩලයට සෘජුවම වගකිව යුතුය.

විගණන නොවන සේවා
සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ බාහිර විගණකවරුන් විසින් විගණන නොවන සේවාවන් ලබා දී නොමැත.

අනුකූලතා කර්තව්‍යය
ආයතනික අනුකූලතා කාර්යයට අනුකූලතා වැඩසටහන් මෙහෙයුම් සහ ආධාරක ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අයත් වේ. සමාගමේ අනුකූලතා වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන්නේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-අනුකූලතා සහ අවදානම් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු-මුදල් විසින්, එක් එක් දෙපාර්තමේන්තුවේ අනුකූලතා සම්බන්ධීකාරකවරුන්ගේ සහාය ඇතිව ය. අනුකූලතා නිලධාරියා සහ අනුකූලතා කමිටුව (ACC) අතර වාර්තාකරණ මුල් ලේඛනය මගින් වසර තුළ ඇති විය හැකි සුවිශේෂී ගැටළු සහ අවදානම් අවස්ථා සඳහා විසඳුම් ලබා දෙයි. මෙහෙයුම් අංශවල ප්‍රධානීන් වෙත පවරා ඇති සුවිශේෂී බැඳීම්වලට අනුකූලව කටයුතු කරන බව තහවුරු කිරීම සඳහා වගකිව යුතු නිලධාරීන් වශයෙන් පත් කරන ලද මෙහෙයුම් අංශ ප්‍රධානීන් විසින් මෙහෙයුම් ක්ෂේත්‍රවලට අදාළ අනුකූලතා වගකීම් ඉටු කළ යුතුය. අභ්‍යන්තර විගණන අංශය මගින් මුදල් විශුද්ධිකරණය වළක්වාලීමේ කර්තව්‍යය වාර්ෂිකව විගණනය කරනු ලබන අතර අනුකූලතා කර්තව්‍යය සඳහා පිරිවැය භාරය වැඩි නොවන අන්දමින් අනුකූලතා සංස්කෘතිය සංවිධානයටම බද්ධ කර ඇත. අනුකූලතා කර්තව්‍යයේ ඉහළ යන සංකීර්ණතාවට අනුකූල වන ප්‍රධාන පාලන ක්‍රියාවලි පිළිබඳව අවධානය යොමු කරමින්, 'අනුකූලතාව සඳහා ස්වාධීනව ක්‍රියාකාරී වීමේ' ආකෘතියක් සමාගම අනුගමනය කරයි. සඵලදායී අන්දමින් ව්‍යාපාරයේ නිරතවීම තහවුරු කිරීමේ අරමුණින් එක් එක් අංශය සඳහා අනුකූලතා සම්බන්ධීකාරකයන් පත් කිරීම මගින් පිරිවැය ඵලදායී අන්දමින් අනුකූලතා කර්තව්‍යය කළමනාකරණය කරන අතරතුර අනුකූලතා කර්තව්‍යයේ ප්‍රබල ස්වාධීනත්වය ද සහතික කිරීමට ද මෙමගින් හැකියාව ලැබේ. ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍රවලට අදාළව විශිෂ්ඨතම පරිචයන් අනුගමනය කිරීම තහවුරු කිරීම සඳහා සමාලෝචිත වසර තුළ අනුකූලතා කර්තව්‍යය තවදුරටත් ශක්තිමත් කරනු ලැබීය.

ආචාර ධර්ම පද්ධතිය, තොරතුරු අනාවරණය සහ වංචා කළමනාකරණය
සමාගමට, සමාගම විසින් අනුමත කරන ලද සියලුම සේවකයින්ට අදාළ වන "ආචාර ධර්ම පද්ධතියක්" සහ "තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රතිපත්තියක්" සහ මණ්ඩලය විසින් අනුමත කරන ලද 'වංචා කළමනාකරණ ප්‍රතිපත්තියක් ඇත. සමාගමේ කිසියම් නුසුදුසු හෝ නීති විරෝධී ක්‍රියාවක් හෝ සදාචාර විරෝධී ක්‍රියාවන් නිරීක්ෂණය කරන සේවකයෙකුට එය තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා සමාගමේ තොරතුරු අනාවරණය කිරීමේ නිලධාරියාට වාර්තා කළ හැකිය. තවද, වංචා කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම තුළින් සමාගමට එරෙහි සියලු වංචා වැළැක්වීම, හඳුනා ගැනීම සහ ඒවාට පිළියම් යෙදීමට අපි කැපවී සිටිමු.

අවදානම් කළමනාකරණය
අවදානම් කළමනාකරණ කමිටුවී නම් වූ වෙනමම අධ්‍යක්ෂක මණ්ඩල අනු කමිටුවක් ඇති අතර අවදානම් කළමනාකරණ කාර්යය අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් එය වෙත බලය පවරා ඇත. අභ්‍යන්තර විගණන ප්‍රධානියා අවදානම් කළමනාකරණ කමිටුවේ ද සාමාජිකයෙකු වන අතර අවදානම් කළමනාකරණ කමිටුවේ ප්‍රධානියා අභ්‍යන්තර විගණන කමිටුවේ සමාජිකයකු වේ.

නිගමනය
සමාලෝචිත වසර තුළ අභ්‍යන්තර විගණන අංශය සහ බාහිර විගණකයින් ඵලදායී අන්දමින් සහ ස්වාධීනව කටයුතු කළ බවට කමිටුව සෑහීමකට පත් වෙයි. එයට අමතරව, ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමේ යෝග්‍යතාව පිළිබඳව ද කමිටුව සෑහීමකට පත් වන අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල විශ්වසනීයභාවය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ද කමිටුව මගින් ලබා දෙයි. සමාගමට අදාළ වන සියලුම නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූලව සමාගම කටයුතු කරන බව සමාගමේ අනුකූලතා රාමුව මගින් තහවුරු කිරීම සම්බන්ධයෙන් ද, සමාලෝචිත වසර තුළ වාර්තා වූ අනුකූල නොවීම් සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන තිබීම සම්බන්ධයෙන් ද කමිටුව සෑහීමකට පත් වෙයි.

2021 අප්‍රේල් මස 23 වන දින මෙම වාර්තාව විගණන හා අනුකූලතා කමිටුව විසින් අනුමත කරන ලදී.



කේ. ඒ. විමලෙන්තිරරාජා
සභාපති - විගණන හා අනුකූලතා කමිටුව

ජූනි 03 වැනිදා

ආයෝජන කමිටු වාර්තාව 2020

ආයෝජන කමිටුවේ අරමුණු
සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අපේක්ෂිත ප්‍රතිලාභ සහ අවදානම සඳහා ඔරොත්තුදීම් වලට අනුකූලව ආයෝජන තීරණයන්හි ප්‍රශස්ත බව සහතික කිරීමට ආයෝජන කමිටු ප්‍රයත්න දරයි. ඉහත කරුණු සාක්ෂාත් කරගනු ලබන්නේ කර්මාන්තයේ වඩාත්ම හොඳ පරිචයන්ට අනුගත වෙමින් කාර්යක්ෂම තීරණ ගැනීමේ ක්‍රියාවලියක් මගිනි.

ආයෝජන උපායමාර්ග
කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 වර්ෂය තුළ ආයෝජන උපායමාර්ගය තුළ සිත්ගන්නාසුළු හා අභියෝගාත්මක පෙරළියක් සිදු විය. වසංගතයේ උච්චතම අවධියේදී ඩිජිටල් ක්‍රමවේද භාවිතයෙන් බාධාවකින් තොරව ආයෝජන කටයුතු සිදු කරන ලදී. මහ බැංකුව විසින් ගෝලීය මහ බැංකු විසින් අනුගමනය කරන ලද උපාය මාර්ගයන්ට අනුකූලව මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් කිරීම නිසා 2020 දී පොලී අනුපාත තියුණු ලෙස පහත වැටීමට පෙර, 2019 දී ආකර්ශනීය හා ඉහළ ප්‍රතිලාභ සහිත රජයේ සහ ආයතනික ණය උපකරණවලට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව කල්තියාම සම්බන්ධ විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඉහළ ප්‍රතිලාභ ලබමින් අඩු ප්‍රති ආයෝජන අනුපාතවල බලපෑම අවම කර ගැනීමටත්, අපේක්ෂිත අනාගතයට තිරසාර ප්‍රතිලාභ පවත්වා ගැනීමටත් හැකි විය.

කෙසේවෙතත්, ප්‍රධාන වශයෙන් අවධානය යොමු වූයේ වෙළඳ ලාභ ලබා ගැනීම සඳහා කොටස් වෙළඳපොළ සතු වූ අවස්ථාවන් භාවිතා කිරීම කෙරෙහි ය. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පැවති අවිනිශ්චිතතාවය හේතුවෙන් වසරේ මුල් භාගය තුළ කොටස් වෙළඳපොළ දැඩි පසුබෑමකට ලක්විය. එම තත්ත්වය යටතේ ඉක්මන් තීරණ ගත් ආයෝජන කමිටුව සැලකිය යුතු කොටස් වෙළඳාම් ප්‍රතිලාභ අත්කර ගැනීමට සමත් විය. කොටස්වල භාරය වැඩිකිරීමේ තීරණය පදනම් වූයේ, අඩු භාර පොලී අනුපාත සහ බහු වාර්ෂික අඩු කොටස් තක්සේරු කිරීම් මත පදනම්ව ය.

ද්‍රවශීලතාවය, පොලී අනුපාතය, ණය අවදානම සහ සාන්ද්‍රණ අවදානම් වැනි ආයෝජන අවදානම් අවම කිරීම ආයෝජන කමිටුවෙහි වැදගත් අංගයක් විය. ක්‍රියාත්මක කිරීමට පෙර සියළුම ආයෝජන තරයේ විශ්ලේෂණය කර, සවිස්තරාත්මකව පරීක්ෂා කරනු ලැබේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආයෝජන කමිටුව විවිධ අංශවල පළපුරුදු වෘත්තිකයන් සහ කර්මාන්ත විශේෂඥයින්ගෙන් සමන්විත වේ. ඔවුන් ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලියට විවිධ අත්දැකීම්, විශේෂඥතාවක් සහ පුළුල් විෂය පථයක් ගෙන එයි. ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී හරස් විකිණීමේ අවස්ථා සෑම විටම නිසි ලෙස සලකා බලනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස ආයෝජන සහයෝගීතාව වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව උත්සාහ කරයි.

අධීක්ෂණය සහ පාලනය
නියමිත වේලාවට ඉලක්ක සපුරා ගැනීම සහතික කරමින්, ඉතිරි ව්‍යාපාර කටයුතුවලට කිසිදු බාධාවක් ඇති නොවන පරිදි ආයෝජන කාර්ය සාධනය අඛණ්ඩව අධීක්ෂණය කරනු ඇත. දර්ශක ඝාතීය ලෙස ඉහළ යන විවිධ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගෙන අවදානම් වලට පිළියම් යෙදීම සඳහා නියාමන හා අභ්‍යන්තර ඔරොත්තු දීමේ හැකියාවට අනුකූලව ප්‍රතිපාර්ශවයන්, වත්කම් පංති සහ ඒකාග්‍රතාව සමඟ දැඩි සීමාවන් ක්‍රියාත්මක වේ. මෙම ක්‍රියාකාරකම් මඟින් රක්ෂණ ඔප්පුහිමියන්ගේ අරමුදල් සුරක්ෂිතව හා සාධාරණව ආයෝජනය කරනු ලබන අතර, සමස්තයක් ලෙස කමිටුව අරමුදල සඳහා ලැබෙන ප්‍රතිලාභ සඳහා වගවීම භාර ගනී.

සමාලෝචනයට භාජනය වන වර්ෂය - ආයෝජන ක්‍රියාකාරකම්වල සාරාංශය
2020 අවසානයේ දී දිගු කාලීන රක්ෂණ අරමුදල රුපියල් බිලියන 152.0 ක් වූ අතර සාමාන්‍ය රක්ෂණ අරමුදල රුපියල් බිලියන 53.7 ක් විය.

සුරක්ෂිත සහ ස්ථාවර ආයෝජන
ක්‍රමානුකූල නොවන අවදානම් අවම කිරීම සඳහා වත්කම් පංති අතර විවිධාංගීකරණය ආයෝජන කමිටුව විසින් සහතික කරයි. මනා ණය ස්ථාවරත්වයක් ඇති ආයතනවලට ආයෝජන දැඩි ලෙස සීමා කර ඇති අතර ඒවා ද්‍රවශීල වේ.

පහත දැක්වෙන ප්‍රස්ථාරවලින් දැක්වෙන්නේ 2020 දෙසැම්බර් 31 දිනට දිගු කාලීන රක්ෂණ අරමුදල, සාමාන්‍ය රක්ෂණ අරමුදල සහ මුළු ආයෝජන කළඹේ ආයෝජන වත්කම් වෙන් කිරීමයි (වටිනාකම් වෙළඳපළ වටිනාකම් මත පදනම් වේ).

ආයෝජන කමිටු වාර්තාව 2020

දීර්ඝ කාලීන රක්ෂණ අරමුදල

ජීවිත රක්ෂණ අරමුදල් කළඹ
31/12/2020



සාමාන්‍ය රක්ෂණ අරමුදල

සාමාන්‍ය රක්ෂණ අරමුදල් කළඹ
31/12/2020



ආයෝජන ආදායම
වර්ෂය සඳහා මුළු ආයෝජන ආදායම පිළිවෙලින් ජීවිත රක්ෂණය සඳහා රු. බිලියන 13.9 ක් සහ සාමාන්‍ය රක්ෂණය සඳහා රු. බිලියන 2.6 කි. වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ ආයෝජන ආදායම සමස්ත සමාගමේ ආදායමෙන් 29% කි. ජීවිත රක්ෂණය සඳහා වන මුළු ආදායමෙන් 42% ක් සහ සාමාන්‍ය රක්ෂණය සඳහා වන මුළු ආදායමෙන් 11% ක් උපයා ඇත්තේ ආයෝජන මගිනි.

ALM සලකා බැලීම් සහ නිපැයුම් සංවර්ධනය
2020 වර්ෂය තුළ වත්කම් හා වගකීම් කළමනාකරණය කෙරෙහි ආයෝජන කමිටුව දැඩි අවධානයක් යොමු කළේය. වර්ෂය අවසානයේදී දක්නට ලැබුණු පහත වැටෙන පොලී අනුපාතවලින් උපරිම වාසි ලබා ගැනීම සඳහා වත්කම් හා වගකීම්වල කාලසීමාවන් අධීක්ෂණය කර කළමනාකරණය කරන ලදී. ඉදිරියේදී අපි ප්‍රතිආයෝජන වෙත අභියෝගයක් විය හැකි අඩු පොලී අනුපාත අපේක්ෂා කරන්නෙමු. කෙසේ වෙතත්, අඩු පොලී අනුපාත වෙළඳුන්ට සහ ආයෝජකයින්ට කොටස් වෙළඳපොළේ ගණනය කළ අවදානම් ගැනීමට මග පාදනු ඇත.

තනි වාරික ආයෝජන නිෂ්පාදනයක් වන "යසස්" නැවත වරක් වසර පුරා ඉහළ ඉල්ලුමක් පෙන්නුම් කළේය.

ආයෝජන කමිටුව 2020 වර්ෂය තුළ ආයෝජන අරමුදල්වල ක්‍රියාකාරිත්වය පිළිබඳව සෑහීමකට පත්වන අතර 2021 කාලය තුළ තවදුරටත් කාර්යසාධනය ඉහළ නැංවීමට උත්සාහ කරනු ඇත.

කේ. ඒ. විමලෙන්තිරරාජා
සභාපති - ආයෝජන කමිටුව
2021 ජූනි 03 වැනිදා

අවදානම් කළමනාකරණ වාර්තාව

ව්‍යාපාර අවදානම් කළමනාකරණය

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අවදානම් කළමනාකරණය අවදානම් ඵලදායී ලෙස හඳුනාගෙන කළමනාකරණය කරමින් අපගේ ව්‍යාපාරයට සහාය වේ. 2014 දී පිහිටුවන ලද අධ්‍යක්ෂක මණ්ඩල අවදානම් කළමනාකරණ උප කමිටුව (BRMC) සමාගමේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමාගමේ උපාය මාර්ග හා අවදානම් රුචියට අනුකූල වන බව සහතික කිරීම සඳහා කළමනාකාරිත්වය සමඟ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අධ්‍යක්ෂක මණ්ඩලයේ අධීක්ෂණ කාර්යය සම්බන්ධීකරණය කරනු ලබන්නේ වෙනත් මණ්ඩල අනු කමිටු විසිනි. එනම් විගණන හා අනුකූලතා කමිටුව (ACC) සහ ආයෝජන කමිටුව (IC) යි.

අවදානම් කළමනාකරණ රාමුව		
අවදානම් සාධකය	ක්‍රියාවලිය	ක්‍රමවේදය
අවදානම් හඳුනා ගැනීම	◆ තර්ජන හඳුනාගෙන තක්සේරු කිරීම ◆ පවතින පාලනයන් හඳුනා ගැනීම ◆ අවදානම් සහ ප්‍රතිවිපාක හඳුනා ගැනීම ◆ තාක්ෂණික උල්ලංඝනය කිරීම් හඳුනා ගැනීම ◆ සංස්කෘතිය, ආචාර ධර්ම, හැසිරීම හඳුනා ගැනීම ◆ මෙහෙයුම්, මූල්‍ය, රක්ෂණ, උපායමාර්ගික සහ පිළිගත් අවදානම් හඳුනා ගැනීම	◆ අවදානම් රුචිය සහ දැරිය හැකි මට්ටම සැකසීම ◆ සිදුවීම් වාර්තා සංවර්ධනය කිරීම ◆ බුද්ධි කැළඹුම් සැසි පැවැත්වීම ◆ සේවක ප්‍රතිපෝෂණය ලබා ගැනීම ◆ ප්‍රධාන අවදානම් දර්ශක සංවර්ධනය ◆ ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය RBC මාර්ගෝපදේශ අනුගමනය
අවදානම් විශ්ලේෂණය	◆ අවිනිශ්චිතතාවයන් සලකා බැලීම ◆ අවදානම් ප්‍රභවයන් විශ්ලේෂණය කිරීම ◆ ප්‍රතිවිපාක විශ්ලේෂණය කිරීම ◆ සම්භාවිතාව, සිදුවීම්, අවස්ථා විශ්ලේෂණය කිරීම ◆ පාලනයන් සහ ඒවායේ කාර්යක්ෂමතාව විශ්ලේෂණය කිරීම	◆ මූල හේතු විශ්ලේෂණය ◆ අවදානම් ලේඛන ◆ ව්‍යාපාර බලපෑම් විශ්ලේෂණය ◆ සිදුවීම් අවදානම් විශ්ලේෂණය ◆ ව්‍යාපාර බලපෑම් විශ්ලේෂණය ◆ අවදානම් ශ්‍රේණිගත කිරීමේ පරිමාණයන් ◆ SWOT විශ්ලේෂණය
අවදානම් ඇගයීම	◆ අවදානම් විශ්ලේෂණ ප්‍රතිඵල අවදානම් නිර්ණායක සමඟ සංසන්දනය කරමින් අවශේෂ අවදානම දරාගත හැකිද යන්න තීරණය කිරීම ◆ තීරණ ගැනීම ◆ අවදානම් ප්‍රතිකාර විකල්ප සලකා බැලීම ◆ අවදානම වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා වැඩිදුර විශ්ලේෂණය ◆ පවතින පාලනයන් පවත්වා ගැනීම ◆ අරමුණු නැවත සලකා බැලීම	◆ ප්‍රලේඛන සමාලෝචන ◆ අවදානම් රුචිය සහ ඉවසීමේ ප්‍රකාශය සමාලෝචනය කරන්න ◆ තොරතුරු රැස්කිරීමේ ක්‍රම ◆ සම්මුඛ සාකච්ඡා ◆ SWOT විශ්ලේෂණය ◆ පිරිස්සුම් ලැයිස්තු විශ්ලේෂණය
අවදානමට විසඳුම්	◆ අවදානම වෙනස් කිරීම සඳහා පියවර සැකසීම ◆ අවදානම වෙනස් කිරීම සඳහා පියවර ක්‍රියාත්මක කිරීම	◆ මග හැරීම ◆ අඩු කිරීම ◆ මාරු කිරීම ◆ පිළිගැනීම ◆ බෙදාගැනීම
අවදානම් අධීක්ෂණය	◆ ක්‍රියාවලි සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිඵල වල ගුණාත්මකභාවය හා ඵලදායීතාවය සහතික කිරීම සහ වැඩි දියුණු කිරීම ◆ අධීක්ෂණය සහ සමාලෝචනය සැලසුම් කිරීම ◆ තොරතුරු රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම ◆ ප්‍රතිඵල හඳුනා ගැනීම සහ ප්‍රතිපෝෂණ ලබා දීම	◆ අවදානම් නැවත ඇගයීම ◆ RBC සහ ද්‍රාව්‍යතා විශ්ලේෂණය ◆ වත්කම් හා වගකීම් කළමනාකරණය ◆ අවදානම් විගණනය ◆ වාර්ෂික AML විගණනය ◆ විවලනය සහ ප්‍රවණතා විශ්ලේෂණය ◆ තාක්ෂණික කාර්ය සාධනය මැනීම ◆ සංචිත විශ්ලේෂණය. ◆ අවදානම් සම්බන්ධීකාරක සමඟ රැස්වීම් කැඳවීම ◆ ඉහළ කළමනාකාරිත්වය සමඟ රැස්වීම් කැඳවීම

අවදානම් වාර්තාකරණය

අධ්‍යක්ෂක මණ්ඩලය

BRMC

ACC මණ්ඩලය /ආයෝජන කමිටුව

අභ්‍යන්තර පාලන-අවදානම් / අනුකූලතා / අභ්‍යන්තර විගණනය

අංශ ප්‍රධානීන්

අවදානම් හිමිකරුවන්

අවදානම් ඒකාබද්ධ කිරීම	◆ බාහිර ව්‍යවස්ථාදායක, නියාමන හෝ අයවැය සහාය අවශ්‍ය වන අවදානම් කළමනාකරණය ◆ ERM සඳහා තීරණාත්මක ආදානයක් උදෙසා උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලියෙන් ප්‍රයෝජන ගැනීම ◆ විභව අවදානම් නිරාවරණ සඳහා මග පාදන, සහ සාර්ථක වීමට වැඩි ඉඩක් ඇති සවිමත් උපාය මාර්ග සැකසීම ◆ පූර්ව අනතුරු ඇඟවීම් සපයන පූර්ව දර්ශක අධීක්ෂණය කිරීම සහ වැළැක්වීමේ ක්‍රියා පටිපාටි ඇරඹීම

අවදානම් කළමනාකරණ වාර්තාව

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අඛණ්ඩව වසර ගණනාවක් තිස්සේ අවදානම් පදනම් කරගත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය අවශ්‍ය මට්ටමට වඩා ඉහළ මට්ටමක පවත්වා ගැනීමට සමත් වී තිබේ. ඒ අනුව, ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා අවදානම් පදනම් කරගත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය 2020 මූල්‍ය වර්ෂයේදී 459% ක් වාර්තා කර ඇති අතර එය 2019 මූල්‍ය වර්ෂය සඳහා 436% ක් විය. සාමාන්‍ය මූල්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා අවදානම් පදනම් කරගත් ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය 223% ක් ලෙස 2020 වර්ෂයේදී වාර්තා වී ඇති අතර එය 2019 මූල්‍ය වර්ෂය සඳහා 212% කි.

2020 දී කොවිඩ්-19 වසංගතය හේතුවෙන් රක්ෂකයාට සහ රක්ෂණ ලාභියාට රක්ෂණාවරණ සම්බන්ධයෙන් ගැටළු රාශියක් ඇතිකර තිබේ. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් රටේ සැවොම ඉතා අවිනිශ්චිත තත්ත්වයකට මුහුණ දෙමින් සිටින අතර වසංගතයේ පැතිරුම් වේගය හා පරිමාණය නිසා මෙතෙක් සලකා නොබැලූ අවදානම්ද නිරාවරණයවී ඇත. කොවිඩ්-19 නිසා ඇති විය හැකි අවදානම් තක්සේරු කිරීමේ අරමුණින්, පවත්නා පාලනයන්හි ප්‍රමාණවත් බව තක්සේරු කිරීම උදෙසා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ප්‍රධාන කාර්යාලයේ සහ අහඹු ලෙස තෝරාගත් ශාඛා තුළ අවදානම් තක්සේරුවක් පවත්වා ඇති අතර ඒ අනුව සුදුසු නිර්දේශ ඉදිරිපත් කර එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඇත. පෙර නොවූ විරූ පරිදි බොහෝ සේවා යෝජකයන් විවිධාකාර මානව සම්පත් ගැටළු වලට මුහුණ දී සිටින අතර, කිසිදු සේවයෙන් ඉවත් කිරීමක් හෝ වැටුප් අඩු කිරීමක් නොමැතිව අපගේ මෙහෙයුම් දිගටම කරගෙන යාමට අපට හැකි විය. එමඟින් මානව සම්පත් සම්බන්ධයෙන් වන අවදානම අවම කිරීමට සහ ඒ හා සම්බන්ධ නීතිමය ගැටළු මඟහරවා ගත හැකි විය.

ඊට අමතරව, පාරිභෝගිකයින්ට අඛණ්ඩව සේවා සැපයීම සඳහා ඩිජිටල්කරණය හඳුන්වාදෙමින් අවදානම් අවම කිරීම සඳහා අපි කටයුතු කරමින් සිටින්නෙමු. කොවිඩ්-19 වසංගතය ව්‍යාපාරයට නව මුහුණුවරක් ලබා දී ඇති බැවින් නිවසේ සිට රැකියා කිරීම නව සාමාන්‍යභාවය බවට පත්ව ඇත. ඩිජිටල් පරිණාමනය වේගවත් වීමත් සමඟ සයිබර් ආරක්ෂාව සපයා ගැනීම ද විශාල අවදානමක් බවට පත්ව ඇත. අපගේ දත්ත හා තාක්ෂණික යටිතල ව්‍යුහයේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අපගේ මාර්ගෝපදේශ සහ විධිවිධාන ගෙනහැර දක්වන සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියක් අප සතුව ඇත. අපි සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණ රාමුව නැවත සලකා බැලූ අතර 2021 කාර්තුමය වශයෙන් ප්‍රධාන තොරතුරු නිලධාරියාගෙන් " සයිබර් ආරක්ෂණ සිදුවීම් වාර්තාව" ලබා ගැනීම ක්‍රියාත්මක කර ඇත්තෙමු.

කොවිඩ්-19 වසංගතය අතරතුර මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි අංශය සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ නිකුත් කර ඇත. ඒ යටතේ වසංගත සමය තුළ පැන නඟින මුදල් විශුද්ධිකරණ / ත්‍රස්තවාදී මූල්‍යකරණ අවදානම් වලින් මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීමට සුදුසු පියවර ගන්නා ලෙස රක්ෂණ සමාගම්වලට උපදෙස් දී තිබේ. ඉහත අවදානම් අවශ්‍යතා අපගේ අවදානම් කළමනාකරණ කාර්යයට අපි ඇතුළත් කර ඇති අතර, විශේෂයෙන් වසංගත සමය තුළ මුදල් විශුද්ධිකරණ / ත්‍රස්තවාදීන්ට මුදල් යෙදවීමේ අවදානම අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇත.

ප්‍රධාන වැඩසටහන්

1. අවදානම් රුචිය සහ ධාරණ මට්ටම වර්ධනය කිරීම
2. සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම
3. මුදල් විශුද්ධිකරණ විරෝධී රාමුව ශක්තිමත් කිරීම
4. කොවිඩ්-19 වසංගත අවදානම් අවම කිරීමේ ක්‍රියාවන්
5. අභ්‍යන්තර චක්‍රලේඛවල අභ්‍යන්තර ගබඩාවක් නිර්මාණය කිරීම
6. දත්ත වර්ගීකරණ ප්‍රතිපත්තිය සකසා නිම කිරීම
7. බාහිරකරණ ප්‍රතිපත්තිය සකසා නිම කිරීම
8. මානව සම්පත් අවදානම අවම කිරීම සඳහා සේවක දුක්ගැනවිලි කමිටුව පිහිටුවීම
9. ISO 31000: 2018 ට අනුකූලව ERM රාමුව සංවර්ධනය කිරීම
10. සේවා ප්‍රමිතීන් පිළිබඳ පසු විපරම

2021 වසර සඳහා සැලසුම

1. වත්කම්-වගකීම් කළමනාකරණ ප්‍රතිපත්තිය සමාලෝචනය
2. අවදානම් රුචිය සහ ඉවසීමේ මට්ටම සමාලෝචනය කිරීම
3. පද්ධති විගණන කාර්යය ශක්තිමත් කිරීම
4. මූල්‍ය හා මූල්‍ය නොවන සාධක අවදානම් විශ්ලේෂණය සහ එහි ව්‍යාපාර බලපෑම.
5. පාරිභෝගික තෘප්ති අවදානම් විශ්ලේෂණය.
6. අභ්‍යන්තර පාලනයන් අවදානම් කළමනාකරණ රාමුවට අනුකූල බව සහතික කිරීම
7. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ / ඩිජිටල් අවදානම් ERM ක්‍රියාකාරිත්වයට ඒකාබද්ධ කිරීම සහ සයිබර් ආරක්ෂණ උපායමාර්ගය තවදුරටත් ශක්තිමත් කිරීම
8. තෙවන පාර්ශවීය අවදානම පිළිබඳ සම්පූර්ණ විශ්ලේෂණය

ආයුගණක, ආයෝජන සහ මූල්‍ය ඇතුළු අදාළ පාර්ශවකරුවන් සමඟ අපි වත්කම්-වගකීම් කළමනාකරණ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම ආරම්භ කර ඇති අතර, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද "රක්ෂණ සමාගම් සඳහා ආයෝජන පිළිබඳ මාර්ගෝපදේශ" වලට අපි අනුකූල වන්නෙමු. අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් අප ආයතනික පාලනය පිළිබඳ හොඳම පරිචය සංග්‍රහයේ 2017 හි අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කර ඇත. කෙසේ වෙතත්, අවදානම් කළමනාකරණ රාමුවට අනුකූල වන පරිදි 2021 දී අභ්‍යන්තර පාලන ක්‍රමය තවදුරටත් ශක්තිමත් කරන්නෙමු.

ජීවිත රක්ෂණ අවදානම

ජීවිත රක්ෂණය හා සම්බන්ධ බොහෝ අවදානම් ඇත. ඊට පහත දේ ඇතුළත් වේ:

මර්ත්‍යතා අවදානම	ජීවිත රක්ෂණ ඔප්පු මත අත් දකින සැබෑ ඔප්පු හිමියාගේ මරණ අවදානම අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩිවීම	අඩු අවදානමකි
දීර්ඝායුෂ අවදානම	වාර්ෂිකලාභීන් බලාපොරොත්තු වූවාට වඩා දිගු කාලයක් ජීවත් වීමේ අවදානම.	අඩු අවදානමකි
රෝගාබාධ අවදානම	සැබෑ රක්ෂණ ඔප්පුහිමියන්ගේ සෞඛ්‍යය /අහඹු සම්බන්ධ හිමිකම් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩිය.	අඩු අවදානමකි
රක්ෂණ ඔප්පුහිමියන්ගේ හැසිරීම් අවදානම	දායක මුදල් අත්හිටවීම සහ අඩුකිරීම හෝ ගිවිසුම කල් පිරීමට පෙර ප්‍රතිලාභ ආපසු ගැනීම ඔප්පු හිමියාගේ හැසිරීමේ අපේක්ෂා කලාට වඩා නරක අතට හැරීමේ අවදානම. දුර්වල අනවරත අනුපාත, අනාගත ස්ථාවර වියදම් දැරීමට පොත්වල රක්ෂණ ඔප්පු ඉතා අඩු ප්‍රමාණයක් පැවතීමට සහ ලේඛණගත ව්‍යාපාර වලට විලම්හිත අත්කර ගැනීමේ වියදම් අයකර ගැනීමට ඇති හැකියාව මත සැබැවින්ම බලපාන වීම ව්‍යාපාරවලින් ලැබෙන අනාගත ධනාත්මක මුදල් ප්‍රවාහ අඩු කිරීමට මුල්විය හැකිය	අඩු අවදානමකි
වියදම් අවදානම	රක්ෂණ ඔප්පු අත්කර ගැනීමේදි සහ පරිපාලනය කිරීමේදි කරනු ලබන වියදම් අපේක්ෂා කලාට වඩා වැඩිවීමේ අවදානම.	අඩු අවදානමකි

නිසි පරිදි පාලනය හා කළමනාකරණය නොකළහොත් සමාගමේ මෙහෙයුම්වලට බලපෑ හැකි ඉහත සඳහන් අවදානම් ඇගයීම සඳහා සමාගම විසින් පරිපාටි සහ ක්‍රියාවලි ස්ථාපනය කරනු ලැබ තිබේ. මෙම පරිපාටි වලින් නිෂ්පාදන සංවර්ධනයේ සිට ප්‍රතිලාභ පරිපාලනය දක්වා සියලුම තීරණාත්මක පියවර ආවරණය කරන ලෙස සකස් කර ඇත.

ඊට අමතරව, සියලුම ජීවිත මූල්‍ය ප්‍රවාහ සැලසුම් කරනු ලැබ ඇති අතර නිෂ්පාදන සැලසුම සහ මිල නියම කිරීමේ අවදානම අඩු කිරීම සඳහා ආයුගණක විසින් ලාභ පරීක්ෂාවක් සිදුකරනු ලබයි. එමෙන්ම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට වගකීම් පවතින්නේ නම් ඒවායින් ඇතැම් වගකීම් ආපසු ලබා ගැනීම සදහා සිහුම් සාධන පත්‍ර (ALM), භාවිතා කරනු ලබයි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් අවදානම් පදනම් කරගත් ප්‍රාග්ධන (RBC) රාමුව යටතේ "දළ වාර්ක තක්සේරුකරණ" යාන්ත්‍රණය (GPV) අනුගමනය කර ඇත. වෙළඳපළ ස්ථාවර ආකාරයකින් වගකීම් ගණනය කරනු ලබන වගකීම් තක්සේරුකරණ අරමුණු සඳහා මෙය අවශ්‍ය වේ. මෙයින් අදහස් කරන්නේ දළ වාර්ක තක්සේරුකරණ යාන්ත්‍රණය පදනම් වී ඇත්තේ මරණ, රෝගාබාධ, වියදම්, ප්‍රමාද දෝෂ යනාදිය සඳහා වන පැහැදිලි ඇස්තමේන්තු මත වන අතර අවදානම් රහිත පොලී අනුපාත ව්‍යුහය මෙහිදී වට්ටම් අරමුණු සඳහා යොදා ගනී. අනාගත අපේක්ෂිත මට්ටමේ ප්‍රසාද දීමනා සඳහා වගකීම් පැහැදිලි ආන්තිකයක් ද දරයි. එය මුළු ප්‍රතිලාභ වගකීම (TBL), ලෙසින් හඳුන්වනු ලබන අතර එහෙයින් අනාගත ප්‍රසාද දීමනා හොඳම නිමාන උපකල්පන යටතේ සුරක්ෂිත කරනු ලබයි. කලින් කලට සිදුකරනු ලබන අභ්‍යන්තර අත්දැකීම් අධ්‍යයන මත පදනම්ව වගකීම ඇගයීම සඳහා හොඳම නිමාන උපකල්පන සකස් කිරීමෙහි ලා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව දිරිමත් කරනු ලැබ ඇත. මෙමගින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට වසර ගණානාවක් පුරා ඔප්පුහිමිකරු වගකීම් ස්ථාවර අකාරයකට කළමනාකරණය කර ගැනීමට අවස්ථාව සැලසේ.

මීට අමතරව, TBL ගණනය කිරීම සඳහා සලකා බලනු ලබන හොඳම ඇස්තමේන්තුගත පරාමිතීන් IRCSL විසින් ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුව අවදානම් ආන්තිකය (RM) යෙදීම ලෙසින් තවදුරටත් අවධාරණය කරනු ලබන අතර TBL හි හොඳම ඇස්තමේන්තු වලින් අහිතකර අපගමනය සඳහා ආන්තිකය සමඟ ගණනය කෙරේ. අවදානම් ආන්තිකය භාවිතා කිරීම මගින් ඔප්පු වගකීම්වල සංඛ්‍යාත්මක විශ්වාසය ඉහළ දමනු ලබන අතර එමගින් ඔප්පුහිමියන්ගේ ප්‍රතිලාභ සඳහා සපයන ආරක්ෂාව වැඩි වී ඔප්පු වගකීම් වැඩි වනු ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් භාවිතා කරන අවදානම් කළමනාකරණය අවදානම් පාදක ගණනය කිරීමේ රාමුවෙහි නිශ්චය කර ඇති සාධක සමඟ අනුගතවන වන්නකි. එය වගකීම් ගණනය කිරීම යටතේ පැවතිය හැකි බෙදාහැරීම අවධාරණය කිරීමට 75% ක විශ්වාස අන්තරයක් නියෝජනය කරයි.

එබැවින් ජීවිත රක්ෂණ ගිවිසුමේ වගකීම් නිශ්චය කිරීමේදි යොදා ගනු ලබන ප්‍රධාන උපකල්පන පහත වගු ගත කර ඇත.

උපකල්පනය	විස්තරය
මර්ත්‍යතාව	- හොඳම නිමාන අත්දැකීම් අනුපාතයට ඉඩදීමට වාර්ෂික නොවන ව්‍යාපාර සඳහා වයස 67-70 කාණ්ඩ වලට වෙන්කරන ලදී.
	- වාර්ෂිකයන්ගේ මර්ත්‍යතාව (mortality) ආසන්න වශයෙන් 1%කින් වර්ධනය කිරීමට ඉඩදීම සඳහා වයස වසරකින් අවහිර කිරීමෙන් පිරිමියෙකුගේ (90) ක භාරිත සාමාන්‍යයක් (Weighted average) සහ ගැහැණියකගේ (90)ක භාරිත සාමාන්‍යයක් පවතී.
ආයෝජන ප්‍රතිලාභ	2020.12.31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ නියාමක කොමිෂන් සභාව (IRCSL) විසින් යෝජිත අවදානම් රහිත අනුපාත ව්‍යුහය



අවදානම් කළමනාකරණ වාර්තාව

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව එහි ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා 2020 වර්ෂය පුරා ස්ථාවර සහ ශක්තිමත් නුඹුන්වත් අනුපාතයක් පවත්වාගෙන යන ලද අතර 2020.12.31 දිනට අවදානම් පදනම් ප්‍රාග්ධන අනුපාතය (CAR), 459% වන අතර එය 2019.12.31 දිනට 436% ක් විය. මෙය අවම නියාමන අවශ්‍යතාවයක් වන 120%ට වඩා ඉහළ අගයක් ගනී.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මක බවේ අනුපාතය (%)



සාමාන්‍ය රක්ෂණ සඳහා සංවේදීතා විශ්ලේෂණය

උපකල්පනය	උපකල්පනයේ වෙනස්වීම	හොඳම ඇස්තමේන්තුගත වගකීම් මත බලපෑම (රු.)
මර්ත්‍යතාව	+10%	724මිලියන
	-10%	(725)මිලියන
වට්ටම් අනුපාතය	අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) යටතේ උඩු ප්‍රකම්පිත වාතාවරණය	(14,964)මිලියන
	අවදානම් පාදක ප්‍රාග්ධන RBC යටතේ යටි ප්‍රකම්පිත	19,582මිලියන

නිෂ්පාදන කාණ්ඩය මත පදනම්ව රක්ෂණ ඔප්පු වගකීම් වෙන් කිරීම

2020 දෙසැම්බර් 31 දිනට රු. 000	රක්ෂණ වගකීම් (ලාභ සහිත)	රක්ෂණ වගකීම් (ලාභ රහිත)	මුළු ප්‍රතිලාභ වගකීම්
පූර්ණ ජීවිත	22,137	4,394	26,531
පරිත්‍යාග/දායාද ජීවිත රක්ෂණය	74,745,760	3,161,913	77,907,673
කාල රක්ෂණය	0	3,858,121	3,858,121
වාර්ෂික ප්‍රදානය	14,687,439	3,390,629	18,078,067
අතුරු ප්‍රතිලාභ	1,983	3,141,906	3,143,889
එකතුව	89,457,319	13,556,963	103,014,282

පහත දැක්වෙන වගුවෙන් සහභාගික සහ අසහභාගික අරමුදල් තත්ත්වය පෙන්නුම් කරයි.

	සහභාගික රු. '000	අනුපාත නොවන රු. '000	එකතුව රු. '000
2020	120,363,450	13,650,092	134,013,542
ප්‍රතිශතය	89.81%	10.19%	-

සාමාන්‍ය රක්ෂණ අවදානම

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසමේ අනිවාර්ය අවශ්‍යතාවකට අනුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2016.01.01 දින සිට අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන නුඹුන්වත් රාමුවක් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කරන ලද අතර එය අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන ක්‍රමය යටතේ අවශ්‍ය වූවකි.

මේ යටතේ, හිමිකම් වගකීම යන සංරචකය හිමිකම් වගකීමේ මධ්‍යම ඇස්තමේන්තුව සහ අවදානම් අන්තරයෙහි සංයෝජනයක් ලෙස අර්ථ දක්වා ඇත. වාරික හිමිකම යන්න, අවදානම් අන්තරයන් සමඟ කල් නොපිරුනු අවදානම් සංචිතයේ මධ්‍යම ඇස්තමේන්තුව ලෙස අර්ථ දක්වා ඇත.

සංචිතයන් ස්ථාපිත කිරීමේ විචක්ෂණභාවය

වාරික වගකීම සහ හිමිකම් වගකීම නමින් සාමාන්‍ය ආයුගණකමය සංචිතයන් හි ප්‍රධාන සංරචකයන් දෙකක් ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 75% ක විශ්වාස මට්ටමක හිමිකම් වගකීමක් (හිඟ හිමිකම් සංචිතය සඳහා හා දරන ලද එහෙත් (ප්‍රමාණවත්ව) වාර්තා නොවූ හිමිකම්) ස්ථාපිත කර ඇති අතර එයට හිමිකම් වගකීමේ මධ්‍යම ඇස්තමේන්තුව, හිමිකම් වල අනාගත නිරවුල් කිරීම් සඳහා සම්බන්ධිත හිමිකම් පරිහරන වියදම් සහ මධ්‍යම ඇස්තමේන්තු හිමිකමෙහි අහිතකර අපගමනය හා ප්‍රතිපාදන හා හිමිකම් වල අනාගත නිරවුල් කිරීම් සඳහා සම්බන්ධිත හිමිකම් පරිහරන වියදම් සඳහා ප්‍රතිපාදන අන්තර්ගත වේ. වාරික හිමිකම ද 75% ක විශ්වාස මට්ටමක ස්ථාපිත කර ඇති අතර එය, ගතවූ හදිසි අනතුරු වර්ෂ දෙකක් හෝ තුනක් සඳහා වන මධ්‍යම ඇස්තමේන්තු අවසාන අලාභ අනුපාතයෙහි සාමාන්‍යය ගණනය කිරීම මඟින් තීරණය කරනු ලබන මධ්‍යම ඇස්තමේන්තු කල් නොපිරුනු අවදානම් සංචිතය සහ අනාවරණය වීම ඉදිරියේ දී සිදු වන බැවින් අතිරේක වෙනස්වීම් විඳහා දැක්වන පරිදි අහිතකර අපගමනයන් සඳහා වන ප්‍රතිපාදන මත පදනම් ව ගණනය කර ඇත.

හිමිකම් සංවර්ධන තොරතුරු

වෛතිහාසික ජීවිත නොවන සංචිතයන් හා ශුද්ධ ප්‍රතිරක්ෂණයන් හි වෙනස්කම් පහත වගුවෙහි දක්වා ඇත. අදාල වසරේ සහ ඉකුත් වසර වල දරන ලද අලාභ සඳහා ඇස්තමේන්තුගත අනාගත ගෙවීම් ප්‍රමාණය විඳහා දක්වන එක් එක් ශේෂ පත්‍ර දිනය අනුව නොගෙවූ අලාභ සහ අලාභ ගැලපීම් සඳහා වන ඇස්තමේන්තුගත දළ සංචිත වගුවෙහි ඉහළ පෙළෙහි

දක්වා ඇත. එක් එක් වසර අවසානයේ දී ස්ථාපිත සංචිත සඳහා එක් එක් පසුව එන වසර වල ගෙවන ලද සමුච්චිත වටිනාකම් වගුවෙහි සමුච්චිත ගෙවීම් කොටසේ දැක්වේ. ඒ ආකාරයෙන්ම, ඉහත ත්‍රිකෝණයේ දක්වා ඇති ගෙවන ලද සමුච්චිත මුදල් ප්‍රමාණය සහ මූල්‍ය වර්ෂය අවසානයේ දී ශුද්ධ හිඟ තත්ත්වය පිළිබඳ තොරතුරු සමුච්චිත වාර්තා ගතවූ අලාභ කොටසෙහි දක්වා ඇත.

	2015	2016	2017	2018	2019	2020
අලාභ සහ අලාභ යථාවත් කිරීමේ වියදම් සඳහා දළ සංචිත	7,894	8,664	8,549	8,776	7,311	**7,862**
ප්‍රතිරක්ෂණ ආපසු ලබාගැනීම්	(976)	(1,434)	(1,451)	(1,590)	(1,061)	**(1,395)**
අලාභ සහ අලාභ යථාවත් කිරීමේ වියදම් සඳහා ශුද්ධ සංචිත	6,917	7,230	7,098	7,186	6,250	**6,466**
දෙසැම්බර් 31 දිනට සමුච්චිත ගෙවීම්:						
වසරකට පසු	4,981	6,637	6,849	7,590	7,723	**5,371**
වසර දෙකකට පසු	6,989	8,392	9,004	9,632	9,451	**-**
වසර තුනකට පසු	7,099	8,539	9,185	9,772	-	**-**
වසර හතරකට පසු	7,160	8,722	9,242	-	-	**-**
වසර පහකට පසු	7,223	8,801	-	-	-	**-**
වසර හයකට පසු	7,301	-	-	-	-	**-**
දෙසැම්බර් 31 දිනට වාර්තාගත සමුච්චිත ගෙවීම්:						
වසරකට පසු	6,326	7,913	8,297	9,467	9,153	**6,493**
වසර දෙකකට පසු	7,291	8,531	9,184	9,907	9,907	
වසර තුනකට පසු	7,376	8,717	9,414	10,288	-	**-**
වසර හතරකට පසු	7,398	8,883	9,526	-	-	**-**
වසර පහකට පසු	7,417	8,943	-	-	-	**-**
වසර හයකට පසු	7,469	-	-	-	-	**-**

* රු. මිලියන

සාමාන්‍ය රක්ෂණ අවදානම් සඳහා සංවේදීතා විශ්ලේෂණය

පහත වගුවෙන් බදු ගෙවීමට පෙර ශුද්ධ අදායමේ සංවේදීතාව සහ සියයට දශම එකකින් පියවීමට ඇති වාර්තාකළ හිමිකම්වල හානිකර වර්ධනයේ ප්‍රතිඵල ලෙස ශුද්ධ වත්කම් වල සංවේදීතාව පෙන්නුම් කරයි. එවැනි වර්ධනයක් රක්ෂිත අවස්ථාවන් වැඩි වාර ගණනක දී සිදු වීමෙන් හෝ ප්‍රතිඵල හිමිකම් වල බරපතලකමේ වර්ධනයකින් හෝ වාර ගන්නේ හෝ බරපතලකමේ සංයෝජනයෙන් පැන නැඟිය හැකිය. එවැනි සිදුවීමක සම්භාවිතාවයක් සංවේදීතාවලින් නොදැක්වෙන අතර ප්‍රතිරක්ෂණයේ කවර හෝ අර්ථවත් බලපෑමක් සංවේදීතා වලින් සලකා බැලීමක් නොකරයි.

මෙහිදී මධ්‍යම නිමාන වැය කරන ලද නමුත් (ප්‍රමාණවත් තරම්) වාර්තා නොකළ IBN(E)R වගකීම් වලට නොගෙවූ වගකීම් වටිනාකම් සමඟ සියයට දශම එකකින් බලපෑමක් තිබෙන බව සහ වගකීම් පරිහරණ වියදම් (CHE) කෙරෙහි බලපෑමක් නොමැති බව අපි උපකල්පනය කරන්නෙමු. පහත සඳහන් වගුවේ සංවේදීතා විශ්ලේෂණය ඉදිරිපත් කිරීමේදී යොදාගත් උපකල්පන මත පදනම්ව වාර්තාගත නොවූ වගකීම් වල සෑම අතිරේක සියයට දශම එකකක වැඩි වීමක් බදු ගෙවීමට පෙර ශුද්ධ අදායම සහ ශුද්ධ වත්කම් මත අර්ථවත් බලපෑමක් ඇති කරයි. ඊට අමතරව, සමාගම ප්‍රතිරක්ෂණ ගිවිසුමවල අර්ථවත් බලපෑම් සැලකිල්ලට ගනිමින් ආන්තික වාතාවරණ ඇගයීම තුළින් රක්ෂණ අවදානම් මෙහෙයවයි.

	උපකල්පනයන්ගේ වෙනස්වීම	වාර්තාවී තිබෙන ගෙවීමට ඇති දළ හිමිකම් රු.	වාර්තාවී තිබෙන ගෙවීමට ඇති ශුද්ධ හිමිකම් රු.	දළ වගකීම් මත බලපෑම රු.	ශුද්ධ වගකීම් මත බලපෑම රු.	බදුකරණයට පෙර ලාභය මත බලපෑම රු.	කොටස් ප්‍රමාණය මත බලපෑම (බදු කරණයට පසුව) රු.
2020 දෙසැම්බර් 31 වන දිනට	+1%	5,630මිලියන	4,337මිලියන	73මිලියන	59මිලියන	(59)මිලියන	(42)මිලියන

ආයෝජන අවදානම් කළමනාකරණය

කොවිඩ්-19 හේතුවෙන් 2020 දී ආයෝජන මෙතෙක් නොවූ විරූ අවදානම් වලට ලක්විය. වසංගතයට පෙර ආයෝජන මත තීරණ ගැනීමේ ක්‍රියාවලීන් වෙත අහිතකර ලෙස බලපා තිබූ බැවින් අස්ථාවරත්වය සහ ප්‍රවණතාව මත පදනම් වූ සාම්ප්‍රදායික වෙළඳ උපාය මාර්ග පසුගාමී විය. 2020 වසරේ සාර්ථකත්වයේ රහස වූයේ අවස්ථාවන් හඳුනා ගැනීම සහ ඒවා ප්‍රයෝජනයට ගැනීමයි. ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල පොලී අනුපාත වසර ගණනාවක්

අවදානම් කළමනාකරණ වාර්තාව

පුරා අඩු වී තිබූ බැවින් 2020 දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ප්‍රති ආයෝජන අවදානම ඉතා වැදගත් විය. මන්ද, ලොව පුරා මහ බැංකු විසින් ආර්ථිකයන් අවපාතයකට යාම වළක්වා ගැනීම සඳහා පොලී අනුපාත දැඩි ලෙස අඩු කළ බැවිනි. ශ්‍රී ලංකා මහ බැංකුව ද කාලෝචිත ආකාරයකින් පොලී අනුපාත සැලකිය යුතු ලෙස අඩු කර තිබේ.

පොලී අනුපාත කප්පාදුව සහ වෙළඳපලවල අතිරික්ත ද්‍රවශීලතාවය, වත්කම් කොටස් සමූහයක් ඇරඹීමට උපකාරී වූ බැවින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ආයෝජන කළඹේ විවිධත්වය, අඩු ආයෝජන අනුපාතවල ඍණාත්මක බලපෑම අවම කිරීමට උපකාරී විය. කොවිඩ්-19 හේතුවෙන් පැවති අවිනිශ්චිතතාවය හේතුවෙන් ප්‍රතිලාභවලට (return) අමතරව ද්‍රවශීලතාවය සහ ණය අවදානම් වැනි අංශ කෙරෙහි ද නිසි අවධානය යොමු විය.

දූරදර්ශී අවදානම් කළමනාකරණ මූලධර්ම සහ අදාළ IRCSL මාර්ගෝපදේශ මත පදනම්ව, අරමුදලේ වගකීම් සපුරාලීම සඳහා ගණනය කළ අවදානම් තක්සේරු කිරීම් ප්‍රාග්ධනීකරණය කිරීම සඳහා වර්ෂය තුළදී අවධානය යොමු කරන ලදී.

වෙළඳපොළ අවදානම

පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු පොලී අනුපාතවල වෙනස්වීම් සහ ඵලදා වක්‍රයේ හැඩයේ වෙනස්වීම් හේතුවෙන් සිදුවිය හැකි පාඩු අවදානමයි. පොලී අනුපාත අවදානම කළමනාකරණය කරනු ලබන්නේ වත්කම්වල කාලසීමාවන් සහ වගකීම් අතර පරතරයන් දරාගත හැකි සීමාවන් තුළ බව සහතික කිරීමෙනි. කොවිඩ්-19 නිසා ආර්ථිකය අඩපණ වීමේ අවදානම නිසා 2020 දී මහ බැංකුව තම මුදල් ප්‍රතිපත්තිය දැඩි ලෙස ලිහිල් කළේය.

පොලී අනුපාත අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කරන බැවින් නැවත ආයෝජනය කිරීමේ අවදානම තවදුරටත් අභියෝගයට ලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, අඩු පොලී අනුපාත මඟින් වැඩි වෙළඳ අවස්ථා ලබා දෙනු ඇත.

විනිමය අනුපාත අවදානම

විනිමය අනුපාතවල අහිතකර වෙනස්වීම් හේතුවෙන් පාඩු සිදුවීමේ හැකියාව විනිමය අනුපාත අවදානම ලෙස හැඳින්වේ. 2020 දී ඒක්සත් ජනපද ඩොලරය ශ්‍රී ලංකාවේ රුපියලට සාපේක්ෂව මෙතෙක් වූ ඉහළම අගය වාර්තා කළේය. කෙසේ වෙතත්, මහ බැංකුව විසින් ක්‍රියාවට නංවන ලද ඥානාන්විත හා කාලෝචිත පියවරවල් රුපියලේ පාඩු පියවා ගැනීමට උපකාරී විය.

කොටස් ප්‍රමාණ අවදානම

කොටස් අවදානම යනු කොටස් වෙලඳපොළ මිලෙහි අස්ථාවරත්වය නිසා ඇතිවන අවදානමයි.

සියලු කොටස් දර්ශකය සහ වඩාත් ද්‍රවශීලමය S&P SL20 යන දෙකම 2020 දී ඉහළ ගියේය. කෙසේ වෙතත්, මෙය සිදු වූයේ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමට රට තාවකාලිකව වසා තැබීමෙන්/අගුලු දැමීමෙන් පසුව ඒවා කඩා වැටීමෙන් පසුවය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි කොටස් ආයෝජන කළඹ ක්‍රමානුකූල අවදානමකට නිරාවරණය වන අතර එය සමස්ත වෙළඳපොළටම ආවේණික වූ අවිනිශ්චිතතාවයකි.

අංශ සඳහා වෙන් කිරීම - ලැයිස්තුගත කොටස්
2020.12.31 දිනට ජීවිත රක්ෂණ අරමුදල



අංශ සඳහා වෙන් කිරීම - ලැයිස්තුගත කොටස්
2020.12.31 දිනට සාමාන්‍ය රක්ෂණ අරමුදල



කල් පිරීමේ පැතිකඩ
2020.12.31 දිනට ජීවිත රක්ෂණ අරමුදල



කල් පිරීමේ පැතිකඩ
2020.12.31 දිනට සාමාන්‍ය රක්ෂණ අරමුදල



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කොටස් කළඹෙහි ඇති විවිධත්වය කොටස් වෙලඳපොළවල තියුණු පහත වැටීමේ බලපෑම අවම කිරීමට උපකාරී වූ අතර, නොවැළැක්විය හැකි ලෙස අඩු ගුණයකින් කොටස් මිලදී ගැනීමට කාලෝචිත ලෙස ක්‍රියා කිරීම නිසා සැලකිය යුතු වෙළඳ ලාභයක් ලැබුණි.

ද්‍රවශීලතා අවදානම
පවත්නා වෙළඳපල මට්ටමින් ඈවර කිරීමට ඇති නොහැකියාව සහ ආයෝජනයක් ඈවර කිරීමේ ක්‍රියාවලියේදී පාඩු සිදුවීම ද්‍රවශීලතා අවදානම ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි අරමුදල්වල ද්‍රවශීලතා අවශ්‍යතා පිළිබඳව දැනුවත්ව සිටින අතර එහි අරමුදල්වලින් වැඩි කොටසක් ගැඹුරු වෙළඳපොලවල් ඇති සාපේක්ෂව ද්‍රවශීලතා ඇති භාණ්ඩාගාර බැඳුම්කර වැනි වත්කම් සඳහා ආයෝජනය කිරීමෙන් ද්‍රවශීලතාවය කළමනාකරණය කරයි. තවද, වත්කම් හා වගකීම් වල කල්පිරීමේ හිඩැස් පාලනය කළ හැකි මට්ටම් තුළ කළමනාකරණය වේ.

ජීවිත අරමුදලට දිගු ආයෝජන ක්ෂිතිජයක් සහ අඩු ද්‍රවශීලතා අවශ්‍යතා ඇත. කෙසේ වෙතත්, සාමාන්‍ය අරමුදලට කෙටි ආයෝජන ක්ෂිතිජයක් සහ ඉහළ ද්‍රවශීලතා අවශ්‍යතා ඇත. එබැවින් මෙම ද්‍රවශීලතා අවශ්‍යතාවන්ට සරිලන පරිදි පරිණත පැතිකඩ සැකසීම අඛණ්ඩ පදනමක් මත සිදු කෙරේ. තනි නිකුත් කරන්නන් සහ ඇතැම් වත්කම් පංති විසින් ආයෝජන සාන්ද්‍රණය කිරීම සඳහා අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද සීමාවන් ද්‍රවශීල උපකරණවල ආයෝජනය සීමා කරයි.

ණය අවදානම
පොලී සහ / හෝ ප්‍රාග්ධනය නිරාකරණය නොකිරීම නිසා ඇතිවිය හැකි පාඩුව ණය අවදානම ලෙස හැඳින්වේ. අවම ණය ශ්‍රේණිගත කිරීම් සහ ගැඹුරු විශ්ලේෂණ නිවැරදිව පිළිපැදීමෙන් මෙම අවදානම අවම කරනු ලැබේ. කිසියම් ආයෝජනයක් කිරීමට පෙර පුළුල් ණය විශ්ලේෂණයක් අභ්‍යන්තරව සිදු කරනු ලැබේ. අවදානම් ගුණාත්මකභාවය, කර්මාන්ත, පරිණතභාවය සහ පරිමාව අනුව නිරාවරණය සීමා කිරීමේ අදහසින් ණය අවදානම් ආයෝජන මට්ටමින් මෙන්ම කළඹ මට්ටමින් හොඳින් සමතුලිත ආයෝජන කළඹක් සහතික කිරීම සඳහා කළමනාකරණය කරනු ලැබේ.

සංකේන්ද්‍රණ අවදානම
වෙළඳපලෙහි ඇතැම් කොටස් වලට ආයෝජන කළඹ නිරාවරණය කිරීමට වඩා, කළඹ ප්‍රමාණවත් ලෙස බණ්ඩනය වී කොටස් වලට ඒකරාශී වීමේ අවදානම, එම අංශයේ අඩු කාර්යසාධනය කළඹේ කාර්ය සාධනය කෙරෙහි සැලකිය යුතු සෘණාත්මක බලපෑමක් ඇති කළ හැකිය. සංකේන්ද්‍රණ අවදානම අවම කිරීම සඳහා ආයෝජන විවිධාංගීකරණය කර ඇත.

මෙහෙයුම් අවදානම
මානව දෝෂ සහ වංචා ඇතුළු මෙහෙයුම් ක්‍රියා පටිපාටිවල අඩුපාඩු හේතුවෙන් මෙහෙයුම් අවදානම පාඩු ලැබීමේ අවදානමට හේතු වේ. මෙහෙයුම් අවදානම අවම කිරීම සඳහා රාජකාරි වෙන් කිරීම, ද්විත්ව පාලනය සහ නිතිපතා විගණනය සිදු කරනු ලැබේ.

අවදානම් කළමනාකරණ වාර්තාව

තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවදානම් කළමනාකරණය



මෙම අවදානම් හඳුනාගත් පසු ඒවා වැදගත් මට්ටමින් මනිනු ලබන අතර ඒවා අවම කිරීම සඳහා අවදානම් අවම කිරීමේ උපාය මාර්ග සකස් කරනු ලැබේ. අභ්‍යන්තර (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධති ආරක්ෂක කණ්ඩායම) සහ බාහිර පාර්ශවයන් (තොරතුරු පද්ධති විගණකවරුන්) විසින් සිදු කරනු ලබන අවදානම් තක්සේරු කිරීම් මගින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවදානම් නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ. මෙම අවදානම් තක්සේරු කිරීම්වල ප්‍රතිඵල වනුයේ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා වඩාත් ආරක්ෂිත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා යෙදවීමකට තුඩු දෙන වාර්තා ය.

සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණය

"සයිබර් ආරක්ෂණ තර්ජන ප්‍රධාන වශයෙන් රහස්‍ය දත්ත නැතිවීම, ව්‍යාපාර කඩාකප්පල් කිරීම සහ පිළිගත් හානිය යන අංශ තුනෙන් රක්ෂණ අංශය ඇතුළුව සමස්තයක් ලෙස මූල්‍ය අංශයට බලපායි."

සයිබර් ආරක්ෂක අවදානම	මූලික හේතුව	ආවේණික අවදානම් මට්ටම	අවදානම් අවම කිරීමේ උපාය මාර්ග	අවශේෂ අවදානම් මට්ටම
අනිශ්ඨ මෘදුකාංග (Malware)	◆ ප්‍රති වෛරස මෘදුකාංග වැඩසටහන් වල අඩුපාඩු.	ඉහළ	◆ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආරක්ෂණ අවදානම තක්සේරු කිරීම	මධ්‍යම
සීරෝ ඩේ ආක්‍රමණ (Zero Day Exploits)	◆ නොසලකා හරින ලද ආරක්ෂක පරාමිතියක වාසිය ලබා ගැනීම.		◆ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආරක්ෂක කණ්ඩායම විසින් අධීක්ෂණය කිරීම	
SQL ප්‍රහාර (SQL Injection)	◆ ෆයර්වෝලය යාවත්කාලීන කර නොතිබීම		◆ සයිබර් ආරක්ෂණ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ ආරක්ෂක කණ්ඩායම විසින් හඳුනාගෙන තිබේ.	
රැන්සම්වෙයා (Ransomware)	◆ නොදන්නා ලින්ක් එකක් ක්ලික් කිරීමකින් වැනි හේතුවකින් පද්ධතියට පැමිණි අනිෂ්ට මෘදුකාංගයක්		◆ ෆයර්වෝල් (Firewall) යාවත්කාලීන කර ඇති අතර ජාල පරිමිතිය තුළ සයිබර් ප්‍රහාර නැවැත්වීමට ඉහළ මට්ටමේ පහසුකම් සපයා තිබේ.	
නොදත් මෘදුකාංග මය ප්‍රහාර (Drive-by Attack)	◆ නොදන්නා මෘදුකාංග හා විශ්වාසවන්ත නොවන නිෂ්පාදකයන්ගේ ක්‍රමලේඛ බාගත කර ගැනීමෙන්.			
ට්‍රෝජන් වෛරස				

සයිබර් අවදානම් අවම කිරීමට ගත නව ක්‍රියාමාර්ග

- නැගී එන සයිබර් ආරක්ෂණ තර්ජන අවම කිරීම සඳහා වඩා හොඳ තත්වයක සිටීම සඳහා ස්ථර ප්‍රවේශයක් භාවිතා කරමින් ජාල සැකැස්ම නැවත සැලසුම් කිරීම.
- සීරෝ ඩේ ආකාරයේ ආක්‍රමණ වැළැක්වීමට එන්ඩ්පොයින්ට් සහ සේවාදායක ප්‍රති-වයිරස පද්ධති වැඩි දියුණු කිරීම.
- දත්ත හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පද්ධති වලට සැලකිය යුතු හානියක් සිදු වීමට පෙර සහ චර්යා පදනම් කරගත් ප්‍රහාර හඳුනා ගැනීමට සහ සයිබර් සඳහා ඇඟවීම් ජනනය කිරීමට දෘඩාංග ලොග්, පැකට් සහ ප්‍රවාහවල විවිධ ප්‍රභවයන් භාවිතා කරමින් ආරක්ෂක සිදුවීම් සහ සිදුවීම් කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීම.

- සයිබර් ආරක්ෂණ ප්‍රහාරයන්ට වඩාත් ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්විය හැකි තත්ත්වයකට පත්වීම සඳහා ආරක්ෂක ස්වයංක්‍රීයකරණය සහ ප්‍රතිචාර ක්‍රමවේද උපයෝගී කරගනිමින් සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම.

වංචා සහ විෂමාචාර අවදානම් කළමනාකරණය

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි ක්‍රියාදාමයන් පවත්වා ගෙන යාම සහ වැඩිදියුණු කිරීමේ අරමුණින්, වංචා සහ විෂමාචාර අවදානම කළමනාකරණය / අවම කිරීම මගින් ව්‍යවසාය පුරා වංචා රහිත පරිසරයක් සැකසීමට ප්‍රධාන වන අතර එය වෙළඳපල විශ්වාසය සහ මහජන විශ්වාසය ආරක්ෂා කළ හැකි වැදගත් පියවරකි. 2018 දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වංචා කළමනාකරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දුන් අතර එය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි වංචා, අයථා පරිහරණයන් සහ වෙනත් අක්‍රමිකතා හඳුනා ගැනීම සහ වැළැක්වීම සඳහා රාමුවක් ස්ථාපිත කළේය. ආයතනික වංචා ප්‍රතිපත්තිය ස්ථාපිත කර ඇත්තේ සමාගමට සහ එහි කාර්ය මණ්ඩලයට එරෙහි වංචා හඳුනා ගැනීම සහ වැළැක්වීම සඳහා උපකාරී වන පාලක සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා ය. පාලක සංවර්ධනය සහ විමර්ශන හා විධිමත් සමාලෝචන සංවර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශ සැපයීම සහ වගකීම් පැවරීම මගින් ස්ථාවර ආයතනික හැසිරීම් ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි අභිප්‍රායයි.

අභ්‍යන්තර විගණනයෙන් ආවරණය වන වංචා අවදානම්	මූලික හේතුව	ආවේණික අවදානම් මට්ටම	අවදානම් අවම කිරීමේ උපාය මාර්ග	අවශේෂ අවදානම් මට්ටම
නියෝජිතයන් පාරිභෝගිකයන් සේවකයන් සැපයුම්කරුවන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය ව්‍යාපෘති ආයෝජන	◆ පැවතිය හැකි දුර්වලතා ප්‍රයෝජනයට ගැනීම	ඉහළ	◆ ඉහළ සුදුසුකම් ලත් සහ පළපුරුදු කාර්ය මණ්ඩලයක්, සහ අවදානම් සහ පාලනයන් පිළිබඳ ශක්තිමත් අවබෝධයක් ඇති කිරීම. ◆ ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි කළමනාකරණයේ කොටසක් ලෙස නියෝජිතයින් විසින් නිසි ලෙස හසුරුවනු නොලැබූ පැමිණිලි සැලකිල්ලට ගැනීම. ◆ වාර්ෂික විගණන සැලැස්ම මගින් හිමිකම් ගෙවීම්, කොමිස් සහ දිරි දීමනා සහ අනෙකුත් කළමනාකරණ වියදම් වැනි ඉහළ අවදානම් අංශ ආවරණය කරයි ◆ ආචාර ධර්ම හා අනුකූලතා වැඩසටහන් සහ ඊට සම්බන්ධ ප්‍රති-වංචා වැඩසටහන් සහ පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම. ◆ ශාඛා සම්බන්ධ විෂමාචාර සහ වංචා පිළිබඳ සියලු සොයා ගැනීම් සමාලෝචනය කෙරෙන අතර විගණන පසු විපරම් කමිටු රැස්වීමේදී අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ. ◆ පුළුල් පද්ධති විගණන කාර්යයක් සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. ◆ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සහ අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා සියලුම අලාභ සිදුවීම් කාර්තුමය වශයෙන් ව්‍යවසාය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට වාර්තා කර ඇත. ◆ වංචනික ක්‍රියා සම්බන්ධයෙන් වැරදිකරුවන් බව ඔප්පු වූ සේවකයින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.	අඩු

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි ව්‍යවසාය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අරමුණ වන්නේ සමස්ත අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, අවදානම් තක්සේරු කිරීම්, ඇගයීම් සහ අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කිරීම මගින් ආයතනික පුළුල් අවදානම අවම කිරීමයි. නියාමන මාර්ගෝපදේශයන්ට අනුකූලව, නියාමන බලාත්මක කිරීම වැඩි කර ඇති අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි වංචා සහ විෂමාචාරයන් අවම කිරීම සඳහා වන පරීක්ෂාව වැඩි දියුණු කර ඇත. දෙපාර්තමේන්තු තුනම මණ්ඩල විගණන හා අවදානම් කළමනාකරණ කමිටුවලට වාර්තා කරයි.

අවදානම් කළමනාකරණ වාර්තාව

මානව සම්පත් අවදානම

ආයතනයක සාර්ථකත්වය බොහෝ දුරට රඳා පවතින්නේ එහි පුද්ගලයන්ගේ ගුණාත්මකභාවය හා ක්‍රියාකාරිත්වය මත වන අතර මානව සම්පත් ඕනෑම ආයතනයක ක්‍රියාදාමයන් අවදානම් සහිත කාර්යයක් බවට පත් කරයි. කර්මාන්තයේ තරඟකාරිත්වය වැඩිවීමත් සමඟම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඔවුන්ගේ කුසලතා මාර්ගය ගැන නැවත සිතා බැලිය යුතු අතර තිරසාර වර්ධනයක් පවත්වා ගැනීම සඳහා මෙම ප්‍රමුඛතා සහ අවදානම් සමඟ සාර්ථකව කටයුතු කිරීම සඳහා ඔවුන්ගේ මානව සම්පත් ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කළ යුතුය. එබැවින් ඕනෑම ආයතනයක මානව සම්පත් කළමනාකරණය අතිශයින්ම වැදගත් වන අතර එය හරහා ව්‍යාපාරයට ඉහළ අවදානමක් ජනනය කළ හැකිය. තවද, මානව සම්පතෙහි ඉහළ වටිනාකම, වැඩි අවදානමක් ඇති කරයි.

අවදානම නිසි ලෙස කළමනාකරණය නොකළ හොත්, එය ඕනෑම ආයතනයක ව්‍යාපාර වර්ධනයට බාධාවක් විය හැකිය. එබැවින්, සිදුවිය හැකි සියලු අවදානම් තක්සේරු කිරීම සහ හඳුනා ගැනීම වැදගත් වන අතර පසුව ව්‍යාපාරයේ අවදානම් අවම කිරීම හෝ ඉවත් කිරීම සඳහා ප්‍රතිවිරුද්ධ ක්‍රියාමාර්ග ගැනීම වැදගත් වේ. නිසි තක්සේරුවක් මඟින් ආයතනයක මානව සම්පත් සම්බන්ධ අවදානම් අංග විසඳීමට බොහෝ ක්‍රම ඇති බව පෙන්වනු ඇත.

මෙම අවදානම් ඉහළ, මධ්‍යම හා අඩු වැනි විවිධ මට්ටම්වල විය හැකි අතර එය අභ්‍යන්තර හෝ බාහිර විය හැකිය. එබැවින් මානව සම්පත් අවදානම් වැළැක්වීමේ උපාය මාර්ග සංවිධානයේ ආයතනික ව්‍යාපාරික උපාය මාර්ගයට ඇතුළත් කිරීම අතිශයින් වැදගත් ය.

ප්‍රධාන මානව සම්පත් අවදානම් ප්‍රදේශ

මානව සම්පත් අවදානම් ක්ෂේත්‍රය	මූලික හේතුව	ආවේණික අවදානම් මට්ටම	අවදානම් අවම කිරීමේ උපාය මාර්ග	අවශේෂ අවදානම් මට්ටම
බඳවා ගැනීම	ව්‍යාපාරයට අවශ්‍ය දැනුම, කුසලතා සහ පළපුරුද්ද ඇති නියම වේලාවට සුදුසු රැකියා අපේක්ෂකයෙකු ලබා ගැනීමට සංවිධානයට ඇති නොහැකියාව.	ඉහළ අවදානම	බඳවා ගැනීමේ ක්‍රියාවලිය සාධාරණ, අපක්ෂපාතී හා විනිවිදභාවයකින් යුක්ත විය යුතු අතර, වාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන අනුබද්ධතා හෝ ජන විකාශන ප්‍රදේශය නොසලකා සමාන අවස්ථා ලබා දීම සහ තෝරා ගැනීම පූර්ණ වශයෙන්ම රැකියාවේ අපේක්ෂාවන්ට සරිලන රැකියා අපේක්ෂක සුදුසුකම් මත වේ.	අඩු අවදානම
			වැඩිපුර බඳවා ගැනීම අනවශ්‍ය මූල්‍යමය බරක් සහ ව්‍යාපාරයට අවදානමක් ඇති කරයි. මෙම අවදානම තුරන් කිරීම සඳහා, ඉදිරි වසර 3 සඳහා සේවක අවශ්‍යතාවය නිසි විශ්ලේෂණයකින් හඳුනාගෙන ඇති අතර මෙම සේවක අවශ්‍යතාවය අනුව සියලුම බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.	
			රක්ෂණ ව්‍යාපාරයට අදාළ මූලික නොවන අංශ සඳහා ශ්‍රමය බාහිරින් ලබා ගැනීම සහ මූලික ව්‍යාපාර අවශ්‍යතා සඳහා පමණක් නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සීමා කිරීම.	
පුහුණුව හා සංවර්ධනය	පුහුණු හා සංවර්ධන ක්‍රියාවලියේ අඩුපාඩු විශාල අවදානමක් ඇති කරයි. ඉන් ව්‍යාපාර වර්ධනය සඳහා මානව ප්‍රාග්ධනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ හැකියාවට බාධා පැමිණිම හා ඉහළ තරඟකාරිත්වයක් පවත්වා ගෙන යාම අපහසු වේ.	ඉහළ අවදානම	සෑම සේවකයෙකුටම තමන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ලැබෙන බව සහතික කෙරෙන පුහුණු හා සංවර්ධන ක්‍රියාවලිය, සමස්ත මෙහෙයුම්වල ඵලදායීතාව ඉහළ නංවන අතර ඔවුන්ගේ වෘත්තීය අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමට සහාය වේ	අඩු අවදානම
			පුහුණු දින සටහනක් සකස් කර, ගැඹුරු පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයක් හරහා අවශ්‍ය පුහුණු කිරීම් හඳුනා ගනේ. මෙය වඩාත් උචිත සේවකයින්ට නිසි වේලාවට නිසි පුහුණුවක් ලබා දෙන බව සහතික කරයි.	

මානව සම්පත් අවදානම් ක්ෂේත්‍රය	මූලික හේතුව	ආවේණික අවදානම් මට්ටම	අවදානම් අවම කිරීමේ උපාය මාර්ග	අවශේෂ අවදානම් මට්ටම
කාර්ය සාධන කළමනාකරණය	සංවිධානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තනි කාර්ය සාධනය සිතියම් ගත කිරීම සඳහා පැහැදිලි ක්‍රියාවලියක් නොලැබීම.	ඉහළ අවදානම	ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තු KPI වලට අනුකූලව තනි සේවකයින් සඳහා ඉලක්ක සකසා ඇති කාර්ය සාධන ඇගයීම් පද්ධතිය.	මධ්‍යම මට්ටමේ අවදානම
			සෑම වර්ෂයකම ආරම්භයේ දී අදාළ රේඛීය කළමණාකරු සමඟ එකඟ වූ විට, පුද්ගලයන්ගේ ක්‍රියාකාරිත්වය PM ක්‍රියාවලිය තුළ වරින් වර ස්වයං තක්සේරු කිරීම් සහ අදාළ රේඛීය කළමනාකරු සමඟ මධ්‍ය කාලීන සමාලෝචන මගින් මනිනු ලැබේ.	
			වර්ෂය අවසානයේ අවසාන කාර්යසාධන ශ්‍රේණිගත කිරීම මඟින් කාර්ය සාධනය ඉහළ නැංවීමට පෙළඹෙන පුද්ගලයන්ට භෞතික ප්‍රතිලාභ සැපයේ.	
වෘත්තීය සමිති ක්‍රියාකාරකම්	අරමුණු සමඟ එකඟ නොවීම	ඉහළ අවදානම	කළමනාකරණය සහ ආයතනයක සේවකයින් අතර ඵලදායී සන්නිවේදනයක් තිබිය යුතුය. ව්‍යාපාර උපායමාර්ග, කළමනාකරණ තීරණ, ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවල යම් වෙනසක් පිළිබඳව කළමනාකාරිත්වය සේවකයින්ට පැහැදිලිව හා කාලෝචිත ලෙස සන්නිවේදනය කරන අතර ව්‍යාපාරය වර්ධනය කිරීම සඳහා කළමනාකාරිත්වයට අවංක හා වැදගත් ප්‍රතිපෝෂණ, යෝජනා සහ අදහස් ලබා දීමට සේවකයින්ට හැකි විය යුතුය.	මධ්‍යම මට්ටමේ අවදානම
			තමන් ද තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කොටසක් බව සේවකයින්ට හැඟී යන පරිදි කටයුතු කිරීමත්, ව්‍යාපාර උපාය මාර්ග ඉදිරියට ගෙනයාමට බලපාන ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීමත් කළ යුතුය. සමාගම් තීරණ ගැනීමේ ක්‍රියාවලියට ක්‍රියාකාරීව සහභාගී වීමට වෘත්තීය සමිතිවලට අවස්ථාව ලබා දිය යුතු වේ.	
			සමාගමේ ව්‍යාපාර උපාය මාර්ග සමඟ පෙළගැස්වීම සඳහා බාහිර පුහුණු, නායකත්ව සංවර්ධන පුහුණු සහ වෘත්තීය සමිති අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ වැඩමුළු පැවැත්වීම.	
මානව සම්පත් දෙපාර්තමේන්තුවේ පුද්ගලික ලිපිගොනු විශාල සංඛ්‍යාවක් පැවතීම	ලේඛන කළමනාකරණය	ඉහළ අවදානම	ලේඛන කළමණාකරණ පද්ධතියක් හඳුන්වාදීමට මූලික පියවර ගෙන ඇති අතර, එහිදී සියලුම පුද්ගලික ලිපිගොනු වල ලේඛන නිසි ලෙස වර්ගීකරණය කර, ස්කෑන් කර, මෘදු පිටපත් ලෙස සුරකිනු ඇත. එබැවින් සේවකයින්ගේ අවශ්‍යතා මත කඩිනමින් ක්‍රියා කිරීමට අවශ්‍ය වූ විට ඩිජිටල් තාක්ෂණය භාවිතා කිරීමෙන් වේගවත් ප්‍රවේශ පහසුකම් ලැබෙන අතරම අවම ගබඩා ඉඩ ප්‍රමාණයක් ලබා ගනිමින් සියලුම ලේඛන සුරක්ෂිතව ගබඩා කළ හැකි වේ.	අඩු අවදානම

අවදානම් කළමනාකරණ වාර්තාව

මානව සම්පත් අවදානම් අවම කිරීම සඳහා වන වෙනත් ප්‍රධාන පියවර

- "Bee News"

අපගේ සන්නිවේදන උපාය මාර්ගයේ වැදගත් අංගයක් ලෙස කාර්තුමය ආයතනික පුවත් සංග්‍රහයක් වන "Bee News" හඳුන්වා දී ඇත. දිවයින පුරා අපගේ ශාඛාවල සිටින සේවකයින් ඇතුළුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සියලුම සේවකයින් වෙත Bee News සැපයේ. මෙම පියවරෙහි පරමාර්ථය වන්නේ සාමාන්‍ය මෙහෙයුම් හා සේවකයින් සම්බන්ධ තොරතුරු බෙදා හැරීම සහ සමාගමේ උපායමාර්ගවලට අනුකූලව සියලු දෙනා පෙළගැස්වීමයි. ගෙවුණු වර්ෂය තුළදී අප යෝජනා සතියක් ද පවත්වා, ආයතනික සංවර්ධනය සඳහා යෝජනා WhatsApp හරහා ඉදිරිපත් කරන ලෙස සේවකයන්ගෙන් ඉල්ලා සිටි අතර ඊට හොඳ ප්‍රතිචාර ලැබුණි. මේවා සමාගමේ උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා ලදී.

- මානව සම්පත් ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි

පසුගිය සිව් වසර තුළ වැදගත් මානව සම්පත් ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි කිහිපයක් ද සංවර්ධනය කර ඇත. සියලුම සේවකයින්ගේ නිරන්තර ප්‍රතිපෝෂණයෙන් මෙය සිදු කර තිබේ. මෙය අපගේ සියලු ක්‍රියාකාරකම්වල විනිවිදභාවය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන අතර සියලුම සේවකයින්ට නොමිලේ සහ සාධාරණ ලෙස සැලකීම සහතික කරනු ඇත. මෙම ප්‍රතිපත්ති සියලුම සේවකයින් සමඟ බෙදාගෙන ඇති අතර ඒය අපගේ වෙබ් අඩවියෙන් ද ලද හැකිය.

- රැකියා දිවියේ සමබරතාවය

සියලුම සේවකයින් සඳහා හොඳ රැකියා දිවියේ සමතුලිතතාවයක් සහතික කිරීම මානව සම්පත් අවදානම් අවම කිරීමට උපකාරී වන තවත් සාධකයකි. "සතුටින් පිරි සේවකයින් සතුටින් පිරි ගනුදෙනුකරුවන් බිහි කරනු ඇත". ඒබැවින් යෝගා පන්තියක්, ව්‍යායාම පහසුකම් වැනි සේවකයින්ගේ ශාරීරික හා මානසික සමතුලිතතාවය ගොඩනගන ක්‍රියාකාරකම් රැසක් දියත් කර ඇත.

තවද, ආගම් සහ ක්‍රීඩා ක්‍රියාකාරකම් නියෝජනය කරන ඇතැම් ආගමික ක්‍රියාකාරකම් වරින් වර සෑම ප්‍රදේශයකම පවත්වනු ලැබේ. හොඳ පුස්තකාලයක් පැවතීම සේවකයින්ගේ අධ්‍යාත්මික යහපැවැත්ම වැඩිදියුණු කිරීමට උපකාරී වන තවත් වැදගත් අංගයක් වන අතර, දැනට අපගේ සේවකයින්ගේ භාවිතය සඳහා විවිධ විෂයයන් පිළිබඳ පොත් 3000 කට වැඩි ප්‍රමාණයක පුස්තකාලයක් අප සතුව ඇත.

ඉහත සියළු ක්‍රියාකාරකම් සාර්ථකව ක්‍රියාවට නංවා ඇති අතර මානව සම්පත් අවදානම අවම කිරීම සඳහා මේ වන විට ඉමහත් දායකත්වයක් ලබා දී තිබේ. අපගේ ව්‍යාපාරය වර්ධනය කර ගැනීම සඳහා අපගේ සංවිධානයේ වටිනාම වත්කම වූ සේවකයන්ගේ ඉහළම මට්ටමේ කැපවීම සහ දායකත්වය ලබා ගැනීමට ඉන් අවස්ථාව උදා වනු ඇත.

අනුකූලතා වාර්තාව

රක්ෂණ සේවා සපයන්නන් සඳහා, විනිවිදභාවය යනු අනුකූලතා අවශ්‍යතා දැඩි ලෙස පිළිපැදිය යුතු ප්‍රධානතම අංගයක් වන අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අපි අනුකූලතා අවශ්‍යතා දෛනික ව්‍යාපාරික භාවිතයන්ට ඇතුළත් කර ඇත්තෙමු. නියාමන වෙනසෙහි වේගය සහ පුළුල් බව රක්ෂණ සමාගම්වලට අඛණ්ඩ අභියෝගයක් වී ඇති අතර විශේෂයෙන් නව මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය වන IFRS 17 නිසැකවම වසර 20 කට වැඩි කාලයක් තුළ රක්ෂණ ගිණුම්කරණ අවශ්‍යතාවන්හි වඩාත්ම කැපී පෙනෙන වෙනසක් ඇති කරනු ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රජය සතු ආයතනයක් වීම මත සීමිත වගකීම් සමාගම්, රක්ෂණ සමාගම් සහ රජය සතු සමාගම් සඳහා අදාළ වන නීති, රීති සහ රෙගුලාසි වලට යටත් වේ.

පහත දැක්වෙන ප්‍රස්ථාරයෙන් සමාගමට අදාළ නෛතික රාමුව නිරූපණය කෙරේ:



අදාළ සියලු නීතිවලට අනුකූල වීමට අපි කැපවී සිටින අතර එබැවින් හඳුනා ගැනීම, අධීක්ෂණය කිරීම, වාර්තා කිරීම සහ අනුකූලතාවය සහතික කිරීම සඳහා විධිමත් අනුකූලතා රාමුවක් සකස් කර ක්‍රියාත්මක කර ඇත. මේ සඳහා ප්‍රධාන අනුකූලතා නිලධාරීගේ ප්‍රධානත්වයෙන් ආයතනික අනුකූලතා කාර්යයක් ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අනුකූලතා බලපත්‍රය මගින් දක්වා ඇත. ප්‍රධාන අනුකූලතා නිලධාරියා විගණන හා අනුකූලතා කමිටුවට, අවදානම් කළමනාකරණ කමිටුවට, සහ අධ්‍යක්ෂක මණ්ඩලයට නිතිපතා වාර්තා කරයි. මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුකූලතා ප්‍රතිපත්තිය මඟින් සමාගමේ අනුකූලතා පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා වූ මාර්ගෝපදේශයික මූලධර්ම, ප්‍රධාන අංග සහ ක්‍රියා පටිපාටි දක්වා ඇත. සමාගමේ විධායක කමිටුව ආයතනයේ ඉහළ මට්ටමේ අපේක්ෂාවන් මධ්‍ය මට්ටම දක්වා ගෙන ඒමට කිරීමට උපකාරී වන අතර මණ්ඩලය හරහා නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල වන බව සහතික කරයි.

"අනුකූලතා අවදානම" අර්ථ දැක්වෙන්නේ අදාළ නීති, රෙගුලාසි, අභ්‍යන්තර ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ මූලධර්මවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලයක් ලෙස සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව දඩ, සිවිල් හා සාපරාධී දඩුවම් යනාදියට නිරාවරණය විය හැකි අනුකූලතා අවදානම ඵලදායී ලෙස කළමණාකරණය කිරීමට අසමත් වීම මඟින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි අඛණ්ඩතාවට ඇති අවදානම හෝ හානිය ලෙසය.අනුකූලතා අවදානම් තක්සේරුකරණය, සමාලෝචනය වන වසර තුළ දී ප්‍රධාන වශයෙන් නියාමන ආශ්‍රිත කරුනු වෙත අවධානය යොමු කර ඇති අතර වඩාත්ම යහපත් පරිචයන් සමග අනුකූලතාව නොදැක්වීම හා සම්බන්ධ අවදානම තක්සේරු කිරීම සඳහා වන විෂය පථය පුළුල් කිරීම ක්‍රියාමාර්ග ගෙන ඇත. ප්‍රධාන අනුකූලතා ප්‍රදේශයන් විගණනයට ලක් වන බවට වග බලා ගැනීම ද එයට ඇතුළත් වේ. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි ව්‍යාපාරික මූලධර්මවලට සෑම මට්ටමකම සිටින සියලුම කාර්ය මණ්ඩලය නීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීම පමණක් නොව, වගකීමෙන් යුතුව අවංකව කටයුතු කිරීමද අවශ්‍ය වේ. මනා අනුකූලතා අවදානම් කළමනාකරණය යනු ගනුදෙනුකරුවන්ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීම බව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අවබෝධ කර ගනී.

අනිවාර්ය (රෙගුලාසි සහ කර්මාන්ත කේත ආදිය) සහ අභිමතය පරිදි (ව්‍යාපාර උපායමාර්ග සහ අරමුණු සහ ආයතනික ප්‍රතිපත්ති ආදිය) අවදානම සමබර කර ගනිමින් අනුකූලතා අවදානම් රුචිය සැකසීම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමකි. ඵලදායී අනුකූලතා අවදානම් කළමනාකරණය යනු අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, නෛතික හා මානව සම්පත් වැනි ආයතනය තුළ ඇති විවිධ පාලන ක්‍රියාකාරකම් එකට එකතු කර ගෙන කටයුතු කරන සහයෝගී ක්‍රියාවලියකි.

සමාගමේ අනුකූලතා දෙපාර්තමේන්තුව අදාළ වන නීති, රීති සහ රෙගුලාසි වලට වගකිව යුතු අංශ හඳුනාගෙන ඇති අතර අනුකූලතා අවශ්‍යතා සපුරාලීමේදී සහයෝගී ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරයි. ක්‍රියාකාරී පියවරක් ලෙස, අනුකූලතා දෙපාර්තමේන්තුව අනාගතයේ අපේක්ෂිත රෙගුලාසි පිළිබඳව කළමනාකරණයට මග පෙන්වයි, මන්ද යත් ක්‍රියාකාරී ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ විසඳුමක් මඟින් නව රෙගුලාසි පිරිවැය ඵලදායී ලෙස විසඳීමට අවශ්‍ය මෙවලම් සමාගමට සපයයි.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ මුදල් විශුද්ධිකරණයට හෝ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා අරමුදල් සැපයීමට පහසුකම් සපයන ඕනෑම ක්‍රියාකාරකමක් තහනම් කිරීම සහ ක්‍රියාශීලීව ඉදිරියට යාම සමාගමේ ප්‍රතිපත්තියයි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අදාළ නීතිවලට අනුකූලව AML අනුකූලතාවයට කැපවී සිටින අතර මුදල් විශුද්ධිකරණ අරමුණු සඳහා සිය නිෂ්පාදන හා සේවාවන් භාවිතා කිරීම වැළැක්වීම සඳහා එහි කළමනාකාරිත්වය, කාර්ය මණ්ඩලය සහ පත් කරන ලද නියෝජිතයින් මෙම ප්‍රමිතීන් පිළිපැදිය යුතුය. මුදල් විශුද්ධිකරණය යනු කුමක්ද, එය සිදු කරන්නේ කෙසේද සහ එය වළක්වා ගැනීමට ගත හැකි පියවර පිළිබඳව කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ට ගැඹුරු අවබෝධයක් ලබා දීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අභ්‍යන්තරව විද්‍යුත් ඉගෙනුම් මොඩියුලයක් නිර්මාණය කර ඇත. ක්‍රියාවලිය අවසානයේදී, සේවකයින්ට විභාගයකට පෙනී සිටීමින් කාර්ය සාධන ඇගයීම සඳහා 5% ක ප්‍රතිපාදන වෙන් කළ යුතුය.

අප සතුව තොරතුරු අනාවරණය කිරීමේ ප්‍රතිපත්තියක් ඇති අතර අනුකූලතා නිලධාරියා තොරතුරු අනාවරණය කරන නිලධාරියා වන අතර එම ප්‍රතිපත්තිය සමාගම තුළ ක්‍රියාත්මක වන බව සහතික කරයි. "අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ අනෙකුත් සියලුම

අනුකූලතා වාර්තාව

සේවකයින් සඳහා වන ව්‍යාපාරික චර්යාධර්ම හා ආචාර ධර්ම සංග්‍රහය" සැලසුම් කර ඇත්තේ ආයතනයේ සාමාජිකයන්ට නියම කර ඇති මූලධර්ම, රීති, සාරධර්ම, ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා ය.

අනුකූලතා දෙපාර්තමේන්තුව දෙපාර්තමේන්තුමය වශයෙන් පුහුණුවක් ලබා දෙන අතර අභ්‍යන්තර සන්නිවේදන වේදිකා හරහා 'අනුකූලතා ඉඟි' මගින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය දැනුවත් කරයි. සමාගම සිය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කරමින් සිටින අතර අනාගතයේදී නිපුණතා අනුකූලතා ප්‍රාග්ධනය උපයෝගී කර ගනිමින් අනුකූලතා කළමනාකරණය කෙරෙහි වඩාත් කාර්යක්ෂමව අවධානය යොමු කරනු ඇත.
අනුකූලතා අවදානම සම්බන්ධයෙන්, ආරක්ෂක ආකෘතියේ මාර්ග හතරක් අනුගමනය කරනු ලැබේ: අදාළ දෙපාර්තමේන්තු වල අවදානම් හවුල්කරුවන් ලෙස හඳුනාගෙන ඇති සැබෑ අවදානම් අයිතිකරුවන් ආරක්ෂක අංශයේ පළමු පෙළ ලෙස ක්‍රියා කරයි; අවදානම් කළමනාකරණ කමිටුව සහ විගණන හා අනුකූලතා කමිටුව ආරක්ෂක දෙවන පෙළ ලෙස ක්‍රියා කරයි; අභ්‍යන්තර විගණනය "මුදල් විශුද්ධිකරණය" සඳහා ආරක්ෂක තුන්වන පේළියක් ලෙස ක්‍රියා කරයි; නියාමකයා, එනම්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) සහ බාහිර විගණකවරුන් (2010 අගෝස්තු 23 දිනැති චක්‍රලේඛ අංක 29,) සිව්වන ආරක්ෂක වළල්ල ලෙස ක්‍රියා කරයි. අනුකූලතා අවදානම් න්‍යාය පත්‍රය විගණන න්‍යාය පත්‍රයට ද්විතියික නොවන බව සහතික කිරීම සඳහා, අනුකූලතා දෙපාර්තමේන්තුව විගණන හා අනුකූලතා කමිටුවට සහ අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කරයි.

පහත සඳහන් දෑ ක්‍රියාත්මක වන බව සහතික කිරීමෙන් අනුකූලතා අවදානම අවම කර ඇත: අනුකූලතාවය සහ අවදානම් කළමනාකරණය අධීක්ෂණය කිරීම ඒකාබද්ධ කිරීම; විවෘත හා විනිවිද පෙනෙන වාර්තාකරණයට සහාය වීම; සහ පාර්ශවකරුවන් සමඟ සබඳතා ගොඩනඟා ගැනීම. ආචාර ධර්ම හා හොඳම භාවිතයන් අනුව අනුකූලතා රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, නිවැරදි කිරීමේ සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අනුකූලතා ගැටළු සහ සිදුවීම් මණ්ඩලය සහ අනු කමිටු වෙත තීව්‍ර කරනු ලැබේ.

පවත්නා කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ, මූල්‍ය අපරාධ පිළිබඳව දැනුවත්ව සිටීමේ අවශ්‍යතාවය සහ සයිබර් ආරක්ෂණ පියවර ගැනීමේ වැදගත්කම පිළිබඳව අපි අවධානයෙන් සිටින්නෙමු. අනන්‍යතාවය සොරකම් කිරීම, ඊමේල් ලිපින සහ වෙබ් අඩවි අන්සතු වීම, සහ රැන්සම්වෙයා ප්‍රහාර බෙදා හැරීම වැළැක්වීම ඇතුළු සයිබර් අපරාධ ගෝලීය වශයෙන් ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතී. දත්ත සුරැකීම සහ ත්‍රස්තවාදයට නොදැනුවත්ව මුදල් සැපයීම වැනි නැගී එන අනුකූලතා අවදානම් කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව අපි සිහියේ තබා ගෙන සිටින්නෙමු.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, බාහිර විගණක වාර්තාවේ හෙළිදරව් කිරීම්වලට යටත්ව සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වලට යටත්ව, පහත දක්වා ඇති සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා, රීති හා රෙගුලාසි වලට සමාගම අනුකූල විය.

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

නියාමන සහ ව්‍යවස්ථාපිත අනුකූලතාවය - 2020 ජනවාරි 01 වන දින සිට 2020 දෙසැම්බර් 31 වනදින දක්වා වන කාල පරිච්ඡේදය සඳහා නියාමන / අධීක්ෂණ අධිකාරිත්ව අනුකූලතා වාර්තාව සඳහා වාර්තා සහ ගෙවීම් ඉදිරිපත් කිරීම. අනුකූලතාව සහ විශේෂ කරුණු

නියාමන/ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය	වාර්ථාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ සංඛ්‍යාතය	ඉදිරිපත් කිරීම/ ගෙවීම කලයුතු නියමිත දිනය	සිදු කළ දිනය	අනුකූලතාව සහ විශේෂ කරුණු
කාල පරිච්ඡේදය තුලදී ගෙවීමට නියමිත වන නියාමන/ ව්‍යවස්ථාපිත වාර්ථා / ගෙවීම්				
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව				
රක්ෂණ කාර්මාන්ත නියාමන පනතේ 49 (ආ) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රක්ෂන නියාමන කොමිෂන් සභාව වෙත ඉදිපත් කළ යුතු වන කාර්තුමය වාර්තා				
2012 අප්‍රේල් 01 වන දින සිට බලපවත්වනු ලබන රක්ෂණ කාර්මාන්ත නියාමන පනතේ 49 (ආ) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතු ප්‍රතිශෝදිත කාර්තුමය වාර්තා (ආකෘතිය 49)				
නිර්ණය ආකෘති	කාර්තුව අවසන් වී දින 45 ක් ඇතුලත කාර්තු වශයෙන්	4 වන කාර්තුව (19) - පෙබරවාරි 15 වන දින	14.02.2020	
		1 වන කාර්තුව (20) - මැයි 15 වන දින	15.05.2020	
		2 වන කාර්තුව (20) - අගෝස්තු 15 වන දින	14.08.2020	
		3 වන කාර්තුව (20) - නොවැම්බර් 15 වන දින	14.11.2020	
අවදානම් පාදක ප්‍රාග්ධනය (ආකෘති) - සමාන්‍ය	කාර්තුව අවසන් වී දින 45 ක් ඇතුලත කාර්තු වශයෙන්	4 වන කාර්තුව (19) - පෙබරවාරි 15 වන දින	14.02.2020	
		1 වන කාර්තුව (20) - මැයි 15 වන දින	15.05.2020	
		2 වන කාර්තුව (20) - අගෝස්තු 15 වන දින	14.08.2020	
		3 වන කාර්තුව (20) - නොවැම්බර් 15 වන දින	14.11.2020	
අවදානම් පාදක ප්‍රාග්ධනය (ආකෘති) - ජීවිත	කාර්තුව අවසන් වී දින 45 ක් ඇතුලත කාර්තු වශයෙන්	4 වන කාර්තුව (19) - පෙබරවාරි 15 වන දින	14.02.2020	
		1 වන කාර්තුව (20) - මැයි 15 වන දින	15.05.2020	
		2 වන කාර්තුව (20) - අගෝස්තු 15 වන දින	14.08.2020	
		3 වන කාර්තුව (20) - නොවැම්බර් 15 වන දින	14.11.2020	
ශේෂ පත්‍ර සහ ලාභ ආලාභ ගිණුම (ආකෘති)	කාර්තුව අවසන් වී දින 45 ක් ඇතුලත කාර්තු වශයෙන්	4 වන කාර්තුව (19) - පෙබරවාරි 15 වන දින	14.02.2020	
		1 වන කාර්තුව (20) - මැයි 15 වන දින	15.05.2020	
		2 වන කාර්තුව (20) - අගෝස්තු 15 වන දින	14.08.2020	
		3 වන කාර්තුව (20) - නොවැම්බර් 15 වන දින	14.11.2020	
ශ්‍රී ලංකා රක්ෂන නියාමන කෝමිසන් සභාවේ අංක 12 චක්‍ර ලේඛය යටතේ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ ප්‍රධාන නිලධාරියා විසින් සිදු කරනු ලබන කාර්තුමය සහතික කිරීම් ((අ) සහතික කිරීම)	කාර්තුව අවසන් වී දින 45 ක් ඇතුලත කාර්තු වශයෙන්	4 වන කාර්තුව (19) - පෙබරවාරි 15 වන දින	14.02.2020	
		1 වන කාර්තුව (20) - මැයි 15 වන දින	15.05.2020	
		2 වන කාර්තුව (20) - අගෝස්තු 15 වන දින	14.08.2020	
		3 වන කාර්තුව (20) - නොවැම්බර් 15 වන දින	14.11.2020	
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසන් සභාවේ අංක 12 චක්‍ර ලේඛය යටතේ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ ප්‍රධාන නිලධාරියා විසින් සිදු කරනු ලබන කාර්තුමය සහතික කිරීම් (ආ) සහතික කිරීම	කාර්තුව අවසන් වී දින 45 ක් ඇතුලත කාර්තු වශයෙන්	4 වන කාර්තුව (19) - පෙබරවාරි 15 වන දින	14.02.2020	
		1 වන කාර්තුව (20) - මැයි 15 වන දින	15.05.2020	
		2 වන කාර්තුව (20) - අගෝස්තු 15 වන දින	14.08.2020	
		3 වන කාර්තුව (20) - නොවැම්බර් 15 වන දින	14.11.2020	
වැඩිදුර තොරතුරු / වැඩිදුර වාර්තා				
1. ප්‍රතිරක්ෂණ ගිවිසුම් ආවරණ සටහන්	වාර්ෂිකව	පසුව එන වසරේ මාර්තු 15 වන දිනට පෙර	13.03.2020	
2. ප්‍රතිරක්ෂණ අවදානම මාරු කිරීමේ වැඩසටහන (2020 වසර)	වාර්ෂිකව	2020/01/31 දින හෝ ඊට පෙර	31.01.2020	
3. පරිවේෂ වර්ත්‍ය සැලසුම (Facultative Arrangement)	කාර්තුමය	4 වන කාර්තුව (19) - පෙබරවාරි 15 වන දින	14.02.2020	
		1 වන කාර්තුව (20) - මැයි 15 වන දින	15.05.2020	
		2 වන කාර්තුව (20) - අගෝස්තු 15 වන දින	14.08.2020	
		3 වන කාර්තුව (20) - නොවැම්බර් 15 වන දින	14.11.2020	

අනුකූලතා වාර්තාව

නියාමන/ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය	වාර්ථාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ සංඛ්‍යාතය	ඉදිරිපත් කිරීම/ ගෙවීම කලයුතු නියමිත දිනය	සිදු කළ දිනය	අනුකූලතාව සහ විශේෂ කරුණු
2000 අංක 43 දරණ රක්ෂණ කාර්මාන්ත නියාමන පනත යටතේ වාර්ෂික ගොනු කිරීම				
අවදානම් පාදක ප්‍රාග්ධනය (ආකෘති) - සමාන්‍ය	වාර්ෂිකව	2019 වසර අවසානයේ - 2020 අප්‍රේල් 30	31.05.2020	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අවසන් දිනය 2020/05/31 දින දක්වා දීර්ඝ කර ඇත.
අවදානම් පාදක ප්‍රාග්ධනය (ආකෘති) - ජීවිත	වාර්ෂිකව	2019 වසර අවසානයේ - 2020 අප්‍රේල් 30	31.05.2020	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අවසන් දිනය 2020/05/31 දින දක්වා දීර්ඝ කර ඇත.
තීරණය කිරීමේ ආකෘති				
1. දිගුකාලීන රක්ෂණ අරමුදලේ ආයතනික ණය	වාර්ෂිකව	2019 වසර අවසානයේ - 2020 අප්‍රේල් 30	31.05.2020	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අවසන් දිනය 2020/05/31 දින දක්වා දීර්ඝ කර ඇත
2. BR-IN ආකෘතිය - ආයෝජන විසුරුවාලීම (AR) - දිගු කාලීන රක්ෂණ අරමුදල				
3. BR-IN ආකෘතිය - ආයෝජන විසුරුවාලීම (AR) - තාක්ෂණික සංචිතය				
4. තාක්ෂණික සංචිතයේ ආයතනික ණය				
ශේෂ පත්‍ර සහ ලාභ ආලාභ ගිණුම (ආකෘති)	වාර්ෂිකව	2019 වසර අවසානයේ - 2020 අප්‍රේල් 30	31.05.2020	
ආයු ගණක වාර්තාව සහ සාරාංශය	වාර්ෂිකව	2019 වසර අවසානයේ - 2020 අප්‍රේල් 30	31.05.2020	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අවසන් දිනය 2020/05/31 දින දක්වා දීර්ඝ කර ඇත.
වෙනත් ආකෘති				
1. අවදානම් තක්සේරු වාර්තාව	වාර්ෂිකව	2019 වසර අවසානයේ - 2020 අප්‍රේල් 30	30.04.2020	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අවසන් දිනය 2020/05/31 දින දක්වා දීර්ඝ කර ඇත.
2. අධ්‍යක්ෂක වරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය	වාර්ෂිකව	2019 වසර අවසානයේ - 2020 අප්‍රේල් 30	31.05.2020	
3. දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය- රක්ෂකයා විසින් පනතේ ප්‍රතිපාදනයන්ට අනුකූලතාව දැක්වීම හා සම්බන්ධ සහතික කිරීම්	වාර්ෂිකව	2019 වසර අවසානයේ - 2020 අප්‍රේල් 30	31.05.2020	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අවසන් දිනය 2020/05/31 දින දක්වා දීර්ඝ කර ඇත.
4. සමාන්‍ය රක්ෂන ව්‍යාපාරය- රක්ෂකයා විසින් පනතේ ප්‍රතිපාදනයන්ට අනුකූලතාව දැක්වීම හා සම්බන්ධ සහතික කිරීම්	වාර්ෂිකව	2019 වසර අවසානයේ - 2020 අප්‍රේල් 30	31.05.2020	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අවසන් දිනය 2020/05/31 දින දක්වා දීර්ඝ කර ඇත

නියාමන/ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය	වාර්ථාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ සංඛ්‍යාතය	ඉදිරිපත් කිරීම/ ගෙවීම කලයුතු නියමිත දිනය	සිදු කළ දිනය	අනුකූලතාව සහ විශේෂ කරුණු
5. සමාගමේ වාර්ෂික වාර්තාව	වාර්ෂිකව	2019 වසර අවසානයේ - 2020 අප්‍රේල් 30	29.06.2020	සමූහයේ විගණනය අවසන් කිරීමේදී ඇතිවූ ප්‍රමාදය හේතු කොට ගෙන
6. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ චක්‍ර ලේඛ අංක 29 මත සත්‍ය අනාවරණය කර ගැනීම පිළිබඳ විගණක වරුන්ගේ වාර්තාව	වාර්ෂිකව	2019 වසර අවසානයේ - 2020 අප්‍රේල් 30	29.06.2020	සමූහයේ විගණනය අවසන් කිරීමේදී ඇතිවූ ප්‍රමාදය හේතු කොට ගෙන
7. කළමණාකාරිත්ව ලිපිය	වාර්ෂිකව	2019 වසර අවසානයේ - 2020 අප්‍රේල් 30	02.09.2020	
8. අනුකූලතා සහතික කිරීම (අ) - දිර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය අනුකූලතා සහතික කිරීම (අ) - සමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය	වාර්ෂිකව	2019 වසර අවසානයේ - 2020 අප්‍රේල් 30	31.05.2020	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අවසන් දිනය 2020/05/31 දින දක්වා දිර්ඝ කර ඇත.
9. අනුකූලතා සහතික කිරීම (ආ)	වාර්ෂිකව	2019 වසර අවසානයේ - 2020 අප්‍රේල් 30	31.05.2020	
ගෙවීම්				
සෙස් බද්ධී ශුද්ධ වාරිකයෙන් ජීවිත 0.2% සහ සමාන්‍ය 0.4% වශයෙන්	කාර්තු වශයෙන්	4 වන කාර්තුව (19) - ජනවාරි 15 වන දින	31.01.2020	
		1 වන කාර්තුව (20) - අප්‍රේල් 30 වන දින	30.04.2020	
		2 වන කාර්තුව (20) - ජූලි 31 වන දින	31.07.2020	
		3 වන කාර්තුව (20) - ඔක්තෝබර් 31 වන දින	30.10.2020	
වාර්ෂික ගාස්තු	වාර්ෂිකව	ගිණුම් විගණනය කිරීමෙන් එක් මසකට පසුව හෝ වළඹෙන වසරේ ජූලි මස 31 වන දිනට පෙර	09.07.2020 -ජීවිත	
		ගිණුම් විගණනය කිරීමෙන් එක් මසකට පසුව හෝ වළඹෙන වසරේ ජූලි මස 31 වන දිනට පෙර	09.07.2020 -සාමාන්‍ය	
දේශීය අදායම් දෙපාර්තමේන්තුව				
වාර්තා				
වැට් බදු වාර්තා	කාර්තුමය	4 වන කාර්තුව (19) - ජනවාරි 31 වන දින	31.01.2020	
		1 වන කාර්තුව (20) - 2020 දෙසැම්බර් 31 වන දින	28.12.2020	
		2 වන කාර්තුව (20) - ජූලි 31 වන දින	31.07.2020	
		3 වන කාර්තුව (20) - ඔක්තෝබර් 31 වන දින	31.10.2020	
මුද්දර ගාස්තු	කාර්තුමය	4 වන කාර්තුව (19) - ජනවාරි 15 වන දින	14.01.2020	
		1 වන කාර්තුව (20) - 2020 අප්‍රේල් 15 වන දින	15.07.2020	කොවිඩ්-19 හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2020/07/15 දින දක්වා කාලය දීර්ඝ කරන ලදී.
		2 වන කාර්තුව (20) - ජූලි 15 වන දින	15.07.2020	
		3 වන කාර්තුව (20) - ඔක්තෝබර් 15 වන දින	15.10.2020	
ආර්ථික සේවා ගාස්තුව	වාර්ෂිකව	2019-2020 අප්‍රේල් 20	20.04.2020	

අනුකූලතා වාර්තාව

නියාමන/ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය	වාර්තාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ සංඛ්‍යාතය	ඉදිරිපත් කිරීම/ ගෙවීම කලයුතු නියමිත දිනය	සිදු කළ දිනය	අනුකූලතාව සහ විශේෂ කරුණු
උපයන විට ගෙවීමේ බදු වාර්තා	වාර්ෂිකව	2019 - 2019 අප්‍රේල් 30	30.04.2020	
බෝග රක්ෂණ බද්ද	කාර්තුමය	3 වන කාර්තුව (19) - ජනවාරි 30 වන දින	30.01.2020	
		4 වන කාර්තුව (19) - අප්‍රේල් 30 වන දින	30.04.2020	
		1 වන කාර්තුව (19) - ජූලි 30 වන දින	30.07.2020	
		අවසානය(19) - සැප්තැම්බර් 30 වන දින	09.10.2020	
		2 වන කාර්තුව (19) - ඔක්තෝබර් 30 වන දින	29.10.2020	
ගෙවීම්				
අඟය එකතු කළ බදු	මාසිකව	ඵලඹෙන මාසයේ 20 වනදින	නියමිත දිනට ගෙවන ලදී	
උපයන විට ගෙවීමේ බදු	මාසිකව	ඵලඹෙන මාසයේ 15 වනදින	නියමිත දිනට ගෙවන ලදී	
ආර්ථික සේවා ගාස්තුව	කාර්තුමය	3 වන කාර්තුව (19) - ජනවාරි 20 වන දින	20.01.2020	
		01.01.2020 දින සිට අහෝසි කරන ලද	-	
		01.01.2020 දින සිට අහෝසි කරන ලද	-	
		01.01.2020 දින සිට අහෝසි කරන ලද	-	
ආදායම් බදු	කාර්තුමය	පෙබරවාරි 15 හෝ ඊට පෙර	14.02.2020	
		මැයි 15 හෝ ඊට පෙර	15.05.2020	
		අගෝස්තු 15 හෝ ඊට පෙර	14.08.2020	
		සැප්තැම්බර් 30 හෝ ඊට පෙර	30.09.2020	
		නොවැම්බර් 15 හෝ ඊට පෙර	13.11.2020	
මුද්දර බද්ද	කාර්තුමය	4 වන කාර්තුව (19) - ජනවාරි 15 වන දින	14.01.2020	
		1 වන කාර්තුව (20) - අප්‍රේල් 15 වන දින	30.04.2020	කොවිඩ්-19 හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2020.04.03 දින දක්වා කාලය දීර්ඝ කරන ලදී
		2 වන කාර්තුව (20) - ජූලි 15 වන දින	15.07.2020	
		3 වන කාර්තුව (20) - ඔක්තෝබර් 15 වන දින	15.10.2020	
බෝග රක්ෂණ බද්ද	කාර්තුමය	3 වන කාර්තුව (19) - ජනවාරි 30 වන දින	30.01.2020	
		4 වන කාර්තුව (19) - අප්‍රේල් 30 වන දින	30.04.2020	
		1 වන කාර්තුව (20) - ජූලි 30 වන දින	30.07.2020	
		අවසන් (20) - සැප්තැම්බර් 30 වන දින	09.10.2020	
		3 වන කාර්තුව (20) - ඔක්තෝබර් 30 වන දින	29.10.2020	

නියාමන/ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය	වාර්ථාව/ගෙවීම ඉදිරිපත් කිරීමේ සංඛ්‍යාතය	ඉදිරිපත් කිරීම/ ගෙවීම කලයුතු නියමිත දිනය	සිදු කළ දිනය	අනුකූලතාව සහ විශේෂ කරුණු
රඳවා ගැනීමේ බද්ද	මාසික	අහෝසි කරන ලද අගැගගෙ 01.01.2020		
ශ්‍රී ලංකා මහ බැංකුව				
සේවක අර්ථසාධක අරමුදල් වාර්තා	වසරකට දෙවරක්	ජනවාරි 31 වන දින සහ ජුලි 31 වන දින	31.01.2020	
			31.07.2020	
මුදල් විශුද්ධිකරණ වාර්තා				
1. මුදල් ගනුදෙනු වාර්තාව	මාසිකව දින දෙකක් ඇතුළත	ඊළඟ මාසයේ 15 වන දින දින දෙකක් තුළ	නියමිත දිනට ඉදිරිපත් කරන ලදී	
2. සැක කටයුතු ගනුදෙනු වාර්තා	මාසිකව		-	
සේවක අර්ථසාදක අරමුදලේ දායක මුදල්		ඊළඟ මාසයේ අවසාන වැඩ කරන දිනට දිනකට පෙර	නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී	
සේවා නියුක්තිකයන්ගේ වාර අරමුදල් මණ්ඩලය				
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් වාර්තා	වසරකට දෙවරක්	ජනවාරි 31සහ ජුලි 31	31.01.2020 31.07.2020	
සේවක අර්ථසාදක අරමුදලේ දායක මුදල	මාසිකව	ඊළඟ මාසයේ අවසාන වැඩ කරන දිනට දිනකට පෙර	නියමිත දිනට ක්‍රියාත්මක කරන ලදී	
මෝටර් රථ වාහන රෙජිස්ට්‍රාර්				
ගෙවීම - සුඛෝපභෝගි හා අර්ධ සුඛෝපභෝගි බද්ද	මාසිකව	ඊළඟ මාසයේ 15 වනදා	නියමිත දිනට ගෙවනු ලදී	
සමාගම් රෙජිස්ට්‍රාර්				
මූල්‍ය ප්‍රකාශන ලියා පදිංචි කිරීම	වාර්ෂිකව	සමාගමේ මූල්‍ය ප්‍රකාශන දින 20 ක් ඇතුලත	08.07.2020	
ප්‍රවාහන අමාත්‍යාංශය				
ගෙවීම - මාර්ග ආරක්ෂක අරමුදල	මාසිකව	ඊළඟෙන මාසයේ 15 වන දිනට	නියමිත දිනට ගෙවනු ලදී	
මහනගරසභා / නගරසභා				
ගෙවීම - ගාස්තු සහ බදු	වාර්ෂිකව	ප්‍රවර්තන වර්ෂයේ ජනවාරි 31 වන දිනට පෙර (ප්‍රතිධානය සදහා)	31.01.2020	
ජාතික රක්ෂණ භාර අරමුදල				
ගෙවීම් - SRCC සහ ත්‍රස්තවාදී අරමුදල	මාසිකව	මාසය අවසන් වී දින 45 ක් ඇතුලත	නියමිත දිනට ගෙවනු ලදී	
කම්කරු වන්දි කොමසාරිස්				
බලපත්‍රය අලුත් කිරීම- කම්කරු වන්දි රක්ෂණ	වාර්ෂිකව	මැයි 30 වන දිනට පෙර	07.07.2020	කොවිඩ්-19 තත්වය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වියි

අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය

හොඳ අභ්‍යන්තර පාලන පද්ධතියක් පවතින බව සහතික කිරීමට අභ්‍යන්තර පාලන ක්‍රම සහ අවදානම් කළමනාකරණය කිරීම සඳහා මණ්ඩලය විසින් අවසාන අධීක්ෂණය සහ මග පෙන්වීම සපයයි. පාර්ශවකරුවන්ගේ අභිලාෂයන් ආරක්ෂා කිරීමේදී ඵලදායීතාවය සහතික කිරීම සඳහා මණ්ඩලය අවදානම් සහ පාලන යන ක්ෂේත්‍රවල වර්ධනයන් පිළිබඳව අවධානයෙන් සිටී.

මනා අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ භාවිතයන් සමාගමේ සමස්ත අවදානම් කළමනාකරණ රාමුවේ අනිවාර්ය අංගයක් බව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. අභ්‍යන්තර පාලන ක්‍රමය සැලසුම් කර ඇත්තේ අසාර්ථක වීමේ අවදානම තුරන් කිරීමට වඩා අපේක්ෂිත ප්‍රතිඵල සහ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස අවදානම් සාධාරණ මට්ටමකට කළමනාකරණය කිරීමට ය. මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ප්‍රධාන අධ්‍යක්ෂක මණ්ඩල අනු කමිටු පහක් සහ මනාව නිර්වචනය කරන ලද ආයතනික ව්‍යුහයක් පිහිටුවා ඇති අතර එමඟින් වගවීම සහ බලය පවරන ලද මාර්ග පැහැදිලිව දක්වා ඇත. මණ්ඩල අනු කමිටු පහ නම්; විගණන හා අනුකූලතා කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව, මානව සම්පත් කමිටුව, ආයෝජන කමිටුව සහ උපායමාර්ගික සමාලෝචන කමිටුව වේ. ප්‍රධාන කමිටු පාලනය කරනු ලබන්නේ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රඥප්ති මඟින් වන අතර ඒවා යහපාලනයේ මූලික මූලධර්මවලට අනුකූලව ක්‍රියා කරයි.

මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන පද්ධති, අවදානම් කළමනාකරණ පද්ධති සහ අභ්‍යන්තර හා බාහිර විගණන කාර්යයන් වැනි අංශවල අධීක්ෂණ වගකීම් ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම සඳහා විගණන හා අනුකූලතා කමිටුව උපායමාර්ගික සහාය සපයයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සමඟ මෙහෙයුම් අනුකූල වීම සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය සත්‍යාපනය කරන අතර ඕනෑම අනනුකූලතාවයක් සම්බන්ධයෙන් සැලකිය යුතු සොයාගැනීම් විශේෂ කොට දක්වයි. සියළුම වීකක සහ ශාඛා පිළිබඳව විගණන සිදු කරනු ලබන අතර, මෙම වීකකවල සහ ශාඛා වල මෙහෙයුම් හා කළමනාකරණ ක්‍රියාකාරකම් පිළිබඳ ස්වාධීන හා විෂය නිශ්‍රිත වාර්තාවක් සැපයීම සඳහා තක්සේරු කරන ලද අවදානම් මට්ටම අනුව වාර ගණන තීරණය වේ. වාර්ෂික විගණන සැලැස්ම විගණන කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කරනු ලබන අතර විගණනයේ සොයා ගැනීම් වරින් වර රැස්වීම්වලදී සමාලෝචනය සඳහා විගණන කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ. ශාඛා විගණනයේ සොයා ගැනීම් සාකච්ඡා කිරීම සඳහා විශේෂ අනුකමිටුවක් පිහිටුවා ඇත.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සංවිධානයේ පාලනයට අත්‍යවශ්‍ය වේ. අභ්‍යන්තර පාලනයට අදාළ විගණන හා අනුකූලතා කමිටුව වෙහි ප්‍රධාන වගකීම මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයයි. ඊට අමතරව, ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම සඳහා කළමනාකරණයට වගකිව යුතු අතර, මෙම පාලනයන් අධීක්ෂණය කිරීම සහ සමස්තයක් ලෙස පද්ධතියේ ඵලදායීතාවය සමාලෝචනය කිරීම විගණන හා අනුකූලතා කමිටුවෙහි වගකීම වේ. අභ්‍යන්තර පාලන පද්ධතියේ ක්‍රියාකාරිත්වය තක්සේරු කරනු ලබන්නේ අබණ්ඩ අධීක්ෂණ ක්‍රියාකාරකම්, අභ්‍යන්තර විගණනය වැනි වෙනමම ඇගයීම් සහ හඳුනාගත් පාලනයේ යෝග්‍යතාවය හා ඵලදායීතාවය අධීක්ෂණය කිරීමේ ක්‍රියා පටිපාටි සංවිධානයේ සාමාන්‍ය මෙහෙයුම් තුළ අන්තර්ගත වේ.

අනුකූලතා අවදානම් කළමනාකරණය යටතේ වඩාත් හොඳින් විස්තර කර ඇති පරිදි, ආයතනයේ සමස්ත අවදානම් කළමනාකරණ උපාය මාර්ගය හා ඒකාත්මික වූ ශක්තිමත් අනුකූලතා කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වේ. අනුකූලතා වැඩසටහන 2007 අංක 07 දරණ සමාගම් පනත මඟින් පාලනය වන සීමිත වගකීම් සහිත සමාගමක් ලෙස කටයුතු කිරීම සඳහා වන නීතිමය අවශ්‍යතා සපුරන අතර, 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන පනත (සංශෝධිත) යටතේ ලියාපදිංචි කරන ලද රක්ෂණ සමාගමක් වශයෙන් සහ රජයේ සීමිත වගකීම් සමාගම් සඳහා වූ නෛතික රාමුවට අනුකූල වන පරිදි මාර්ගෝපදේශ සපයයි. මෙහෙයුම් රාමුවේ අඛණ්ඩතාව සහ ස්ථායිතාව මත ඇති විය හැකි ප්‍රතිවිපාක අවම කිරීම සඳහා, අප විසින් ශක්තිමත් මුදල් විශුද්ධිකරණ රාමුවක් ක්‍රියාත්මක කර ඇති අතර එමඟින් නියම කරන ලද දත්ත සමුදාය සමඟ ගනුදෙනුකරුවන් පරීක්ෂා කිරීම, ගනුදෙනුකරුවන්ගේ අනවරත බව, ඉ-ඉගෙනුම් මොඩියුලය භාවිතයෙන් සේවකයින්ගේ කාර්ය සාධනය ඇගයීම, වාර්ෂික අභ්‍යන්තර විගණනය සහ AML අවදානම් තක්සේරු කිරීම සිදු කෙරේ.

සමාගම විසින් අවදානම් කළමනාකරණ කාර්යයන් වෙනම අවදානම් කමිටුවකට පවරා ඇති අතර එමඟින් සමාගමේ වඩාත්ම තීරණාත්මක අවදානම් කළමනාකරණ හැකියාවන් කෙරෙහි අවධානය යොමු කෙරේ. සමාගම විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමාගමේ උපාය මාර්ග හා අවදානම් රුචියට අනුකූල වන අතර අවදානම් දැනුම් දිය හැකි පුළුල් ව්‍යවසාය සංස්කෘතියක් පැවතීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් සෑහීමකට පත්වේ. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත් කරන ලද අනු කමිටු - අවදානම් කළමනාකරණ කමිටුව සහ ආයෝජන කමිටුව සහ විධායක කමිටුව, විගණන පසු විපරම් කමිටුව සහ නිෂ්පාදන සංවර්ධන කමිටුව යනාදිය - අවදානම් දෙපාර්තමේන්තුව නියෝජනය කරනු ලබයි. ඒ අනුව, ERM අවදානම් දෘෂ්ටි කෝණයකින් ස්වාධීන මතයක් සපයන අතර එමඟින් අවදානම් බලපෑම සැලකිල්ලට ගනිමින් කළමනාකාරිත්වයට සහ මණ්ඩලයට අවබෝධාත්මක තීරණ ගැනීමට හැකියාව ලැබේ.



ජගත් වැල්ලවත්ත
සභාපති



කේ. ඒ. විමලෙන්තිරරාජා
සභාපති-විගණන හා අනුකූලතා කමිටුව
2021 ජූනි 03 වැනිදා

මූල්‍යමය තොරතුරු

116 - සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව
120 - අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පිළිබඳ වාර්තාව
121 - ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම පිළිබඳ වාර්තාව
122 - රක්ෂකයාගේ ආයුගණක සහතිකය
123 - වගකීම් ප්‍රමාණාත්මතාවයේ පරීක්ෂණය
124 - දරණ ලද වූහෙත් ප්‍රමාණවත්ව වාර්තා නොවූ හිමිකම් පිළිබඳ සහතිකය
125 - ස්වාධීන විගණකවරයාගේ වාර්තාව
130 - මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
132 - ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය
134 - හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
140 - මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය
142 - බණ්ඩමය සමාලෝචනය: ආදායම් ප්‍රකාශය
144 - බණ්ඩමය සමාලෝචනය - මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
146 - මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්



සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සාමාන්‍ය තොරතුරු
සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, 2020 දෙසැම්බර් 31 න් අවසන්වූ වර්ෂය සඳහා ඔවුන්ගේ වාර්ෂික වාර්තාව,සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ (සංශෝධිත), 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනතේ (සංශෝධිත), 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ හා එහි සංශෝධන සහ සමාගම් පාලනය පිළිබඳ යහ පිළිවෙත්වල අවශ්‍යතාවයන් මූල්‍ය ප්‍රකාශන වලින් සපුරා ඇති බවට විගණකාධිපතිගේ වාර්තාව සමඟ සිය සමාපිකයින්ට සතුටින් ඉදිරිපත් කර සිටියි.

2020 දෙසැම්බර් 31 දිනට 99.97% ක කොටස් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම් වෙත පවරනු ලැබ ඇත.

සීමා සහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් පුද්ගලික සමාගම, සීමාසහිත කැනොවින් හොටෙල් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම සහ සීමාසහිත කළමනාකරණ සේවා රක්ෂණ පුද්ගලික සමාගම යන සමාගම් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට පූර්ණ අයිතිය ඇති සමාග මේ පරිපාලිත සමාගම් වෙයි. සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමේ කොටස්වලින් 99.94% ක් ද සීමාසහිත ලංකා හොස්පිටල් පුද්ගලික සමාග මේ කොටස් වලින් 51.34% ක් ද ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතු වෙයි. ඊට අමතරව, සීමාසහිත කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම් කොටස් වලින් 45.95% ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට හිමිය.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හා, ප්‍රධාන කාර්යාලය කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 21, රක්ෂණ මන්දිරයෙහි පිහිටා ඇත.

මෙම වාර්තාව 2021 මැයි මස 19 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

සමාගමේ සහ සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්
සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ ශ්‍රී ලංකාව තුළ පීවිත රක්ෂණ සහ පීවිත නොවන රක්ෂණ (සාමාන්‍ය රක්ෂණ) ගනුදෙනු කිරීමයි. සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල විශාල වෙනසක්කම් සිදුකර නැත.

සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් පුද්ගලික සමාගම ද්‍රව පෙට්‍රෝලියම් (LPG) ගබඩා කිරීමේ නිරතවී සිටින අතර සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් ආනයනය කිරීම සහ ගෘහමය වශයෙන්, වාණිජ වශයෙන් සහ තොග වශයෙන් බෙදා හැරීම සිදු කරයි. සීමාසහිත ලංකා හොස්පිටල් පුද්ගලික සමාගම සෞඛ්‍ය ආරක්ෂණ සේවා ලබා දෙන අතර සීමාසහිත කළමනාකරණ සේවා රක්ෂණ පුද්ගලික සමාගම පඩිපත් කළමනාකරණ සේවා ලබාදෙයි. සීමාසහිත කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමේ මූලික කාර්ය වන්නේ හෝටල් ව්‍යාපෘති කළමනාකරණය කිරීමයි. සීමාසහිත කැනොවින් හොටෙල් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම මූලික වශයෙන් දකුණු අධිවේගි මාර්ගයේ වෙළඳ කුටිවල අයිතිය ලබාගෙන ඒවායෙහි කළමනාකරණය සිදුකරයි.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම
සමාගමේ සහ සමූහයේ කටයුතුවල සත්‍ය සහ සාධාරණ පිළිබිඹුවක් නිරූපනය වන පරිදි සමාග මේ සහ සමුහයේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වෙයි. ගිණුම්කරණ ප්‍රතිපත්ති ව්‍යාප හෝ දෝෂ සහගත ලෙස තෝරා ගැනීම හේතුවෙන් හෝ එසේ නොමැතිව හෝ සැලකිය හැකි සාවද්‍ය ප්‍රකාශවලින් තොරව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අභ්‍යන්තර පාලන පවත්වාගෙන යාම සහ අවස්ථාවන්ට අනුව සාධාරණ ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්වලට ඇතුළත් වෙයි.

වාර්ෂික වාර්තාවේ සඳහන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීරණ ආදායම්, සාමාන්‍ය කොටස් ප්‍රමාණයේ වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ එහි සටහන්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනත (සංශෝධිත) සහ 2007 අංක 07 දරණ සමාගම් පනතට (සංශෝධිත) අනුකූලව සකස්කර තිබෙන බව අධ්‍යක්ෂ වරුන්ගේ අදහසයි.

මූල්‍ය ප්‍රකාශ හා විගණකගේ වාර්තාව
2020.12.31 න් අවසන්වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ,ශ්‍රී ලංකා චරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මත පදනම්ව සකස් කරනු ලබයි. ප්‍රධාන මූල්‍ය නිලධාරි සහ අධ්‍යක්ෂකවරුන් විසින් අත්සන් තබන ලද සමාගමේ සහ සමුහයේ මූල්‍ය ප්‍රකාශයන් වාර්ෂික වාර්තාවේ දක්වා ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ සහ සටහන් මගින් 2020 දෙසැම්බර් 31 වන දිනට සමාග මේ මූල්‍ය තත්වය සහ එම දිනයෙන් අවසන් වන වසර සඳහා එහි කාර්ය සාධනයන් පිලිබඳ සත්‍ය හා සධාරණ දැක්මක් ඉදිරිපත් කරනු ලබයි.

විගණකගේ වාර්තාව
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා බාහිර විගනක වශයෙන් පත්කරනු ලැබ ඇත. 2019.12.31 න් අවසන්වූ වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රකාශ වාර්ෂික විගණනයේදි සුදුසුකම් ලත් විගණකවරයෙකු ලෙස විගණකාධිපතිට සහයවීම සඳහාශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍ර සමාජවාදී ජනරජයේ ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(4) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති විසින් වරලත් ගණකාධිකාරී සමාගමක් වන Messrs BDO Partners පත්කරනු ලැබ තිබේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්තාවේ එකාබද්ධ කොටසක් වන මූල්‍ය ප්‍රකාශ පිලිබඳ විගණකගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

විගණන සහ අනෙකුත් අදාළ සේවා ගාස්තු
විගණන සහ අනෙකුත් අදාළ සේවා සඳහා ගෙවන ලද ප්‍රමාණ පහත දැක්වෙයි. මෙම ඡේදයෙන් අනාවරණය කෙරෙන කරුණු වලට වඩා විගණකවරුන්ට වෙනත් කිසිදු සුහද සම්බන්ධතාවයක් නොමැති බව අධ්‍යක්ෂකවරු දැන සිටිති.

	2020 රු. '000	2019 රු. '000
ව්‍යවස්ථාපිත විගණන ගාස්තු	**5,602**	7,771
විගණන නොවන සේවා	**-**	13,390

ගිණුම්කරණ ප්‍රතිපත්ති
මෙම මූල්‍ය ප්‍රකාශ සකස්කිරීම සඳහා යොදාගත් සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වාර්ෂික වාර්තාවේ සඳහන් කර ඇත.

අවදානම කාලමණාකරනය සහ අභ්‍යන්තර පාලන පද්ධති
සමාගමේ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් සමාගම් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම හා පාලනය කිරීම සිදු කරයි.

මෙම වාර්තාවේ අවදානම් කළමනාකරණ පරිච්ඡේදයේ අවදානම් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සාකච්ඡා කරනු ලබයි. සමාගම මනා අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලැබ තිබෙන අතර ඒවැනි ප්‍රතිපත්ති හා ක්‍රියාපරිපාටි සමාගමේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබයි. විගණන හා අනුකූලතා කමිටුව විසින් සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රියාකාරකම් පාලනය කරනු ලබයි.

සමාලෝචිත වර්ෂයේ දී අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම්වල සඵලත්වය ගැන අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්ව සිටියි.

අබණ්ඩ පැවතුම
සමාගමේ සහ සමූහයේ ඉදිරි වර්ෂයේ මෙහෙයුම් කටයුතු අබණ්ඩව සිදු කිරීම සඳහා සමාගම සහ සමූහය සතුව ප්‍රමාණවත් සම්පත් තිබෙන බව, මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය, මුදල් ප්‍රවාහය සහ නියාමක හා ව්‍යුහාත්මක සාධක සැලකිල්ලට ගනිමින් සමාගම අපේක්ෂා කරයි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී අබණ්ඩ පැවතුම් පදනම යොදා ගනී.

කොවිඩ්-19 වසංගතයට සමාගමේ ප්‍රතිචාරය
කොවිඩ්-19 වසංගතය ව්‍යාපාරයට සහ ලොව පුරා ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. ආර්ථික පුනර්ජීවය ලැබීමේදී රක්ෂණ සමාගම් අභියෝග රැසකට මුහුණ දෙන නමුත් එතුළ මධ්‍යම හා දිගු කාලීන නව අවස්ථා රාශියක් ද උදාවනු ඇත. සාමාන්‍ය රක්ෂණකරුවන්ට ඇති බලපෑම රක්ෂකයන් විසින් සපයනු ලබන නිෂ්පාදන සහ ආවරණ වර්ග මත පදනම්ව වෙනස් වේ. වසංගතය විසින් ගමනාගමනය වැනි ඇතැම් ව්‍යාපාරික අංශ වෙත බලපා ඇති අතර, ඉන් සිදුවූ අලාභ සැලකිය යුතු කරුණකි. මෝටර් සහ නිවාස වැනි වෙනත් ව්‍යාපාර සාපේක්ෂව ස්ථාවරව පවතී. ජීවිත රක්ෂණ ගත් කල, නව ව්‍යාපාර පරිමාවන්ගේ අඩු බවට අමතරව, ගෝලීය වශයෙන් වෙළඳපල වටිනාකම් සහ පොලී අනුපාතවල සැලකිය යුතු අඩුවීමක් ද දක්නට ලැබේ.

කොවිඩ්-19 වසංගත කාල පරිච්ඡේදය තුළදී අපි අපගේ ව්‍යාපාර කටයුතු උපරිම මට්ටමට ගෙන යමින් සිටින අතර, නිවසේ සිට වැඩ කිරීම සහ සමාගමට භෞතිකව වාර්තා කිරීම යන දෙකම අනුගමනය කරමින් සෞඛ්‍ය මාර්ගෝපදේශ වල ඉහළම ප්‍රමිතීන්ට අනුකූලව අපගේ ගනුදෙනුකරුවන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කරන්නෙමු. ව්‍යාපාර අරමුණු කාලානුරූපව සාක්ෂාත් කිරීම සඳහා සුමට මෙහෙයුම් සහතික කරමින් අපි ඩිජිටල්කරණයට යොමුව ඇත්තෙමු.

පිරි වැටුප/ දළ ලිඛිත රක්ෂණ වාරික (GWP)
සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මුලු පිරිවැටුප රු. මි. 52,614ක් වූ අතර 2019 දී එය රු.මි. 48, 609ක් විය. දළ ලේඛනගත රක්ෂණ රු.මි.39,421 සමන්විත වන්නේ මුළු ලේඛනගත ජීවිත රක්ෂණ වාරිකය වූ රු.මි.19,258 න් සහ ජීවිත නොවන රක්ෂණ වල දළ ලිඛිත රක්ෂණ වාරිකය වූ රු.මි. 20,163 නි. 2019 වසරේ දළ ලේඛනගත රක්ෂණ රු.මි.33,794 සමන්විත වන්නේ මුළු ලේඛනගත ජීවිත රක්ෂණ වාරිකය වූ රු.මි.14,820 න් සහ ජීවිත නොවන රක්ෂණ වල දළ ලිඛිත රක්ෂණ වාරිකය වූ රු.මි. 18,974 නි. එයින් සමාගම අත්කරගත් මුළු ලේඛනගතරක්ෂණ වාරිකයේ සවිස්තර විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශවල සඳහන් කර ඇත.

මූල්‍ය ප්‍රතිඵල සහ විසර්ජන

	2020 රු. '000	2019 රු. '000
බදු ගෙවීමට පෙර ලාභය (PBT)	**7,971,782**	8,205,007
අදායම් බදු වියදම්	**2,183,248**	1,176,052
බදු ගෙවීමට පසු ලාභය	**5,788,533**	7,028,955
අනෙකුත් විස්තීර්ණ ආදායම්	**(368,153)**	(155,611)
ගැලපිම්	**(182)**	79,331
විකිණීම සඳහා පවතින ආකාරයෙන් කොටස්කරුවන් වෙත වෙන් කරන ලද ප්‍රවර්තන වර්ෂයේ ලාභය	**(118,402)**	(253,692)
ඉදිරියට ගෙන ආ විසර්ජනය නොවන ලාභ	**27,447,385**	24,840,496
ඉඩම් බැහැර කිරීම පිළිබඳ නැවත තක්සේරු කිරීමේ සංචිතය සාක්ෂාත් කර ගැනීම	**5,182**	-
විසර්ජන ලාභ	**32,754,362**	31,539,479
ගෙවූ ලාභාංශ	**695,693**	1,720,720
ජීවිත රක්ෂණයෙන් ලඟා කරගත හැකි අතිරික්තය කොටස් කරුවන් වෙත	**2,145,273**	2,371,377
ඉදිරියට ගෙනා විසර්ජන නොවන ලාභ	**29,913,401**	27,447,385

ලාභාංශ
2021 ජූනි 30 වන විට මූල්‍ය වර්ෂය සඳහා කොටසකට රුපියල් 1.50 ක (එකතුව රුපියල් 899,614,800.00) ක අතුරු ලාභාංශයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කර ඇත.

ප්‍රකාශයට පත්කරන ලද අතුරු ලාභාංශ සහ අවසන් ලාභාංශ සඳහා 2017 අංක 07 දරණ සමාගම් පනතේ දරණ 56 වන වගන්තිය යටතේ නුබුන්වත් බව පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය සමාගම විසින් සපුරාලනු ලැබ ඇති බවට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තහවුරු කරනු ලැබ තිබේ. විගණකවරුන්ගෙන් නුබුන්වත් සහතික ලබාගෙන ඇත.

පරිත්‍යාග
2019 වර්ෂය තුලදී සමාගම විසින් රු.මි 9.4ක මුදලක් පරිත්‍යාග වශයෙන් ගෙවා ඇත.

බදුකරණය සඳහා ප්‍රතිපාදන
සමාගමේ බදු තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය වේ.

සංචිත
සමාගමේ බදුවල තත්ත්වය මූල්‍ය ප්‍රකාශවල අණාවරණය කරනු ලබයි.

සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

රක්ෂණ වගකීම් සහ ප්‍රතිපාදන
ජීවිත නොවන රක්ෂණ සඳහා වැය කරන ලද නමුත් වාර්තා නොකරන ලද (IBNR) හිමිකම් සහ වැය කරන ලද නමුත් ප්‍රමාණවත් තරම් වාර්තා නොකරන ලද (IBNER) හිමිකම් සඳහා වෙන් කළ ප්‍රතිපාදන ඇතුළත්ව උපයා නොගත් වාරික හා හිඟ හිමිකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කිරීම් තහවුරු කිරීමෙහිලා සියලු සාධාරණ පියවර අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගනු ලැබ තිබේ. එමෙන්ම, වැය කරන ලද නමුත් වාර්තා නොකරන ලද හිමිකම් (IBNR) සහ වැයකරන ලද නමුත් ප්‍රමාණවත් තරමින් වාර්තා නොකරන ලද හිමිකම් (IBNER) ඇගයීමේ ක්‍රියාවලිය සඳහා ස්වාධීන ආයුගණකවරයෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් ලබා ගෙන තිබෙන අතර ඔහුගේ වාර්තාව වාර්ෂික වාර්තාවේ සඳහන් කර ඇත.

එලෙසම, සේවක ප්‍රතිලාභ වලට අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) වල 19 වන ප්‍රමිතියට අනුව අවශ්‍ය වන පරිදි පාරිතෝෂික වගකීම් ස්වාධීන ආයුගණකවරයෙකු මඟින් අගයන ලදී.

මෙම වාර්තාවේ දිනට මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන ලබා නොදුන් බවට දැක්වෙන කිසියම් හෝ අවස්ථාවක් ගැන අධ්‍යක්ෂ මණ්ඩලයට දැනගන්නට ලැබී නැත.

අධ්‍යක්ෂවරුන්ගේ සහ නිලධාරීන්ගේ හිමිකම් රක්ෂණය
අධ්‍යක්ෂකවරුන් සහ නිලධාරීන්, අධ්‍යක්ෂකවරුන්ගේ නිළධාරීන්ගේ හිමිකම් රක්ෂණ ඔප්පුව මගින් ආවරණය කර ඇත.

ආයෝජන
2020.12.31 දිනට සමාගම සතු ආයෝජන වල වටිනාකම රු.මි.205,746 කි (2019 දී රු.මි 185,185 කි). සමාගම සතුව පවතින ආයෝජනවල සවිස්තර විග්‍රහයක් මූල්‍ය ප්‍රකාශවල සඳහන් කර ඇත.

දේපළ, යන්ත්‍රෝපකරණ, සහ උපකරණ
දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ පිළිබඳ තොරතුරු වාර්ෂික වාර්තාවේ දැක්වේ.

සින්නක්කර දේපළවල වෙළඳපළ වටිනාකම
ඉඩම් සහ ගොඩනැගිලි වලට වඩා දේපළ' යන්ත්‍රෝපකරණ සහ උපකරණ පිළිබඳව වාර්තාකිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස පිරිවැය ක්‍රමය සමාගම විසින් භාවිතා කරනු ලබයි. වත්කම් ප්‍රතිගණනය සඳහා සමාගමේ ප්‍රතිපත්තිය වන්නේ සෑම දෙවසරකටම වරක් වරකි. ඒ අනුව, M/S FM Valuers විසින් 2018දී ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රතිගණනයක් සිදු කරන ලදි .එම වත්කම් පවත්නා භාවිතයේ පදනම සඳහා විවෘත වෙළඳපොළ වටිනාකමක් මත තක්සේරු කරනු ලැබේ. එම තක්සේරුකිරීම්වල ප්‍රතිඵල ඒවා බල පවක්වන දිනය වන 2018.12.31 දින සිට මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කර ඇත.

වාර්තාකරණ දිනට පසු සිදු වූ සිදුවීම්
මූල්‍ය ප්‍රකාශවල සටහන් වලින් අනාවරණය කරන ලද සිදුවීම් වලට අමතරව මූල්‍ය ප්‍රකාශවල වෙනස්කම් සිදු කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කිරීමට හෝ අවශ්‍ය වන තරමේ කිසිදු හෞතික සිදුවීමක් වාර්තාකරණ දිනයෙන් පසුව සිදුවී නොමැත.

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු
මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී යොදා ගත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 24 අනුව සම්බන්ධිත පාර්ශව ගනුදෙනු, සහ සම්බන්ධිත පාර්ශව අනාවරණ මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

සමාගම සමග කෝන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ගේ අභිලාෂය
ගිවිසුම්වල අධ්‍යක්ෂක අභිලාශය මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කර ඇත. මෙම අභිලාශයන් අධ්‍යක්ෂක රැස්වීම්වලදී ද විධිමත් පරිදි අනාවරණය කරනු ලැබ තිබේ .අධ්‍යක්ෂකවරු
සමාගමේ කිසිදු කොටසක අයිතිකරුවෝ නොවෙති.

අධ්‍යක්ෂකවරුන්ගේ වේතන
වසර තුළ දී අධ්‍යක්ෂකවරුන්ගේ ගාස්තු සහ පාරිශ්‍රමික වශයෙන් රු.මි 10.2 ක් ගෙවනු ලැබ ඇති අතර පසුගිය වසරේ (2019) වාර්තා වී ඇති මුදල රු.මි 5.4 කි.

ප්‍රකාශිත ප්‍රග්ධනය
2007 අංක 07 දරණ සමාගම් පනතට (සංශෝධිත) අනුකූලව 2020 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 6,000 කි. 2020.12.31 දිනට කොටස් වලින් 99.97% ක් රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම් වෙත පවරනු ලැබීය.

ව්‍යවස්ථාපිත ගෙවීම්
අධ්‍යක්ෂකවරුන් දන්නා පරිදි සහ විශ්වාස කරන පරිදි රජයට,ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට (IRCS) සහ සේවකයින්ට අදාළ ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට ගෙවා ඇති බවට අධ්‍යක්ෂක වරු සැහිමකට පත්වෙති.

අස්පර්ශ්‍ය වත්කම්
2020.12.31 දිනට අස්පෘශ්‍ය වත්කම් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරනු ලැබේ.

පරිසරය
අදාළ පාරිසරික නීති හා රෙගුලාසි සැලකිල්ලට ගනිමින් සමාගම් මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබන අතර පරිසරයට හානිකර කටයුතු වල නිරත වන්නේ නැත.

නීති හා රෙගුලාසි වලට අවනතවීම
බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය/කොටස්කරුවන්ගේ අරමුදලට හුවමාරු	**3,643,261**	**2,145,273**	**384,995**	**1,103,759**	**(146,959)**	**(200,000)**	**6,930,329**

	2019						
	ජීවිත නොවන රක්ෂණ	ජීවිත රක්ෂණ	සෞඛ්‍ය ආරක්ෂක	බලශක්ති	වෙනත්	ඉවත් කිරීම්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
	18,974,323	14,820,025	-	-	-	(162,776)	33,631,572
	(400,274)	-	-	-	-	-	(400,274)
	18,574,049	14,820,025	-	-	-	(162,776)	33,231,298
	(3,358,525)	(356,967)	-	-	-	-	(3,715,493)
	93,481	-	-	-	-	-	93,481
	15,309,004	14,463,057	-	-	-	(162,776)	29,609,286
	-	-	7,548,711	45,092,487	108,413	(2,064,442)	50,685,169
	15,309,004	14,463,057	7,548,711	45,092,487	108,413	(2,227,218)	80,294,455
	(9,290,432)	(7,333,265)	-	-	-	-	(16,623,697)
	(967,782)	(2,018,406)	-	-	-	-	(2,986,186)
	-	(11,659,844)	-	-	-	-	(11,659,844)
	-	-	(4,329,019)	(36,830,284)	(25,024)	2,064,442	(39,119,884)
	(10,258,214)	(21,011,515)	(4,329,019)	(36,830,284)	(25,024)	2,064,442	(70,389,611)
	4,228,592	13,442,917	233,522	1,580,908	77,557	(2,608,907)	16,954,587
	-	89,310	-	-	-	-	89,310
	(24,434)	(32,022)	(44,967)	(169,566)	(123,733)	-	(394,722)
	278,892	925,694	68,019	813,198	629,667	(879,932)	1,835,537
	4,483,050	14,425,899	256,574	2,224,539	583,491	(3,488,838)	18,484,712
	(4,546,109)	(4,660,164)	(2,634,990)	(3,542,736)	(5,685,439)	1,042,707	(20,026,730)
	4,987,731	3,217,277	841,276	6,944,007	(5,018,558)	(2,608,907)	8,362,825
	(330,151)	(845,900)	(260,640)	(1,972,500)	(47,829)	(391,969)	(3,848,989)
	4,657,579	2,371,377	580,636	4,971,507	(5,066,387)	(3,000,875)	4,513,837

බණ්ඩමය සමාලෝචනය: මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා	2020						
	ජීවිත නොවන රක්ෂණ	ජීවිත රක්ෂණ	සෞඛ්‍ය ආරක්ෂක	බලශක්ති	වෙනත්	ඉවත් කිරීම්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්							
මූල්‍ය ආයෝජන	31,693,115	138,614,218	3,106,994	100,000	-	-	173,514,327
පරිපාලිත සමාගම්වල ආයෝජනය	19,634,852	1,296,543	-	5,000,000	18,500,000	(44,431,395)	-
ආශ්‍රිත සමාගම්වල ආයෝජනය	164,125	-	-	-	-	-	164,125
දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	10,781,351	86,004	4,757,114	18,859,285	22,268,479	-	56,752,233
වත්කම් භාවිතා කිරීමේ අයිතිය	172,755	458,820	551,719	408,773	22,982	-	1,615,049
ආයෝජන දේපළ	1,719,966	-	-	-	854,614	-	2,574,580
බදු හිමිකම් දේපළ	-	-	-	-	-	-	-
අස්පර්ශ්‍ය වත්කම්	37,172	-	56,532	-	781	2,992,805	3,087,290
ඔප්පු හිමියන්ට ණය	-	1,734,723	-	-	-	-	1,734,723
අය විය යුතු ප්‍රතිරක්ෂණ	1,692,118	488,859	-	-	-	-	2,180,977
අය විය යුතු රක්ෂණ වාරික	6,202,338	531,495	-	-	-	-	6,733,833
විලම්බිත බදු වත්කම්	-	-	-	-	1,562	-	1,562
අනෙකුත් වත්කම්	637,709	3,877,779	1,118,908	4,206,856	1,251,067	(1,758,788)	9,333,531
විලම්බිත වියදම්	478,162	-	-	-	-	-	478,162
මුදල් සහ මුදල් සමානතා	3,186,885	12,963,071	290,657	14,702,188	403,602	-	31,546,403
මුළු වත්කම්	76,400,548	160,051,512	9,881,924	43,277,102	43,303,087	(43,197,378)	289,716,794
වගකීම් සහ කොටස් ගණන							
වගකීම්							
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත	-	137,129,036	-	-	-	-	137,129,036
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත නොවන	18,866,402	-	-	-	-	-	18,866,402
බදු වගකීම්	17,474	510,975	272,170	394,141	217	-	1,194,978
ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ	1,059,939	615,341	-	-	-	-	1,675,280
ප්‍රවර්තන බදු වගකීම්	919,374	1,113,679	47,914	220,416	4,243	-	2,305,626
විලම්බිත බදු වගකීම්	3,193,361	-	1,052,709	3,333,001	72,943	-	7,652,015
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	1,332,256	1,221,234	294,427	187,860	181,168	-	3,216,945
අනෙකුත් වගකීම්	3,528,994	3,260,971	785,047	12,358,676	2,974,396	(714,098)	22,193,986
මූල්‍ය වගකීම්	281,487	172,510	260,343	167,007	2,430,615	(1,044,579)	2,267,383
මුළු වගකීම්	29,199,287	144,023,746	2,712,610	16,661,101	5,663,582	(1,758,677)	196,501,651
කොටස් ප්‍රමාණය							
ප්‍රකාශිත ප්‍රාග්ධනය	6,000,000	-	2,671,543	1,947,109	37,870,087	(42,488,740)	6,000,000
විකවරක් පමණක් ලැබෙන අතිරික්කතයන් වෙතින් රෙගුලාසිමය සීමා කරන ලද සංචිතයන්ට	-	98,237	-	-	-	-	98,237
ප්‍රාග්ධන සංචිතය	7,301,747	57,378	1,093,047	3,349,535	4,063,395	(2,752,502)	13,112,599
විකිණීමට ඇති සංචිතය	2,819,764	2,884,888	-	-	-	-	5,704,652
ආදායම් සංචිත	31,079,750	12,987,262	3,404,724	21,319,357	(4,293,977)	(5,182,630)	59,314,487
පාලනයකින් තොර පොලිය	-	-	-	-	-	8,985,168	8,985,168
මුළු කොටස් ගණන	47,201,261	16,027,765	7,169,314	26,616,001	37,639,505	(41,438,702)	93,215,143
මුළු වගකීම් සහ කොටස් ගණන	76,400,548	160,051,512	9,881,924	43,277,102	43,303,087	(43,197,378)	289,716,794

	2019						
	ජීවිත නොවන රක්ෂණ	ජීවිත රක්ෂණ	සෞඛ්‍ය ආරක්ෂක	බලශක්ති	වෙනත්	ඉවත් කිරීම්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
	31,033,992	131,116,035	2,482,400	100,000	-	-	164,732,428
	19,634,852	1,296,543	-	5,000,000	18,500,000	(44,431,395)	-
	148,509	-	-	-	-	-	148,509
	10,985,571	88,364	4,375,000	14,683,834	22,213,932	-	52,346,702
	156,733	435,320	638,881	1,113,910	23,029	-	2,367,673
	1,719,966	-	-	-	851,500	-	2,571,466
	-	-	-	-	-		
	66,560	-	75,838	-	175	2,992,808	3,135,380
	-	1,803,439	-	-	-	-	1,803,439
	1,398,724	280,330	-	-	-	-	1,679,053
	3,507,533	526,576	-	-	-	-	4,034,109
	-	-	-	-	324	-	324
	591,503	3,710,573	1,333,768	3,112,897	1,161,144	(1,481,377)	8,428,432
	561,022	-	-	-	-	-	561,022
	1,620,339	1,624,328	521,702	18,206,846	987,996	8,501	22,969,711
	71,425,304	140,881,508	9,427,389	42,217,487	43,738,100	(42,911,537)	264,778,250
	-	119,167,865	-	-	-	-	119,167,865
	16,648,028	-	-	-	-	-	16,648,028
	-	464,996	377,312	1,149,961			1,992,268
	1,082,178	245,482	-	-	-	-	1,327,660
	284,668	631,799	56,909	367,495	9,864	-	1,350,735
	3,344,700	-	1,101,753	3,364,730	60,316	-	7,871,499
	949,469	870,346	245,320	156,412	122,726	-	2,344,273
	2,618,600	3,072,010	749,652	11,273,339	3,374,478	(502,559)	20,585,519
	300,144	246,030	266,885	184,434	2,366,294	(981,883)	2,381,904
	25,227,787	124,698,527	2,797,831	16,496,370	5,933,679	(1,484,441)	173,669,751
	6,000,000	-	2,671,543	1,947,109	37,870,087	(42,488,739)	6,000,000
	-	98,237	-	-	-	-	98,237
	7,296,794	57,378	982,213	3,356,005	4,063,395	(2,697,050)	13,058,736
	4,611,587	4,860,777	-	-	-	-	9,472,363
	28,289,136	11,166,590	2,975,802	20,418,002	(4,129,060)	(5,009,024)	53,711,446
	-	-	-	-	-	8,767,718	8,767,718
	46,197,517	16,182,981	6,629,558	25,721,116	37,804,422	(41,427,095)	91,108,498
	71,425,304	140,881,508	9,427,389	42,217,487	43,738,100	(42,911,536)	264,778,250

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. වාර්තාකරණ ආස්ථාන්ව

1.1 සංයුක්ත තොරතුරු

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (සමාගම/SLIC) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත හා පවත්වාගෙන යන සීමිත වගකීම් සහිත රාජ්‍ය සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 21 දරන රක්ෂණ මන්දිරයේ පිහිටුවා තිබේ.

2020 දෙසැම්බර් 31 දිනට සහ දිනෙන් අවසන්වන වර්ෂය සඳහා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ, සමාගම සහ එහි පරිපාලිත සමාගම් වලින් ("සමූහය" ලෙසින්ද, තනිව "සමූහයේ ආස්ථිත්‍යය", ලෙසින් ද හඳුන්වන ලබන) සහ සමූහයේ හවුල්කාර සමාගම්වලින් සමන්විත වෙයි. සමූහය අයත් සියළුම සමාගම්වල මූල්‍ය ප්‍රකාශ, 2020 දෙසැම්බර් 31 න් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් සඳහා සකස් කරනු ලැබේ.

මව් සමාගමේ සාමාන්‍ය කොටස් වලින් 599,598,516 ක් (99.97%) භාණ්ඩාගාර ලේකම් සතු වන, අතර ඉතිරි කොටස් සමාගමේ සේවකයින් සහ සේවකයින හා කලින් සේවය කල සේවකයන් සතුවේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

1.2.1 සමූහය/සමාගම

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ රක්ෂණ ක්ෂේත්‍රයේ සියලුම වර්ගයේ ව්‍යාපාර ආරම්භය සහ අඛණ්ඩව පවත්වා ගෙන යාමයි.

1.2.2 අනුබද්ධිත සමාගම

අනුබද්ධ සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
සීමාසහිත ලංකා හොස්පිටල් කෝපරේෂන් පුද්ගලික සමාගම	සෞඛ්‍යාරක්ෂණය සහ රසායනාගාර සේවා
සීමාසහිත ලිට්‍රෝ ගෑස් සමාගම	ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් ආනයනය, සැකසීම, ගබඩා කිරීම, බෙදා හැරීම අලෙවිය සහ අනෙකුත් ආනුෂංගික සේවා
සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්) සමාගම	ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් සඳහා තොග ගබඩාකරණ පහසුකම් සැලසීම
සීමා සිහිත කැනෝවින් හොටෙලස් ඇන්ඩ් ස්පා (පුද්)සමාගම	වාණිජමය කාර්යයන් සඳහා කාර්යාලීය ඉඩ කඩ සැලසීම සහ ආගන්තුක සත්කාර සේවයේ කටයුතු කිරීම
සීමාසහිත කැන්විල් හෝල්ඩිංග් (පුද්) සමාගම	විවේක කාල ක්‍රියාකාරකම් ක්ෂේත්‍රයට අදාළ ආයෝජන ප්‍රවර්ධනය, හිමිකාර සමාගම වශයෙන් පරිපාලිත සමාගම් පාලනය කිරීම සහ මෙහෙයවීම.
මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ සමාගම	ශ්‍රී ලංකා රක්ෂණ සමාගම වෙත පඩිපත් කළමනාකරණ සේවා සැපයීම

2. සැකසීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS/SLFRS) සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ හා 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනතේ අවශ්‍යතාවයන්ට අනුව සකස් කර තිබේ.

මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා 2021 ජුනි 03 දින අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අවසර දෙන ලදී.

2.2 මැනීමේ පදනම

සමූහයේ සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශ, විකල්ප පදනමක් මත මිනිනු ලබන පහත දැක්වෙන ප්‍රමාණාත්මක කරුණු හැර ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලැබ තිබේ.

- රක්ෂණ ඔප්පු හිමියන්ගේ වගකීම් ආයුගණකව නිශ්චය කරන අගයන්ට මිනිනු ලැබ තිබේ.
- වට්ටම් කල නිශ්චිත ප්‍රතිලාභ සඳහා වන වගකීම ආයුගණකව අගයන, අතර වට්ටම් කල නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ වර්තමාන වටිනාකම ලෙස පිළිගනු ලැබේ.
- ඉඩම් හා ගොඩනැගිලි සාධාරණ අගයට මිනිනු ලැබේ.
- විකිනීම සඳහා වන මූල්‍ය වත්කම් සාධාරණ අගයට මිනිනු ලැබේ.
- ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට හඳුන්වනු ලබන මූල්‍ය වත්කම් සාධාරණ අගයෙන් මිනිනු ලැබේ.
- විකිණීම සඳහා වන මූල්‍ය වත්කම් සාධාරණ අගයට මිනිනු ලැබේ.

සමූහය එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ද්‍රවශීලතා අනුපිළිවෙලට පුළුල් ලෙස ඉදිරිපත් කරයි.

2.3 කාර්ය සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් මුදලින් ඉදිරිපත් කර ඇති අතර ශ්‍රී ලංකා රුපියල් සමූහයේ මව් සමාගමේ කාර්යය විවහාර මුදල් ඒකකය වේ. සියලු වටිනාකම් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ආසන්නතම දහසට කෙටි කර ඇත.

2.5 ඇස්තමේන්තු සහ තීන්දු යොදා ගැනීම

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, සමූහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම්, සහ වියදම් යොදා ගැනීම බලපාන තීන්දු ගැනීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ උපකල්පන කිරීම කළමනාකරණය විසින් සිදු කරනු ලබයි. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක කරගත් උපකල්පන ක්‍රියාත්මක පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන ප්‍රතිශෝධනයන් අනාගතයේදි බලාපොරොත්තු විය හැකි පරිදි පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණ හඳුනාගැනීම මත බලපෑම් කරන උපකල්පන කිරීමේ සහ ඇස්තමේන්තු සකස් කිරීමේ දී තිබෙන අවිනිශ්චිතතා ගැන තොරතුරු පහත සඳහන් සටහන් යටතේ ඇතුළත් කර ඇත.

සටහන 26 - වට්ටම් කරන ලද ප්‍රතිලාභ බැඳියාවන් ඊ ප්‍රධාන ආයුගණකත උපකල්පන

සටහන 5, 8, 13, 14 සහ 16 - හීන වී යන මූල්‍ය නොවන සහ මූල්‍යමය වත්කම් සඳහා ප්‍රතිපාදන ඊ ප්‍රධාන උපකල්පනයන්

සටහන 23 - ජීවිත රක්ෂණවල ආයුගණක ඇගයීම ඊ ප්‍රධාන ආයුගණක උපකල්පන

සටහන 24 - වැයකරන ලද නමුත් වාර්තා නොකළ හිමිකම් ආයුගණක උපකල්පන ඇතුළුව ජීවිත නොවන හිමිකම් සඳහා ජීවිත රක්ෂන ප්‍රතිපාදන මැනීම

සටහන 17 - විලම්බිත අත්කරගැනීම් පිරිවැය මැනිම (DAC)

සටහන 05 - නියම නොකරන ලද සාධන පත්‍රවල සාධාරණ අගය මැනීම සහ මූල්‍ය අයෝජනයන් හි ලාභය හෝ පාඩුව ඔස්සේ සාධාරණ අගය මැනිම

සටහන 10 - ආයෝජන දේපලවල සාධාරණ ඇගයීම

සාධාරණ අගයන් මැනීම

සමුහයේ/සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනාවරණ රාශියක, මූල්‍ය සහ මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් සඳහා සාධාරණ අගය මැනීම අවශ්‍ය වෙයි.

සාධාරණ අගයන් මැනීමට අදාළ ස්ථාපිත පාලන ආකෘතිමය රාමුවක් සමුහය සතු වෙයි. මෙයට ඇගයීම් කණ්ඩායමක් ඇතුළත් වන අතර සාධාරණ අගයක්ද ඇතුළුව සියලුම සුවිශේෂී සාධාරණ අගය මැනීමක්ම පාලනය කිරීමේ සහ ඒ පිළිබඳ ප්‍රධාන මූල්‍ය නිලධාරියා හට සෘජුවම වාර්තා කිරීමේ සමස්ත වගකීම ඔවුන්ට පැවරෙයි. ඇගයීමේදී ඇතිවන විශේෂිත ගැටළු සමාගමේ සහ අදාල පරිපාලිත සමාගමේ විගණන කමිටුවට වාර්තා කරනු ලබයි.

වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මැනීමේදී සමුහය/සමාගම හැකි තරම් නිරීක්ෂණය කළ හැකි වෙළඳපළ දත්ත භාවිතා කරයි. ඇගයීමේ ශිල්පීය ක්‍රම භාවිතයේදී යෙදවුම් මත පදනම් වන ධූරාවලියක් විවිධ මට්ටම්වලට සාධාරණ අගයන් පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කරනු ලැබේ.

- මට්ටම 1 - අන්‍ය වත්කම් හා වගකීම් සඳහා සක්‍රීය වෙළඳපළෙහි නියම කරන ලද මිල (වෙනස් නොකළ).
- මට්ටම 2 - ඉහත මට්ටම් 1 හි ඇතුළත් නියම කරන ලද මිල හැර අනෙකුත් යෙදවුම් සෘජුව හෝ වක්‍රව වත්කම් සහ වගකීම් සඳහා නිරීක්ෂණය කළ හැකිය.
- මට්ටම 3 - නිරීක්ෂණය කළ හැකි වෙළඳපළ දත්ත මත පදනම් නොවන වත්කම් සමඟ වගවීම් සඳහා යෙදවුම් (නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්).

සාධාරණ අගයන් මැනීම සඳහා සිදු කරන ලද උපකල්පන ගැන වැඩිදුර තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ සටහන් තුළ ඇතුළත් කර ඇත.

කොවිඩ් - 19 වසංගතය මගින් ඇති කළ බලපෑම

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමෙහි දී ඇස්තමේන්තු කිරීමේ පවතින අවිනිශ්චිතභාවය යටතේ කොවිඩ්-19 වසංගත තත්ත්වය, රජයේ ප්‍රතිපත්තිමය තීරණ සමග ආර්ථික සහ වෙළඳපොල තත්ත්වයන් හමුවේ වැඩි වී තිබේ. කළමනාකරණය මෙවැනි තත්ත්වයන් පිළිබඳව දැනුවත් අතරම ඇස්තමේන්තු සමාලෝචනය කිරීමේදී සහ ඒ සම්බන්ධ තීරණ ගැනීමේදී එම තත්ත්වයන් ද සළකා බලා තිබේ. ඇස්තමේන්තු කිරීමේ අවිනිශ්චිතතාවන් පහත කරුණු සමග සම්බන්ධ වී තිබේ.

- වෛරසයේ පැතිරීමත් ඒ සම්බන්ධයෙන් සෞඛ්‍ය අංශ මගින් ගන්නා ලද පියවරත් හේතුවෙන් ව්‍යාපාර කටයුතුවලට බාධා සිදු වූ කාල සීමාව සහ එහි දීර්ඝ කිරීම
- රජය සහ මහා බැංකුව විසින් ව්‍යාපාර කටයුතුවලට සිදු වන බාධා අවම කිරීමට ගන්නා ලද පියවරවල කාර්යක්ෂමභාවය
- අපේක්ෂිත ආර්ථික කඩා වැටීමේ කාල සීමාව සහ එහි විශාලත්වය, ප්‍රාග්ධනයට සහ මුදල් වෙළඳපොළට ඇතිවන බලපෑම සහ වෙනත් සාර්ව-ආර්ථික සාධක වනම්, දල දේශීය නිෂ්පාදිත වර්ධන වේගය, සේවා වියුක්තිය, උද්ධමනය සහ අන්තර්ජාතික වෙළඳ සීමා
- ආර්ථික කඩා වැටීම මගින් පාරිභෝගිකයන්ගේ මිලට ගැනීමේ හැකියාව සහ පාරිභෝගික චර්යාවන්ට සිදුවන බලපෑමේ ස්වභාවය

ගිණුම්කරණ ඇස්තමේන්තු සම්බන්ධයෙන් කොවිඩ් - 19 වසංගත තත්ත්වයේ බලපෑම මූල්‍ය ප්‍රකාශ සම්බන්ධ අදාළ සටහන් යටතේ අදාළ වන අවස්ථාවන්හිදී තවදුරටත් සාකච්ඡා කෙරෙනු ඇත.

2.6 ප්‍රමාණවත් බව සහ එකතුව

සමාන අයිතමවල සෑම ප්‍රමාණවත් වර්ගයක්ම මූල්‍ය ප්‍රකාශවල වෙනම ඉදිරිපත් කරන අතර අසමාන ස්වභාවයේ හෝ ශ්‍රිතයේ අයිතම ප්‍රමාණවත් නොවන්නේ නම් වෙනම ඉදිරිපත් කරනු ලබයි.

2.7 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමට අනුකූලව වීම අවශ්‍ය වන අවස්ථාවලදී නැවත වර්ගීකරණය කරනු ලැබෙයි.

2.8 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙසින් අඛණ්ඩව ඉදිරියට යාමට සමූහයේ ඇති හැකියාව ගැන තක්සේරුවක් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සිදු කර තිබෙන අතර ඉදිරි අනාගතයේදී ද ව්‍යාපාර අඛණ්ඩව පවත්වා ගෙන යාමට සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂක මණ්ඩලය සෑහීමට පත්ව සිටියි. තවදුරටත් අඛණ්ඩ පැවැත්මක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාමට සමාගමේ ඇති හැකියාව ගැන අවිශ්වාසයක් ඇති කළ හැකියැයි සැලකිය හැකි අවිනිශ්චිතතා ගැන අධ්‍යක්ෂක මණ්ඩලයට සැලකිය හැකි අවිනිශ්චිතතා නොමැත. එම නිසා මූල්‍ය ප්‍රකාශ දිගටම අඛණ්ඩ පැවැත්ම පදනම මත සකස් කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

කොවිඩ් - 19 වසංගතයේ ව්‍යාප්තිය සහ එම වසංගත ව්‍යාප්තිය අවම කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරන ලද ආරක්ෂිත ක්‍රමෝපායන් සමුහයේ ක්‍රියාකාරී සහ මූල්‍යමය අංගවලට විවිධ බලපෑම් ඇතිකොට තිබේ. රජය විසින් පනවන ලද දිවයින පුරා ක්‍රියාත්මක වූ ඇඳිරි නීතිය ඇතුළු මෙම ක්‍රමෝපායන්ගේ ප්‍රතිඵලයක් ලෙස, 2020 මාර්තු මස අතරමැදි කාලය තුළ සමුහයේ ක්‍රියාකාරිත්වයට තාවකාලික බාධා සිදු විය. කෙසේ වුවත්, 2020 ජූනි ආරම්භයේ සිට සමූහය නැවතත් සාර්ථක ලෙස සාමාන්‍ය අන්දමින් කටයුතු කිරීම ආරම්භ කළ අතර එමගින් සමුහයේ මූල්‍යමය ස්ථාවරයට හෝ ද්‍රවශීලතාවට විශේෂ බලපෑමක් සිදු නොවූ බවට සමූහය විශ්වාස කරයි.

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී, අඛණ්ඩ පැවැත්මක් වශයෙන් සමූහය සහ සමාගම සතුව ඉදිරියට යාමට පවතින හැකියාව සම්බන්ධයෙන් තක්සේරු කිරීම අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම වේ. කළමනාකාරිත්වය විසින් ඉදිරියට සිදු වීමේ හැකියාව පවතින රට වසා දැමීම්, අවම ආර්ථික වර්ධනය, රජයේ රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්තීන්හි වෙනස්කම්, ප්‍රාග්ධනය ගලාඒම සහ මුදල් වෙළඳපොළ සංචලනයන් මගින් සමූහයට සහ සමාගමට ඇතිවිය හැකි අනුමිතියන් තක්සේරු කොට තිබේ. අඛණ්ඩ ව්‍යාපාර පවත්වා ගැනීමේ සැලසුම් දැනටමත් ක්‍රියාත්මක වන අතට දූරදර්ශී ආයෝජන උපායමාර්ග මගින් මෙම වසංගත තත්ත්වය සමග පැමිණි බලපෑම් අවම කොට තිබේ.

අඛණ්ඩ පැවැත්මක් ලෙසින් අඛණ්ඩව ඉදිරියට යාමට සමූහයේ ඇති හැකියාව ගැන තක්සේරුවක් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සිදු කර තිබෙන අතර ඉදිරි අනාගතයේදී ද ව්‍යාපාර අඛණ්ඩව පවත්වා ගෙන යාමට සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂක මණ්ඩලය සෑහීමට පත්ව සිටියි. එසේම, කොවිඩ් - 19 මගින් ඇති කළ බලපෑම් ඇතුළු මෙම තීරණයට එළඹීම සඳහා සළකා බැලූ විය හැකි ප්‍රතිඵල පරාසය දක්වමින් කළමනාකාරිත්වය විසින් අවසන් වශයෙන් දක්වන්නේ, සමුහය හෝ සමාගමට අඛණ්ඩ පැවැත්මක් ලෙසට ඉදිරියට යාමට පවතින හැකියාවට විශේෂ සැකයක් ඇති කළ හැකි අවස්ථාවන්ට හෝ තත්ත්වයන්ට සම්බන්ධ ප්‍රධාන අවිනිශ්චිතතාවන් එමගින් ඇති නොවන බවයි. එම නිසා අඛණ්ඩ පැවැත්මක් ලෙස මූල්‍ය ප්‍රකාශ දිගටම පිළියෙළ වනු ඇත.

අතිරේක තොරතුරු මූල්‍ය ප්‍රකාශයන්හි සටහන 50 හි අනාවරණය කර ඇත.

3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශයේ ඉදිරිපත් කරන සියළුම කාලසීමා සඳහා පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සමූහය හා සමාගම විසින් නිත්‍ය වශයෙන් යොදා ගෙන ඇත.

3.1 ඒකාබද්ධකරණ පදනම

3.1.1 ව්‍යාපාර සංයෝජනය

පාලනය සමුහයට පවරා දෙන විට අත්පත්කර ගැනීමේ ක්‍රමය භාවිතා කරමින් ව්‍යාපාර සංයෝජනය සඳහා සමූහය සලකා බලයි. හඳුනාගත හැකි ශුද්ධ වත්කම් අත්කරගන්නා පරිදි අත්පත් කර ගැනීම් වල ප්‍රතිලාභ මාරුකිරීම සාමාන්‍යයෙන් සාධාරණ අගයට මනිනු ලැබේ.ලැබෙන කිසියම් කීර්ති නාමයක් වෙත්නම් හානිවීම් වලට අනුව එය වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ.කේවල්කර මිලදී ගැනීම මත ලැබෙන යම් ප්‍රතිලාභයක් ලාභ හෝ පාඩු වලදී එකෙනෙහිම හඳුනා ගනු ලැබේ. ණය සහ සාමාන්‍ය කොටස් සුරැකුම් වල ගැටළු වලට අදාළ වන්නේ නම් හැර වියදම් කරනු ලබන හුවමාරු පිරිවැය අලාභයක් දැරීමක් ලෙස සලකනු ලබයි.

පෙර පැවති සම්බන්ධතා පියවීමට අදාළ ප්‍රමාණ ප්‍රතිලාභ හුවමාරුවට ඇතුළත් නොවෙයි. එම ප්‍රමාණ සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභ වලදී හඳුනාගනු ලබයි.

3.1.2 පාලනයකින් තොර පොලී

පාලනයකින් තොර පොලී අත්පත්කර ගන්නා දිනට අත්පත්කර ගන්නා හෝ හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වලට එම පොලීවල සමානුපාතික කොටස් මනිනු ලබයි.

පාලනයක් නොමැතිවීමේ ප්‍රතිඵලයක් නොවන,පරිපාලිත සමාගමක් තුළ සමුහයේ පොලියේ වෙනස්වීම් සාමාන්‍ය කොටස් හුවමාරුවක් ලෙස සලකනු ලැබේ.

3.1.3 පරිපාලිත සමාගම්

පරිපාලිත සමාගම් යනු සමූහය මඟින් පාලනය කරනු ලබන අස්ථිත්ව වෙයි. යම් පරිපාලිත සමාගමක් අස්ථිත්වය සමඟ එහි මැදිහත්වීමෙන් විචල්‍ය ප්‍රතිලාභ වලට නිරාවරණය වන විට හෝ එම ප්‍රතිලාභ ලැබීමට අයිතියක් ඇති විට සහ අස්ථිත්වයේ බලය ඇති අභිබවා එහි බලය පාවිච්චි කර එම ප්‍රතිලාභ වලට බලපෑම් කිරීමේ හැකියාව ඇති විට සමූහය විසින් එය පාලනය කරනු ලබයි. පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ,සමූහය විසින් ඒවා පාලනය කිරීම ආරම්භ කළ දිනයේ සිට අවසන් කළ දින දක්වා වන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කරනු ලැබේ.

පරිපාලිත සමාගම් සඳහා කරන ලද ආයෝජනයන් සමාගමේ මූල්‍ය ප්‍රකාශයන් හි හානිවිම් අඩුකර පිරිවැය වෙත ගෙන ගොස් ඇත.

3.1.4 පාලනය අහිමිවීම

පරිපාලිත සමාගමක පාලනය සමූහයට අහිමි වූ විට එම පරිපාලිත සමාගමේ වත්කම් සහ වගකීම් සහ කිසියම් අදාළ පාලනයකින් තොර පොලී සහ සාමාන්‍ය කොටස්වල අනෙකුත් සංරචක එය හඳුනා නොගනී. පෙර පරිපාලිත සමාගම විසින් රඳවා ගන්නා ලද පොලිය පාලනය අහිමි වූ විට සාධාරණ අගයට මනිනු ලැබේ.

3.1.5 අනුබද්ධ සමාගම්වල ආයෝජනය

අනුබද්ධ ආයතනයක් යනු සමාගමේ පරිපාලිත සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් නොවන නමුත් සමාගමට එය වෙත සැළකිය යුතු බලපෑමක් ඇති කල හැකි ආස්ථිත්ව ඒකකයකි. සමුහය/ සමාගම විසින් අයෝජිතයාගේ සමාගමේ ඡන්දය දීමේ බලයෙන් 20% හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරනු ලබන අවස්ථාවෙදි සැලකිය යුතු බලපෑමක් සිදු කල හැකි යැයි උපකල්පනය කරන අතර එසේ නොවන්නේ නම් මෙය අදාලත්වය නොවන බව පැහැදිලිව දක්වනු ලැබේ.

සාමාන්‍ය කොටස් ප්‍රමාණ ක්‍රමය භාවිත කරමින් අනු බද්ධ සමාගම්හි අභිලාශයන් නිශ්චය කරනු ලැබේ. ඒවා මූලිකව පිරිවැයට හඳුනාගනු ලබන අතර එයට ගණුදෙනු පිරිවැය ඇතුලත් වේ. මූලික හඳුනා ගැනිමේන් පසුව, එකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් හි ලාභය හෝ අලාභය සමුහයේ කොටස සහ අයෝජකයන් වෙත ගණනය කරන ලද කොටස් ප්‍රමාණය සැලකිය යුතු බල පෑමක් හෝ සමුහ පාලනය අවසන් වන දිනය තෙක් ඇතුලත් වේ.

අනුබද්ධ සමාගම් වෙත කරන ලද අයෝජනයන් සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් හි හානි වීම් අඩු කර පිරිවැය වෙත ගෙනයනු ලැබේ.

3.1.6 ඒකාබද්ධ විම මත අතහැර දමන ගණුදෙනු

අන්ත : සමූහ හුවමාරු වලින් ඇතිවන අන්ත : සමූහ ශේෂ හා හුවමාරු සහ කිසියම් උපලබ්ධි නොවූ ආදායම් සහ වියදම් ඒකාබද්ධ කිරීම මත ඉවත් කරන ලද හුවමාරු ඉවත් කරනු ලැබේ. සාමාන්‍ය කොටස් ගිණුම්ගත ආයෝජිතයින් සමඟ කරන හුවමාරු වලින් ඇතිවන උපලබ්ධි නොවූ ලැබීම්,ආයෝජකයා කෙරෙහි සමූහයේ සබඳතාවයේ ප්‍රමාණයට කරනු ලබන ආයෝජනයට වෙරෙහිව ඉවත් කරනු ලැබේ. උපලබ්ධි නොවූ පාඩුද ,උපලබ්ධි නොවූ ලැබීම් ආකාරයෙන්ම ඉවක් කරනු ලබන නමුත් හානිවීම් පිළිබඳ සාක්ෂි හමු නොවන තාක් එසේ කරනු ලැබේ.

3.2 විදේශ මුදල් ගනුදෙනු

විදේශ මුදල් හුවමාරු,එම හුවමාරු දිනවල පවතින විනිමය අනුපාත අනුව සමාගමේ යොදාගන්නා ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කරනු ලැබේ. විදේශ මුදල්වලට ප්‍රකට මූල්‍ය වත්කම් හා වගකීම්, වාර්තාකරණ දිනයට තිබෙන විනිමය අනුපාතයට අනුව යොදාගන්නා ව්‍යවහාර මුදල් වලට පරිවර්තනය කරනු ලැබේ.

විදේශ මුදල්වල සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය නොවන වත්කම් හා වගකීම්, සාධාරණ අගය තීරණය කරන විට පැවති විනිමය අනුපාතයට අනුව යොදාගන්නා ව්‍යවහාර මුදල්වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශ මුදල්වල වෛතිහාසික පිරිවැය මත පදනම්ව මනිනු ලබන මූල්‍ය නොවන අයිතම හුවමාරුව සිදුවන දිනයේ ඇති විනිමය අනුපාතයට අනුව පරිවර්තනය කරනු ලබයි.

සාමාන්‍යයෙන් විදේශ මුදල්වල වෙනස්වීම් ලාභ සහ අලාභවලින් හදුනා ගනු ලැබේ.

3.3 රක්ෂණ ගිවිසුම්

නිෂ්පාදන වර්ගීකරණය

හුවමාරු කරන රක්ෂණ අවදානමේ ප්‍රමාණය මත පදනම්ව රක්ෂණකරුවන් විසින් ලියනු ලබන ගිවිසුම් හෝ "රක්ෂණ ගිවිසුම්" "ආයෝජන ගිවිසුම්" ලෙස වර්ගීකරණය කිරීම ශ්‍රී.ලං.ම.නි.ප්‍ර 4 අනුව අවශ්‍ය වෙයි.

රක්ෂණ ගිවිසුම යනු, ඔප්පු හිමිකරුවන් නිශ්චිතව සඳහන් කරන ලද අනාගත අවිනිශ්චිත අවස්ථා වලදී (රක්ෂිත සිදුවීමකදී) ඔවුන්ට විල්ලවන අහිතකර බලපෑමක් සඳහා වන්දි ලබාදීමට එකඟවී සමූහය/සමාගම (රක්ෂකයා) විසින් තවත් පාර්ශවයකින් (ඔප්පුහිමියන්) ඉදිරිපත්වන සුවිශේෂී රක්ෂණ අවදානමක් පිළිගැනීමයි. සාමාන්‍ය මාර්ගෝපදේශයක් ලෙස රක්ෂිත සිදුවීම් සිදුනොවුනහොත් ගෙවන ලද ප්‍රතිලාභය ගෙවිය යුතු ප්‍රතිලාභය සමඟ සංසන්දනය කර එම සිදුවීමෙන් සුවිශේෂී රක්ෂණ අවදානමක් තිබේද යන්න තීරණය කරනු ලැබීම දැක්විය හැකිය. රක්ෂණ ගිවිසුම් මූල්‍ය අවධානමට හුවමාරු කිරීමටද හැකිවෙයි.

ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් ලෙස වර්ගීකරණය කර තිබෙන අවස්ථාවක, සියලුම අයිතිවාසිකම් හා බැඳීම් ශූන්‍ය වී හෝ ඉකුත්වී නැත්නම් එම කාලසීමාව තුළ රක්ෂණ අවදානම සුවිශේෂී ලෙෂ අඩු වී තිබුණද එය රක්ෂණ ගිවිසුමක් ලෙස ගිවිසුම් ගත කාලය අවසන් වන තුරු පවතියි. එහෙත් ආයෝජන ගිවිසුම්ද ආරම්භ කිරීමෙන් පසු රක්ෂණ අවදානම සැලකිය යුතු මට්ටමකට පත්වන්නේ නම් එම ගිවිසුම් ද රක්ෂණ ගිවිසුම් ලෙස වර්ගීකරණය කළ හැකිය.

සමාගම විසින් අලෙවිකර ඇති සියලුම නිෂ්පාදන රක්ෂණ ගිවිසුම් වන අතර එහෙයින් ඒවා ශ්‍රී.ලං.මු.වා.ප්‍ර 4 (SLFRS 4), යටතේ රක්ෂණ ගිවිසුම් ලෙස වර්ගීකරණය කරනු ලබයි. එසේම වාර්තා කරන දිනයට සමාග මේ නිෂ්පාදන කාර්ය ආකෘතිය තුළ සමාගමට කිසිදු ආයෝජන ගිවිසුමක් නොමැත.

3.3.1 රක්ෂණ ගිවිසුම් වගකිම් වලින් කොටස්කරුවන් වෙත මාරු කරන ලද අතිරික්ත ලාභය

එක් එක් වාර්තාකරණ කාල සිමාවෙහිදි කොටස්කරුවන් වෙත පැවරිය හැකි සංචිත භාවිත කරමින් කොටස්කරුවන්ගේ වටිනාකම සමාගම විසින් තක්සේරු කරනු ලැබේ. සංචිතයන්හි ආරම්භක හා අවසන් කිරීමේ ශේෂයන් අතර වෙනස කොටස්කරුවන් වෙත පැවරිය හැකි අතිරික්ත ලාභය ලෙස සළකනු ලබන අතර එය වාර්තාකරණ දිනයට රක්ෂණ ගිවිසුම් වගකිමෙන් අඩු කරනු ලැබේ. කොටස්කරුවන් වෙත පැවරිය හැකි අතිරික්ත ලාභය පහත දැක්වෙන පරිදි ආකාර දෙකකින් සමන්විත වේ.

- ඔප්පුහිමියන්ගේ අරමුදලෙන් කොටස්කරුවන් වෙත පැවරිය හැකි අතිරික්ත ලාභය
- කොටස්කරුවන්ගේ වත්කම්වලින් ඉපැයූ ලාභය

ඔප්පුහිමියන්ගේ අරමුදලෙන් කොටස්කරුවන් වෙත පැවරිය හැකි අතිරික්ත ලාභය

ස්වාධීන උපදේශක ආයුගණකවරයකුගේ නිර්දේශය මත ආයුගණක ඇගයීමකින් අතිරික්තය ලබා ගනු ලැබේ.

කොටස්කරුවන්ගේ වත්කම් වලින් ඉපැවූ ලාභය

අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මත, ආවාසික ආයුගණක දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත කොටස්කරුවන්ගේ වත්කම්වලින් ඉපයූ ලාභ පදනම් වේ.

3.4 ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය.

3.4.1 ආදායම් හඳුනාගැනීම

3.4.1.1 දළ ලේඛනගත රක්ෂණ වාරික (GWP)

(අ) ජීවිත රක්ෂණවල දළ ලේඛනගත රක්ෂණ වාරික

ජීවිත රක්ෂණ ගිවිසුම් මත පුනරාවර්ත රක්ෂණ වාරික ඔප්පු හිමියන් විසින් ගෙවනු ලබන විට එය ආදායමක් ලෙස පිළිගනු ලැබේ. (දින 30 ක සහන කාලය ඇතුළත ඔප්පු අයවීමක් ලෙස සලකනු ලැබේ. නියමිත දිනට කලින් ලැබෙන රක්ෂණ වාරික ආදායමක් ලෙස වාර්තාගත නොකරන අතර එවැනි රක්ෂණ වාරික ආදායමක් ලෙස පිළිගැනීමට අදාළ ප්‍රතිපත්තිමය කොන්දේසිවලට අනුව අවශ්‍ය නොවන්නේ නම් එම රක්ෂණ වාරික අයවීමක් ලෙසතිබෙන තුරු වගකීමක් ලෙස සටහන් කරනු ලැබෙයි. එම ඔප්පුවල තක්සේරු කළ ජීව කාලය මත ලාභ හඳුනාගැනීම සඳහා එකී ආදායම් වලට වෙරෙහිව ප්‍රතිලාභ හා වියදම් හඳුනාගනු ලබයි.

තනි රක්ෂණ වාරික ව්‍යාපාර සඳහා ආදායම හඳුනා ගන්නේ ඔප්පුව ක්‍රියාත්මක වන දින සිටය.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

(ආ) ජීවිත නොවන රක්ෂණවල දළ ලේඛනගත රක්ෂණ වාරික
දළ ලේඛනගත රක්ෂණ වාරික, ගිණුම්කරණ කාල සීමාවේ දී අත්සන් කළ ගිවිසුම්වලින් ලබා දෙන රක්ෂණාවරණයේ සම්පූර්ණ කාල සීමාව සඳහා ලැබිය යුතු මුළු රක්ෂණ වාරිකවලින් සමන්විත වෙයි. ඒවා සෘජුව ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට පිළිගනු ලැබේ. ගිවිසුම් ආරම්භ කිරීම මත රක්ෂණ වාරික ලේඛනගත ලෙස වාර්තා කරනු ලබන අතර ආශ්‍රිත ඔප්පු ආවරණ නියමය අනුව සමානුපාතික පදනම මත මූලිකව උපයා ගනු ලැබේ. හිමිකම් නොපෑමේ ප්‍රතිදාන වැනි රක්ෂණ වාරික අනුපාත වල කොටස් වන ප්‍රතිදාන, දළ ලේඛනගත රක්ෂණ වාරික වලින් අඩුකරනු ලැබේ.

නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික සංචිතය (UPR)
නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික, වාර්තාකරණ දිනයට පසු අවදානම් කාල සීමාවට අදාළ වර්ෂයකදී ලේඛනගත රක්ෂණ වාරික වලට සමානුපාතික රක්ෂණ වාරික වෙයි. නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික අවදානම් ආදේශක ගිවිසුම් සඳහා විශේෂයෙන් දැක්වෙන සෘජු රක්ෂණ ඔප්පුවල කොන්දේසිවලින් වෙනස් වෙයි.

(2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනත අනුව 365 පදනම භාවිතා කරමින්, එසේ වුවද අවදානම් කාල සීමාව ගිවිසුම් කාල සීමාවෙන් සැලකිය යුතු තරම් වෙනස්වන, මෙම ගිවිසුම් සඳහා ලබා දෙන ලද රක්ෂණ ආරක්ෂණයේ ප්‍රමාණයට වාරික උපයාගනු ලබයි).

3.4.1.2 ප්‍රතිරක්ෂණ රක්ෂණ වාරික
රක්ෂණ ගිවිසුමක් මත දළ ප්‍රතිරක්ෂණ වාරික, රක්ෂණ වාරික ගෙවනු ලැබිය යුතු දිනයට හෝ රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මක වන දිනයට හෝ පෙර වියදමක් සේ පිළිගනු ලැබේ. ප්‍රතිරක්ෂණ වාරික, ප්‍රතිරක්ෂකයා සමඟ එකඟවූ අනුපාත මත තීරණය කරනු ලැබේ.

(අ) ජීවිත නොවන රක්ෂණවල ප්‍රතිරක්ෂණ රක්ෂණ වාරික
ලේඛනගත ප්‍රතිරක්ෂණ රක්ෂණ වාරික ,කාල සීමාව සඳහා අත්සන් කළ ගිවිසුම මඟින් ලබා දෙන සම්පූර්ණ ආවරණය සඳහා ගෙවිය යුතු මුළු රක්ෂණ වාරිකවලින් සමන්විත වන අතර රක්ෂණ ඔප්පුව ආරම්භවන දිනයේදී පිළිගනු ලැබේ.

නොඉපයූ රක්ෂණ වාරික සංචිත (UPR)
නොඉපයූ රක්ෂණ වාරික යනු , වාර්තාකරණ දිනයට පසු අවදානම් කාලසීමාවට අදාළ වර්ෂයක ලේඛනගත රක්ෂණ වාරිකවලට සමානුපාතික රක්ෂණ වාරිකයි. නොඉපයූ රක්ෂණ වාරික, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනත අනුව 365 පදනම මත ගණනය කරනු ලැබේ. එසේවුවද, අවදානම් කාලසීමාවට ගිවිසුම්ගත කාලසීමාවෙන් සැලකිය යුතු තරම් වෙනස්වන ගිවිසුම සඳහා අවදානම් කාල සීමාවේ දී ලබා දෙන රක්ෂණ ආරක්ෂණයේ ප්‍රචාරණයට සමානුපාතිකව රක්ෂණ වාරික උපයා ගනු ලැබේ. වසරේදි ලිඛිත වාරිකවල කොටස නොඉපයූ රක්ෂණ සංචිතය නියෝජනය කරන ලබන නමුත් කල් ඉකුත් නොවූ ආවරණ නියමයන්ට අදාලවේ. පසුව එන කාලපරිච්ඡේද සඳහා අත්කරගත හැකි අනුපාතය වගකීම් යටතේ ඇතුළත්වන නොඉපයූ රක්ෂණ වාරික සඳහා ප්‍රතිපාදනයක් සේ වෙනස් වෙනු ඇත.

(ආ) ජීවිත රක්ෂණ වල ප්‍රතිරක්ෂණ සංචිත වාරික
ජීවිත රක්ෂණයේ ප්‍රතිරක්ෂණ රක්ෂණ වාරික, රක්ෂණ වාරික ගෙවිය යුතු දිනයට හෝ රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මක වන දිනයට හෝ පෙර වියදමක් ලෙස පිළිගනු ලැබෙයි.

3.4.1.3 ගාස්තු සහ කොමිස් ආදායම්
(අ) ප්‍රතිරක්ෂණ කොමිස් ආදායම
බැහැර ප්‍රතිරක්ෂණ ගිවිසුම් මත ප්‍රතිරක්ෂණ කොමිස් ලැබිය යුතු ආදායමක් සේ හඳුනා ගැනිමෙන් අනතුරුව, බැහැර ප්‍රතිරක්ෂණ ගිවිසුම් මත ප්‍රතිරක්ෂණ කොමිස්, අපේක්ෂිත ගෙවිය යුතු රක්ෂණ වාරික කොන්දෙසිවල සෘජු මාර්ග ඵදනම මත වෙනස් වන අතර හිලව් කරනු ලැබේ.

(ආ) අනෙකුත් ගාස්තු ආදායම්
රක්ෂණ ගිවිසුම් ඔප්පු හිමියන් ගෙන් ඔප්පු පරිපාලන සේවා සඳහා සහ අනෙකුත් ගිවිසුම් සඳහා ගාස්තු අයකරනු ලබයි. මෙම ගාස්තු ලැබීම් මත ආදායම් ලෙසින් හෝ උපචිත අයවීම් ආදායම් ලෙස සලකනු ලැබයි.

3.4.1.4 ආයෝජන ආදායම්
මූල්‍ය ආදායම් ආයෝජනය කළ අරමුදල් වලින් ලැබෙන පොලී ආදායම්, ලාභාංශ ආදායම්, ප්‍රාග්ධන ලැබීම් හෝ අහිමිවීම් සහ විදේශ මුදල් ලැබීම් හෝ අහිමිවීම්වලින් සමන්විත වෙයි.

(අ) පොලී ආදායම
සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් පොලී ආදායම් ලාභ සහ අලාභ ලෙසින් හඳුනා ගනු ලැබේ. සඵල පොලී අනුපාතය , මූල්‍ය වත්කම්වල ධාරණ අගය මූල්‍ය වත්කම්වල (යෝග්‍ය අවස්ථාවලදී කෙටි කාල සීමා) අපේක්ෂිත ජීව කාල මඟින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ලැබීම් හා ගෙවීම් සත්‍ය වශයෙන්ම වට්ටම් කරන අනුපාතය යි. සඵල පොලී අනුපාතය ගණනය කරන විට , සමූහය මූල්‍ය සාධන පත්‍රවල, සියලුම ගිවිසුම්ගත නියම සැලකිල්ලට ගනිමින් අනාගත ණය පාඩු නොවන, නමුත් අනාගත ණය මූල්‍ය ප්‍රවාහ ඇස්තමේන්තු ද කරයි.

සඵල පොලී අනුපාත ගණනය කිරීමට සඵල පොලී අනුපාතයේ ඒකාබද්ධ කොටස් වල සියලුම හුවමාරු පිරිවැය ගාස්තු සහ ගෙවූ සහ ලැබුණු සමායන ඇතුළත් වෙයි. හුවමාරු පිරිවැයට, මූල්‍ය වත්කමක් අත්කරග ැනීමේ දී හෝ නිකුත් කිරීමේදී සෘජුවම අත්කර ගනු ලබන වර්ධනයේ පිරිවැය ඇතුළත් වෙයි.

(ආ) ලාභාංශ ආදායම
ආදායම් ලැබීමේ හිමිකම ස්ථාපිත කරනු ලබන විට ලාභාංශ ආදායම හඳුනාගනු ලබයි.

3.4.1.5 ගණුදෙනු කරුවන් සමග වන ගිවිසුම් වලින් ලැබෙන ආදායම
අදාල භාණ්ඩ හෝ සේවා හුවමාරු කිරීමට නියමිත යැයි සමූහය අපේක්ෂා කරනු ලබන ප්‍රතිලාභය දක්වන මුදලකට භාණ්ඩ හා සේවා පාලනය පාරිභෝගිකයා වෙත මාරු කරන අවස්ථාවේදී පාරිභෝගිකයා සමග පවතින කොන්ත්‍රාත්වලින් ලැබෙන ආදායම ලෙස පිලිගනු ලැබේ.

3.4.1.6 රෝහල් ආදායම්

සේවය පිළිබඳ පූර්ණ තෘප්තිමත්භාවයේ ප්‍රගතිය මැනීම සඳහා යෙදවුම් ක්‍රමයක් භාවිත කරමින් රෝහල් සේවා මඟින් ලැබෙන ආදායම කාලය ඔස්සේ සමුහය විසින් හදුනාගනු ලැබේ. මක්නිසාදයත් සමූහය විසින් සපයන ප්‍රතිලාභයන් පාරිභෝගිකයා විසින් සමාගම් ආකාරයෙන් ලබා ගනිමින් පරිභෝජනය කරන බැවිනි.

පරිපාලිත සමාගම් විසින් රෝහල් තුළ සහ බාහිර සේවා වල නියුතු විශේෂඥයින්ගෙන් ගාස්තු එකතු කර ගනු ලබයි. විශේෂඥ සේවා ගාස්තු ආදායමේ කොටසක් නොවන අතර එම ගාස්තු ආදායමට ඇතුළත් කරනු නොලැබේ.

3.4.1.7 භාණ්ඩ විකිණීම මඟින් ලැබෙන ආදායම

සාමාන්‍යයෙන් උපකරණ බෙදා හැරීමේදී වත්කම් පාලනය පාරිභෝගිකයාට පැවරෙන මොහොතේදී භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගැනේ. ගනුදෙනු මිලෙන් කොටසක් වෙන් කළ යුතු වෙනම කාර්යසාධන බැඳීම් වන කොන්ත්‍රාත්තුවේ වෙනත් පොරොන්දු තිබේද යන්න සමූහය සලකා බලයි. භාණ්ඩ විකිණීම සඳහා ගනුදෙනු මිල තීරණය කිරීමේදී, විචල්‍ය සලකා බැලීම සහ සැලකිය යුතු මූල්‍යකරණ කොටස්වල පැවැත්ම සමූහය විසින් සළකා බැලේ.

(i) විචල්‍ය සලකා බැලීම

ගිවිසුමක් සලකා බැලීමේදී විචල්‍ය ප්‍රමාණයක් ඇතුළත් වන්නේ නම්, භාණ්ඩය පාරිභෝගිකයා වෙත මාරු කිරීම සඳහා නුවමාරුවක් වශයෙන් සමූහය විසින් සලකා බැලිය යුතු ප්‍රමාණය ඇස්තමේන්තු කරයි. විචල්‍ය සලකා බැලීම ගිවිසුම ආරම්භයේ දී තක්සේරු කර ඇති අතර විචල්‍ය සලකා බැලීම් සමඟ සම්බන්ධිත අවිනිශ්චිතතාව පසුව විසඳන විට හඳුනාගත් සමුච්චිත ආදායම් ප්‍රමාණයෙන් සැලකිය යුතු ආදායම් ආපසු හැරවීමක් සිදු නොවන බවට බෙහෙවින් සම්භාවිතාවක් ඇති වන තෙක් එය සීමා කර ඇත. භාණ්ඩ විකිණීම සඳහා වන සමහර ගිවිසුම් මඟින් ගනුදෙනුකරුවන්ට ආපසු පැමිණීමේ අයිතිය ලබාදේ. ආපසු පැමිණීමේ අයිතිවාසිකම් විචල්‍ය සලකා බැලීමට තුඩු දෙයි.

(ii) ආපසු පැමිණීමේ අයිතිවාසිකම්

නිශ්චිත ගිවිසුමක් මඟින් නිශ්චිත කාල සීමාවක්තුළ භාණ්ඩ ආපසු ලබා දීමට පාරිභෝගිකයාට අයිතියක් ඇත. ආපසු ලබා නොදෙන භාණ්ඩ තක්සේරු කිරීම සඳහා සමූහය අපේක්ෂිත වටිනාකම් ක්‍රමය භාවිතා කරයි, මන්ද මෙම ක්‍රමය මඟින් කණ්ඩායමට හිමිවිය යුතු විචල්‍ය සලකා බැලීමේ ප්‍රමාණය මැනවින් පුරෝකථනය කරයි. ගනුදෙනු මිලට ඇතුළත් කළ හැකි විචල්‍ය සලකා බැලීමේ ප්‍රමාණය තීරණය කිරීම සඳහා විචල්‍ය සලකා බැලීමේ ඇස්තමේන්තු සීමා කිරීම පිලිබඳව 15 හි අවශ්‍යතා ද අදාළ වේ. ආපසු ලබා දීමට අපේක්ෂා කරන භාණ්ඩ සඳහා, ආදායම වෙනුවට, සමූහය මුදල් ආපසු ගෙවීමේ වගකීමක් හඳුනා ගනී.

(iii) සැලකිය යුතු මූල්‍යකරණ උපාංගය

සාමාන්‍යයෙන් සමූහයට තම ගනුදෙනුකරුවන්ගෙන් කෙටි කාලීන අත්තිකාරම් ලැබේ. එස්.එල්.එෆ්.ආර්.එස් 15 හි ප්‍රායෝගික උපයෝගීතාව භාවිතා කරමින්, ගිවිසුම ආරම්භයේ දී, පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවාව පාරිභෝගිකයාට පැවරීම අතර කාල සීමාව සහ සැලකිය යුතු මූල්‍යකරණ අංගයක බලපෑම සඳහා සමූහය පොරොන්දු වූ සලකා බැලීමේ ප්‍රමාණය සකස් නොකරයි. පාරිභෝගිකයා එම භාණ්ඩ හෝ සේවාව සඳහා ගෙවන විට වසරක් හෝ ඊට අඩු වනු ඇත.

3.4.1.8 ආයෝජන දේපල වලින් ලැබෙන පොලි ආදායම

ආයෝජන දේපළවලින් ලැබෙන කුලී ආදායම,බදු නියමය මත සෘජුව පදනම්ව ආදායමක් ලෙස පිළිගනු ලැබේ. බදු නියමය අනුව ලබා දෙන බදු පාරිතෝෂික මුළු බදු ආදායමේ ඒකාබද්ධ කොටසක් ලෙසින් සලකනු ලැබේ.

3.4.1.9 දේපළ,යන්ත්‍රෝපකරණ සහ උපකරණ බැහැරලීම මත ලාභ/අලාභ

දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ බැහැරලීම මත ලාභ/අලාභ අලෙවි සිදුවන කාල සීමාවේදී හඳුනා ගන්නා අතර ආදායම් යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

3.4.2 ප්‍රතිලාභ, හිමිකම් සහ වියදම්

3.4.2.1 දළ ප්‍රතිලාභ සහ හිමිකම්

(අ) ජීවිත රක්ෂණ ව්‍යාපාරය

මරණ හා කල්පිරීම මඟින් ලැබෙන හිමිකම් වේ. මරණය හෝ කාල පරිච්ඡේදය ඉකුත්වීමේ දැන්වීම මත ආදායමට එරෙහිව අයකරනු ලැබේ. අන්තර් ගෙවීම් හා රඳවා ගැනීම් පියවීම් කරන අවස්ථාව සඳහා පමණක් ගණනය කරනු ලැබේ.

අත්පත් කර ගැනීමේ වියදම් හා ජීවිත රක්ෂණ ව්‍යාපාර පවත්වාගෙන යාමේ වියදම්, උපචයන පදනම මත ගණනය කරනු නොලබන ප්‍රාග්ධන වියදම් ලෙස නොසලකන ආයෝජනවලට අදාළ වියදම් යනාදිය ජීවිත රක්ෂණ වියදම් වලට අදාළ වෙයි.

(ආ) ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරය

ජීවිත නොවන රක්ෂණ හිමිකම්වලට හිමිකම් සැකසීම හා පියවීම් වලට සෘජුවම අදාළවන හිමිකම් මෙහෙයුම් පිරිවැය සමඟ වාර්තා කළ හෝ නොකළ වසර තුළ ඇතිවන හිමිකම්, මුකාතාවශේෂ අගය හා අනෙකුත් අයකිරීම්වල අඩුකිරීම් සඳහා අඩු කිරීමක් සහ පසුගිය වසරේ නොපියවූ හිමිකම් වල කිසියම් හෝ වෙනස්වීමත් ඇතුළත් වෙයි. නොපියවූ හිමිකම්,පුද්ගල හිමිකම් ගොනු සමාලෝචනය මඟින් සහ පියවමින් තිබෙන හිමිකම්වල අත්‍යන්ත පිරිවැය වෙනස් වීම් තක්සේරු කරගනිමින් තක්සේරු කරනු ලැබේ. වැය කරන ලද නමුත් වාර්තා නොකළ හිමිකම් (IBNR) සහ වැය කරන ලද නමුත් ප්‍රමාණවත් තරම් වාර්තා නොකළ හිමිකම් (IBNFR) අදාළ ප්‍රතිපාදන ,අතීත අත්දැකීම් සහ ප්‍රවනතා මත පදනම්ව අනාගත වගකීම් වඩාත් යථාර්තවාදී ලෙස ඇස්තමේන්තු කිරීම තහවුරු කිරීම සඳහා ආයුගණකව අගයනු ලැබේ. ආයුගණක ඇගයීම් කාර්තුමය පදනම මත සිදුකරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

හිමිකම් සඳහා ප්‍රතිපාදන වර්තමානයේ පවතින තොරතුරුවල මනා සේ දැක්විය යුතු බවට අධ්‍යක්ෂකවරුන් සලකනු ලබන අතර අනතුරුව ලැබෙන තොරතුරු හා සිදුවන සිදුවීම් වල ප්‍රතිඵලයක් ලෙස අවසාන වගකීම් වෙනස්වනු ඇත. මෙම තත්ත්වය ලබා දෙන පරිමාණයන් වෙනස් කිරීමට හේතු වනු ඇත. එම ප්‍රමාණයන් එකී කාලසීමාව සඳහා වන මූල්‍ය ප්‍රකාශවල දක්වනු ලබයි.

හිමිකම් ඇස්තමේන්තු කිරීමට භාවිතා කළ ක්‍රමය සහ සකස් කරන ලද ඇස්තමේන්තු නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ.

3.4.2.2 ප්‍රතිරක්ෂණ හිමිකම්

අදාළ ගිවිසුම්වල නියමව අනුව අදාළ දළ රක්ෂණ හිමිකම් පිළිගනු ලබන විට ප්‍රතිරක්ෂණ හිමිකම් හඳුනාගනු ලැබේ.

3.4.2.3 ශුද්ධ විලම්භිත අත්පත් කර ගැනීමේ වියදම්

අත්පත් කර ගැනීමේ වියදම් ව්‍යාපාරයේ නිෂ්පාදනය සමඟ වෙනස්වන අතර ව්‍යාපාරයේ නිෂ්පාදනවලට සෘජුවම අදාළ වෙයි. ජීවිත නොවන රක්ෂණ ගිවිසුම්වල අදාළ කර ගත හැකි අත්පත් කරගැනීමේ වියදම් අදාළ ලේඛනගත රක්ෂණ වාරික උපයා ගනු ලබන කාලය තුළදී විලම්භිතකිරීම සහ හිලව් කිරීම සිදුකරනු ලබයි. ප්‍රතිරක්ෂණ කොමිස්ද විලම්භිත අත්පත්කර ගැනීමේ පිරිවැය තුළ ඒ ආකාරයෙන්ම හඳුනා ගනු ලැබේ.

3.4.2.4 ජීවිත රක්ෂණ අරමුදලේ ආයුගණක ඇගයීම

ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ සිය වාර්ෂික පරීක්ෂණය අධ්‍යයනය කරමින් ස්වාධීන විශේෂඥ ආයුගණකගේ නිර්දේශය මත වසර අවසානයේදී සමාගම සඳහා දිගු කාලීන රක්ෂණ ප්‍රතිපාදන ලබාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය එකඟවී ඇත. ආයුගණක ඇගැයීම සියලුම වගකීම් සැලකිල්ලට ගනු ලැබ ඇති අතර ස්වාධීන විශේෂඥ ආයුගණක විසින් නිර්දේශ කරන ලද උපකල්පන මත පදනම් වී ඇත.

3.4.2.5 අනෙකුත් වියදම්

අනෙකුත් වියදම් උපචිත පදනම මත පිළිගනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාමට වැය කරනු ලබන සියලුම වියදම් සහ දේපළ හා යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශයට පවරනු ලබයි.

3.4.3 සේවක ප්‍රතිලාභ

(අ) කෙටි කාලීන ප්‍රතිලාභ

අදාළ සේවාව සැපයීම සඳහා කෙටි කාලීන සේවක ප්‍රතිලාභ වැය කරනු ලබයි. සේවකයා විසින් පූර්ව සේවා ලබාදීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රමාණය ගෙවීමට සමූහයට නීතිමය හෝ ගිවිසුම්ගත බැඳීමක් ඇත්නම්, කෙටි කාලීන මුදල් පාරිතෝෂික හෝ ලාභ බෙදා ගැනීමේ සැලැස්මක් යටතේ ගෙවීමට අපේක්ෂා කරනු ලබන ප්‍රමාණයට වගකීමක් හඳුනාගනු ලබන අතර එම බැඳීම් සත්‍ය වශයෙන්ම ඇස්තමේන්තු කළ හැකිය.

(ආ) නිශ්චිත දායකත්ව සැලැසුම

නිශ්චිත දායකත්ව සැලසුම පූර්ව සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුමක් වන අතර මේ යටතේ යම් ආස්ථිත්වයක ස්ථාවර දායකත්ව වෙනත් ආස්ථිත්වයකට ගෙවන අතර ඊට වැඩිපුර ප්‍රමාණයක් ගෙවීම සඳහා නීතිමය හෝ ගිවිසුම්ගත බැඳීමක් ඇති නොවෙයි. නිශ්චිත දායකත්ව සැලසුම්වලට දායකත්ව ලබාදීම සඳහා වන බැඳීම්, සේවකයන් විසින් සේවා සපයන කාලසීමාවේ දී ලාභ හෝ අලාභ ප්‍රකාශයේ සේවක ප්‍රතිලාභ වියදම් ලෙස හඳුනා ගනු ලබයි.

සේවක අර්ථසාධක අරමුදල

සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ, සීමාසහිත ලිට්‍රෝ ගෑස් සමාගම සහ සීමාසහිත ලිට්‍රෝ ටර්මිනල් (පුද්) සමාගමේ සේවකයින් විසින් පිළිවෙළින් 15% සහ 10% ක් දායකත්වයක් අනුමත අර්ථසාධක අරමුදලට දක්වනු ලබයි.

සමූහයේ අනෙකුත් ආස්ථිත්ව සහ සමූහයේ අනෙකුත් අස්ථිත්වවල සේවකයින් වෙනුවෙන් සෑම කෙනෙකුගේම වැටුපෙන් 12% ක දායකත්වයක් අනුමත අර්ථසාධක අරමුදලට දක්වනු ලබයි.

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල

සමූහය/සමාගම විසින් සෑම සේවකයකුගේම වැටුපෙන් 3% ක් දායකත්වයක් සේවක අර්ථසාධක අරමුදලට දක්වනු ලබයි.

(ඇ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම නිශ්චිත ප්‍රතිලාභ සැලසුමකට වඩා පූර්ව - සේවා නියුක්ති සැලසුමක් වෙයි.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වලට අදාළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පිළිගනු ලැබ ඇති වගකීම්, වාර්තාකරණ දිනට නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය වෙයි. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් ගණනය කිරීම සුදුසුකම්ලත් ආයුගණකවරයෙකු විසින් LKAS 19 - 'සේවක ප්‍රතිලාභ' නිර්දේශ කර ඇති පරිදි පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය (PUC) භාවිතා කරමින් වාර්තාකරණ දිනට වාර්ෂිකව සිදුකරනු ලබයි. ආයුගණක ඇගයීම වට්ටම් අනුපාතය, වැටුප් වර්ධක අනුපාතය සහ සේවකයින්ගේ ශේෂ සේවා කාලය පිළිබඳ කරනු ලබන උපකල්පනවලින් සමන්විත වෙයි. සැලසුම්වල දිගු කාලීන ස්වභාවය හේතුවෙන් එවැනි තක්සේරු සැලකිය යුතු තරම් අවිනිශ්චිතතාවයකට යටත් වෙයි.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ වසර 05 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීම මත පමණක් සේවකයකුට මෙම වගකීම හිමි වෙයි. මෙම වගකීමට බාහිර අරමුදල් නොලැබෙයි.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමට අදාළ ශුද්ධ පොළී වියදම සහ අනෙකුත් වියදම් ලාභයේදී හෝ අලාභයේදී හඳුනාගනු ලබයි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක පියවීම් පවතින විට එම පියවීම් සිදු කිරීම මත යම් ලැබීම් හෝ අහිමිවීම් සමූහය විසින් හඳුනාගනු ලබයි.

ආයුගණක ලැබීම් සහ අහිමි වීම් වලින් සමන්විත ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ ප්‍රතිප්‍රමාණනය වෙනත් විස්තීර්ණ ආදායමකදී එකෙනෙහිම හඳුනාගනු ලබයි.

3.4.4 ආදායම් බදු වියදම්.

ආදායම් බදු වියදම් ප්‍රවර්තන සහ විලම්බිත බදුවලින් සමන්විත වෙයි. ප්‍රවර්තන සහ විලම්හිත බදු සාමාන්‍ය කොටස්වලදී හෝ OCI වලදී සෘජුව හඳුනාගනු ලබන අයිතම වලට අදාළවන ප්‍රමාණයට හැර ලාභයේදී හෝ අලාභයේදී හඳුනාගනු ලබයි.

3.4.4.1 ප්‍රවර්තන බදු

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම් වී ඇත්තේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති පරිදි ආදායම් හා වියදම්වල අංගයන් මත වන අතර 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 67 වන වගන්ති ප්‍රකාරව ගණනය කරනු ලැබේ. මෙම අංශයට අනුව, බදු ගෙවිය යුතු ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ වාසි සහ ලාභය පහත ඒවායේ එකතුව වේ.

- කොටස් හිමියන්ට බෙදා හරින ලද අතිරික්තය ජීවිත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදලෙන් 28% ක ආයුගණක අනුපාතයක් මගින් සහතික කර ඇත.
- ආයෝජන ආදායම, කොටස් හිමියන්ගේ ආදායමෙන් 28% ක අනුපාතයකින් එම ආදායම නිෂ්පාදනය කිරීමේදී දරන ඕනෑම වියදමකට වඩා අඩුය.
- ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ නියැලී සිටින පුද්ගලයෙකුගේ ලාභයෙන් බෙදා ගන්නා ජීවිත රක්ෂණ ඔප්පුහිමියෙක් වෙත බෙදා හරින ලද අතිරික්තය 14% ක අනුපාතයකින් ගණනය වේ. (2018 සිට වසර 3 දක්වා සහ ඉන් පසුව 28% දක්වා)

නමුත් ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාර සඳහා අනෙකුත් සියලුම අංශ අදාළ වන අතර එම ව්‍යාපාරයේ ලැබීම් සහ ලාභය සඳහා 28% ක බදු අය කෙරේ.

වර්තමාන ආදායම් බද්ද යනු වසර සඳහා බදු ගෙවිය යුතු ආදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු අපේක්ෂිත බද්ද වන අතර පෙර වර්ෂවලට අදාළව ගෙවිය යුතු හෝ ලැබිය යුතු බද්දෙහි යම් වෙනස් කිරීම් වේ. එය මනිනු ලබන්නේ වාර්තා කරන දිනට පනවන ලද බදු අනුපාත භාවිතා කරමිනි.

අදාළ බදු රෙගුලාසි අර්ථ නිරූපණයට යටත් වන අවස්ථාවන්ට අදාළව බදු වර්ගයන්හි ගනු ලබන තනතුරු කළමනාකරණය වරින් වර ඇගයීමට ලක් කරන අතර සුදුසු අවස්ථාවල ප්‍රතිපාදන ස්ථාපිත කරයි.

3.4.4.2 විලම්හිත බදු

විලම්හිත බදු මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සඳහා වත්කම්වල ධාරණ අගය අතර තාවකාලික වෙනස්කම්වලට සහ බදුකරණ ක්‍රියාවලිය සඳහා භාවිතා කළ අගයන්වලට අදාළව හඳුනාගනු ලබයි.

සියලුම තාවකාලික වෙනස්කම් සඳහා හඳුනාගනු ලබන විලම්හිත බදු, වත්කම් සහ වගකීම් භාවිතා නොකළ බදු බැර, භාවිතා නොකළ බදු හා භාවිතයට ගත හැකි අනාගත බදු, අය කළ හැකි ලාභවලට එරෙහිව අනාගත බදු, අය කළ හැකි ලාභ පැවතීමේ සම්භාවිතාව දක්වා ඉදිරියට ගෙන යයි.

විලම්හිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනකදීම සමාලෝචනය කරනු ලබන අතර අදාළ බදු ප්‍රතිලාභ උපලබ්ධි වීම තවදුරටත් සම්භාවී නොවන තාක් අඩුකරනු ලැබේ. එම අඩුකිරීම් අනාගත බදු අය කළ හැකි ලාභ ලැබීමේ සම්භාවිතාව වර්ධනය වන විට ප්‍රතිවර්තනය කරනු ලැබේ.

විලම්හිත බදු, වාර්තාකරණ දිනයට පනවනු ලැබ ඇති සහ නිත්‍ය වශයෙන් පනවනු ලැබ ඇති බදු අනුපාත භාවිතා කරමින් තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය කරන විට ඒවාට අදාළ කරගැනිමේ අනපේක්ෂිත බදු අනුපාත වලට මනිනු ලබයි.

හඳුනා නොගත් විලම්හිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකට තක්සේරු කරනු ලබන අතර ඒවා භාවිතයට ගත හැකි වීමට එරෙහිව අනාගත බදු අය කළ හැකි ලාභ පැවතීමේ සම්භාවිතාව දක්වා හඳුනා ගනු ලබයි.

විලම්හිත බදු වත්කම් සහ විලම්හිත බදු වගකීම්, ප්‍රවර්තන බදු වගකීම්වලට එරෙහිව ප්‍රවර්තන බදු වත්කම් හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක අයිතිවාසිකමක් පවතීනම් සහ එනම් බදු අයකළ හැකි ආස්ථිත්වයකට සහ එකම බදුකරණ අධිකාරියකට විලම්හිත බදු අදාළ වන විට හිලව් කරනු ලැබේ.

විලම්හිත බදු හඳුනා ගැනීමේදී කොවිඩ් - 19 මගින් ආස්ථිත්වයේ අනාගත ලාභවලට බලපෑමක් ඇති කොට තිබිය හැකි අතර අනෙක් අතට විලම්හිත බදු ප්‍රමාණයට සහ ප්‍රතිසාධන ප්‍රමාණවලට බලපෑම් ඇති කළ හැකිය. එම නිසා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විලම්හිත බදු වත්කම් නැවත අයකර ගැනීමේ හැකියාවට කොවිඩ් - 19 සහිත පරිසරයක් මගින් ඇති කළ හැකි වෙනස්කම්වල බලපෑම නිර්ණය කරයි. මෙම ඇගයීමේදී, එක් විශේෂ කාල සීමාවක් තුළ ප්‍රතිසාධනයට කොවිඩ් - 19 මගින් ඇති කළ හැකි බලපෑම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගතානුගතික ප්‍රවේශයක් අනුගමනය කරමින් සංවේදීතා විශ්ලේෂණයක් සිදු කෙරිණි. වැඩිදුර තොරතුරු සඳහා සටහන 15 බලන්න.

3.4.4.3 ලාභාංශ මත රුදවුම් බද්ද

සමූහය විසින් ලාභාංශ බෙදාහැරීමෙන් පැන නගින රුදවුම් බදු අදාළ ලාභාංශය ගෙවීම වගකීම හඳුනා ගනු ලබන අවස්ථාවේදීම හඳුනාගනු ලබයි. ආදායම් බදු දෙපාර්තමේන්තුව මගින් 2020 පෙබරවාරි 18 වන දින පළ කරන ලද දැන්වීම (PN/2020-03) අනුව 2020 ජනවාරි 1 සිට ලාභාංශ මත රුඳවුම් බද්ද අඩු කිරීමේ අවශ්‍යතාව ඉවත් කොට තිබේ.

3.4.4.4 භෝග රක්ෂණ අයබදු (CIL)

2013 අංක 12 දරන මූල්‍ය පනතේ 14 වන වගන්තියේ විධිවිධාන යටතේ බෝග රක්ෂණ අයබදු හඳුන්වනු ලැබ ඇති අතර 2013 අප්‍රේල් 1 දින සිට ක්‍රියාත්මක වෙයි. එය ජාතික රක්ෂණ සංස්ථාවේ භාරකාර අරමුදලට ගෙවිය යුතු අතර 1% ක බදු ගෙවීමෙන් පසු ලාභයකට බැඳී සිටියි.

3.5 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

3.5.1 දේපළ,යන්ත්‍රෝපකරණ සහ උපකරණ

3.5.1.1 මූලික හඳුනාගැනීම හා මැනීම

දේපළ යන්ත්‍රෝපකරණ හා උපකරණ, සම්මත පිරිවැයට සහ සමුච්චිත හානිකරණ අලාභයට ප්‍රමාණනය කරනු ලබයි. දේපළ යන්ත්‍රෝපකරණ හා උපකරණ පිරිවැය, එම වත්කම් ඒවායින් අපේක්ෂිත භාවිතයට සුදුසු තත්ත්වයට පත්කරන තුරු දරනු ලබන කවර හෝ වියදම් ද සමඟ එම වත්කම් අත්පත්කර ගැනීමට හෝ ඉදිකිරීමට දරන ලද පිරිවැය වෙයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

වත්කම් අත්පත්කර ගැනීමේ දී සෘජුවම අත්කර ගන්නා වියදම පිරිවැයට ඇතුළත් වෙයි. ස්වයං ඉදිකිරීම් වත්කම්වල පිරිවැයට පහත සඳහන් පිරිවැයද ඇතුළත් වෙයි.

- ද්‍රව්‍ය හා සෘජු කම්කරු පිරිවැය.
- වත්කම් ඒවායින් අපේක්ෂිත භාවිතයට සුදුසු තත්ත්වයට පත්කිරීම සඳහා සෘජුව පත්කර ගනු ලබන වෙනත් කවර හෝ පිරිවැය.
- වත්කම් ඉවත් කිරීමට හෝ වැඩ බිම ප්‍රතිස්ථාපනය සඳහා බැඳීමක් සමුහයට ඇති අවස්ථාවක දී එම අයිතම කඩා ඉවත් කිරීමේ සහ ඒවා ස්ථාපනය කර තිබූ භූමිය ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය.

ඇස්තමේන්තුව බැහැරලීම මත කිසියම් ලැබීමක් හෝ අහිමිවීමක් ඇත්නම් එය ලාභයේ හෝ අලාභයේ වෙනත් මෙහෙයුම් ආදායමක් ලෙස හඳුනා ගනු ලබයි.

3.5.1.2 පසුව එන වියදම සහ ප්‍රතිස්ථාපනය

දේපළ,යන්ත්‍රෝපකරණ හා උපකරණ අයිතමවල කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ලැබීමේ සම්භාවිතාවක් ඇතිනම් සහ එහි පිරිවැය සත්‍ය වශයෙන් අගැයීමට හැකි නම් ධාරණ අගය හඳුනා නොගනියි. දේපළ,යන්ත්‍රෝපකරණ හා උපකරණ එදිනෙදා සේවා කිරීම සඳහා පිරිවැය වැය කරනු ලබන ලෙසට ලාභයේ දි හෝ අලාභයේදී හඳුනා ගනු ලබයි.

3.5.1.3 ප්‍රතිඇගයීම

සාධාරණ අගය සත්‍ය වශයෙන් ඇගයීමට හැකි ඉඩම් හා ගොඩනැගිලි වත්කම් ලෙස හඳුනා ගැනීමෙන් පසුව, ඒවා ප්‍රතිඇගයීම් දිනයට පෙර හෝ පසුව එන සමුච්චිත ක්ෂය වීමකට සහ පසුව එන සමුච්චිත හානිකරණ අලාභයකට වඩා අඩු ප්‍රති අගයන ලද අගයකට රැගෙන යනු ලැබ තිබේ. ප්‍රතිඅගයන ලද වත්කම් සාධාරණ අගය වාර්තාකරණ දිනයට එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව තහවුරුකිරීම සඳහා තක්සේරු කිරීම් සිදු කරනු ලබයි.

තක්සේරු කිරීම් වෘත්තීමය වශයෙන් සුදුසුකම් ලත් තක්සේරුකරුවන් විසින් පිළිවෙළින් අවම වශයෙන් වසර තුනකදී සිදු කරනු ලබන අතර සාධාරණ අගයේ වෙනස්කම් හේතුවෙන් ඇති වන්නා වූ ලාභ හෝ පාඩු ඒවා ඇති වන වසරේ අනෙකුත් විස්තරාත්මක ඉපයීම් තුළ ඇතුලත් කෙරෙයි.

ප්‍රතිඇගයිමේ ප්‍රතිඵලයක් වශයෙන් ධාරණ අගයේ වැඩිවීමක්, වෙත් අනෙකුත් විස්තීර්ණ ආදායමේදි හදුනාගනු ලබන අතර ප්‍රතිඇගයිමේ සංචිතයේ ශීර්ෂය යටතේ සාමාන්‍ය කොටස් ප්‍රමාණයෙහි එක් රැස්වෙයි. කෙසේ වුවද, එම වැඩිවීම ලාභ හා අලාභයන් හි කලින් හදුනාගත් එම වත්කමේම ප්‍රති ඇගයිමේ පහළ යෑමක් දක්වා ලාභ හෝ අලාභවලදි හදුනාගනු ලැබේ.

ප්‍රතිඇගයිමේ ප්‍රතිඵලයක් වශයෙන් වන ධාරක අගයේ අඩුවිමක් ලාභ හෝ අලාභවලදි හදුනාගනු ලැබේ. කෙසේ වුවද, එම අඩුවිම එම වත්කමට අදාලව ප්‍රතිඇගයිම් අතිරික්තයන් හි පවතින කිසියම් බැර ශේෂයක් ඇති වන තෙක් වෙනත් විස්තීර්ණ අදායම් වලදි හදුනාගනු ලබයි.

ඊට අමතරව, ප්‍රතිඇගයීම් දිනට සමුච්චිත ක්ෂයවීම වත්කමේ දළ ධාරණ අගයට විරෙහිව ඉවත් කරනු ලබන අතර ශුද්ධ අගය වත්කමේ ප්‍රතිඇග යීමේ අගයේ යළි සඳහන් කරනු ලබයි. බැහැරලීම මත ,විකුණනු ලබන කිසියම් විශේෂිත වත්කමකට අදාළ කවර හෝ ප්‍රතිඇගයීම් සංචිතයක් සෘජුවම රඳවාගත් ඉපැයීම්වලට හුවමාරු කරනු ලබයි.

3.5.1.4 ක්ෂයවීම්

තක්සේරු කරන ලද අවශේෂ වටිනාකම්වලට අඩු වටිනාකමක් ඇති දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ පිරිවැය ඒවායෙහි තක්සේරු කරන ලද ප්‍රයෝජනවත් ජීව කාලය තක්සේරු කරන ලද ඵලදායි ජීව කාල සෘජු මාර්ග ක්‍රමය භාවිතා කරමින් තක්සේරු කරන ලදුව ශේෂ වටිනාකමට අඩු වටිනාමක් ඇති දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ අයිතමවල පිරිවැය පොතෙන් කපා හැරීමේ ක්ෂයවීම් අගය ගණනය කරනු ලබන අතර එය සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභ වලදී හඳුනාගනු ලබයි. මෙයින් වත්කමක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වල අපේක්ෂිත පරිභෝජන රටාව ඉතා හොඳින් පෙන්නුම් කරයි.

ප්‍රවර්තන සහ සංසන්දනාත්මක කාල සීමාව සඳහා තක්සේරු කරන ලද ඵලදායි ජීව කාලය පහත දැක්වේ.

◆ ගොඩනැගිල	- වසර 20-40
◆ ගෘහ භාණ්ඩ සහ මෙවලම්	- වසර 5-10
◆ කාර්යාල සහ අනෙකත් උපකරණ	- වසර 5-10
◆ විදුලි ජනක යන්ත්‍ර සහ වායු සමීකරණ පිරිවිත	- වසර 5 -10
◆ රථ වාහන	- වසර 4- 5
◆ වෑද්දුම සහ සවිකිරීම්	- වසර 6 2/3
◆ පිරියත සහ යන්ත්‍රෝපකරණ	- වසර 20
◆ පරිගණක සහ පරිගණක උපකරණ	- වසර 4 - 7
◆ වේල් පි ගෑස් ගබඩා කරණ ටැංකි පයිප් ලයින් සහ සවිකිරීම්	- වසර 25
◆ වේල් පි ගෑස් සිලිනඩර්	- වසර 10
◆ අනෙකුත් ස්ථාවර වත්කම්	- වසර 3-12

ක්ෂයවීම් ක්‍රම. ඵලදායි ජීව කාලය සහ අවශේෂ අගයන් සෑම වාර්තාකරණ දිනයකදී සමාලේචනය කරනු ලබන අතර උචිත නම් ගළපනු ලැබේ.

3.5.1.5 හඳුනා නොගැනීම

බැහැර කිරීම්, මත හෝ භාවිතයෙන් බැහැරලීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කර නොමැති විට දේපළක, යන්ත්‍රෝපකරණවල සහ උපකරණවල අයිතමයක සාධාරණ අගය හඳුනාගනු ලබන්නේ නැත. දේපළකින්, යන්ත්‍රෝපකරණයකින් සහ උපකරණයකින් ඇතිවන ලැබීම් හෝ හානිවීම්, අයිතමය හඳුනා නොගන්නා විට ලාභයට හෝ අලාභයට ඇතුළත් කරනු ලබයි.

3.5.1.6. හානිකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇතිවිය හැකි බලපෑම ද සළකා බලා 2020 දෙසැම්බර් 31 දින වන විට දේපළ යන්ත්‍රෝපකරණ හා උපකරණවලට ඇතිවිය හැකි හානිකරණ හානි ප්‍රමාණය අගයා තිබේ. එම ඇගයීම පදනම් කරගෙන, දේපළ යන්ත්‍රෝපකරණ හා උපකරණ (2020 - නැත) ලෙස දක්වා ඇති හෙයින් මූල්‍ය ප්‍රකාශවලට කිසිදු හානිකරණ ප්‍රතිපාදනයක් ඇතුලත් කිරීමට අවශ්‍යතාවක් නොමැත.

3.5.1.7 කාරක ප්‍රාග්ධනය

කාරක ප්‍රාග්ධනය පිරිවැයෙහි සඳහන් කරනු ලබයි. මෙම වියදම් ගොඩනැගිලි ඉදිකිරීමේදි, අපේක්ෂික ප්‍රාග්ධනකරණයේ දී සෘජුවම ප්‍රාග්ධනයක ස්වභාවයේ වියදම් වෙයි.

3.5.2 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට අත්කර ගත හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒම සහ පිරිවැය සත්‍ය වශයෙන්ම අගැයීමට හැකි බවට සම්භාවිතාවයක් ඇත්නම් එම අස්පෘශ්‍ය වත්කම් පිළිගනු ලබයි.

3.5.2.1 කීර්තිනාමය

පරිපාලිත සමාගම් අත්කර ගැනීම මත ඇතිවන කීර්තිනාමය අඩු පිරිවැය සමුච්චිත හානිකරණ අලාභවලට අගයනු ලැබෙයි.

කීර්තිනාමයට හානිවීම

ව්‍යාපාර සංයෝජනයකින් අත්කර ගන්නා කීර්තිනාමයට හානි සහ ධාරණ අගයට හානිවී ඇති බව යම් යම් සිදුවීම් වලින් පෙන්නුම් කරන විට වාර්ෂික පරීක්ෂා කරනු ලබයි. කීර්ති නාමයට අදාළ වන සෑම මුදල් උපයන ඒකකයකම ප්‍රතිලභ්‍ය අගය තක්සේරු කිරීම මඟින් කීර්තිනාමයේ සිදුවී ඇති හානිය නිශ්චය කරනු ලැබේ. මුදල් උපයන ඒකකයේ ප්‍රතිලභ්‍ය අගය එහි ධාරණ අගයට වඩා අඩුවන විට හානිකරණ අලාභයක් ලාභයේදී හෝ අලාභයේදී හඳුනා ගනු ලබයි .කීර්තිනාමයක හානිකරණ අලාභය ප්‍රතිවර්තනය කරනු නොලැබෙයි.

3.5.2.2 මෘදුකාංග

සමුහය විසින් අත්කර ලනු ලබන සහ සීමිත ඵලදායි ජීවිත කාලයක් ඇති අනෙකුත් අස්පෘශ්‍ය වත්කම් අඩු පිරිවැය සමුච්චිත හිලව් කිරීමට සහ යම් සමුච්චිත හානිකරණ අලාභවලට ප්‍රමාණනය කරනු ලබයි. සීමිත ඵලදායි ජීවිත කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්, එම වත්කම් හානිවීමට ලක්විය හැකි බවට පෙනෙන්නට ඇති අවස්ථාවක දී හානිවීම සඳහා ඒවා තක්සේරු කරනු ලබයි. අවිනිශ්චිත ඵලදායි ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් තනි තනිව හෝ මුදල් උපයන ඒකක මට්ටමින් හානිවීම සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලබයි.

වාර්තාකරණ දිනට අනෙකුත් අස්පෘශ්‍ය වත්කම් මෙන්ම වෙනම අත්කරගත් මෘදුකාංග සමාගම සතු වෙයි.

පසුව එන වියදම්

මෘදුකාංග මත පසුව එන වියදම් ඊට අදාළ විශේෂිත වත්කමක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ එම මෘදුකාංගය මඟින් වර්ධනය කරනු ලබන විට පමණක් එය ප්‍රාග්ධනීකරණය කරනු ලබයි.අනෙකුත් සියලුම වියදම් එම වියදම් දරනු ලබන ආකාරය අනුව ලාභ හෝ අලාභ මිලදී ගනු ලබයි.

ක්‍රමක්ෂය

තක්සේරු කළ ඵලදායි අගයේ සෘජු මාර්ග ක්‍රමය භාවිතා කරමින් ඒවායෙහි තක්සේරු කළ අවශේෂ වටිනාකමට වඩා අඩු වටිනාකමක් ඇති අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය පොතෙන් කපාහැරීම සඳහා හිලව් කිරීම් ගණනය කරනු ලබන අතර ඒවා ලාභයේදී හෝ අලාභයේදී හඳුනාගනු ලබයි. මෘදුකාංග වල තක්සේරු කළ ඵලදායි ජීව කාලය වසර පහකි. ඵලදායි ජීව කාල සහ අවශේෂ වටිනාකම් සෑම වාර්තාකරණ දිනයකටම සමාලෝචනය කරනු ලබන අතර උචිත අවස්ථාවලදී ගැළපීම් කරනු ලබයි.

හඳුනා නොගැනීම

බැහැරලීම මත හෝ භාවිතයෙන් හෝ බැහැරලීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කර නොමැති විට අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොග නියි. එම අස්පෘශ්‍ය වත්කම් හඳුනා නොගැනිමෙන් වන ලැබීම් හෝ අලාභය, එම අයිතමය හඳුනා නොගන්නා අවස්තාවේදි ලාභයට හෝ අලාභයට ඇතුලත් කරනු ලැබේ.

සමූහය විසින් 2020 දෙසැම්බර් 31 වන දින වන විට කොවිඩ් - 19 මඟින් ඇති වූ බලපෑම ඇතුළුව අස්පෘශ්‍ය වත්කම්වලට විය හැකි හානිකරණ දර්ශක තක්සේරු කොට ඇත. එම ඇගයීම අනුව, කිසිදු හානිකරණ දර්ශකයක් හඳුනා නොගැනිණි.

3.5.3 බද්දට දුන් වත්කම්

SLFRS 16 මඟින් LKAS 17 කල්බදු අවලංගු වන අතර, IFRIC 4 මඟින් යම් ගිවිසුමක් තුළ කල්බද්දක් අන්තර්ගත වේ ද යන්නත්, SIC-15 ක්‍රියාත්මක වන කල්බදු) වරප්‍රසාද සහ SIC-27 කල්බද්දක නෛතික ස්වරූපය ගන්නා ගනුදෙනුවල හරය විනිශ්චය කිරීම සිදුවේ. මෙම ප්‍රමිතිය මඟින් කල්බදු හඳුනා ගැනීම, නිර්ණය කිරීම, ඉදිරිපත් කිරීම සහ හෙළි කිරීම, සහ බදුකරුවන්ට සියලූ කල්බදු ගිණුම් තනි ශේෂ පත්‍ර ආකෘතියක් (single on balance sheet model) තුළ ගිණුම්ගත කිරීමට කටයුතු සළසයි. සමූහය විසින් 2018 වාර්තාකරණ කාල සීමාවට අදාළ ආනුෂංගික නැවත නොදක්වමින්, එම ප්‍රමිතියේ විශේෂ සංක්‍රාන්තික ප්‍රතිපාදනවල අවසරය යටතේ 2019 ජනවාරි 1 දින සිට අතීතයට බලපාන අන්දමින් SLFRS 16 භාවිතයට යොදාගෙන ඇත.

ගිවිසුම ආරම්භ කරන අවස්ථාවේ, සමූහය විසින් යම් ගිවිසුමක් යනු, හෝ ඊට අන්තර්ගතව කල්බද්දක් ද/ පවතියිද යන්න නිර්ණය කරයි. යම් ගිවිසුමක්, ඊට අන්තර්ගතව කල්බද්දක් නම්/ පවතියි නම් එම ගිවිසුම මඟින් හඳුනා ගත් වත්කමක් භාවිතා කිරීම යම් ප්‍රතිෂ්ඨාවක් මත යම් කාල සීමාවකට පාලනය කිරීමට අයිතිය ලබා දෙයි. යම් ගිවිසුමක් මඟින් හඳුනාගත වත්කමක් පාලනය කිරීමට අයිතිය ලබා දෙන බව නිර්ණය කිරීමට සමූහය විසින්,

- ගිවිසුමට හඳුනාගත් වත්කමක් හවුල් වන්නක් ද යන්න
- සමාගමට එම වත්කම භාවිතා කරන මුළු කාල සීමාව පුරාවටම එහි සියලූ හරයාත්මක ආර්ථිකමය වාසි ලබා ගැනීමට අයිතිය තිබේ ද යන්න
- එම වත්කම භාවිතා කිරීමට ඇති අයිතිය හැසිරවීමට සමාගමට අයිතිය ඇති ද යන්න බලයි.

සමූහය විසින් වත්කම් භාවිත කිරීමේ අයිතිය හා කල්බදු ආරම්භ වන දිනයේ කල්බදු වගකීමක් ද හඳුනා ගනියි. සමූහයේ වත්කම් භාවිත කිරීමේ අයිතියට මීට පෙර LKAS 17 යටතේ ක්‍රියාත්මක වූ කල්බදු මත පැවති දේපළ අයත් වේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

මූලික හඳුනා ගැනීම
සමූහය විසින් වත්කම් භාවිත කිරීමේ අයිතිය හා කල්බදු ආරම්භ වන දිනයේ කල්බදු වගකීමක් ද හඳුනා ගනියි. වත්කම් භාවිත කිරීමේ අයිතිය පළමුව වියදම්, එනම් කල්බදු වගකීමේ මුල් මුදල් ප්‍රමාණය එම කල්බද්ද ආරම්භ වීමට පෙර හෝ පසු දිනක සිදු කළ ඕනෑම කල්බදු ගෙවීමක් සමඟ ගලපා, ඊට ඇතිවූ ඕනෑම සෘජු වියදමක් සහ ඊට පාදක වූ වත්කම හෝ එය අඩංගු භූමිය කොටස් කිරීමට සහ ඉවත් කිරීමට හෝ ප්‍රතිෂ්ඨාපනය කිරීමට වූ වියදම් ඇස්තමේන්තුවක් එකතු කොට ඊට ලැබුණු ඕනෑම කල්බදු දිරි දීමනාවක් අඩු කොට ගණනය කෙරෙයි.

කල්බදු වගකීම පළමුව කල්බද්ද ආරම්භ වූ දිනයේ නොගෙවූ කල්බදු ගෙවීම්වල වර්තමාන අගයට, කල්බද්දට ඇතුලත් පොලී අනුපාත භාවිතා කොට වට්ටමක් දීම මගින් හෝ, එම අනුපාතය නිසි ලෙස නියම කළ නොහැකිනම්, සමූහයේ වර්ධනය වන ණය ගැනීමේ අනුපාතය භාවිතා කරමින් ගණනය කෙරේ.

යම් අනුබද්ධ සමාගමකට සමාගම විසින් කුලියට ලබාදුන් දේපලක් සම්බන්ධයෙන් වත්කම් භාවිතා කිරීමේ අයිතියක් පවතියි නම්, එවැනි වත්කම් භාවිතා කිරීමේ අයිතියක් හෝ කල්බදු වගකීමක් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවලින් ඉවත් කෙරේ.

දෙවනුව ගණනය කිරීම
වත්කම් භාවිතා කිරීමේ අයිතිය දෙවනුව කල් බද්ද ආරම්භ වූ දිනයේ සිට වත්කම් භාවිතා කිරීමේ අයිතියේ ඵලදායි ජීව කාල අවසානය දක්වා හෝ කල් බදු කාල සීමාවේ අවසානය දක්වා සරල මාර්ග ක්‍රමය යොදා ගෙන ක්ෂය කෙරේ. ඇස්තමේන්තුගත නිසි ලෙස භාවිත කළ හැකි වත්කම් භාවිතා කිරීමේ අයිතිය දේපළ සහ උපකරණ ගණනය කරන ආකාරයෙන්ම තීරණය කරනු ලැබේ. ඊට අමතරව, වත්කම් භාවිතා කිරීමේ අයිතිය කලින් කලට හානිකරණ හානි තිබේ නම් මගින් අඩු කෙරෙන අතර, කල්බදු වගකීමේ සමහර වෙනස්කම් මත ගැලපීම් සිදු කෙරේ.

කල්බදු අයිතිය සරල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය වියදම් මත ගණනය කෙරේ. එය අනාගත කල්බදු ගෙවීම්වල දර්ශකයක් හෝ අනුපාතයක වෙනසක් හේතුවෙන් ඇතිවන වෙනස්කමක් හෝ, තක්සේරු කරන ලද අවශේෂ වටිනාකම් යටතේ ගෙවිය යුතු මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් සමූහයේ ඇස්තමේන්තු කිරීම වෙනස් වීම හේතුවෙන් හෝ, සමූහය මිලදී ගැනීමක්, දීර්ඝ කිරීමක් හෝ අවසන් කිරීමක් සම්බන්ධයෙන් එහි ඇගයීමක් වෙනස් කළහොත් මත නැවතත් ගණනය කෙරේ.

භාවිත කිරීමේ අයිතිය ඇති වත්කම් හානිකරණය වීම
වාර්තාකරණ දිනය වන විට, එක් එක් ව්‍යාපාර ඒකකය විසින් හැකිතාක් සමාගම් අවදානම් කළමනාකරණ උපායමාර්ග අනුව ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාමේ සැලසුම් යටතේ රජය විසින් ලබා දී ඇති මාර්ගෝපදේශවලට සහය දෙමින් සහ ඒවාට අනුගත වෙමින් කටයුතු කළ හෙයින් භාවිත කිරීමේ අයිතිය ඇති වත්කම් කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් කිසිදු හානිකරණය වීමක් සමූහය විසින් හඳුනා ගෙන නොමැත.

3.5.4 ආයෝජන දේපළ
ආයෝජන දේපළක් යනු කුලී ආදායමක් ලැබීමට හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම සඳහා හෝ ඒ දෙක සඳහාම හෝ හිමිකරගත් දේපළක් වෙයි. ආයෝජන දේපළ මූලික වශයෙන් පිරිවැයෙන් අගයනු ලබන අතර ලාභයේදී හෝ අලාභයේදී හඳුනා ගන්නා එහි කවර හෝ වෙනස්කමක් සහිත සාධාරණ අගයට අගයනු ලබයි.

ආයෝජන දේපළ , ඒවායින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකිරීම හේතුවෙන් බැහැර කරනු ලැබ හෝ ස්ථිරවම භාවිතයෙන් ඉවත් කර ඇතිවිට හඳුනා නොගනියි. ආයෝජන දේපළක් මත කවර හෝ ලැබීමක් හෝ හානියක් (බැහැරලීමේ ශුද්ධ උත්පාදන සහ අයිතමයේ ධාරණ අගය අතර ලෙස ගණනය කරන ලද) ලාභයේදී හෝ අලාභයේදී හඳුනා ගනු ලබයි. පූර්වයෙන් දේපළ යන්ත්‍රෝපකරණ සහ උපකරණ ලෙස වර්ගීකරණ කරන ලද දේපළක් විකුණන ලබන විට, ප්‍රති ඇගයීම් සංචිතයට ඇතුළත් කවර හෝ අදාළ ප්‍රමාණයක් වෙත්නම් එය රඳවාගත් ආදායම්වලට හුවමාරු කරනු ලබයි.

භාවිතයේ වෙනසක් ඇතිවිට ආයෝජන දේපළවල හුවමාරු සිදු කරනු ලබයි. පරිපාලිත සමාගමක ආයෝජන දේපළවලින් සැළකිය යුතු කොටස් සමූහ සමාගම විසින් බුක්ති විඳිනු ලබන විට, එම දේපළ, දේපළ යන්ත්‍රෝපකරණ සහ උපකරණ ලෙස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයේදී ශ්‍රී.ලං.ගි.ප්‍ර 16 - 'දේපළ, යන්ත්‍රෝපකරණ හා උපකරණ' ලෙස සළකනු ලැබේ.

3.5.5 මූල්‍ය නොවන වත්කම්වල හානි
සෑම වාර්තා කරන දිනයකදීම සමූහය විසින් එහි මූල්‍ය නොවන වත්කම්වල ධාරණ අගය (ආයෝජන දේපළ හැර, භාණ්ඩ ලේඛන සහ විලම්භිත බදු) එම වත්කම්වලට යම්කිසි හානියක් සිදුවීමට ඇති බව පෙන්නුම් කරන්නේද යන්න නිශ්චය කර ගැනීම සඳහා සමාලෝචනය කරනු ලබයි. එවැනි යම් සලකුණක් දක්නට ලැබෙන්නේ නම් එම වත්කමේ අයකර ගත හැකි අගය තක්සේරු කරනු ලබයි. කීර්තිනාමය ඊට සිදුවිය හැකි හානි සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලබයි.

වත්කමක අයකර ගත හැකි අගය හෝ මුදල් උපයන ඒකකය (CGU) එහි භාවිත අගයට සහ එහි සාධාරණ අගයට වඩා වැඩිනම් ඒවා විකිණීමෙන් වියදම් අඩුවෙයි. භාවිත අගය තක්සේරු කිරීමේදී, මුදලේ කාලීන අගයේ සහවත්කමට හෝ මුදල් උපයන ඒකක (CGU)ට ඇති නිශ්චිත අවදානම්වල ප්‍රවර්තන වෙළඳපල තක්සේරුව පෙන්නුම් කරන පූර්ව බදු වට්ටම් අනුපාතයක් භාවිතා කරමින් තක්සේරු කරන ලද අනාගත මූලය ප්‍රවාහ ඒවායෙහි වර්තමාන අගයට වට්ටම් කරනු ලබයි.

වත්කමක හෝ මුදල් උපයන ඒකකයක (CGU) ධාරණ අගය එහි අයකරගත හැකි අගයට වඩා වැඩි වන්නේ නම් හානිකරණ අලාභයක් හඳුනා ගනු ලබයි. හානිකරණ අලාභ ලාභයේදී හෝ අලාභයේදී හඳුනාගනු ලබයි. මුලින්ම මුදල් උපයන ඒකකයට (CGU) අනුමත කරනු ලැබ ඇති කවර හෝ කීර්තිනාමයක ධාරණ අගය අඩු කිරීමටත් ඉන්පසුව මුදල් උපයන ඒකකය (CGU) අනෙකුත් වත්කම්වල ධාරණ අගය අඩු කිරීමටත් ඉන්පසුව මුදල්

උපයන ඒකකය (කඩඹ) අනෙකුත් වත්කම්වල ධාරණ අගයන් සමානුපාතික පදනමක් මත අඩුකිරීමටත් අනුමත කරනු ලබයි.

අනෙකුත් වත්කම් සඳහා හානිකරණ අලාභයක් ප්‍රතිවර්තනය කරනු ලබන්නේ, වත්කම්වල හානිකරණ අලාභයක් හදුනාගෙන නොතිබුනේ නම් වත්කමේ ධාරණ අගය නිශ්චය කරනු ලැබ තිබෙන ධාරණ අගයට ශුද්ධ ක්ෂය හෝ හිලව් අගය දක්වා පමණක් වෙයි.

3.5.6 භාණ්ඩ ලේඛන

භාණ්ඩ ලේඛනවලට, අඩු පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි අගය යටතේ දක්වනු ලබන පාරිභෝජන භාණ්ඩ ඇතුළත් වෙයි.

සමූහය සතු භාණ්ඩ ලේඛනවල ස්වභාවය පරීක්ෂා කිරීමෙන් අනතුරුව, කොවිඩ් - 19 මගින් ඇති වූ අනුමිතීන් හේතුවෙන් වූ යම් බලපෑමක් හේතුවෙන් ඒවායේ ශුද්ධ උපලබ්ධි කළ හැකි අගයට කිසියම් බලපෑමක් සිදු ව ඇත් නම් භාණ්ඩ ලේඛනවල ධාරණ අගය ගැලපීමක් සිදු කිරීමට අවශ්‍යද යන්න සමූහය විසින් ඇස්තමේන්තු කර තිබේ. භාණ්ඩ ලේඛනවල ධාරණ අගය අඩු කර ගැලපීමට අවශ්‍ය වන්නා වූ කිසිදු අවස්ථාවක් සමූහය විසින් හඳුනා ගෙන නොමැත.

3.5.7 මූල්‍ය උපකරණ LKS39

ව්‍යුත්පන්න නොකළ වත්කම්, සමූහය විසින් පහත සඳහන් පරිදි වර්ගීකරණය කරනු ලබයි. එනම් විකිණීමට ඇති මූල්‍ය වත්කම් ,ණය සහ අයවීම් කල්පිරීමට අත්හිටුවා ඇති මූල්‍ය වත්කම් හා ලාභය හෝ අලාභය අතුරින් සාධාරණ අගයේ දී මූල්‍ය වත්කම් ලෙසින්ය.

සමූහය ව්‍යුත්පන්න නොකළ මූල්‍ය වගකීම්, අනෙකුත් මූල්‍ය වගකීම් කාණ්ඩ ලෙසින් වර්ගීකරණය කරයි.

3.5.7.1 ව්‍යුත්පන්න නොකළ මූල්‍ය වත්කම්

මූල්‍ය වශයෙන් ආරම්භක දිනයේම නිකුත් කරන ලද ණය හා අයවීම් සහ ණය සුරුකුම් සමූහය විසින් හඳුනා ගනු ලබයි. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභය හෝ අලාභය අතුරින් සාධාරණ අගයේදී නම් කරන ලද වත්කම් ඇතුළුව) මූලික වශයෙන්,එම උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශවයක් බවට සමූහය පත්වන වෙළඳ දිනයේ පිළිගනු ලබයි.

මූලික වශයෙන් මූල්‍ය වත්කමක්, එහි සාධාරණ අගය සමඟ අලාභ හෝ අලාභය අතුරින් සාධාරණ අගයක් නොමැති වත්කමක් හඳුනා ඒය අත්කර ගැනීමේදි සහ නිකුත් කිරීමේදී සෘජුව ම ආරෝපණය වන හුවමාරු පිරිවැය ද එකතුව අගයනු ලබයි.

මූල්‍ය වත්කමක් එයින් ලැබෙන මුදල් ප්‍රවාහවලට ඇති ගිවිසුම්ගත අයිතියක් අවසන්වන විට හෝ මූල්‍ය වත්කමේ හිමිකාරිත්වයේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සත්‍ය වශයෙන් ම හුවමාරු කරනු ලබන හුවමාරුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබා ගැනීමට ඇති අයිතිය හුවමාරු කරන විට සමූහය විසින් එය හඳුනා ගනු නොලබයි. සමූහය විසින් ඇති කරනු ලබන හෝ රඳවාගනු ලබන හුවමාරු කරන මූල්‍ය වත්කමක පොලිය වෙනම වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගනු ලබයි.

වටිනාකම හිලව් කිරීමට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධිය කිරීමට සහ ඊට සමගාමීව වගකීම පියවීමට නීත්‍යානුකූලව බලාත්මක අයිතියක් සමූහයට පවතින්නේ නම් පමණක් මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශවල ඉදිරිපත් කරනු ලබයි.

පසුව කරන අගැයීම්

(අ) විකිණීමට ඇති මූල්‍ය වත්කම් (AFS)

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන යනු වෙළඳාම සඳහා රඳවා ගෙන ඇති ලෙස වර්ගීකරණය නොකරන ලද හා ලාභ හෝ පාඩු තුලින් සාධාරණ අගයක් නියම කර නැති ආයෝජන වේ.

මූලික අගැයීමෙන් පසු විකිණීමට ඇති මූල්‍ය ආයෝජන සාධාරණ අගයේදී මනිනු ලබන එහි වෙනස්කම්, අනෙකුත් විස්තීර්ණ ආදායම් වලදි හඳුනාගනු ලබන අතර විකිණීමට ඇති සංචිතයට සමුච්චිත කරනු ලබයි. මෙම වත්කම් හඳුනා නොගන්නා විට සාමාන්‍ය කොටස්වල ලැබීම් හෝ අහිමිවීම් ලාභ හෝ අලාභ ලෙස නැවත වර්ගීකරණය කරනු ලබයි.

විකිණීමට ඇති මූල්‍ය වත්කම් ආසන්න කාලයේදී අලෙවි කිරීමේ හැකියාව සහ අභිලාශය තවමත් උචිතද යන්න නිශ්චය කර ගැනීමට සමූහය විසින් එහි තිබෙන විකිණීමට ඇති මූල්‍ය වත්කම් ඇගයීමක් සිදු කරනු ලබයි. අක්‍රිය වෙළඳපොළ සහ කළමනාකරණය හේතුවෙන් මෙම මූල්‍ය වත්කම් විකිනීමට සමූහයට හැකියාවක් නොමැති විට, ඉදිරි අනාගතයේදී එම වත්කම් දුලබ සංසිද්ධීන් ලෙස වර්ගීකරණය කිරීමට සමූහය විසින් තෝරා ගනු ඇත. මූල්‍ය වත්කම් ණය සහ අයවීම් ලෙස අර්ථ දක්වනු ලබන විට සහ මෙම වත්කම් ඉදිරි අනාගතය සඳහා හෝ කල්පිරෙනතුරු රඳවා ගැනීමේ අභිලාෂයක් සහ හැකියාවක් කළමනාකරණයට තිබෙන විට ඒවා ණය සහ අයවීම් ලෙස ප්‍රතිවර්ගීකරණයට අවසර ලබා දෙයි. මූල්‍ය වත්කම කල් පිරෙනතුරු රඳවා ගැනීමේ හැකියාව සහ අභිලාෂය ආස්ථිත්වයට තිබෙන විට පමණක් කල්පිරෙන තුරු රඳවාගත් ලෙස වර්ගීකරණය කිරීමට අවසර දෙනු ලබයි.

සමුහයේ විකිණීමට ඇති මූල්‍ය වත්කම් ආයෝජනය සඳහා රඳවා ගෙන ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය නොකරනු ලබනවා මෙන්ම ඒවා ලාභය සහ අලාභය අතුරින් සාධාරණ අගයේදී නම් නොකරනු ලබන සාමාන්‍ය කොටස් සහ ණය සුරුකුම් වලින් සමන්විත වෙයි.

(ආ) ලාභය හෝ අලාභයේ අතුරින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් (FVTPL)

මූල්‍ය වත්කමක් ලාභය හෝ අලාභය අතුරින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කමක් ලෙසින් වර්ගීකරණය කළ හැක්කේ එය වෙළඳාම සඳහා රඳවා ගෙන ඇති ලෙස වර්ගීකරණය කර මූලික හඳුනාගැනීමේදී එය එසේ නම් කරනු ලැබ ඇති විටයි. සෘජුවම අත්කරගත හැකි හුවමාරු පිරිවැය ලාභයේදී හෝ අලාභයේදී වියදමක් ලෙස හඳුනාගනු ලබයි. ලාභය හෝ අලාභය අතුරින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම්, ලාභයේදී හෝ අලාභයේදී හඳුනා ගනු ලබන කවර හෝ පොලියක් හෝ ලාභාංශයක් ද ඇතුළත් එහි සාධාරණ අගයේදි සහ එහි වෙනස්වීම් වලදී අගයනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

වත්කම් හා වගකීම් යනු සමූහය විසින් කළමනාකරණය කරනු ලබන එහි මූල්‍ය වත්කම්, මූල්‍ය වගකීම් හෝ ඒ දෙකම හෝ වන අතර සමූහයේ ආයෝජන උපාය මාර්ගයට අනුව ඒවායෙහි කාර්ය සාධනය සාධාරණ අගය පදනම මත අගයනු ලබයි. සමූහයේ ලාභය හෝ අලාභය අතුරින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම්, ලැයිස්තුගත සාමාන්‍ය කොටස් ආයෝජන වලින් සමන්විත වෙයි.

(ඇ) කල්පිරෙන තුරු රඳවාගෙන සිටින මූල්‍ය වත්කම් (HTM)
මෙම මූල්‍ය වත්කම් ස්ථාවර සහ නිශ්චය කරනු ලැබිය හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොකළ වත්කම් වන අතර සමූහයට එම වත්කම් කල්පිරෙනතුරු රඳවා ගැනීමේ අභිලාෂය සහ හැකියාව තිබෙන විට ස්ථිර කල්පිරීම්, කල්පිරීම සඳහා රඳවාගත් ලෙස වර්ගීකරණය කරනු ලබයි. මෙම වත්කම් මූලික වශයෙන් සාධාරණ අගය සමඟ කවර හෝ සෘජුව අත්කර ගත හැකි හුවමාරු පිරිවැයද එකතුව හඳුනා ගනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් පසුව, එම වත්කම් ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් හිලව් කිරීමේ පිරිවැයේදි අගයනු ලැබේ.

කල්පිරීම සඳහා රඳවාගත් මූල්‍ය වත්කම් භාණ්ඩාගාර බිල්පත් වලින් හා සමූහය විසින් කරනු ලැබ ඇති භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනවලින් සමන්විත වෙයි.

(ඈ) ණය සහ අයවිය යුතු වත්කම්
ණය සහ අයවිය යුතු වත්කම් යනු ,මූල්‍ය සක්‍රිය වෙළඳ පොළ හදුන්වා නොදෙන ස්ථාවර හෝ නිශ්චය කරනු ලැබිය හැකි මූල්‍ය වත්කම් වේ. මෙම වත්කම් මූලික වශයෙන් සාධාරණ අගය සමඟ කවර හෝ සෘජුව අත්කරගත හැකි හුවමාරු පිරිවැය ද එකතුව හඳුනාගනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් හිලව් පිරිවැයේදී ණය සහ අයවීම් අගයනු ලබයි.

ණය සහ අයවීම්, සඳහන් නොකරණු ණය, කාල තැන්පතු වත්කම් ඇප සුරුකුම්පත්. සංවර්ධන බැදුම්කර. වාණිජ නෝට්ටු අනෙකුත් ණය සහ අයවීම්, මුදල් සහ මුදල් සමතාවලින් සමන්විත වෙයි.

◆ **ලැබිය යුතු ප්‍රතිරක්ෂණ**
සමූහයේ සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලියේදී ඇතිවන රක්ෂණ අවදානම් හඳුනා ගැනීම විධිමත් රක්ෂණ සැලසුම්වලට පවරා දෙයි.

ප්‍රතිරක්ෂණ වත්කම්වලට,ගෙවූ සහ නොගෙවූ අලාභ සඳහා ප්‍රතිරක්ෂණ සමාගම්වලින් අයවීමට ඇති ශේෂ වලින් සහ අලාභ ගැළපීමේ වියදම් ඇතුළත් වෙයි. ප්‍රතිරක්ෂකයින්ගෙන් අයකරගැනීමට ඇති ප්‍රමාණ ප්‍රතිරක්ෂකයින්ගේ ප්‍රතිපත්ති ආශ්‍රිත නොපියවූ හිමිකම් ප්‍රතිපාදන, නොපියවූ ප්‍රතිපාදන හා සංස්ථිතික ආකාරයකට සහ අදාළ ප්‍රතිරක්ෂණ ගිවිසුමට අනුව ඇස්තමේන්තු කරනු ලබයි.

ප්‍රතිරක්ෂණ හිලව් කිරීමේ හිමිකමක් නොපවතින්නේ නම්, මූල්‍ය ප්‍රකාශයේ ප්‍රතිරක්ෂණයක් දළ වශයෙන් වාර්තා කරනු ලබයි.

ප්‍රතිරක්ෂණ වත්කම්, වාර්තාකරණ වර්ෂය තුළදී හානිකරණයක සලකුණු දකින්නට ඇති විට, සෑම වාර්තාකරණ දිනයකදීම හෝ නිතර නිතර හානිකරණ සඳහා සමාලෝචන කරනු ලබයි. ප්‍රතිරක්ෂණ වත්කම් මූලික වශයෙන් හදුනාගැනීමෙන් පසුව සිදුවන සිදුවීමක ප්‍රතිඵල ලෙස, ගිවිසුමේ කොන්දේසි යටතේ අයවීමට ඇති සියලුම නොපියවූ ප්‍රමාණ සමූහයට නොලැබිය හැකි බවට පරාමාර්ථික සාක්ෂි ඇති විට සහ එම සිදුවීමෙන් ප්‍රතිරක්ෂකගෙන් සමූහයට ලැබීමට ඇති ප්‍රමාණ මත සත්‍ය වශයෙන්ම සැලකිය යුතු බලපෑමක් ඇති විට හානිකරණයක් සිදුවෙයි. කවර හෝ හානිකරණ අලාභයක් ලාභ වල හෝ අලාභවල වාර්තා කරනු ලබයි.

පවරන ලද ප්‍රතිරක්ෂණ සැලසුම් ඔප්පු හිමියන්ට සමූහයේ ඇති බැදීම් වලින් සමූහය මුදා හැරීමක් සිදු නොකරයි.

ගිවිසුම්ගත අයිතිවාසිකම් ශූන්‍ය වූ විට හෝ ඉකුත් වූ විට හෝ ගිවිසුම වෙනත් පාර්ශවයකට පවරනු ලැබ ඇති විට ප්‍රතිරක්ෂණ වත්කම් හා වගකීම් පිලිනොගනියි.

◆ **ලැබිය යුතු රක්ෂණ වාරික**
ලැබිය යුතු රක්ෂණ අයවීමට ඇති විට සහ ලැබිය යුතු ප්‍රමාණ සලකා බැලීමේ සාධාරණ අගයේදී මූලික හදුනාගැනීම මත ඒවා අගයනු ලැබ ඇති විට හඳුනා ගනු ලැබේ. රක්ෂණ වාරික අයකර ගත හැකි බව ඉදිරියට යන ක්‍රියාවලියක පදනමින් සමාලෝචනය කරනු ලබයි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCS) විසින් නිකුත් කරන ලද රක්ෂණ වාරික ගෙවීමේ ප්‍රතිශ්‍රාහාර (PPW) නියමවලට අනුව ජීවිත රක්ෂණ ඔප්පු, රක්ෂණ වාරික ගෙවීමේ ප්‍රතිශ්‍රාහාරයන්ට (PPW) යටතේ නිකුත් කරනු ලැබ ඇති අතර රක්ෂණ වාරික නොපියවන්නේනම් දින 90 ක් ඉකුත්වීමෙන් පසු අවලංගු කරනු ලබයි.

ජීවිත රක්ෂණ, වාරික උපචිත පදනම මත සමාගම විසින් ගිණුම්ගත කරනු ලැබෙයි. අයවීමට ඇති ජීවිත රක්ෂණ වාරික (දින 30 ක සහන කාලසීමාව තුළ අයවීමට ඇති රක්ෂණ වාරික පමණි) සෑම වාර්තාකරණ දිනකදීම හදුනා ලබන අතර අනතුරුව එළඹෙන මාසයේදී රක්ෂණ වාරික පියවන්නේ නැත්නම් ඒවා ප්‍රතිවර්තනය කරනු ලබන අතර එසේම, සමාගමේ ප්‍රතිපත්ති අනුව එම ඔප්පු අවලංගු වී යයි.

සමූහය විසින් කොවිඩ් - 19 මගින් ඇති වූ ආර්ථික අනුමිතීන් සළකා බලමින් 2020 දෙසැම්බර් 31 වන දිනට අයවිය යුතු රක්ෂණ වාරිකව ල හානිකරණ හානි අගයා තිබේ. එම අගැයීම මත පදනම් ව, වාර්තාකරණ දිනය වන විට අයවිය යුතු රක්ෂණ වාරික සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශවලට කිසිදු හානිකරණ ප්‍රතිපාදනයක් ඇතුලත් කිරීම අවශ්‍ය නොවේ.

◆ **අදාල පාර්ශවයන් ගෙන් අයවිය යුතු අනෙකුත් අයවීම් සහ හිඟ අයවීම්**
අදාල පාර්ශවයන්ගෙන් අයවිය යුතු අයවීම් සහ හිඟ බොල් සහ අඩමාන අයවිය යුතු අයවීම් සහ හිඟ අයවීම් සඳහා අඩු පිරිවැය දීමනාවලදී හදුනා ගනු ලබයි.

◆ **මුදල් සහ මුදල් සමානතා**
මුදල් සහ මුදල් සමානතා, ප්‍රතිවර්තන පත්‍ර මිලදී ගැනීමේ ගිවිසුම්, සාධාරණ අගයේ වෙනස්කම් කිරීමේ සැලකිය යුතු අවධානමකට යටත්වන සහ සමූහය විසින් එහි කෙටි ාලීන වගකීම් කළමනාකරණයේ භාවිතා කරනු ලබන අත්කරගත් දිනයේ සිට මාස 03 ක් හෝ ඊට අඩුවෙන් කල් පිරුණු මුදල් ශේෂ සහ ඒක්ෂණ තැන්පතුවලින් සමන්විත වෙයි.

3.5.7.2 ව්‍යුත්පන්න නොකළ මූල්‍ය වගකීම්

සමූහය මූලික වශයෙන් නිකුත් කරන ලද ණය සුරුකුම් සහ යටත් වගකීම් ඒවා ආරම්භ කරන ලද දිනයේදී හඳුනා ගනියි.

අනෙකුත් සියලුම වගකීම් වෙළඳ දිනයේ එනම් උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල සමූහය පාර්ශවකරුවෙකු වන දිනයේ දී පිළිගනු ලබයි. අනෙකුත් මූල්‍ය වගකීම් මූලික වශයෙන් කවර හෝ සෘජුවම අත්කර ගත හැකි හුවමාරු පිරිවැයකට අඩු සාධාරණ අගයේදී මනිනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් පසුව මෙම වගකීම්, ඵලදායි පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් හිලව් කරන ලද පිරිවැයේදී අගයනු ලබයි.

සමූහය විසින් මූල්‍ය වගකීමක්, එහි ගිවිසුම්ගත බැඳීම්වලින් නිදහස් කරනු ලබන විට, අවලංගු කරනු ලබන විට හෝ ඉකුත් වූ විට නැවත හඳුනා ගනු ලබයි.

අනෙකුත් මූල්‍ය වගකීම්, ණය හා ණය ගැණුම්, බැංකු අයිරා සහ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ප්‍රමාණයන්ගෙන් සමන්විත වෙයි.

3.5.8 මූල්‍ය වත්කම් වල හානිකරණ (ව්‍යුත්පන්න නොකළ)

ලාභය හෝ අලාභය අතුරින් සාධාරණ අගයට වර්ගීකරණය නොකළ මූල්‍ය වත්කම්, හානිකරණයේ පරමාර්ථික සාක්ෂියක් තිබේද, නැද්ද යන්න නිශ්චය කර ගැනීම සඳහා සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරු කරනු ලබයි.

මූල්‍ය වත්කම් හානිකරණයට ලක් වී ඇති බවට පරමාර්ථික සාක්ෂි වලට පහත දැ ඇතුලත්වේ. ණය ගැතියෙකු විසින් ණය ගෙවීම පැහැර හැරීම හෝ යුතුකම් පැහැර හැරීම:

- ණයගැතියෙකු හෝ රක්ෂකයෙකු වස්තු භංගත්වයට පක්වීමේ ලක්ෂණ පෙන්නුම් කිරීම
- ණය ලබාගත් අයගේ සහ රක්ෂකයින්ගේ ගෙවීමේ තත්ත්වයේ සැළකිය යුතු වෙනස්කම්.
- මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සුරුකුම් සඳහා සක්‍රිය වෙළඳපළ නැතිවී යාම හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක අපේක්ෂිත මුදල් ප්‍රමාණයන් හි මැනිය හැකි අඩුවීමක් තිබෙන බවට නිරීක්ෂණය කල හැකි දත්ත පැවතීම.
- විකිණීම සඳහා පවතින වශයෙන් වර්ගීකරණය කර ඇති කොටස් ආයෝජනයන් හිදි, ආයෝජනයක සාධාරණ අගය එහි පිරිවැයට අඩුවෙන් පවතින විට "සැලකිය යුතු" හෝ "දීර්ඝකාලීන" යනුවෙන් ද ඇතුලත් විය හැක. "සැලකිය යුතු" හෝ "දීර්ඝකාලීන" යන්න තීරණය කිරීමේදි විනිශ්චයක් සිදු කිරීම අවශ්‍ය වේ.

3.5.8.1 හිලව්කරන ලද පිරිවැය දරාගත් මූල්‍ය වත්කම්

සමූහය, මෙම වත්කම් සඳහා තනි වත්කමකදී සහ සමූහ මට්ටමේදී හානිකරණ සාක්ෂි සලකා බලයි. තනිව ගත්කළ සුවිශේෂී වන සියලුම වත්කම් හානිකරණය සඳහා තනිව තක්සේරු කරනු ලබයි. හානිකරණයට ලක් නොවුණු බවට සොයා ගන්නා ලද සියලුම වත්කම් ඉන් පසුව වැය කරන ලද නමුත් මේ වන තෙක් තනිව හඳුනා නොගත් යම් හානිකරණයක් සඳහා සමූහ වශයෙන් තක්සේරු කරනු ලබයි. තනිව ගත් කළ සුවිශේෂී නොවන වත්කම් සමූහ වශයෙන් හානිකරණය සඳහා තක්සේරු කරනු ලබයි. සමූහ වශයෙන් තක්සේරු කිරීම එකම අවදානම් ලක්ෂණ සහිත වත්කම් සමූහයක් ලෙසට එකට එක් කරමින් සිදු කරනු ලබයි.

හානිකරණ අලාභයක්, වත්කමේ ධාරණ අගය සහ වත්කමේ ධාරණ අගය සහ වත්කමේ සැබෑ ඵලදායි පොලී අනුපාතයට වට්ටම් කරන ලද තක්සේරු කළ අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගය අතර වෙනස ලෙසින් ගණනය කරනු ලබයි. හානිකරණ, ලාභයේ දී හෝ අලාභයේදී හඳුනා ගනු ලබන අතර දීමනා ගිණුමක පෙන්නුම් කරනු ලබයි. හානිකරණ අලාභයක අගය පසුව අඩුවන්නේ නම් එම අඩුවීම, හානිකරණය සොයාගත් පසු සිදුවූ සිදුවීමකට විෂය මූලික වශයෙන් සම්බන්ධ විය හැකිය. එවිට පූර්වයෙන් හඳුනාගත් හානිකරණ අලාභය ලාභ හෝ අලාභ මඟින් ප්‍රතිවර්තනය කරනු ලබයි.

3.5.8.2 විකිණීමට ඇති මූල්‍ය වත්කම් (AFS)

විකිණීමට ඇති මූල්‍ය වත්කම් මත හානිකරණ අලාභ, ලාභයෙහි හෝ අලාභයෙහි විකිණීමට ඇති සංචිතයේ සමුච්චිත අලාභ ලෙස වර්ගීකරණය කරමින් හඳුනා ගනු ලබයි. එම ප්‍රතිවර්ගීකරණය කරන ලද අගය, අත්කර ගැනීමේ පිරිවැය (කවර හෝ ප්‍රධාන ප්‍රතිගෙවීමක සහ හිලව්කිරීමක ශුද්ධ අගය) සහ ලාභයේදී පූර්වයෙන් හඳුනා ගන්නා ලද කවර හෝ හානිකරණ අලාභයකට වඩා අඩු වර්තමාන සාධාරණ අගය අතර වෙනස වෙයි.

හානිකරණයට ලක්වූ ඇති ණය සුරුකුම්පතක සාධාරණ අගය පසුව වැඩිවන්නේ නම් එම වැඩිවීම, හානිකරණ අලාභය හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ සිදුවීමකට විෂය මූලිකව සම්බන්ධ විය හැකිය. එවිට එම හානිකරණ අලාභය, ලාභය හෝ අලාභය මඟින් ප්‍රතිවර්තනය කරනු ලබයි. සාමාන්‍ය කොටස් උපකාරකයක ආයෝජනයක විකිණීමට ඇති ලාභයේ හෝ අලාභයේ හඳුනා ගන්නා ලෙස වර්ගීකරණය කරන ලද හානිකරණ අලාභය, ලාභය හෝ අලාභය මඟින් ප්‍රතිවර්තනය කරනු ලබයි.

3.5.9 මූල්‍ය සාධන පත්‍ර - SLFRS 09

SLFRS 9 මූල්‍ය වත්කම්, මූල්‍ය වගකීම් සහ මූල්‍ය නොවන භාණ්ඩ මිලදී ගැනීම හෝ විකිණීම සඳහා වන සමහර ගිවිසුම් හඳුනා ගැනීම සහ මැනීම සඳහා අවශ්‍යතා දක්වා ඇත. මෙම ප්‍රමිතිය LKAS 39 මූල්‍ය සාධනපත්‍ර ප්‍රතිස්ථාපනය කරයි. මීට අමතරව, සමූහය විසින් SLFRS 07 මූල්‍ය සාධනපත්‍ර සඳහා ආනුෂංගික සංශෝධන සම්මත කර ගෙන ඇත. 2018 පිළිබඳ අනාවරණයන් සඳහා අදාළ වන නමුත් සාමාන්‍යයෙන් සංසන්දනාත්මක තොරතුරු සඳහා අදාල කර ගෙන නොමැත.

ක්‍රමක්ෂය පිරිවැය අනුව මැනීම, FVOCI සහ FVTP යනුවෙන් SLFRS 9 හි මූල්‍ය වත්කම් සඳහා ප්‍රධාන වර්ගීකරණ කාණ්ඩ තුනක් අඩංගු වේ. SLFRS 9 යටතේ මූල්‍ය වත්කම් වර්ගීකරණයට සාමාන්‍යයෙන් පදනම් වන්නේ මූල්‍ය වත්කමක් කළමනාකරණය කරන කරන ව්‍යාපාරික ආකෘතිය සහ එහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ මත ය. කල් පිරීම සඳහා පැවති, ණය සහ සහ ලැබීම් සහ විකිනීම සඳහා පවතින යන කලින් පැවති LKAS කාණ්ඩයන් SLFRS 9 මඟින් ඉවත් කර ඇත.

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දේ, මුදල් හා මුදල් සමානකම් සහ අදාළ පාර්ශවවලින් වන ලැබීම් යන කලින් LKAS 39 යටතේ ණය සහ ලැබීම් ලෙස වර්ගීකරණය කර ඇති දෑ LKAS 9 යටතේ ක්‍රමක්ෂය පිරිවැය ලෙස වර්ගීකරණය කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ මැනීම සඳහා LKAS 39 හි දැනට පවතින අවශ්‍යතාවන් SLFRS 09 මගින් විශාල වශයෙන් රඳවා ගෙන ඇති අතර එම ප්‍රමිතිය යොදා ගැනීම මගින් සමාගමේ මූල්‍ය වගකීම් සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට හැර සමුහය වෙත සැලකිය යුතු බලපෑමක් කර නැත.

3.5.10 විලම්භිත වියදම්,

විලම්භිත අත්කර ගැනීමේ පිරිවැය (DAC)

විලම්භිත අත්කරගැනීමේ පිරිවැය ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් සඳහා පමණක් අදාළ කරගත හැකිය. අත්කර ගැනීමේ පිරිවැය එක සැරේටම උපයාගත් ආදායමින් දරනු ලබන නිසා ජීවිත රක්ෂණ සඳහා විලම්භිත අත්කර ගැනීමේ ගණනය කිරීම සිදු නොකරයි.

රක්ෂණ ගිවිසුම් ලේඛනගත කිරීමේ හෝ අලුත් කිරීමේ කාලසීමාවේ දී දරනු ලබන සෘජු හෝ වක්‍ර පිරිවැය අදාළ ආදායම් උපයනු ලබන කාලසීමාවේදී, විලම්භිත කිරීම හෝ හිලව් කිරීම සිදුකරනු ලබයි. අනෙකුත් සියලුම අත්කර ගැනීම් පිරිවැය ඒවා දරනු ලබන අවස්ථාවේදී වියදමක් ලෙස ගනු ලබයි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCS), නිකුත් කරනු ලැබ ඇති නියාමන මාර්ගෝපදේශ අනුව යමින් විලම්භිත අත්කර ගැනීමේ පිරිවැය (DAC) 365 පදනම මත පදනම්ව ගණනය කරනු ලබයි.

සෑම වාර්තාකරණ දිනයකදීම හෝ හානිකරණ සලකුණක් පැන නගින විට හෝ නිතර හානිකරණ සමාලෝචනයක් සිදු කරනු ලබයි. අය කර ගත යුතු ප්‍රමාණය ධාරණ අගයට වඩා අඩු වන විට, ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හානිකරණ අලාභයක් හඳුනා ගනියි.

අදාළ ගිවිසුම පියවනු ලැබ ඇති විට හෝ ඉවත් කරනු ලැබ ඇතිවිට විලම්භිත අත්කර ගැනීම් පිරිවැය හඳුනා ගනු නොලබයි.

3.5.11 ප්‍රකාශිත ප්‍රාග්ධනය

ප්‍රාථමික කොටස් සාමාන්‍ය කොටස් ලෙෂ වර්ගීකරණය කරනු ලබයි.
ප්‍රාථමික කොටස් නිකුත් කිරීමෙන් සෘජුවම අත්කර ගත හැකි වර්ධනයේ පිරිවැය සාමාන්‍ය කොටස්වලින්,යම්
බදු බලපෑම්වල ශුද්ධ අගයෙන් අඩුකිරීමක් ලෙස හඳුනා ගනු ලබයි.

3.5.12 වගකීම් සහ ප්‍රතිපාදන

3.5.12.1 රක්ෂණ ගිවිසුම් වගකීම්

රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත රක්ෂණ

ජීවිත රක්ෂණ වගකීම්, ගිවිසුම් අත්සන් කර, රක්ෂණ වාරික අයකරනු ලබන විට හඳුනා ගනු ලබයි. මෙම වගකීම්, ස්වාධීන විශේෂඥ ආයුග ණකගේ නිර්දේශය මත පදනම්ව 2000 අංක 43 දරන ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩල පනතේ (IBSL) නියම කරනු ලැබ ඇති පරිදි ශුද්ධ රක්ෂණ වාරික භාවිතා කරමින් අගයනු ලබයි. භාවිතා කරන ලද ඇගයීම් උපකල්පන මත පදනම්ව අනාගත මුදල් ප්‍රවාහවල අවශ්‍යතා සපුරාලිය යුතු අනාගත රක්ෂණ වාරිකවල වට්ටම් කළ වටිනාකමට වඩා අඩු අනාගතයේදී අපේක්ෂිත රක්ෂණ වාරික ප්‍රතිලාභ වල වට්ටම් කළ වටිනාකමේ වීකතුව ලෙසින් වගකීම නිශ්චය කරනු ලබයි. අහිතකර අපගමනවලට ඉඩ සලසන නියම කරන ලද ආන්තික අවදානමක් සහිත හොඳම තක්සේරු අත්දැකීම මත පදනම්ව ඇගැයීම් උපකල්පන ව්‍යුත්පන්න කරනු ලබයි.

සහභාගි රක්ෂණ ඔප්පු වගකීම්වල අගය, සහභාගි රක්ෂණ අරමුදල මට්ටමේදී ව්‍යුත්පන්න කරන ලද සහතික කළ ප්‍රතිලාභ වගකීමේ සහ මුළු ප්‍රතිලාභ වගකීමේ වටිනාකමට වඩා වැඩි වෙයි. සහතික කළ ප්‍රතිලාභ වගකීම ගණනය කිරීමේදී සහතික කළ ප්‍රතිලාභ පමණක් සැලකිල්ලට ගනු ලබන අතර අවදානම් රහිත පොලී අනුපාත පල ශ්‍රේතය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ වට්ටම් කරනු ලබයි. මුළු ප්‍රතිලාභ වගකීමට, සහතික කළ සහ සහතික නොකළ ප්‍රතිලාභ ඇතුළත්වන අතර සහභාගි රක්ෂණ පලය මත පදනම් අරමුදල භාවිතා කරමින් මුදල් ප්‍රවාහ වට්ටම් කරනු ලබයි.

තවද, වර්තමානයේ ඉකුත් වී ගොස් ඇති ගිවිසුම් අනාගතයේදී සමාලෝචනය කිරීමේදී පැන නැගිය හැකි සුදුසු වගකීම් ග්‍රහණය කර ගැනීම සඳහා ගැළපීම් සිදු කරනු ලබයි.

ශ්‍රී.ලං.මු.නි.ප්‍ර 4 (SLFRS 4) 'රක්ෂණ ගිවිසුම්' අනුව අවශ්‍ය කරන පරිදි බාහිර ආයුගණකවරයෙකුගේ සහය ඇතිව ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම්වලට අදාළව වගකීමේ ප්‍රමාණවත් බව පරීක්ෂාවක් (LAT) සමාගම විසින් සිදුකරනු ලබයි.මෙම වගකීමේ ප්‍රමාණවත් බව පරීක්ෂාව සිදුකිරීමේදී හිමිකම් පරිහරණය හා රක්ෂණ ඔප්පු පරිපාලන වියදම්, රක්ෂණ ඔප්පුහිමි විකල්ප හා ඇප මෙන්ම ඒවැනි වගකීම්වල ආදේශක වත්කම්වලින් ලැබෙන ආයෝජන ආදායම් ඇතුළත් අනාගත ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහවල වර්තමාන ප්‍රශස්ථ ඇස්තමේන්තු භාවිතා කරනු ලබයි.

රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත නොවන රක්ෂණ

ජීවිත නොවන රක්ෂණවල වගකීම්වලට, වැය කරන ලද නමුත් වාර්තා නොකළ (IBNR) සහ වැය කරන ලද නමුත් ප්‍රමාණවත් තරම් වාර්තා නොකළ (IBNER), ඇතුළු නොපියවූ වගකීම් ප්‍රතිපාදන, නොඉපයූ රක්ෂණ වාරික සඳහා ප්‍රතිපාදන සහ රක්ෂණ වාරික ඌනතා සඳහා ප්‍රතිපාදන ඇතුළත් වෙයි.

නොඉපයූ රක්ෂණ වාරික සංචිත ඇගයීම, 2000 අංක 43 දරන රක්ෂණ නියාමන පනතේ (ඒනම් 365 පදනම, පදනම් කරගෙන) මාර්ගෝපදේශ අනුව අගයනු ලබයි. එසේ වුවද, මෙම ගිවිසුම් සඳහා අවදානම් කාල සීමාව ගිවිසුම් කාල සීමාවෙන් සැළකිය යුතු තරම් වෙනස්වන අතර රක්ෂණ වාරික ලබා දී ඇති රක්ෂණ අගයට සමානුපාතිකව අවදානම් කාල සීමාවේදී උපයා ගනු ලබයි.

වැය කරන ලද නමුත් වාර්තා නොකළ (IBNR) සහ වැය කරන ලද නමුත් ප්‍රමාණවත් තරම් වාර්තා නොකළ (IBNER) වගකීම් සංචිතය ආයුගණකව ගණනය කරනු ලැබේ. සමතාකරණ සහ විපත්තිකර සංචිත සඳහා ප්‍රතිපාදන හඳුනා ගන්නේ නැත.

හිමිකමකට ගෙවීමට ඇති බැදීම ඉක්ම වී යන විට, නිදහස් කරනු ලබන විට හෝ අවලංගු කරනු ලබන විට වගකීම් හඳුනා ගන්නේ නැත.

ශ්‍රී.ලං.මු.නි.ප්‍ර 4 (SLFRS 4) - රක්ෂණ ගිවිසුම් අනුව අවශ්‍ය කරන පරිදි බාහිර ආයුගණකවරයෙකුගේ සහය ඇතිව ජීවිත නොවන රක්ෂණ වගකීම්වලට අදාළව වගකීම් ප්‍රමාණවත් බව පරීක්ෂාවක් :බීඕ* සමාගම විසින් සිදුකරනු ලබයි.

වට්ටම් අනුපාතය සහ සටහන 46.2 සාකච්ඡා වූ පරිදි රක්ෂණ ගිවිසුම් වගකීම් තීරණය කෙරෙන හෙයින් 2020 දෙසැම්බර් 31 වන විට කොවිඩ් - 19 ව්‍යාප්තිය හේතුවෙන් රක්ෂණ ගිවිසුම් වගකීම්වලට විශාල බලපෑමක් ඇති වී නොමැත.

3.5.12.2 හිමිකම් රක්ෂණ සංචිත

හිමිකම් රක්ෂණ ඔප්පුවලින් ඇතිවන නව්‍ය හිමිකම් සඳහා ගෙවීම් සිදුකිරීමට සමාගම විසින් හිමිකම් රක්ෂණ සංචිතය පවත්වාගෙන යනු ලබයි. සාමාන්‍යයෙන් හිමිකම් රක්ෂණ ඔප්පු වසර 05 හෝ ඊට වැඩි දිගු කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලබයි. මෙම රේඛීය ව්‍යාපාරයේ දිගු කාලීන ස්වභාවය සහ අවිනිශ්චිතතාව හේතුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් (SLIC) පවත්නා රක්ෂණ වාරික සංචිත ගත කළ අනාගත හිමිකම් හා වියදම් සඳහා වන අරමුදලක් ද සමඟින්, හිමිකම් සහ වියදම් පැන නගින පරිදි වියදම් දැරීම ආවරණය කිරීම සඳහා ඉපයීමට ප්‍රමාණවත් රක්ෂණ වාරික ඉපයීමේ ප්‍රවේශයක් යොදා ගනු ලබයි. මෙම ප්‍රවේශය යටතේ, උපයාගත් රක්ෂණ වාරික මත ලාභය හඳුනා නොගනියි.

3.5.12.3 ප්‍රතිපාදන (රක්ෂණ ගිවිසුම් මත හැර)

සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහයට / සමාගමට නෛතික හෝ ප්‍රයෝජනවත් බැඳීමක් ඇති විට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදන හඳුනාගෙන ඇති අතර වගකීම පියවා ගැනීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම අවශ්‍ය වන අතර එය විශ්වාසදායක ලෙස මැනිය හැකිය. රක්ෂණ ගිවිසුම් හැරුණු විට ප්‍රතිපාදන තීරණය කරනු ලබන්නේ අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් බදු ගෙවීමට පෙර වර්තමාන වෙලඳපොල තක්සේරුව මුදල්වල කාල වටිනාකම සහ එම වගකීමට විශේෂිත අවදානම් පිළිබිඹු කරන අනුපාතයකට වට්ටම් කිරීමෙනි.

3.6 කැපවීම සහ අසම්භව්‍ය වගකීම්

සම්පූර්ණයෙන් ම සමූහයේ පාලනය තුළ නොවන අනාගත අවිනිශ්චිත අවස්ථාවන් සිදුවීමෙන් හෝ සිදුනොවීමෙන් හෝ ආර්ථික ප්‍රතිලාභ හුවමාරුව සාමාන්‍ය නොවන හෝ ඒවා සත්‍ය වශයෙන්ම මැනිය නොහැකිය. වර්තමාන බැඳීම්වලින් පමණක් වගකීම් හා අසම්භාව්‍ය වගකීම්වල පැවැත්ම සීමා කරනු ඇත.

සමූහයේ ප්‍රාග්ධන කැපවීම සහ අසම්භව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශවල අදාළ සටහන්වල දී අනාවරණය කරනු ලබයි.

3.7 බණ්ඩමය වාර්තාකරණය

මෙහෙයුම් බණ්ඩය යනු ව්‍යාපාර කටයුතුවල නිරතවන සමූහයේ එක් සංරචකයක් වන අතර එයින්, සමූහයේ අනෙකුත් කිසියම් සංරචකයක් සමඟ සිදු කරනු ලබන හුවමාරුවට අදාළ ආදායම් සහ වියදම් ඇතුළුව ආදායම් ඉපයීම සහ වියදම් දැරීම සිදු කරයි. බණ්ඩවලට වෙන්කළ යුතු සම්පත් සම්බන්ධයෙන් තීරණ ගැනීමට සහ එහි කාර්ය සාධනය තක්සේරු කිරීමට සහ ඒ සඳහා ප්‍රශස්ථ මූල්‍ය තොරතුරු පැවතීම නිසා ප්‍රධාන විධායක නිලධාරි (CEO) විසින් සියලුම මෙහෙයුම් ප්‍රතිඵල නිතිපතා සමාලෝචනය කරනු ලබයි.

ප්‍රධාන විධායක නිලධාරිට (CEO) වාර්තා කරනු ලබන බණ්ඩ ප්‍රතිඵලවලට බණ්ඩයකට සෘජුවම අත්කරගත හැකි අයිතම මෙන්ම සාධාරණීය පදනම මත වෙන් කරනු ලැබිය හැකි අයිතම ඇතුළත් වෙයි. ඒ අනුව. සමූහයේ බණ්ඩීය තොරතුරු වලින් ජීවිත නොවන රක්ෂණ, ජීවිත රක්ෂණ,සෞඛ්‍ය ආරක්ෂණය, ශක්ති සහ අනෙකුත් බණ්ඩ පිළිබිඹු කරයි. අන්තර් බණ්ඩ අතර හුවමාරු සාධාරණ වෙළඳපළ මිළ ගණන් මත පදනම් වෙයි.

3.8 කොටසක ඉපයීම (EPS)

සමූහය එහි සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට කොටසකට මූලික ඉපයීම් පිළිබඳ දත්ත ඉදිරිපත් කරයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 33 (LKAS 33) අනුව හාරක මධ්‍යක කොටස් සංඛ්‍යාවලින් සමූහයේ සාමාන්‍ය කොටස් හිමියන්ට හිමිවිය යුතු ලාභය හෝ අලාභය බෙදා කොටසකට ඉපැයීම් ගණනය කරනු ලබයි.

3.9 යෝජික ලාභාංශ

වාර්තාකරණ දිනට පසුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කරනු ලබන ලාභාංශ වගකීමක් ලෙස හඳුනා නොගන්නා අතර මූල්‍ය ප්‍රකාශවල සටහන් ලෙසින් පමණක් අනාවරණය කරනු ලබයි. ලාභාංශය සඳහා ප්‍රතිපාදන, වාර්ෂික මහ සභා රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කරනු ලැබ ඇති ලාභාංශය කොටස් හිමිකරුවන් විසින් අනුමත කළ කාල සීමාවේදී පමණක් හඳුනා ගනු ලබයි.

3.10 වාර්තාකරණ දිනයට පසුව සිද්ධි

වාර්තාකරණ කාල සීමාවෙන් පසු සිද්ධි හිතකර සහ අහිතකර සිද්ධීන් වෙයි. එම සිද්ධීන් වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා බලය දෙන දිනය දක්වා කාල සීමාව තුළ ඇතිවන සිද්ධීන්ය. වාර්තාකරණ දිනයට පසුව සිදුවන සියලුම ප්‍රමාණික සිද්ධි සලකා බලනු ලැබ තිබෙන අතර අවශ්‍ය අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයේ අදාළ සටහන්වල ගැළපීම් හෝ අනාවරණ සිදු කරනු ලැබ ඇත. වැඩිදුර තොරතුරු සටහන 46හි ඇතුලත් වේ.

3.11 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 (LKAS-7) , මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන අනුව මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ සකස් කිරීමේ වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබ තිබෙයි.

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ ක්‍රියාවලිය සඳහා ශුද්ධ බැංකු අයිරා මඟින් මුදල් හා මුදල් සමානතා ඉදිරිපත් කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

4. නිකුත් කරන ලද නමුත් වාර්තාකරණ දිනට බල නොපැවැත්වෙන ගිණුම්කරණ ප්‍රමිති

4.1. නිකුත් කරන ලද නමුත් වාර්තාකරණ දිනට බල නොපැවැත්වෙන ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරී ආයතනය පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ නව ප්‍රමිති නිකුත් කරනු ලැබ තිබෙන අතර මෙම ප්‍රමිති 2019 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව හෝ ඊට පසු වෙනත් දිනයකින් ආරම්භවන මූල්‍ය කාලසීමාවක් සඳහා අදාළ වෙයි.

නව සංශෝධනය වූ ප්‍රමිති නිකුත් වුවත්, පහතින් දැක්වෙන මූල්‍ය ප්‍රකාශ නිකුත් කරන දිනය වනවිට ඒවා බලාත්මක වී නැත.

- SLFRS 9, LKAS 39, SLFRS 7, SLFRS 4 සහ SLFRS 16 ට සංශෝධන - පොලී අනුපාතික මිනුම් ප්‍රතිසංස්කරණ (අදියර 1 සහ 2)
- SLFRS 17 - රක්ෂණ ගිවිසුම්
- SLFRS 16 සඳහා සංශෝධන - කොවිඩ් - 19 හා සම්බන්ධ කුලී සහන මුදල්

SLFRS 9 වෙතින් තාවකාලිකව බැහැරවීම

SLFRS 9 - මූල්‍ය සාධන පත්‍ර

මෙම ප්‍රමිතිය LKAS 39 හි පවත්නා මග පෙන්වීම ප්‍රතිස්ථාපනය කරයි - 'මූල්‍ය සාධනපත්‍ර: SLFRS 9 පිළිගැනීම සහ මිනුම යන්නට මූල්‍ය සාධනපත්‍ර වර්ගීකරණය හා මැනීම පිළිබඳ සංශෝධිත මග පෙන්වීමක්, මූල්‍ය වත්කම්වල හානිය ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය පාඩු ආකෘතියක් සහ නව සාමාන්‍ය ඉදිරි රැකුම් ගිණුම්කරණ අවශ්‍යතා ඇතුළත් වේ. SLFRS 9, 2018 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා බලපැවැත්වෙන අතර, කලින් අදාල කර ගැනීමට අවසර ඇත.

සමාගම (SLIC) ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ SLFRS 4 'රක්ෂණ කොන්ත්‍රාත්තු' සඳහා යෝජිත සංශෝධන මත ය. රක්ෂණ කොන්ත්‍රාත්තු නිකුත් කිරීම සිය ප්‍රධාන ක්‍රියාකාරකම් වන ආයතනවලට SLFRS 9 පූර්ණ වශයෙන් අදාල කර ගැනීම කල් දැමීමට 2022 දී ආරම්භ කිරීමට අපේක්ෂා කරන සංශෝධිත SLFRS 4 සම්මත කර ගන්නා තෙක් අවසර ඇත. 2021 ජනවාරි සිට 2023 ජනවාරි දක්වා බලපැවැත්වෙන පරිදි IFRS 17 ගෝලීය වශයෙන් කල්දැමීමේ ප්‍රතිඵලයක් ලෙස සමාගම විසින් 2023 ජනවාරි දක්වා තාවකාලික නිදහස් කිරීම කල් දැමීමට බලාපොරොත්තු වේ.

රක්ෂණකරුවෙකුට SLFRS 9 වෙතින් තාවකාලික නිදහස් කිරීම අයදුම් කළ හැක්කේ පහත තත්ත්වයන් මත පමණි.

අ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමක් ලෙස නම් කර ඇති මූල්‍ය වගකීම්වල ලැබීම් සහ අලාභ ඉදිරිපත් කිරීම සඳහා වන අවශ්‍යතා හැරුණු විට එය මීට පෙර SLFRS 9 හි කිසිදු සංස්කරණයක් භාවිතා කර නොමැති වීම.

ආ. 2016 අප්‍රේල් 1 වන දින ට පෙර වාර්ෂික වාර්තාකරණ දිනයේදී හෝ පසු වාර්ෂික වාර්තාකරණ දිනයකදී එහි ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වීවා වීම.

SLFRS 4 - රක්ෂණ ගිවිසුමට කරන ලද සංශෝධනවලට අනුකූලව රක්ෂණකරුවෙකුගේ ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වන්නේ නම්, සහ පමණක් නම්,

අ. රක්ෂණ කොන්ත්‍රාත්තුවලින් වෙන් කරන ලද ඕනෑම තැන්පතු සංරචක හෝ අන්තර්ගත කළ ව්‍යුත්පන්නයන් ඇතුළත් වන මෙම SLFRS හි විෂය පථය තුළ ඇති ගිවිසුම් වලින් පැනනගින එහි වගකීම්වල ධාරණ අගය,එහි සියළු වගකීම්වල මුළු ධාරණ අගය සමග සංසන්දනය කිරීමේ දී වැදගත් වේ.

ආ. සියළුම වගකීම්වල මුළු ධාරණ අගය ප්‍රමාණයට සාපේක්ෂව රක්ෂණය හා සම්බන්ධිත එහි වගකීම්වල මුළු ධාරණ අගය ප්‍රමාණයෙහි ප්‍රතිශතය:

I. 90% ට වඩා වැඩි; හෝ
II. 90% ට වඩා අඩු හෝ සමාන නමුත් 80% ට වඩා වැඩි වන අතර රක්ෂකයා රක්ෂණයට සම්බන්ධ නොවන සැලකිය යුතු ක්‍රියාකාරකමක නිරත නොවේ.

SLFRS 9 වෙතින් තාවකාලිකව නිදහස් කිරීම, එහි ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වී ඇත්දැයි පසුකාලීන වාර්ෂික වාර්තා කර දිනයක දී නැවත තක්සේරු කරනු ලබන්නේ එම දිනයේ අවසන් වන වාර්ෂික කාල සීමාව තුලදී ආස්ථිත්ව ඒකකයේ ක්‍රියාකාරකම්වල වෙනසක් වී තිබුණි නම් පමණි. සංශෝධිත SLFRS 4 සම්මත කර ගන්නා කාලයට ආසන්නව SLFRS 9 යටතේ සිය ආයෝජන සුදුසු පරිදි වර්ගීකරණය කිරීම පිළිබඳව සමාගම තීරණය කරනු ඇති අතර, ඒ අනුව වාර්තා කරන දිනට SLFRS 9 සිය මූල්‍ය ප්‍රකාශන සඳහා යොදා ගැනීමේ බලපෑම සම්පූර්ණයෙන් ගණනය කළ නොහැක. කෙසේ වෙතත් එය අපේක්ෂා කරන අතර එමඟින් සමාගමේ ම මුළු කොටස් සැලකිය යුතු ලෙස වෙනස් නොවේ.

SLFRS 15 - "ගනුදෙනුකරුවන් සමඟ ඇති ගිවිසුම් වලින් ලැබෙන ආදායම"
SLFRS 4 - රක්ෂණ කොන්ත්‍රාත්තු, මෙම ප්‍රමිතියෙන් ඉවත් කර ඇත. එබැවින්, සමාගමට රක්ෂණ ගනුදෙනු සඳහා ප්‍රමිතියෙන් සැලකිය යුතු බලපෑමක් නොවනු ඇත. කෙසේ වෙතත්, මෙම ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ වෙනත් ආදායම් ගනුදෙනු සඳහා බලපෑමක් ඇති කළ හැකිය. මෙම ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන මූල්‍ය ප්‍රකාශන කෙරෙහි ඇති විය හැකි බලපෑම සමාගම තක්සේරු කරමින් සිටී.

SLFRS 17 - රක්ෂණ ගිවිසුම්
SLFRS 17, 2023 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේදයන් සඳහා බලපැවැත්වේ. SLFRS 9 සහ SLFRS 15 යොදා ගැනීමත් සමඟ කලින් යොදා ගැනීම සඳහා අවසර දෙනු ලැබේ. SLFRS 17 මගින්, SLFRS 4 අභිභවනය කරනු ලබයි. නව ප්‍රමිතිය සමාගමේ අනිවාර්ය බලපැවැත්වෙන දිනයේදී යොදා ගැනීමට සමාගම අදහස් කරයි.

2005 ජනවාරි මාසයට පෙර තම නීතිමය බල අධිකාරයේ පැවති රක්ෂණ වත්කම් සහ වගකීම් සඳහා ගිණුම්කරණයේ ව්‍යවස්ථාපිත පදනම දිගටම භාවිතා කිරීමට SLFRS 4 රක්ෂණකරුවන්ට අවසර දී ඇත. සියලු රක්ෂණ ගිවිසුම් සඳහා වන නව මිනුම් ආකෘතිය මගින් SLFRS 17 ප්‍රතිස්ථාපනය කරයි.

SLFRS 17 සඳහා, රක්ෂණ ගිවිසුම් සඳහා වන වගකීම් අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම ලෙස පිළිගැනීම, වර්තමාන තත්වයන් පිළිබිඹු කිරීමට එක් එක් වාර්තා කරන දිනයේදී යාවත්කාලීන කරනු ලබන පැහැදිලි අවදානම් ගැලපුමක් ඇතුළත් කිරීම සහ මූලික පිළිගැනීම මත පැන නගින ඕනෑම දිනක" එක් ලැබීමක් සඳහා සමාන සහ ප්‍රතිවිරුද්ධ ගිවිසුම් සේවා ආන්තිකයක් (CSM) අවශ්‍ය වේ. පාඩු ආදායම් ප්‍රකාශයට සෘජුවම හඳුනා ගනේ. මිනුම් කාර්යයන් සඳහා ගිවිසුම් සමාන අවදානම් ලාභදායිතා පැතිකඩක් සහ නිකුත් කරන වර්ෂය මත ගිවිසුම් වලට කාණ්ඩගත කර ඇති අතර වෙන වෙනම කළමනාකරණය කරනු ලබන ගිවිසුම් සඳහා තවදුරටත් බෙදීම් පවතී.

SLFRS 17 යටතේ රක්ෂණ සම්බන්ධතා සඳහා වන ලාභය නිරූපණය කරනු ලබන්නේ, අදාල කාල සීමාව තුළ රක්ෂණ ඔප්පුහිමියන්ට ලබා දී ඇති සේවාව පිළිගැනීම (CSM මුදා හැරීම), ආර්ථික නොවන අවදානම අවබෝධ කර ගැනීම (අවදානම ගැලපීම් අවබෝධ කර ගැනීම) සහ ආයෝජන ලාභය මගිනි.

රක්ෂණ ඔප්පුහිමියාට ලබා දුන් සේවා දක්වමින් රක්ෂණ ගිවිසුමේ ආවරණ කාල සීමාව තුළ වන ලාභය ලෙස ගිවිසුම් සේවා ආන්තිකයක් මුදා හරිනු ලැබේ. සහභාගී වන අංගයන් සහිත ඇතැම් ගිවිසුම් සඳහා (මෙහිදී අදාළ ආයෝජනවල සාධාරණ වටිනාකමෙන් සැලකිය යුතු කොටසක් සහ අනෙකුත් පාදක කර ගත් අයිතම රක්ෂණ ඔප්පු හිමියන්ට ගෙවනු ලැබේ) කොටස් හිමියන්ට ගෙවන විචල්‍ය ගාස්තුව ගිවිසුම් සේවා ආන්තිකය මගින් පිළිබිඹු කරයි. මෙම ගිවිසුම් සඳහා, ආර්ථික අත්දැකීම් සහ උපකල්පනවල වෙනස්කම් පිළිබිඹු වන පරිදි ගිවිසුම් සේවා ආන්තිකය ගලපා ඇත. අනෙකුත් සියලුම ගිවිසුම් සඳහා ගිවිසුම් සේවා ආන්තිකය ගලපනු ලබන්නේ ආර්ථික නොවන උපකල්පන සඳහා පමණි.

රක්ෂණ ආදායම පිළිබඳ නව මිනුමක් SLFRS 17 විසින් හඳුන්වා දී ඇති අතර එය රක්ෂණ ඔප්පු හිමියන්ට සේවා සැපයීම සහ රක්ෂණ ඔප්පුවල ආයෝජන අංගවලට අදාළ ඕනෑම වාරිකයක් ඇතුලත් නොවීම මත පදනම් වී ඇත. ඒවා දැනට ආදායම් ප්‍රකාශයේ වාර්තා වී තිබෙන දැනට පවතින වාරික ආදායම් පියවරයන්ට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වනු ඇත. SLFRS 17 වෙත මාරුවීම සඳහා, සංක්‍රාන්ති දිනයේ දී ගිවිසුම් සේවා ආන්තිකය වන විලම්බිත ලාභ ප්‍රමාණය තීරණය කිරීම සිදු කළ යුතුය.

SLFRS 17 ට අවශ්‍ය වන්නේ, ප්‍රමිතීන් අතීතයේ සිට අදාල කර ගෙන තිබූනාක් මෙන් ගිවිසුම් සේවා ආන්තිකය ගණනය කිරීමයි. මෙය ප්‍රායෝගික නොවේ නම්, සංක්‍රාන්ති දිනයේදී වගකීම්වල සාධාරණ වටිනාකම සඳහන් කරමින් සරල කළ නැවත සලකා බැලීමේ ප්‍රවේශයක් තෝරා ගැනීමට හෝ ගිවිසුම් සේවා ආන්තිකය තීරණය කිරීමට ආයතනයක් අවශ්‍ය වේ. ගිවිසුම් සේවා ආන්තිකය තීරණය කිරීමේ ප්‍රවේශය කොටස් හිමියන්ගේ කොටස් සහ අනාගත වාර්තාකරණ කාල පරිච්ඡේදයන් තුළ බලපවත්වන ව්‍යාපාරයට ලැබෙන ලාභයේ ප්‍රමාණයට යන දෙකටම සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇත.

නව ප්‍රමිතියේ අවශ්‍යතා සංකීර්ණ වන අතර රක්ෂණ ගිවිසුම් සඳහා ගිණුම්කරණයේ මූලික වෙනසක් මෙන්ම සැලකිය යුතු විනිශ්චයක් සහ නව තක්සේරුකරණ ක්‍රමවේදයන් භාවිතා කිරීම සඳහා SLFRS 17 මූල්‍ය ප්‍රකාශන සහ අනාවරණයන් ඉදිරිපත් කිරීමේදී සැලකිය යුතු වෙනසක් අපේක්ෂා කරයි. මෙම ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අවශ්‍ය වෙනස්කම් වල බලපෑම දැනට අවිනිශ්චිත නමුත් මෙම වෙනස්කම් වෙනත් දේ අතර ලාභ හඳුනාගැනීමේ කාලය වෙනස් කරනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

SLFRS 17 ක්‍රියාත්මක කිරීමත් සමඟ රක්ෂණ ආශ්‍රිත වත්කම් හා වගකීම් සඳහා ඡායා ගිණුම්කරණය (Shadow Accounting) අදාළ නොවේ.

SLFRS 17 ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සමාගම විසින් සකස් කරමින් සිටී. ගිණුම්කරණ ප්‍රතිපත්ති සැකසීම සහ අදාල කර ගැනීමේ ක්‍රමවේදයන් සැකසීම, යෝග්‍ය ක්‍රියාවලි සහ පාලනයන් ස්ථාපිත කිරීම, සුදුසු දිනයක් නිශ්චය කිරීම සහ ආයුගණන හා මූල්‍ය පද්ධති වෙනස්කම් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහන වගකීම දරයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

5 මූල්‍යමය ආයෝජන

දෙසැම්බර් 31 දිනට		සමූහය				සමාගම			
		2020		2019		2020		2019	
	සටහන	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය
		රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
කල්පිරීම සඳහා පැවති මූල්‍ය වත්කම්	5.1	**51,885,786**	**61,606,054**	53,113,519	55,174,232	**51,885,786**	**61,606,054**	53,113,519	55,174,232
ණය හා ලැබීම්	5.2	**50,861,422**	**50,861,422**	46,019,481	46,019,481	**47,654,428**	**47,654,428**	43,437,082	43,437,082
විකිණීමට සඳහා පවතින මූල්‍ය වත්කම්	5.3	**55,420,439**	**55,420,439**	59,956,407	59,956,407	**55,420,439**	**55,420,439**	59,956,407	59,956,407
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ වටිනාකම	5.4	**15,346,680**	**15,346,680**	5,643,021	5,643,021	**15,346,680**	**15,346,680**	5,643,021	5,643,021
මූල්‍යමය ආයෝජන එකතුව		**173,514,327**	**183,234,595**	164,732,428	166,793,141	**170,307,333**	**180,027,601**	162,150,029	164,210,742

5.1 කල්පිරීම සඳහා පැවති මූල්‍ය වත්කම්

දෙසැම්බර් 31 දිනට		සමූහය				සමාගම			
		2020		2019		2020		2019	
	සටහන	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය
		රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
භාණ්ඩාගාර බැඳුම්කර		**51,885,786**	**61,606,054**	53,113,519	55,174,232	**51,885,786**	**61,606,054**	53,113,519	55,174,232
		51,885,786	**61,606,054**	53,113,519	55,174,232	**51,885,786**	**61,606,054**	53,113,519	55,174,232

5.2 ණය හා ලැබීම් (L & R)

දෙසැම්බර් 31 දිනට		සමූහය				සමාගම			
		2020		2019		2020		2019	
	සටහන	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය
		රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
ලේඛනගත නොවූ ණයකර		**22,310,237**	**22,310,237**	5,623,014	5,623,014	**22,310,237**	**22,310,237**	5,623,014	5,623,014
කාලීන තැම්පතු		**17,293,583**	**17,293,583**	29,647,015	29,647,015	**14,086,589**	**14,086,589**	27,064,616	27,064,616
සංවර්ධන බැඳුම්කර		**11,257,602**	**11,257,602**	10,749,452	10,749,452	**11,257,602**	**11,257,602**	10,749,452	10,749,452
		50,861,422	**50,861,422**	46,019,481	46,019,481	**47,654,428**	**47,654,428**	43,437,082	43,437,082

5.3 විකිණීමට සඳහා පවතින (AFS)

දෙසැම්බර් 31 දිනට		සමූහය				සමාගම			
		2020		2019		2020		2019	
	සටහන	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය
		රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
ලැයිස්තුගත කොටස්		**19,215,501**	**19,215,501**	23,765,733	23,765,733	**19,215,501**	**19,215,501**	23,765,733	23,765,733
ලැයිස්තුගත නොකළ කොටස්		**11,267**	**11,267**	24,411	24,411	**11,267**	**11,267**	24,411	24,411
ඒකක භාර		**1,590,984**	**1,590,984**	2,029,106	2,029,106	**1,590,984**	**1,590,984**	2,029,106	2,029,106
ලැයිස්තුගත ණයකර සමාගම		**33,376,199**	**33,376,199**	32,360,622	32,360,622	**33,376,199**	**33,376,199**	32,360,622	32,360,622
භාණ්ඩාගාර බැඳුම්කර		**1,226,488**	**1,226,488**	1,776,535	1,776,535	**1,226,488**	**1,226,488**	1,776,535	1,776,535
		55,420,439	**55,420,439**	59,956,407	59,956,407	**55,420,439**	**55,420,439**	59,956,407	59,956,407

5.4 ලාභය හෝ පාඩුව මත සාධාරණ වටිනාකම (FVTPL)

දෙසැම්බර් 31 දිනට		සමූහය				සමාගම			
		2020		2019		2020		2019	
	සටහන	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය
		රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
Listed Shares		**12,454,354**	**12,454,354**	5,643,021	5,643,021	**12,454,354**	**12,454,354**	5,643,021	5,643,021
Unit Trusts		**2,892,326**	**2,892,326**	-	-	**2,892,326**	**2,892,326**	-	-
		15,346,680	**15,346,680**	5,643,021	5,643,021	**15,346,680**	**15,346,680**	5,643,021	5,643,021

ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගය මත ආයෝජනය සහ විකිණීම සඳහා පවතින ආයෝජනයන් සාධාරණ අගය මත මිනුම් කර ඇත. කල් පිරීම සඳහා පවතින ආයෝජන සහ ණය හා ලැබිය හැකි මුදල් ක්ෂය වීමේ පිරිවැය මත මිනුම් කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

5.5 මූල්‍ය ආයෝජනයන් හි ධාරක අගයන් හි සංචලනයන්

සමාගම	විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්	ලාභ හෝ පාඩු මූල්‍ය වත්කම් ඔස්සේ සාධාරණ අගය	කල් පිරීම සඳහා පවතින මූල්‍ය වත්කම්	ණය හා ලැබිය හැකි වාරික	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
2020 ජනවාරි 01 වන දිනට	59,956,407	5,643,021	53,113,519	43,437,082	162,150,029
මිලදී ගැනීම්	1,288,761	11,352,842	584,368	27,376,378	40,602,349
කල් පිරීම්	(3,152,545)	(2,002,047)	(1,800,000)	(23,617,970)	(30,572,562)
බැහැර කිරීම්	(38,609)	(1,112,592)	-	-	(1,151,201)
වෙනත් පරිපූර්ණ ආදායමෙහි වාර්තාගත සාධාරණ අගයෙහි ලැබීම්	(4,844,854)	-	6,625	-	(4,838,229)
උපලබ්ධිත ප්‍රාග්ධන ලාභ/(අලාභ)	25,908	-	-	-	25,908
උපලබ්ධිත /උපලබ්ධිත නොවූ ප්‍රාග්ධන අලාභ	-	1,474,881	-	-	1,474,881
පොලී ක්‍රමක්ෂය	2,123,057	-	-	-	2,123,057
විදේශ මුදල් පරිවර්තන සැසඳුම්	19,342	(9,425)	-	269,095	279,012
පොලී ආදායම	3,914,179	-	5,511,279	4,022,605	13,448,063
පොලී/කූපන ලැබීම්	(3,871,206)	-	(5,530,005)	(3,832,762)	(13,233,973)
2020 දෙසැම්බර් 31 දිනට	55,420,439	15,346,680	51,885,786	47,654,428	170,307,333
2019 ජනවාරි 01 වන දිනට	58,480,606	3,627,702	54,622,917	33,326,553	150,057,778
මිලදී ගැනීම්	13,523,857	2,286,917	-	38,674,920	54,485,694
කල් පිරීම්	(1,100,000)	-	(1,500,000)	(29,092,447)	(31,692,447)
බැහැර කිරීම්	(8,728,156)	(778,352)	-	-	(9,506,508)
වෙනත් පරිපූර්ණ ආදායමෙහි වාර්තාගත සාධාරණ අගයෙහි ලැබීම්	(3,403,456)	-	-	-	(3,403,456)
උපලබ්ධිත ප්‍රාග්ධන ලාභ/(අලාභ)	771,805	-	-	-	771,805
උපලබ්ධිත /උපලබ්ධිත නොවූ ප්‍රාග්ධන අලාභ	-	506,755	-	-	506,755
වර්ෂය තුළදී වත්කම් හානිවීම	(127,933)	-	-	-	(127,933)
පොලී ක්‍රමක්ෂය	(16,488)	-	22,479	-	5,990
විදේශ මුදල් පරිවර්තන සැසඳුම්	(8,356)	-	-	(89,854)	(98,210)
පොලී ආදායම	3,345,191	-	5,670,816	3,693,876	12,709,883
පොලී/කූපන ලැබීම්	(2,780,663)	-	(5,702,692)	(3,075,966)	(11,559,321)
2019 දෙසැම්බර් 31 දිනට	59,956,407	5,643,021	53,113,519	43,437,082	162,150,029

සමූහය	විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්	ලාභ හෝ පාඩු මූල්‍ය වත්කම් ඔස්සේ සාධාරණ අගය	කල් පිරීම සඳහා පවතින මූල්‍ය වත්කම්	ණය හා ලැබිය හැකි වාරික	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
2020 ජනවාරි 01 වන දිනට	59,956,406	5,643,023	53,113,520	46,019,481	164,732,428
මිලදී ගැනීම්	1,288,761	11,352,842	584,368	28,000,973	41,226,944
කල් පිරීම්	(3,152,545)	(2,002,047)	(1,800,000)	(23,617,970)	(30,572,562)
බැහැර කිරීම්	(38,609)	(1,112,592)	-	-	(1,151,201)
වෙනත් පරිපූර්ණ ආදායමෙහි වාර්තාගත සාධාරණ අගයෙහි ලැබීම්	(4,844,854)	-	6,625	-	(4,838,229)
උපලබ්ධිත ප්‍රාග්ධන ලාභ/(අලාභ)	25,908	-	-	-	25,908
උපලබ්ධිත/උපලබ්ධිත නොවූ ප්‍රාග්ධන අලාභ	-	1,474,881	-	-	1,474,881
පොළී ක්‍රමක්ෂය	2,123,057	-	-	-	2,123,057
විදේශ මුදල් ගනුදෙනු සැසඳුම්	19,342	(9,425)	-	269,095	279,012
පොළී ආදායම	3,914,179	-	5,511,279	4,022,605	13,448,063
පොළී/කූපන ලැබීම්	(3,871,206)	-	(5,530,005)	(3,832,762)	(13,233,973)
2020 දෙසැම්බර් 31 දිනට	55,420,439	15,346,682	51,885,787	50,861,422	173,514,327
2019 ජනවාරි 01 වන දිනට	58,480,603	3,627,702	54,622,918	36,100,316	152,831,539
මිලදී ගැනීම්	13,523,857	2,286,917	-	38,674,920	54,485,694
කල් පිරීම්	(1,100,000)	-	(1,500,000)	(29,283,810)	(31,883,810)
බැහැර කිරීම්	(8,728,156)	(778,352)	-	-	(9,506,508)
වෙනත් පරිපූර්ණ ආදායමෙහි වාර්තාගත සාධාරණ අගයෙහි ලැබීම්	(3,403,456)	-	-	-	(3,403,456)
උපලබ්ධිත ප්‍රාග්ධන ලාභ/(අලාභ)	771,805	-	-	-	771,805
උපලබ්ධිත /උපලබ්ධිත නොවූ ප්‍රාග්ධන අලාභ	-	506,755	-	-	506,755
පොළී ක්‍රමක්ෂය	(16,488)	-	22,479	-	5,991
විදේශ මුදල් පරිවර්තන සැසඳුම්	(8,356)	-	-	(89,854)	(98,210)
වර්ෂය තුළදී වත්කම් හානිවීම	(127,933)	-	-	-	(127,933)
පොළී ආදායම	3,345,191	-	5,670,816	3,693,876	12,709,883
පොළී/කූපන ලැබීම්	(2,780,663)	-	(5,702,692)	(3,075,966)	(11,559,321)
2019 දෙසැම්බර් 31 දිනට	59,956,406	5,643,023	53,113,520	46,019,481	164,732,428

6. පාලිත සමාගම්හි ආයෝජනය

දෙසැම්බර් 31 දිනට		සමාගම	
		2020	2019
	අනු සටහන	රු. '000	රු. '000
පිරිවැයට			
ලැයිස්තුගත පාලිත සමාගම්	6.1	**2,764,196**	2,764,196
ලැයිස්තුගත නොවූ පාලිත සමාගම්	6.2	**18,059,696**	18,059,696
		20,823,892	20,823,892

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

6.1 ලැයිස්තුගත පාලිත සමාගම්

	2020				2019			
	කොටස් ගණන	ශ්‍රීලං.ර.ස සතු %	ධාරක අගය රු. '000	සාධාරණ අගය රු. '000	කොටස් ගණන	ශ්‍රී ලං.ර.ස සතු %	ධාරක අගය රු. '000	සාධාරණ අගය රු. '000
ද ලංකා හොස්පිටල්ස් කොපරේෂන් පීඑල්සී	**114,861,951**	**51.34%**	**2,764,196**	**6,179,573**	114,861,951	51.34%	2,764,196	4,674,881
			2,764,196	**6,179,573**			2,764,196	4,674,881

6.2 ලැයිස්තුගත නොවූ පාලිත සමාගම්

	කොටස් ගණන	ශ්‍රීලං.ර.ස සතු %	ධාරක අගය රු. '000	කොටස් ගණන	ශ්‍රීලං.ර.ස සතු %	ධාරක අගය රු. '000
ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ්	35,976,853	99.94%	3,510,063	35,976,853	99.94%	3,510,063
ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්)ලිමිටඩ්	158,710,945	100%	5,280,188	158,710,945	100%	5,280,188
මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ්	5	100%	-	5	100%	-
කැන්විල් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	850,000,000	45.95%	8,399,358	850,000,000	45.95%	8,399,358
කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ්	87,008,686	100%	870,087	87,008,686	100%	870,087
			18,059,696			18,059,696

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් කැන්විල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි රුපියල් බිලියන 8.5 ක මුදලක් ආයෝජනය කර ඇති අතර එය කැන්විල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි කොටස් වලින් 45.95% කි. ස්වාධීන තක්සේරුකරුවෙකු විසින් 2019 අප්‍රේල් 10 වන දින සිදු කරන ලද තක්සේරුවට අනුව 2019 දෙසැම්බර් 31 දිනට කැන්විල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි ශුද්ධ වත්කම් වටිනාකමට ගනණය කරන ලදි. ඒ අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල කැන්විල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ආයෝජනයට එදිරිව රු. මිලියන 100.6 ක හානිකරණයක් හඳුනාගෙන ඇත. 2020 මූල්‍ය වර්ෂය සඳහා හානිකරණයක් හඳුනා ගෙන නොමැත.

6.3 ප්‍රධාන පාලිත සමාගම්වල ව්‍යාපාර සමූහය සතු කොටස්

NCI විසින් දරනු ලබන සමූහයේ සංයුතිය සහ හිමිකාරිත්වයේ ප්‍රමාණය පහත දැක්වෙන අනාවරණයන් ගෙන් අනාවරණය වේ.

සමාගම	ප්‍රධාන ක්‍රියාකාරකම්	අයත් කොටස්වල පන්තිය	සමූහ හිමිකම		පාලනයක් නොමැති හිමිකම්	
			2020	2019	2020	2019
ද ලංකා හොස්පිටල්ස් කොපරේෂන් පීඑල්සී	සෞඛ්‍යාරක්ෂක හා රසායනාගාර සේවා	සාමාන්‍ය	**51.34%**	51.34%	**48.66%**	48.66%
ලංකා හොස්පිටල් ඩයග්නොස්ටික්ස් ලිමිටඩ්	සෞඛ්‍යාරක්ෂක හා රසායනාගාර සේවා	සාමාන්‍ය	**51.34%**	51.34%	**48.66%**	48.66%
ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ්	ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් ආනයනය, සැකසීම, ගබඩා කිරීම, බෙදා හැරීම, විකිණීම සහ වෙනත් ආනුෂාංගික සේවා සැපයීම	සාමාන්‍ය	**99.94%**	99.94%	**0.06%**	0.06%
ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්)ලිමිටඩ්	ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් සඳහා තොග ගබඩා පහසුකම් සැපයීම	සාමාන්‍ය	**100%**	100%	**0.00%**	0.00%
කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ්	හෝටල් ව්‍යාපාර	සාමාන්‍ය	**100%**	100%	**0.00%**	0.00%
කැන්විල් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	වීවේකාස්වාදය හා සම්බන්ධ ආයෝජන ප්‍රවර්ධනය	සාමාන්‍ය	**72.97%**	72.97%	**27.03%**	27.03%
සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ්	හෝටල් ව්‍යාපාර	සාමාන්‍ය	**72.97%**	72.97%	**27.03%**	27.03%
හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ්	හෝටල් ව්‍යාපාර	සාමාන්‍ය	**72.97%**	72.97%	**27.03%**	27.03%
මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ්	කළමනාකරණ සේවා	සාමාන්‍ය	**100%**	100%	**0.00%**	0.00%

6.4 පාලනය නොවන හිමිකම

ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පදනමින් ව්‍යාපාර සමුහයට අදාල කිසියම් පාලනය නොවන හිමිකමක් ව්‍යාපාර සමුහය විසින් හඳුනාගෙන නොමැත.

කැන්විල් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්		සමාගම	
		2020	2019
	ශ්‍රී ලං.ර.ස සතු %	රු.	රු.
සිනොලංකා හොටේල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්	100%	**18,000,000,000**	18,000,000,000
හෙලංකෝ හොටේල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්	100%	**500,000,000**	500,000,000
නිල්යන් හොටේල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්	100%	**10**	10
		18,500,000,010	18,500,000,010
හානිවිමි සඳහා ප්‍රතිපාදනය		**(10)**	(10)
		18,500,000,000	18,500,000,000

තම සමාගම තවදුරටත් ව්‍යාපාර කටයුතුවල නිරත නොවන හෙයින් නිල්යන් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ටරයෙන් සමාගම් නාමය කපා හැරීමට තීරණය කර ඇත. ඒ අනුව, 2017 වර්ෂයේ නිල්යන් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් යටතේ රු.10ක ආයෝජනයේ වටිනාකම පහත බැසීම අනුව ප්‍රතිපාදන ඇතිකර තිබේ.

7. ආශ්‍රිත සමාගම්හි ආයෝජනය

සමුහය/සමාගම	2020				2019			
	කොටස් ගණන	ශ්‍රීලං.ර.ස සතු,	ධාරක අගය	සාධාරණ අගය	කොටස් ගණන	ශ්‍රීලං.ර.ස සතු,	ධාරක අගය	සාධාරණ අගය
			රු. '000	රු. '000			රු. '000	රු. '000
සිලෝන් ඇසට් මැනේජ්මන්ට් කම්පණි ලිමිටඩ්	**1,250,000**	**18.95%**	**5,808**	**5,808**	1,250,000	21.37%	4,779	4,779
සීබෑන්ක් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ්	**759,998**	**26.57%**	**158,317**	**158,317**	759,998	26.57%	143,730	143,730
			164,125	**164,125**			148,509	148,509

***** ඉහත ආයෝජනයන් ආයෝජකයාගේ ශුද්ධ වත්කම් අගයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කොටසට මැන (මුල්‍ය ප්‍රකාශයන් මත පදනම්ව) ඇති අතර වටිනාකම්වල වෙනස්කම් මුල්‍ය ප්‍රකාශයන්හි පිලිගෙන ඇත. ඉහත හවුල්කරුවන්ගේ ප්‍රධාන ක්‍රියාකාරකම් අරමුදල් කලමනාකරණය වන අතර බදුකරණයෙන් පසුව සමුහයේ හෝ කොටස්වල ලාභය මත හෝ මුදල් මත ප්‍රමාණවත් බලපෑමක් නොමැත.

8. දේපල, පිරියත හා උපකරණ

8.1 සමූහය

	2020	2019
	Rs. '000	Rs. '000
ධාරක මුදල	**40,012,092**	35,881,772
සිදුකරමින් පවතින වැඩ (8.1.3 සටහන)	**16,740,141**	16,464,930
	56,752,233	52,346,702

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

	ඉඩම්	සින්නක්කර ඉඩමේ ගොඩනැගිලි	බදුකර ඉඩමේ පිහිටි ගොඩනැගිලි	උපකරණ	ගෘහ භාණ්ඩ හා උපාංග	මෝටර් රථ
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය/තක්සේරුව						
සින්නක්කර						
2020 ජනවාරි 01 වන දිනට ශේෂය	10,744,367	2,364,770	6,858,904	4,740,030	738,080	1,124,264
වසර තුළදී වැකතු කිරීම්	-	23,970	55,726	431,260	67,434	22,913
පිළි ඇගයීම	9,000	-	(140,475)	-	-	-
පිළි ඇගයීම් සංචිත වෙත සමුච්චිත ක්ෂය මාරු කිරීම්	-	-	-	-	-	-
බැහැර කිරීම්	(5,625)	-	-	(40,562)	(25,551)	(79,686)
වසර තුළ මාරු වීම්	-	-	-	(851)	(465)	-
වැඩ සිදු කරන අතරතුර මාරුවීම්	2,619,141	1,145	18,906	30,564	25,943	17,539
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	13,366,883	2,389,885	6,793,061	5,160,441	805,441	1,085,030
සමුච්චිත ක්ෂය වීම						
සින්නක්කර						
2020 ජනවාරි 01 වන දිනට ශේෂය	9,282	177,439	283,906	2,568,799	371,175	675,907
වසර තුළදී අයකිරීම	1,741	115,941	163,417	400,641	89,471	200,338
පිළි ඇගයීම් සංචිත වෙත සමුච්චිත ක්ෂය මාරු කිරීම්	-	-	-	-	-	-
බැහැර කිරීම්	-	-	-	(33,882)	(13,989)	(79,686)
වසර තුළ මාරු වීම්	-	-	-	(80)	(1)	-
පිළි ඇගයීම	-	-	-	(346,489)	-	-
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	11,023	293,380	447,323	2,588,989	446,656	796,559
ශුද්ධ පොත් වටිනාකම						
2019 දෙසැම්බර් 31 දිනට	10,735,085	2,187,331	6,574,998	2,171,231	366,905	448,357
2020 දෙසැම්බර් 31 දිනට	13,355,860	2,096,505	6,345,738	2,571,452	358,785	288,471

විදුලි ජනක යන්ත්‍ර හා මඟී සෝපාන	වෑද්දුම් හා සවි කිරීම්	වායු ෂමන යන්ත්‍ර	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	ගබඩා ටැංකිනළ හා පොම්පාගාර	චිල් පි ගෑස් සිලින්ඩර හායන්ත්‍ර	වෙනත්	එකතුව 2020	එකතුව 2019
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
55,961	5,283	109,328	1,521,873	5,479,240	14,707,517	300,006	**48,749,625**	43,741,464
521	-	18,553	-	-	-	46,076	**666,453**	1,236,806
-	-	-	-	-	-	-	**(131,475)**	4,052,095
-	-	-	-	-	-	-	**-**	(141,600)
-	-	-	-	-	(4,744)	(1,665)	**(157,833)**	(138,469)
-	-	-	-	-	-	(901)	**(2,217)**	-
-	-	-	127	14,921	2,618,976	-	**5,347,262**	(671)
56,482	5,283	127,881	1,522,000	5,494,161	17,321,749	343,516	**54,471,815**	48,749,625
10,617	1,116	16,493	393,336	1,829,149	6,307,086	223,548	**12,867,853**	10,321,211
10,539	2,372	18,020	69,889	222,423	741,614	36,018	**2,072,424**	2,723,404
-	-	-	-	-	-	-	**-**	(141,600)
-	-	-	-	-	(4,735)	(1,559)	**(133,851)**	(35,162)
-	-	-	-	-	-	(133)	**(214)**	-
-	-	-	-	-	-	-	**(346,489)**	-
21,156	3,488	34,513	463,225	2,051,572	7,043,965	257,874	**14,459,723**	12,867,853
45,344	4,167	92,835	1,128,537	3,650,091	8,400,431	76,458	**-**	35,881,772
35,326	1,795	93,368	1,058,775	3,442,589	10,277,784	85,642	**40,012,092**	-

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

8.1.1 ඉඩම්

සින්නක්කර ඉඩම්

ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පිවිල්සි - පිළි ඇගයුම් වටිනාකමට ගෙනයන ලදි.

පිහිටීම	ප්‍රමාණය (පර්චස්)	තක්සේරු කළ ක්‍රමය	දේපළ තක්සේරුකරු	තක්සේරුව අදාළ වන දිනය	නිරීක්ෂණය කළ නොහැකි වැදගත් යෙදවුම්	2020.12.31 දිනට ධාරක වටිනාකම රු.	නැවත තක්සේරු කිරීමේ අතිරික්තය රු.	පිරිවැයෙහි ධාරක වටිනාකම රු.
හත්බෝධිය, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05	10.35	විවෘත වෙළඳපොළ ඇගයීම් ක්‍රමය	ඒ. ඒ. වී. ෆාතිහු මහතා (FIV) වරලත් තක්සේරුකරු	2018 දෙසැම්බර් 31 වන දිනට	පර්චසයක තක්සේරු මිල	37,127,764	30,659,318	6,468,447
හත්බෝධිය, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05	10.00	විවෘත වෙළඳපොළ ඇගයීම් ක්‍රමය	ඒ. ඒ. වී. ෆාතිහු මහතා (FIV) වරලත් තක්සේරුකරු	2018 දෙසැම්බර් 31 වන දිනට	පර්චසයක තක්සේරු මිල	35,872,236	29,622,529	6,249,706
						73,000,000	60,281,847	12,718,153

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්

සිනෝලංකා හොටෙල් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් ඉඩම් කැබලි තුනක් එම ඉඩම් කැබලිවලට සම්බන්ධව තිබූ ගොඩනැගිලිද සමඟ 2014 වර්ෂයේදී එම ගොඩනැගිලි කඩා ඉවත් කර බෝල්රූම් ශාලාව තවදුරටත් පුළුල් කිරීමට, රථවාහන නැවතුම්පළට පහසුකම් සැලසීමට, රථ වාහන සංසරණය ප්‍රතිසංවිධානය කිරීමට පහසුකම් සැලසීමේ අභිලාෂයෙන් සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව මිලදී ගත්තේය. 2013 වර්ෂයේ දී මිලදී ගත් එම දේපළවල මුළු පිරිවැය රු 1,139.357,179/- ක් විය. එම මුළු පිරිවැය සින්නක්කර ඉඩම සහ ක්‍රියාත්මක ප්‍රාග්ධන කාර්යය අතර වෙන්කරනු ලබයි. සින්නක්කර ඉඩමට වෙන් කරන ලද පිරිවැය, පර්චස් එකකට රු මිලියන 7 ක් ලෙස රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තීරණය කරන ලද තක්සේරුව මත පදනම්ව තීරණය කරනු ලැබ ඇත. එමඟින් රු. 716,734,184 ක් සින්නක්කර ඉඩමේ පිරිවැය ලෙස වෙන් කරන ලදී. ඉඩම්කැබලි තුනේ වපසරිය තක්සේරු අංක 112-62. පර් 77, තක්සේරු අංක 108- පර්15 සහ තක්සේරු අංක 134-පර් 20.10 කි. ඉහත සින්නනක්කර ඉඩමේ මුළු පිරිවැයට ඉඩම අත්කර ගැනීමට අදාළ සෘජු පිරිවැය ඇතුළත් වෙයි. ඉහත සින්නක්කර ඉඩමට අමතරව සී/ස සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්) සමාගම, සී/ස සෙලින්කෝ හෝම්ස් ඉන්ටනැෂනල් (ලෝටස් ටවර්ස්) සමාගමට වර්තමානයේදී අයත් ඉඩමේ ආසන්න වශයෙන් පර් 22.56 ක ප්‍රමාණයක පදිංචිව සිටියි. මෙම ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සමාගමේ රේඛීය අමාත්‍යාංශය (රාජ්‍ය ව්‍යාපාර අමාත්‍යාංශය) විසින් එම විෂයට අදාළ අමාත්‍යාංශය වන ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හරහා ආරම්භ කරනු ලැබ තිබේ. පහත දැක්වෙනුයේ ඒ හා සම්බන්ධ නෛතික ප්‍රතිඵලයන්ය.

අංක DLM / 43/18 දරන නඩුව සිනෝ ලංකා හෝටල් සහ ස්පා (පුද්ගලික) සමාගමට එරෙහිව සෙලින්කෝ හෝම්ස් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් විසින් කොළඹ දිසා අධිකරණයේ ගොනු කරනු ලැබූ අතර ඔවුන් අදාල දේපලෙහි නීත්‍යානුකූල දේපල හිමිකරු බවට අධිකරණයෙන් ප්‍රකාශයක් නිකුත් කරන ලෙසත්, වර්තමාන පදිංචිකරු නෙරපා හරින ලෙසත් දේපලෙහි අලාභ අයකර ගැනීමට සහ දේපලෙහි වැඩිදුර ඉදිකිරීම් සිදුකිරීමෙන් හා සීනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්) සමාගම වැලැක්වීම සඳහා ස්ථිර තහනම් නියෝගයක් නිකුත් කරන ලෙසත් ඉල්ලා සිටින ලදී. පසුව මෙම නඩුව කොළඹ උගත් දිසා විනිසුරු විසින් 2018 ජූලි 24 දිනැති නියෝගය මඟින් ප්‍රතික්ෂේප කරන ලදී.

පසුව, පැමිණිලිකරුගේ නීතීඥයින් විසින් ප්‍රශ්නගත දේපල නැවත මැනීම සඳහා අධිකරණයෙන් අවසර ඉල්ලා සිටි අතර, එසේ නැවත මනින ලද සැලැස්ම බලයලත් මිනින්දෝරුවරයා විසින් 2019 අගෝස්තු 07 වන දින අධිකරණයට ඉදිරිපත් කරන ලදී. සෙලින්කෝ හෝම්ස් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් විසින් එම දේපලටම සම්බන්ධයෙන් සීනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමට එරෙහිව අභියාචනාධිකරණයේ පවරා ඇති සීවී (රිට්) අංක 219/18 දරන අයදුම්පත සම්බන්ධයෙන් තීරණයක් ලැබෙන තෙක් අධිකරණය විසින් නඩු විභාගය කල් දමන ලදී.

2018 ජූලි 24 දිනැති දිසා අධිකරණයේ ඉහත කී නියෝගය ඉවත් කිරීම සඳහා සීනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්) සමාගමට එරෙහිව සෙලින්කෝ හෝම්ස් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් විසින් අභියාචනා පෙත්සමක් නඩු අංක WP / HCCA / 109/18 / LA යටතේ බස්නාහිර පළාත් මහාධිකරණ (සිවිල් අභියාචන)යෙහි ගොනු කර ඇත. මෙම නඩුව ඉහත සඳහන් කළ සෙලින්කෝ හෝම්ස් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් විසින් 2020 සැප්තැම්බර් 17 වන දින ඉල්ලා අස් කරගන්නා ලදී.

